

D.S.W. MUNIWIRA
D.S.W.M.
COLOMBO.

# පරෙවි සන්දේශය.

—○:○:○—

පණ්ඩිත ශිරෝමණී වූ
තොටගමුවේ
ශ්‍රී රාහුල සංඝරාජ මහාස්වාමීන්ද්‍ර ස්ථවිරපාදයන් විසින්
විරචිතයි.

---

දකුණු ලක්දිව මාගම්පුරයෙහි
රජමහා විහාර සංඛ්‍යාත ගටාලමැණික්
උභය විහාරාධිපතිවූ
තංගල්ලේ
සිරිසුනන්දාභිධාන සාමීන් විසින් ලියනලද
පදාර්ථ භාවාර්ථ සන්නසහිතයි.

---

උගත් ඩබ්ලිව්. ඇජ්. ගුණවර්ධන මුදලිතුමන් විසින්
පිලිගන්නාලදී.

---

කොළඹ දුම්රිය දෙපාර්තමේන්තුවේ ඉංග්‍රීසි පාඨශාලාවේ
ප්‍රධාන ගුරුතනතුර දරණ
තංගල්ලේ
ඩී. ඇස්. ඩබ්ලිව්. මුණිවීරරත්න මා විසින්
කොළඹ සුදර්ශන අච්චුගසනාලයෙහි
මුද්‍රණය කරන ලදී.

1902.

# සං ලෙ ප න යි.

ප්‍රවර පණ්ඩිත ශිඛාමාණික්‍යවූ විවිධ විබුධජන ප්‍රශංසිත ශ්‍රීසංඝබෝධි ශ්‍රීවිජයබාහු පරිවෙණාධිපතිව වැඩිවිසූ ෂඩ්භාෂා පරමේශ්වර ත්‍රිපිටක වාගීශ්වරාචාර්‍ය්‍යවූ තොටගමුවේ ශ්‍රීරාහුල සංඝරාජ මහාස්වාමීන්ද්‍ර ස්ථවිර පාදයන් විසින් විරචිත මෙම පරෙවිසන්දේශය විවිධ කාව්‍යාලඞ්කාරාදීයෙන් හා මධුරමනොහර කණ්ණරසායන විචිත්‍ර විචිත්‍ර උපමෝපමෙය යන්ගෙන්ද සමලඞ්කෘතය ඡන්දස් ව්‍යාකරණාදියට අතිසයින් එකඟව මහාවිනාචිත් ඊසින්ම ප්‍රකාශකළ යුතුවූ ගූඪගම්භීර අර්ථාන්විතවූ බොහෝතැන් ඇත්තේය. එහෙයින් විබුධජන ශෙඛර පණ්ඩිතුමෙක්වූ දකුණු ලක්දිව මාගම්පුරයෙහි සටාල මැණික් වෙහෙර දෙන පිහිටි රජමහවිහාරය ආදී විහාර දසයකට අධිපතිව සිටියාවූ සංඝපිරිසක්ද ඇතිව මැඩවිසූ රාජ පූජිත ගණාචාර්‍ය්‍යවූ කාංගල්ලේ ශ්‍රී ජිනරතන තිස්ස ස්ථවිර ස්වාමිපාදයන්ගේ ශිෂ්‍යවූ දැනට සටාල මැණික් විහාරස්ථානවල අධිකාරී ධූරන්ධර කාංගල්ලේ සිරිසුනන්දනම ස්ථවිරයන්වහන්සේ 'විවිධ විදජ්ජන ප්‍රශංසිත පණ්ඩිතුමෙක්වූ දෙන් අන්ද්‍රිස් හුඩාවේ පණ්ඩිත ගුණවර්ධන මුහන්දිරම් මන්ත්‍රීන්දයන්ගෙන් අසා ඒ තුමන්ගේ සම්මූඛයෙහිදීම ලියාගෙණ තිබුන මෙම පදාර්ථ භාවාර්ථ සන්නදෙක ලෝවැඩ සිරින් මුද්‍රණයකරවා පරෙවි සන්දේශය බොහෝ වරවල මු ද්‍රණයවූයේ වුවද අච්චුගැස්වීමෙහිදී ගොයෙනාවක් දැමීමකට සිද්ධ නාව මෙලෝ ප්‍රයෝජනයට ලියාගත්තෙන් මෙසෙන් කියා දුන් ඒ ස්වාමීන්ගෙන් ඕලත් එතන් ඉතා හිතෛසිවනස උතුමෙකුගේ ආධාරයෙන් ලබාගෙණ බොහෝ ලොකයාටත් වැඩපිණිස මුද්‍රණයකරවන්ට කල්පනා කෙළෙමු. මෙහි සමහර පදගැන ගුරුමුඛයෙන් ප්‍රකාශිත නොයෙක් අර්ථද නොයෙක් ප්‍රකාර අදහස්ද මෙම ස්වාමින් විසින්ම ලියාගෙණ තිබුණ අන්දම දැනගැණීම පණ්ඩිතයන්ගේ වචනශොභන භාෂාකාව ජනතාහි ලාභීන්ට ඉතා ප්‍රයොජනවෙනවා ඇත යන කල්පනාවෙන් ඒ ඒ සන්නවල තිබුණ වැඩි දිඝීනොවන විස්තර අදහස් ආදී සත් සමගම මුද්‍රණයකරවූයෙමු. තවත් මෙම සන්නයට වැඩිවිස්තර ගැටපද විවරණයක්ද, ශුද්ධපත්‍රයක්ද, සන්න ලියාගෙන තිබුණ එම ස්වාමීන්ලවාම ලියවාගෙන කල්නොයවාම නැවත මුද්‍රණයකරවා පළකිරීමටද අදහස් ඇතිබවත් මෙයින් දන්වමු. ඒ ඇර බොහෝ පරෙවිසන්දෙශ පොත්වල හා අච්චුවලත් ඇත්තාවූ වෙනසද අදහස්වල දුරප්‍රමාණයද සොයන්නන්ට නොයෙක් තැන්වලින් දැනගතහැකිවෙතත් පහසුවෙන් සොයා කල්පනාකිරීමට මෙහි අතරතුරෙන් කවි කීපයක් පෙන්වමී—එනම් 1 පළමුවෙනි ගීයේද, 15 වෙනි කවියද, 53 වෙනි, 63 වෙනි, 69, 72, 76, 85, 104, 105, 113, 120, 13?, 147, 196, 200 යනමේ ආදියයි මෙසේ සමහර තැන කවිවලත් සමහරතැන සන්නවලත් ඇති වෙනස්කම් කල්පනාකරබලා මෛත්‍රී කෙරෙත්වා. මෙම පොත නැවත අච්චුගැස්වීමේ අයතිකම්ද මෙහි කම්ජේක අපටම බවත් සියල්ලන්ටම මෙයින් දැනුම්දී සිටින්නේ.

කාංගල්ලේ ඩෙවිඩ් ඩ'ර්ඩු:
විජේසිංහ මුහන්දිරම්.

# ශුද්ධිපත්‍රය.

| පි. | පෙ. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 1 | 19 | සිංග | සිංහ |
| 2 | 11 | බුවමෝද | බුවුමෝද |
| ,, | 14 | බදුරස් | බුදුරස් |
| ,, | 15 } 16 } | සදුතුය | තදුතුය |
| ,, | 19 | දිවයන් | දිව්‍යයන් |
| 3 | 5 | මිලක් | මිලෙක් |
| ,, | 6 | ඔනෑ | ඕනෑ |
| 4 | 11 | ගෙමි | ගෙමෙ |
| ,, | 17 | ඉසිත | ඉස්ත |
| 6 | 7 | පාවාක | පාඩාග, යනුවැඩි (යේගොදුම් |
| 8 | 3 | සූක්ෂම | සූක්ෂම |
| ,, | 25 | ගියාවුන් | ගැවුන් |
| 11 | 13 | වලාකුලු | වැසිවලාකුළු |
| ,, | 26 | පඩක්තිය | පඞ්ක්තිය |
| 13 | 1 | මුහුල | මුහුලු |
| ,, | 4 | ගෙවුගන් | ගෙළුයන්වැඩියේ (සොඳැසි |
| ,, | 8 | කෑඩීග | හැඩිග |
| ,, | 28 | රශ්මි | රශ්මි |
| 14 | 1 | නමැති | නමැති |
| ,, | 4 | සිරි | පිරි |
| ,, | 10 | ඊදි | දිදි |
| ,, | 11 | ආකාර | ආකර |
| ,, | 12 | ගිනි | ගිනි |
| ,, | 25 | මණී | මණී |
| ,, | 29 | කිරි | කිරි |
| 15 | 6 | සිර | සිර |
| ,, | 11 | සෑමි | සෑමි |
| ,, | 12 | කාරිවු | කාරිවූ |
| ,, | 13 | අඳිනා | අඳිදා |
| ,, | ,, | සවගා | සවනාව |
| ,, | 16 | කිරණින් | කිරණින් |
| ,, | 18 | කදුලු | කඳුලු |
| ,, | 22 | මිහිපා | මිහිපා |
| 16 | 13 | රජුන් | රජුන් |
| ,, | 22 | රශ්මිය | රශ්මිය |
| ,, | 26 | කරණකල්පි | කොට එන (කල්පි |
| 17 | 7 | පිඹුර | පිඹුර |
| ,, | 31 | විනාශය | විනාශය |
| 18 | 19 | නමැති | නමැති |
| ,, | 22 | බොහෝ | බොහෝ |
| ,, | 23 | දේවත්වය | දේවත්වය |
| 18 | 30 | අවිජ් | අවජා |
| ,, | ,, | ඩිඹි | ඩිඹි |
| 19 | 3 | ආරම්භ | ආරම්භ |
| ,, | 5 | පියිපි | පියපි |

| පි. | පෙ. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 20 | 1 | ගෙවත් | හෙවත් |
| ,, | 2 | ගිනි | ගිනි |
| ,, | 4 | දුරු | දුරු |
| ,, | 6 | ආරුඪව | ආරූඪව |
| ,, | 17 | ගිරග | ගිරය |
| ,, | 19 | දිති | දිප්ති |
| ,, | 29 | බ්‍රග්ම | බ්‍රහ්ම |
| 21 | 24 | ත්‍රිදශ | ත්‍රිදශ |
| 22 | 32 | අනෑඅනෑ | නානා |
| 23 | 15 | මෙනිරිඳු | මෙනිරිඳු |
| ,, | 17 | මධරා | මධුරා |
| 24 | 26 | සුබි | සුරබි |
| ,, | 29 | ගෙබි | හෙබි |
| ,, | 33 | බියගා | බියනා |
| 25 | 25 | ඇමද | ඇමද, |
| 26 | 6 | නොහොත් (කෙතුන් | යනු වැඩිසි |
| 27 | 15 | සිපි | සිප් |
| ,, | 23 | අගමුබ | අභිමුඛ |
| ,, | 25 | පරෙවි | පරෙවි |
| 28 | 5 | අගිනව | අභිනව |
| 31 | 5 | අසුරු | අසුරු |
| 32 | 13 | පැවති | පැවැති |
| ,, | 23 | පැවති | පැවැති |
| ,, | 26 | බඩාදරයෙන් | බන්ධනයකරණ ලද්ආදරයෙන් යුතු කන බ නො හොත්ආදරබැ දිමෙන් |
| 33 | 3 | දනී | දනි |
| 34 | 5 | ඊවි නිති | පිවි, නිති, |
| | | (යනාදීය | කියා ගුණවති |
| ,, | 13 | පෑ නො | ගෙකෝ |
| 35 | 2 | නමින්ගේ | එට්ටැඳුන්ගේ |
| 36 | 23 | වැල්ලව | වැල්වලි |
| 37 | 24 | පුණ්ඩ | ගුණාණ්ඩ |
| ,, | ,, | කලාව | කලාවූ |
| 38 | 9 | ගිව | ගිබා |
| 39 | 5 | දිලි | දිලි. |
| ,, | 21 | වැකී | වැකී |
| 40 | 9 | ගොපගේ | තොපගේ |
| ,, | 21 | ගිහිකා | ගිනිකා |
| 43 | 35 | වනවාස | වනවතිවාස |
| 44 | 27 | මාලිවු | මාලිවූ |
| 46 | 8 | පුෂප | පුෂ්ප |
| ,, | 9 | මොලපුවා | මොලපුව |
| 48 | 5 | නිමකර | නිඝමකර |
| 49 | 24 | ජවලිත | ජ්වලිත |
| 52 | 20 | ක්‍රිඩා | ක්‍රීඩා |

| පි. | පෙ. | අශුධ. | ශුධ. |
|---|---|---|---|
| 53 | 28 | රාජීන්ද්‍ර | රාජීන්ද්‍ර |
| 54 | 27 | ඵලි | එලි |
| 55 | 4 | ප්‍රභූ | ප්‍රභූ |
| 56 | 19 | ඒ කාන්ත | එකාන්ත |
| ,, | 35 | සොභාව | සොභාව |
| 57 | 17 | ප්‍රිසාම්කි | ප්‍රිසාම්කි |
| ,, | 32 | වන්‍දන | චන්‍දන |
| 58 | 1 | විලා | වලා |
| ,, | 27 | ප්‍රභා | ප්‍රභා |
| 54 | 11 | ප්‍රභා | ප්‍රභා |
| 61 | 21 | ශෝභා | ශොභා |
| 63 | 22 | මතුභාග | මනුභාග |
| 65 | 2 | මහි | මහී |
| ,, | ,, | ශ්‍රීපාද | ශ්‍රීපාද |
| 66 | 19 | සියල්ල බලව වනය | සියල්ලෙන් ප්‍රත් වනය බලව |
| ,, | 29 | අකුලවූ | ආකුලවූ |
| 68 | 13 | මුවරද | මූවරද |
| 69 | 5 | විගත | විගත |
| 72 | 17 | ගලා | ගහලා |
| ,, | 24 | වයගිලු | වියගිලු |
| ,, | 26 | සුස්ක | ශුෂ්ක |
| 72 | 27 | වාරිත්‍ර | චාරිත්‍ර |
| ,, | 30 | අවලො | අවිලො |
| 73 | 17 | සිරිය | සිරිය |
| 73 | වෙනිපිටේ 132 වෙනිකවියට පෙන්නූ දෙවෙනි තුන්වෙනිනෝට්දෙක දෙකට දෙක මාරුකොටද තුන්වෙනි නෝට්එක, පැමෙනි, යන කියන්න ලගටද ගතයුතුයි. | | |
| ,, | 26 | ඹකරඳ | මකරඳ |
| 75 | පිටේ පටන් 79 වේ පිටදක්වාපිටු ගණනගෙන් ඉලක්කම්වැරදීතිබේ. ඉදිරිපහුසාර ගතයුතුයි. | | |
| ,, | 6 | ගාත්‍රා | ගාත්‍ර |
| ,, | 12 | ව කලරව (කලරය | ව, කාලරව, කල (රවය |
| ,, | 17 | ආහරණ | ආභරණ |
| ,, | 21 | නීනී | නිනි |
| ,, | 25 | කාන්තා | කාන්තා |
| ,, | 29 | උත්තම | උත්තම |
| 76 | 2 | ඇත | ඇති |
| ,, | 9 | පවිණීන් | පබනින් |
| ,, | 11 | සාම්‍රි | සාමාග්‍රි |
| 77 | 15 | සනිග්ධ | සනිග්ධ |
| ,, | 16 | ධවජ | ධවජ |
| ,, | 34 | මාග්නාර | මාගානාර |
| ,, | 37 | අනුපම | අනුපම |
| 78 | 23 | වඩින් | වඩින් |
| | 29 | වඩින | වඩින |
| | 3 | යනූන් | ධාතූන් |
| ,, | 5 | ධතු | ධාතු |

| පි. | පෙ. | අශුධ. | ශුධ. |
|---|---|---|---|
| 80 | 23 | වනි | වැනි |
| ,, | 30 | අනන්ත | අනන්ත |
| ,, | 32 | ධවජ | ධවජ |
| ,, | 33 | වැලෙවු | වැලෙව් |
| ,, | 35 | සනිග්ධ | සනිග්ධ |
| 82 | 31 | ප්‍රභාව | ප්‍රභාව |
| 84 | 5 | අනග | අනංග |
| ,, | 156 වෙනි කවියේ දෙවෙනිපදේ ප්‍රණද, පන් පත්‍රයන්, අද, ගඝනය කොරෙන්, ශත්‍රුවෙන් ඉනෝට් එකේ පෙන්වූ තේරුම වැඩියෙන් හොඳයි. | | |
| 85 | 6 | එපුරැ | එපුරැ |
| ,, | 8 | උඩගු | උඩගු |
| ,, | 33 | සිතෙහි | සිතෙහි |
| 87 | 35 | සම්භාග | සම්භාග |
| 88 | 1 | හිත | හිත |
| ,, | 17 | පුදකල | පුදකල |
| 90 | 10 | අගත | අගත |
| 91 | 6 | පසිති | පසිඳි |
| ,, | 23 | සලෙකු | සලෙලකු |
| 92 | 7 | සහසැස් | සහසැස් |
| ,, | 29 | ඇසින්ගන් | ඇසින්හන් |
| 94 | 7 | නාවිකාදිවූ | නාවිකාදි |
| 96 | 17 | මනත | මනත |
| ,, | 21 | සරී | සරි |
| 97 | 16 | කිව | කිව |
| ,, | 21 | ඉසුලුශේයයි | ඉසිලුයේය කිව් |
| ,, | 22 | ක්වවොත් | වොත් ඒ කිම |
| ,, | 24 | සැදී | සැදී |
| ,, | 26 | විතෙ | විතෙ |
| ,, | 32 | උජවලිත | උජ්ජවලිත |
| ,, | 34 | කරත | කරණ |
| 98 | 6 | සූක්‍ෂම | සූක්‍ෂම |
| ,, | 31 | මිලන | මූලන |
| 99 | 4 | කඩු | කඩු |
| ,, | ,, | කඩොල් | කඩොල් |
| ,, | 16 | එනම් | එනම් |
| ,, | 25 | සෙකගේ | සෙකුගේ |
| 100 | 10 | එකියන | එකියන |
| ,, | 19 | නීය | නිය |
| 101 | 4 | විකු | විකු |
| ,, | 15 | තලාවන්හි | තලාවෙහි |
| ,, | 17 | නොදීය | නොදිය |
| 102 | 3 | රුසිරු | රුසිරු |
| ,, | 9 | රණඹරණ | රණඹර |
| ,, | 10 | සාලා | සාල |
| ,, | 30 | ශිය | ශිය |
| ,, | 35 | ලොව | ලොවැ |
| ,, | 36 | සැදීඑත | සැදීඑත |
| 103 | 2 | වැනී | වැනී |
| ,, | 4 | දෙසසත් | දෙසසත් |

| පිට | පෙල | අශුඩ | ශුඩ |
|---|---|---|---|
| 62 | 22 | රොහිත මත්ශ්‍ය | මඩගුර |
| | 23 | ගෙණ | නැගෙණ |
| | 29 | රේම්සුත් | මගුරත් |

| පි. | පෙ. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| ,, | 18 | මුනිදුන | මුනිදුන් |
| ,, | 21 | දිවපුරු | දිවපුරු |
| ,, | 26 | රාජ්‍යශ්‍රී අශී | රාජ්‍ය ශ්‍රී අශී |
| 104 | 5 | ලක්‍ෂමිය | ලක්‍ෂ්මිය |
| ,, | 37 | සරන | සරණ |

තවද මෙහි සමහරතැනක විපරීතව දක්නට ලැබුන දීඝ, හ්‍රස්ව, ණ, න ල, ළ, සංයෝග විසංයෝග ආදිය සහෘදයෙන් දැනගෙනගෙනයි ශුද්ධකොට කියවන්නෝ කොටමු.

සන්න සහිත

# පරෙවිසන්දේශය

1 සැරද පරෙවිඳුසඳ-පඬුවන් සුරත් සරණින්,
පහළවූ කිරිමුහුදින්-සහපබල පලුසක්වන්......

පරෙවිඳුසඳ සැරද-යනුමෙහි වාක්‍යයොජනායි......පඬුවන්, පාණ්ඩරවර්ණයෙන්හා; සුරත් සරණින්, මනාරක්තවරණයද කරණකොටගෙණ; කිරිමුහුදින්, ක්ෂීරාර්ණවයෙන්; පහළවූ, ප්‍රාදුර්භූතවූ; පබලපලුසහ, ප්‍රවාලපල්ලවසහිතවූ; සක්වන්, සඞ්ඛයකටබඳුවූ, පරෙවිඳුසඳ, කපොතෙන්ද්‍රොත්තමය; සැරද, චිරකාලයක් ජීවත්වව් හෙවත් බොහෝකලක් පවතු නොහොත් චිරකාලයක් ජීවත්වෙහිවා......සුදුවර්ණයෙනුත්- යහපත් රතුවර්ණය ඇතිපාදයෙනුත්- කිරිමුහුදෙන් පහළවූ පබලුදලු සහිත හක්ගෙඩියක්වැනිවූ-පරෙවියන්ට ප්‍රධානවූ-උතුම් පරෙවිය-(තුඹ) බොහෝකලක් ජීවත්වෙයන් හෙවත්බොහෝකලක් පැවැතියන්......මෙහි පළමුකොටදක්වනලද-අතිමධුරමනොහර පදාන්විතවූ-යහගීයෙන්-පාරාපත පක්ෂිහුගේරූපවර්ණනාවෙන් ආමන්ත්‍රණයකොට-දූතයාහට මඞ්ගල්‍යය පිණිස-චිරකාලයක් ජීවත්වෙව-යි- ආශීර්වාදකොට-තදනන්තරව-පරෙවියාතුෂ්ටිජනක මිත්‍රයෙකුබවද ප්‍රකාශවන්නාවූ-සතුටු උපදවන මාධුර්‍ය්‍යකර්ණරසායන ප්‍රශංසනීය මනොහරවචනයන්ගෙන්ද ශාලඞ්කෘතවූ-තමන්ගේ චිත්තප්‍රීතිය හඟවන්නාවූ-"මිතුරුතුරුසරහණ" යනාදි උපජාතිනම් දසපද සැහැල්ලකීහ......

2 මිතුරු තුරු සරහණ-මණිතුරුන වවසත යූ රූ
තුබ්නෙත සඳෙහි නද මද මද පවන ලෙ ලි
හෙබ් පුල්කුමුදු හැගැනොනතුද අතින් හි ලි
සුරගඟිතල නෙලුඹු-දැලි සද හස නොවෙත ප ත

සුදු බුදුනිවෙසී නෙනතොප දැකැලෙව් එස ද
සුදු බුදුරැස් පිඬෙකැති නොකලෝද සු ද
ස දෙ කි න් නඳුනු යන්නෙන මලෙක සුරන ඹේ
ස දෙ කි න් ලොබින් වටලා නොදැලීද ඉ ඹේ

න් දු කි න් අඩිද සකි සඳ අතරමග තු ඩේ
ඉ න් කි න් අපට පැපනම් දැක්කම්මයි තු ඹේ......

2 චිතුරු, චිත්‍රනැමති; තුරු. වෘක්ෂයන්; සරහණ, අලංකෘතකරන් නාවූ; නවවසතතුරු, අභිනවවසන්ත කාලයබඳුවූ; මිතුරු, මාගේ මිත්‍රය; නද. සන්තුෂ්ටවූ; මඳ මඳ පවන, මඳ මඳ මාරුතයෙන්; ලෙලී, ලීලෝපේතව; තුබින්, නභස්තලයෙන්; එනසඳෙහි. ආගමන යකරන්නාවූ කාලයෙහි; ගිලි, (දිව්‍යයන් අතින් නොහොත් ආකාශ ගඞ්ගාවෙන්) ගලිතවූ; හෙබි, සොභමානවූ; පුල්කුමුදු. පුල්ලකුමුදය කැයි. හැඟැ, සංඥව; අතින්, හස්තයෙන්: නොගතුද. ග්‍රහණය නො කළනුද;- සුරගඟින්. ආකාශගඞ්ගාවෙන්; අල, හලූවාවූනොහොත් පැමිනියාවූ නෙලුඹුදුලි. භිශාඞ්කුරයෙක හෙවත් මුලාලයකැයි; සඳ, ශශාඞ්කයෙන්; නොහොත් සඳ, චන්ද්‍රයෙන්; හසැ, හංසයෝ: වෙත, සමීපයට; නොපත, ප්‍රාප්තනුවූවෝද හෙවත් නොපැමිණියනුද;- සු දු. ශුභවූ. බුදුනි වෙසින්, බුඞනිවේසනයෙන්, එන, ආගමනයකරන් නාවූ නොප, යුෂ්මත්හු; දුකැ, දර්ශනයකොට; එසඳ, තත්කාලයෙහි ලෙව්. ලොකවාසීහු; සුදුබුදුරැස් පිඬෙකැයි. ශුභ්‍ර බුද්ධ රශ්මිපිණ්ඩයෙ කැයි පුදනොකලෝද, පූජනොකළහුද නඳුනුයනින්, නන්දනෝද්‍යා නයෙන් නොහොත් නඳුනුයනින්. නන්දනෝද්‍යානයෙහි; සඳෙනින්, චන්දනවෘක්ෂයෙකින්; එන, ආගමනයකරන්නාවූ; මලෙක, පුෂ්පයෙ කැයි; සුරනඟේ, දිව්‍යාඞ්ගනාවෝ නොහොත්; අඹේ, ආකාශයෙහි; සුරන්. දිව යන් විසින්; සදෙකින්. ඡන්දයෙකින්: ලොබින්. ලොභ යෙන්: වට්ලා, පරික්ෂෙපකොට; ඉඹේ. චුම්බනයකොට; නොදැමූද, ඡඩ්ඩනය නොකළහුද සකිසඳ මිත්‍රොත්තමය; තුබේ. ආකාශයෙහි; අතරමග. අන්තරමාර්ගයෙහි; නිදුකින් නිර්දුඃඛයෙන්; අවුද. ආගම නයකෙළෙහිද; ඉතිකින්. ඉතින්කිම නොහොත් මෙයින් ඔබ්බෙහි, අපට, අපහට: සැපනම්, සෞඛ්‍යයනම්; තුඹේ යුෂ්මත්හුගේ, දුක්මමයි. දර්ශනයමයි —— මිත්‍රනමැති වෘක්ෂයන් අලංකාරකරන්නාවූ හෙවත් සරසන්නාවූ අලූත් * වසන්තකාලයක්වැනිවූ-මගේ මිතුර සතුටු උපදවන්නාවූ ටික ටික (හමන) සුලඟින් ලෙලදිදී ආකාශ යෙන්-(තුඹ) එනකාලයේදී-දෙව්ලොවින් දෙවියන් අතින් ගැලවී හෙවත් අතෑරිආවාවූ-නොහොත් ආකාශගඞ්ගාවෙන් ආවාවූ-බඹ ලන්නාවූ-පිපුනාවූ ශ්වෙතොත්පලයෙක හෙවත් සුදු උපුල්මලෙකැ යි යනකල්පනාවෙන් ලොකවාසීහු අතීන් නොගත්තෝද-ආකාශ ගඞ්ගාවෙන් පැමිණියාවූ නෙළුඹුදුලියෙක හෙවත් හටගත් අංකුරය ඇතිනෙලුඹලයක්දෝහෝයි- ශශාංකාකාර-නොහොත්, මුලාලයක්මය

---

* බක් වෙසක් වසන්-බක් වෙසක් දෙමසෙහි බොහෝමල්පිපු වනය සැරසෙයි ඒදෙමස "වසන්ත" කාලනම.

යනසිතින් හංශයෝ උඹේ ලඟට ආවේනැද්ද-පිරිසිදුවූ බුදුන්වැඩ වසන ගඳකිළියෙන් (විහාරස්ථානයෙන්) එන්නාවූ නොපදකලා ඒ කාලයෙහිදී ලොකවාසීහු-සුදුපාට බුදුරැස් පිඬෙක යන කල්පනා වෙන් (මොකවත්) පූජනොකලෝද-නඳුන් උයනින් නොහොත් නඳුන් උයනෙහි සඳුන්ගසකින් එනම ලක්යයි දිව්‍යස්ත්‍රීහු කැමැත් තෙන් හෙවත් ඔනෑකමින් ලොභයෙන් වටකරගෙණ-ඉඹලාදමුවේ නැද්ද-උතුම් මිත්‍රය ආකාශයෙහි අතරමග නිදුකින් ආයෙහිද-ඉතින්-නොහොත් මෙසින් මත්තෙහි-අපට සැපත නම් (මිත්‍රය) තුඹේ දැකීමමයි——

3 ත මා ඉටු මිතුරු කරණී පැමිනිව ර
ප මා නොවෙති සුදනෝ මෙත්කායැතික ර *
පෙමා එසිනුවම් මිණිර,වණින් පව ර
මෙමා වදන් පස්කැන් කන්ලකරක ර

3 තමා, තමාගේ; ඉටුමිතුරු, ඉෂ්ටමිත්‍රයන්ට; කරණී, කටයුත්තක්; පැමිනිවර, ප්‍රාප්තකල්හි; සුදනෝ· සත්පුරුෂයෝ; මෙත්කායැතිකර, මෛත්‍රිකාය ඇතිකොට නොහොත් මෛත්‍රියකායායතන කොට, (කායසන්තක ඒකක්කොට) පමානොවෙති, ප්‍රමාදනොවෙත්ය. එසින්, එසේහෙයින්; පෙමා, ප්‍රේමවනතය; උවම්, උපමානමැති; පවර, උතුම්වූ: මිණිරුවණින්, මාණික්‍යරත්නයෙන්; (සැදුනාවූ) මෙමා, මේමාගේ; වදන්, වචනනමැති; පස්කැන්. තාඩඞ්ක යෙන්; කන්, කණීයන්; ලකරකර, අලඞ්කාරකරහෙවත් සරහව——

තමාගේ කැමතිවූ (මනාප) මිත්‍රයන්ට කටයුත්තක් පැමිණිවාරයෙහි සත්පුරුෂයෝ- මෛත්‍රියෙන් යුත්කාය ඇතිකරගෙණ නොහොත් මිත්‍රයාගේ කාය තමන්ගේ කාය කරගෙණ-එනම්-සමානාත්මතාව යෙන්-නොහොත්-මිත්‍රකමනිසා ඒකට යුත්තඇඟටගෙණ මෛත්‍රිය කායට අයතිකරගෙණ (කටයුතුකිරීමෙහි) පමානොවෙත්ය-ඒනිසා පෙම්ඇති නැනැත්ත උපමානමැති මාණික්‍යරත්නයෙන් (සැදුනාවූ) මේ මගේවචනනමැති තෝඩුවලින් උඹේ කන්සරසා ගන්න——

මෙමාමෙන මැදුරුතුරු මිතුරුපුරු මිතුරුසඳ
මෙසඳ කුම්‍කරෙම්දෙහෝ.

මෙමා, මේමාගේ; මෙන, චිත්තනමැති; මැඳුරුතුරු, මඤ්ජිරානන රයට නොහොත් මඤ්ජිරානනරයෙහි; මිතුරුයුරු, ප්‍රදීපයක්බඳුවූ;

* "මෙත්කරුණුකර"-"කායටකර" කියාද-සමහරපොත්වල.

මිතුරැසඳ, මිත්‍රොත්තමය, මෙසඳ, මේ කාලයෙහි; කුම්කෙරෙම්දෝහෝ. කුමක්කෙරෙම්දෝහෝ ~ මගේ සිත්නම්ැති ගෙට පහණක් වැනිවූ උතුම් මිතුර මේකාලයෙහි මම කුමක්කෙරෙම්ද ~

4 වි පු ල් කුළුණුමෙත් ගුණයෙන් ලෙව්පු ස් න
කොපුල් අතැදලැසලෙස තෙදරැස් ඉ ස් න
තෙපුල් ගෙණැ සුරිඳු රකිණ ලෙව්ස ස් න
උ පු ල් වන් සුරිඳු දැකැ දෙව් මේ හ ස් න

4 විපුල්, මහත්වූ; කුළුණුමෙත් ගුණයෙන්, කරුණාමෛත්‍රිගුණය කරණකොටගෙණ; ලෙව්, ලොකවාසීන්; පුස්න, පුෂ්ටිකරන්නාවූ හෙවත් පොෂ්‍යයකරන්නාවූ; නොහොත්, කුළුණුමෙත් ගුණයෙන්, කරුණාමෛ ත්‍රිගුණය කරණකොටගෙණ, ලෙව්, ලොකයෙහි; පුස්න, පැතුරුණාවූ; කොපුල්අත, කපාලහස්තයාගේ; දළැසලෙස, ලලාටනෙත්‍රයවැනිවූ; තෙදරැස්, තෙජෝපුඤ්ජය නොහොත් තෙජංසුව, ඉසින, සිඤ්චනය කරන්නාවූහෙවත් පතුරුවන්නාවූ; සුරිඳු, සුරෙන්ද්‍රයාගේ; තෙපුල්, වචනය; ගෙණැ, ග්‍රහණයකොට; ලෙව්සස්න, ලොකශාසනය; රකිනා, රක්‍ෂාකරන්නාවූ; උපුල්වන් සුරිඳු, උත්පලවර්ණ සුරෙන්ද්‍රයා; දැකැ, දර්ශනයකොට මේ හස්න, මේ සන්දෙශය; දෙව්, දෙනය කරව් ~ මහත්වූකරුණා මෛත්‍රිගුණයෙන් ලොකයාපොෂ්‍යයකරන්නාවූ–නොහොත් කරුණාමෛත්‍රි ගුණය කරණකොටගෙණැ ලොව පතලාවූ; (ප්‍රසිඬවූ) ඊශ්වරයාගේ නලලෙහි තිබෙන ඇස පරිද්දෙන් තෙජස්රාශිය නොහොත් තෙජස් නමැති රශ්මිය ඉසින්නාවූ–ශක්‍රයාගේ වචනය හැරගෙණ ලොකයහා බුඬශාසනයරකින්නාවූ* විෂ්ණු දිව්‍යරාජයාදක මේ පනිවිඩවචනය දිපන් ~

"මියුරු රසබස් නුමුතු අස්නැතතු † වණනෙම්—දූන්තානිකුත් පුරවර වෙසෙසඅස ~ මියුරු, මධුරවූ; රසබස් රසවත්වචනයෙන් නුමුතු, මුක්තනූවූ: අස්නැ සන්දෙශයෙහි; තතු, තත්වය; වණනෙම්, වර්ණනාකරන්නෙමි; දූන්, මේකාලයෙහි; තානිකුත්, තාවිසින් නිස්ක්‍රාන්තවනු ලබන්නාවූ; පුරවර, නගරොත්තමයාගේ නොහොත් නගරොත්තමයෙහි; වෙසෙස, විශෙෂය නොහොත් විශිෂ්ටය, අස, ශ්‍රවණයකර ~ මිහිරි රසවත් වචනයෙන් නොමිදුනාවූ හෙවත් රස ඇත්තාවූ පනිවිඩයෙහි ඇති ස්වභාව-(ජයවඪීන පුරවර්ණනාවෙන් පසුව) වර්ණනාකරන්නෙමි-(මේ) වර්තමාන කාලයෙහි තුඹ විසින් පිටත්වනු ලබන්නාවූ උතුම් නුවරෙහි වෙනස අහපන් ~

* මේ කීරවි සමහර ලොකයා අතරේ පවත්නා කල්පනාවකි.
† වණම්–සමහර—

5 තු තු රුවනෙහි බැති පෙම්තර සත නිතො ර
උ තු නොව යුත් පහදද බිහිදොර පත ර
ම තු කුල මුදුන් නිරිඳුන් රදන හැමව ර
ද තු මමිතුර ජයවද්දන පුර පව ර

5 තුතුරුවනෙහි, ත්‍රිවිධරත්නයෙහි; බැතිපෙම්තර, මහත්භක්ති ප්‍රේම ඇත්තාවූ; සත, සත්වයාගෙන්; නිතොර, නිරන්තරවූ; පතර මහත්වූ; පහ, ප්‍රාසාදයෙන්ද; දද, ධවජයෙන්ද; බිහිදොර, බහිවාර යෙන්ද, උනුනොව, ඌනත්වයක් නැතිවඃ යුත්, යුතනවූ; මනුකුල, මනුවංශයම; මුදුන්, ප්‍රධානවූ; නිරිඳුන්. නරෙන්ද්‍රයන්. හැමවර, සැම කල්හි; රදන, රඤ්ජමානවූ; පවර, උතුම්වූ; ජයවද්දනපුර, ජයවර්ධ නනගරය; මමිතුර, මාගේ මිත්‍රය දනු, ජනනය කරව—(බුඩාදී) තුනුරුවන් කෙරෙහි මහත් භක්තිප්‍රේමයෙන් යුක්තවූ සත්වයාගෙන් අතරක්නැත්තාවූ; මහත් (මීභූමිකාදී) ප්‍රාසාදව ලින්හා-කොහෙලි යෙන්ද-තොරණින්ද අඩුවක්නැතිව පවත්නාවූ-මහාසම්මත වංශ යෙහි පළමුවෙනි රජුන් හැමකල්හිම රඳන්නාවූ-උතුම් ජයවර්ධන නම් නුවරමගේ මිතුරෙ දනගන්—

6 කා ළ සුලකළ හෙළ රුවනින් තුඟු නැබ ල
ලෙ ල සිලිලෙන් පිරි පිරි වෙත පවුර දු ල
අ ල ල නවර කිරණ වමත්පහර * බ ල
ප ළ කෙළෙ සළාදි නැගි වට තරඟ වැ ල

6 ලෙල, ලීලොපෙතවූ; සිලිලෙන්, සලිලයෙන්; පිරි, පිරුණාවූ; පිරිවෙතැ, පරිඛාසමීපයෙහි; දුල, දිලිසෙන්නාවූ; හෙලර. වනින් ශ්වේතරත්නයෙන්, සුලකලකළ, අත්‍යලඞ්කෘතකළාවූ; තුඟ, උස්වූ නැබල, මහත්වූ; පවුර, ප්‍රාකාරය (කොසේද) කිරණව, ක්ෂීරාර්ණවය අලලනවර, ආලොලනයකරණකල්හි; මත්පහර. මථන ප්‍රහාරයාගේ බල, බලයෙන් හෙවත් ශක්තියෙන්; සළාදි. ඡටාදනයකොට නො හොත් ඡටාදනයකිරීමෙන්; වට, හාත්පසින්; නැගි උද්ගතවූ; තර ඟවැල, තරඞ්ගාවලිය, පළකෙළෙ. ප්‍රකාශකෙළේය—ලෙලදීම හෙ වත් සෙලවීම ඇතිජලයෙන් පිරීතිබෙන අගලසමීපයෙහි දිලිසෙන සුදුපැහැඇති රත්නයෙන් අතිශයින් අලඞ්කාරකළාවූ, උසමහත ඇති (වටේටතිබෙන) ප්‍රාකාරය (කොසේදකීවොත්) කිරිමුහුද කලම් බන්නාවූ කාලයෙහි † මතේ පහරේ බලයෙන් දියසලාහෙවත් කර

---

* ඕල-† "මතේ" යනුදූත්කාලේද-දියොදේ පොඩිකිරීමට මැදින් සිහින්කොට දෙකොන මහත්කොට-තූල් රෝලේ හැඩේට ලොකු කර ලීවලින් සාදා තිබෙන බව දනිමු.

කැවෙන දියසුලිදීමෙන් හාත්පස (වටේට) නැංගාවූරලවැලකඅාකා
රය ප්‍රකට කෙළේය.

7 සොබමන් උවන් නෙත් පියයුරු බැම සස ල
අගනන් දියකෙළිනු දැකැ මෙහි ගෙදිගුවි ල
ගණරන් පියුම් නිලුපුල් තිසර බිගුකැ ල
දනකැන් දනිති තොරතුරු ඇසුමෙන් තෙපු ල

7 මෙහි. මේනගරයෙහි; ගෙදිගුවිල, ගෘහදීර්ඝිකා තටාකයන්හි; සොබමන්, සොභමානවූ; උවන්, වක්ත්‍රයෙන්හා; සසල, චඤ්චලවූ, නෙත්, නෙත්‍රයෙන්ද; පියයුරු, පයොධරයෙන්ද; බැම, භෘයෙන්ද; උපලක්ෂිතවූ, අඟනන්, අංගනාවන්; දියකෙළිනු, ජලක්‍රීඩාකරණ භාවය; දැකැ, දර්ශනයකොට; ගණරන්පියුම්, ඝනසුවර්ණපද්මය, නිලුපුල්; නීලොත්පලය; තිසර, හංසය; බිඟුකැල, භෘංගසමූහය යනමොවුන්ගේ; තොරතුරු විශේෂවිභාගය, තෙපුල ඇසුමෙන්; වචනශ්‍රවණය කිරීමෙන්; දනකැන්, ජනසමූහයෝ; දනිති, ජානනය කෙරෙත්.

මේනුවර ගෙවල්ලඟ සාදාතිබෙන (කුඩා) විල්වල හෙවත් පොකුණු වල-බබලන්නාවූ මුහුනුවලින්හා-චඤ්චලවූ ඇස්වලින්ද-තනවලින් හා බැමවලින්ද යුක්තවූ ස්ත්‍රීන්ගේ ජලක්‍රීඩාකිරීම හෙවත් දියකෙළිනසුවභාව දැකලා-ඝණරන් පියුම්ය නිල්මහනිල්මල්ය- හංසය-මීමැසි සමූහය යනමොවුන්ගේ වෙනස්බව-වචන ඇසීමෙන් ජනසමූහයෝ දැනගණිත්ය- (කතාකරණ වචන නොඇසෙනවානම් දැනගන්ට නොහැකිය දුෂ්කරය යනුභාවයි.

8 කිකිණ් දැලින් ලෙලදෙන මුතුලැල් සම ග
ගිහණ් ලකුළුතුගු පහමුදුනැම නර ග
කිරණ් * තොවිද සැදි රතමිණ් කැරැළි අ ග
පැමිණ් මෙපුර නුබ මැදැහිරුල ඟරුර ග

8 මුතුලැල් සමග, මුක්තාලතිකාවන් සමග; ලෙලදෙන, ලලිතදානයකරන්නාවූ; කිකිණි දැලින්, කිංකිණිකජාලායෙන්; ගිහිණි, ගගණවූ; ලකුළු, අලඞ්කෘතවූ; තුඟු, උච්චයවූ; මනරඟ, මනොරජනය කරන්නාවූ හෙවත් හිත්අලවන්නාවූ; පහමුදුනැ, ප්‍රාසාදමස්තකයෙහි(වූ) කැරැළිඅග, ශ්‍රිඞගාග්‍රයෙහි, සැදි, සජ්ජිතවූ; රතමිණි, රක්තමාණික්‍ය යෙහි නොහොත් රතමිණි රක්තමාණික්‍යයාගේ; කිරණින්. කාන්තියෙන්; ඔවිදි, ඔවිදුනාවූ හෙවත් විරාජමානවනු ලබන්නාවූ; මෙපුර, මේනගරයෙහි; නුබමැදැ, නභොමධ්‍යයට; පැමිණි, ප්‍රාප්තවූ; හිරු,

* කිරණි නොරැදි.

සූය‍ර්‍යතෙම; ලඝිරුරඟ, බාලාර්කයා වැන්න~මුතුවැල් සමග ලෙල දෙන්නාවූ හෙවත් කම්පාවන්නාවූ රහුගෙඩි හෙවත් කුඩාමිණිගෙඩි සමූහයෙන් ගැවසීගත්තාවූ-අලංකාරකරණලද (සරසනලද)-උස්වූ-භිත් අලවන්නාවූ-පහමුදුන්හි-තබනලද කොත්අග (ඡවිකර සාදා තිබෙන) රතුමැණික් සමූහයාගේ කාන්තියෙන් බබලනු ලබන්නාවූ-මේනුවර ආකාශය මැදට පැමිණි සූය‍ර්‍යයා-(උදයකාලයෙහි හෙවත් පායාගණඑන-රැස් අඩුවපෙණෙන) බාලසූය‍ර්‍යයා සමානයි.

9 නි ල් මිණි පැහැති තුඟු පහ මිහිඟුනි නදී නේ
කු ල් මත් මෙනෙන් රැවටුනු මැදුරු සිකිකැ නේ
තු ල් ගණ ගිගුම් ඇසමින් නොමද ඇමිදී නේ
පි ල් නොම හඹත් දිනිඳුවමුත් උදෑස් නේ

9 නිල්මිණිපැහැති. නීලමාණික්‍යප්‍රභාන්විතවූ; තුඟු, උත්තුඞ්ගවූ; පහ, ප්‍රාසාදයන්හි; මිහිඟුනිනදිනේ, මෘදංගභෙරිනාදයෙන්; කුල්මත් මෙනෙන්. කුටමත්තචිත්තයෙන්; රැවටුනු, වඤ්චිතවූ; මැදුරුසිකිකැනේ ගෘහමයූරසමූහයෝ තුමූ; උදෑසනේ, ප්‍රාතඃකාලයෙහි; දිනිඳුවමුත්, සූය‍ර්‍යයාට මිසක්; තුල්. මහත්වූ; නොමද, බොහෝවූ; ගණගිගුම්, මේඝගජ්ජිනාව; අසමින්, ශ්‍රවණය කෙරෙමින්; ඇමදිනේ. සෑම දවස්හි, පිල් පිඤ්ජාවන් නොමහඹත් ආවර්තනය නොකෙරෙත් (ය)~(නිල්වීදුරු ඇල්ලීමෙන්හෝ වෙනයම් අන්දමකින්හෝ) නිල්මැණික් පැහැය ඇත්තාවූ-උස්වූ ප්‍රාසාදවල(ගසනුලබන්නාවූ) මිහිඟුබෙරනාදයඅසා (නීලවර්ණප්‍රාසාදයන් වැසිකළුයයිද-මිහිඟුබෙර නාදය මේඝනාදයයිද සිතාක්‍රීඩාවටයාම පිණිස) කුල්මත්වූ සිතින් රැවටුනාවූ ගෙවල්වල ඇතිකරණ මොණර සමූහයෝ-උදයකාලයෙහි සූය‍ර්‍යයාට මිසක්-මහත්වූ බොහෝවූ මේඝනාදය අසමින්-සෑම දවස්වලම පිල්කරකැවීම නොකෙරෙත් *~

10 ම න හ ර පුළුලු කුළු පියපුරු බරන් දැ ක
මෙහෙවර සිපුම් බඹ † නොපහළවනැයි සැ ක
හැ ම ව ර ගනන් මැද ගෙදෙසින් නෙලබුසෙ ක ‡
දූ ර තු රැ සරණ සලෙලුන් බල සහි ගෙනයෙ ක

* ඉරපායානණ එනවේලාවට මොණරු පිල්විදහාගෙණ නටමින් කරකැවෙත්ළ-ඊට ඉරිදෙවියන් වඳින්නයි-දන්කාලේ කියත්-පිජාවන්ට ආවරණවූ හෙයින් ඒ වෙලාවේ මොණරුන්ට මොනදෙයක් වත් නොපෙනෙත්ළ එහෙයින්-මයුරබෙනුනු උවදුරුබලා හාත්පසසිට ගණීත්ලු~† නොහැසීවනැයි. ‡ නෙලඹසෙක.

10 මනහර, මනොහරවූ; පුළුලුකුළු, පුථුලවූ ශ්‍රොණීන්හා; පියයුරු
බරන්, පයොධරභාරයන්; දැක, දර්ශනයකොට; සියුම්මෙහෙවර,
සූක්ෂ්මකර්මාන්තයෙහි; බඹ, බ්‍රහ්මයා; නොපහළවනැයි, ප්‍රකටනොව
න්නේය යන, සැක, සංකාව; හැම්වරඟනන්, සකලඋත්තමඅඞ්ගනා
වන්ගේ නොහොත්; හැමවර, සෑමවාරයෙහි (හැම්කල්හි) අඟනන්,
අඞ්ගනාවන්ගේ; මැදපෙදෙසින්, මධ්‍යප්‍රදෙශයෙන් අසෙක, සවල්
පයකුත්; සැක, සංකාව; නෙලබු, ලබ්ධනොකළාවූ; පුරතුර, පුරා
න්තරයෙහි; සරණ, සඤ්චාරණය කරන්නාවූ; නොයෙක සලෙලුන්,
අනෙක සල්ලාලයන් හෙවත් නොයෙක් තරුණයන්; සකි, මිත්‍රය;
බල. නිරීක්ෂණයකරව..........., මනොඥවූ (සිත පැහැරගන්නාවූ) පල
ළුවූ උකුල් හා මහත් පයෝධරයන්ද දැකලා-(කුඩාවූ උකුලක්වත්
පයොධරයක්වත් දකින්ට නැතිබැවින්) බ්‍රහ්මයා සිහින් කර්මාන්තකිරී
මෙහි සමර්ථනොවන්නේය ලොකුවැඩකිරීමෙහිම සමර්ථයාය යන
සැකය-සියළු උතුම් (ලක්ෂණඇති) ස්ත්‍රීන්ගේ නොහොත් සෑමදවස්
ඵලම (දකින්ට ලැබෙන) ස්ත්‍රීන්ගේ (සිහින්වූ) ඉඟටිය හෙවත් මැද
පෙදෙස (දැකීම) කාරණකොටගෙණ-ටිකකුත් සැකය නොලැබුවා
වු-(ඒ සැකයට නොපැමිනියාවූ) නුවර ඇතුලෙ හැසිරෙන ඉලන්දූ
රින් (ගේ ආකාරය) බලාපන් ——

11* මෙ පු ර ඟනන් තනපිඬුවැන් යොවුනිනි රි
එ බ ර සුලා හඬනෙව් නද මෙවුල් සි රි
ප ව ර මොණර කරදහව් † තම නොස රි
නි ත ර කියනවැනි මිණිනු පුර ගිගි රි

11 මෙපුර, මේ නගරයෙහි; අඟනන්, අඞ්ගනාවන්ගේ; තනපිඬු,
පයොධරපිණ්ඩයෝ තුම්බුකෙසේද; යොවුන්, යෞවනය; ඉතිරිවැනි,
අතිරිත්තවහෙවත් ඉතිරීගියාක් වැන්න නොහොත් ඉතිරිගියාවුන්
වැන්නෝය; මෙවුල්, මෙඛලාවන්ගේ හෙවත් රස්නාදාමයන්ගේ; න
දසිරි, නාදශ්‍රීයකෙසේද; එබර, ඒභාරය; උසුලා, උද්වහනයකොට;
හඬනෙව් රොදනය කරන්නාක් වැන්න නොහොත් රොදනයකිරී
මක් වැනිය; මිණිනුපුර, මාණික්‍යනූපුරයන්ගේ; ගිගිරි, ගර්ජනාව
කෙසේද; පවර, උතුම්වූ; මොණරකර, මයූරග්‍රීවය; තම, තමාහට;
නොසරිවී, අසදෘසවියයි; දහ, ජඞ්ඝානොමෝ; නිතර, නිරන්තර
යෙන්; කියනවැනි, කථනය කරන්නාක් වැන්න නොහොත් කථ
නය කරන්නියක් වැනිය..........මේ නුවර ස්ත්‍රීන්ගේ (පිරුණාවූමහ

* එපුර සිද— † තවනොසිරි– සිදසමහර

ත්වූ) පියයුරු පිඬු කෙසේද කීවොත්–තරුණකම ඉතිරීගියාක් වැනිය–(ඉතේ බඳිනලද) මෙවුල්දම්වල හෙවත් පෙතිවැල් හවඩි ඇඳීන්ගේ නාද (ය පවත්නා) ස්වභාවය කෙසේද කීවොත්–ඒ පයොධර පිණ්ඩයන්ගේ බර උසුලාගෙණ ඉන්ට නොහැකිව–හඬන්නාක් වැනිය නොහොත් හැඬීමක් සමානය–මාණික්‍යනූපුරයන්ගේ ශ්‍රීහිරිය හෙවත් නාදය කෙසේදකීවොත් උතුම්වූ මොණරකර හෙවත් මයූරග්‍රීවය තමහට සමාන (වට්ටව සිලුවුනකි යක්)නොවීයයි ඊර්ෂ්‍යාතොමෝ හෙවත් කෙන්ඩය නිරතුරු කියන්නාක් වැනිය–නොහොත් කියන්නියක් වැනිවීය.

12 කොමල අදරකර සරණිත ලපලුද ර
උදුල දසන් කුසුමැති තෙන පලපත ර
සලෙල සලෙලු යදිදන මන නඳනක ර
ලකල මෙපුර ලිය කප්ලිය වැනි පව ර

12 කොමල, කෝමලවූ හෙවත් මෘදුවූ; අදරකර සරණිත, අධරහස්ත චරණ නමැති; ලපලුදර, බාලපත්‍රයන් දරන්නාවූ; උදුල, උජ්වලිතවූ; දසන්, දන්තනමැති; කුසුමැති, පුෂ්පාන්විතවූ; තෙන, පයොධර නමැති; පතර, මහත්වූ; පල, ඵලාන්විතවූ; සලෙල, ලීලාසහිතවූ; සලෙලු, සල්ලාලනමැති; යදිදන, යාචකජනයාගේ; මන, චිත්තය; නඳනකර, නන්දනකාරිවූ; නොහොත් සන්තුෂ්ටකරන්නාවූ; ලකල, අලඞ්කෘතවූ; මෙපුර, මේ නගරයෙහි; ලිය, කාන්තාවෝ; පවර, උතුම්වූ; කප්ලියවැනි, කල්පලතාවැන්නෝය,

මොලොක්වූ තොල් හා අතුල්පතුල් නලනමැති–බාලපත්‍රයන් දරන්නාවූ–දිලිහෙන්නාවූ දත්නමැති මල්ඇත්තාවූ–මහත්වූ පියයුරුනමැති ඵල (ගෙඩි) ඇත්තාවූ–ලීලාසහිතවූ (හැසිරෙණ) සල්ලාල ජනනමැති යාචකජනයාගේ සිත්සතුටුකරණ සුලුවූ–සැරසුනාවූ නොහොත් ලක්‍ෂණ ඇත්තාවූ–මේ නුවර ස්ත්‍රීහු–උතුම්වූ කල්පලතාවන්මෙනි.

13 ඇති දෙරදෙර ඉඳුනිල්මිණි රන්තොර ණ
පැතිර අඳුරුකර හැර පැලඹෙන කිර ණ
*නිතිරය සරණවේ මැද සුරඟන හර ණ
වෙති මෙහි බිසරු දිගැසිය සහතුටු උර ණ

13 දොරදොර, වාරයක්පාසා; ඇති, විද්‍යමානවූ; ඉඳුනිල්මිණි, ඉන්ද්‍රනීල මාණික්‍යමයවූද; රන්, ස්වර්ණමයවූද; තොරණ, බහිවාරයන්ගේ; කිරණ, රශ්මිය; පැතිර, ප්‍රසාරිතව; අඳුරුකර, අන්ධකාරකොටද; හැර, අන්ධකාරය පහකොටද; පැලඹෙන, ප්‍රලම්බිතවනකල්හි හෙවත් විජෘම්භමානවන කල්හි; නිති, නිත්‍යයෙන්; රය, රාත්‍රියෙහි; වේමැද, විථිමධ්‍යයෙහි; සරණ, සංචාරණය කරන්නාවූ; සුරඟන හරණ, සුරාඞ්ගනාවන් වැනිවූ; මෙහි, මේ නගරයෙහිවූ; අබිසරුදිගැසිය, අභිසාරිකාඞ්ගනාවෝ; තුටුසහ, සන්තොෂ හා; උරණ, කොපයද; වෙති, වෙත්ය.

13 * නිති රෑ සරණ.

දෙරකඩක් දෙරකඩක් පාසා තිබෙන ඉඳුනිල්මැණික්මයවූද-රත්රන් මයවූද-තොරන්වල කාන්තියපැතිරී-අඳුරු ඇතිකරද-අඳුරු නැතිකරද(ඉඳු නිල්මිණි තොරන්වල කාන්තිය පැතිරීමෙන් අඳුරුකොටද-රන්තොරන් වලකාන්තිය පැතිරීමෙන් අඳුරුනැතිකොටද-කිසිලුවඳුරක් නැතිව දෙකාන්ති සම (එකි) හොඳින් පවත්නා කාලයෙහි-නිතර රූ විජිම්බනයෙහි හැසිරෙ ණා සුරඟණන් වැන්වූ (ලක්ෂණ ඇති) පුරුෂයන් සලකුණු කිතැනව යන ඇම් හු-සතුටු හා කොපයද වෙත්ය—

14 *න ර පහඅග ලකල කලදෝකො තේ යා
හ ර ගිරිහිසින් හුනු සුරගඟ ව තේ යා
තොර නොව ලෙලෙන රන්දද පල වෙ තේ යා
සු ර ගන එගඟබැස කෙලිනී සි තේ යා

14 පහඅග, ප්‍රාසාදග්‍රයන්හි; ලකල, අලංකෘතවූ නොහොත් විතතකාන්ති වූ; කලදෝකොතේයා, කලධෞත (රිදී) ශෘංගයන්ගෙන් (නිසක්‍රාන්ති වන්නාවූ) තර, රශ්මියකෙසේද; හරගිරි හිසින්, කෛලාසවාසීහුගේ ශීර්ෂ යෙන් නොහොත්; හරගිරි හිසින්, කෛලාස පර්වතශීර්ෂයෙන්; හුනු, පයි තවූ හෙවත් හටගත්තාවූ; සුරගඟවතේයා, ආකාශගඞ්ගාවවැන්න; පල්වෙ තේයා, ජදනසමීපයෙහි; තොරනොව, නිරන්තරව; ලෙලෙන, ලීලෝපෙත වන්නාවූ; රන්දද, ස්වර්ණධ්වජයෝ කෙසේද; සුරගන, සුරාඞ්ගනාවෝ; නොහොත්සුරගණ, දිව්‍යසමූහයෝ; එගඟ, ඒගඞ්ගාවෙහි; බැස, අවතීර්ණව; කෙළිනී, ක්‍රීඩාකෙරෙත්යයි; සිතේයා, විතතනයවෙයි—

පහමුදුන්හි තිබෙන-මනොඥවූ (සිත සතුටු කරන්නාවූ) රිදීකොත්වලින්-නික්මෙන කාන්තිය කොහොමද කිවොත්-කෛලාස වාසිහුගේ හිසින් නොහොත් කෛලාස පර්වතමස්තකයෙන් වැටුනාවූ අහස්ගඟ වැනිය-පියසි සමීපයෙහි තුරන්නොවී(නිතර)ලෙලදෙන රන්කෙහෙලි කෙබඳුද කිවොත් සුරඅඟනෝ නොහොත් සුරසමූහයෝ-ඒ ගඟෙහි බැහැලා කෙළිත්යයි සිතෙයි—

15 ද ළු සි එ කැකුළු කොකවැළු දුලු සිරුරු ක ළු
මදවෙ ළු †කකු ළු බිහු තැ ළු කන්තල හුලෙ ළු
රුපු ර ළු ගි ම ළු පිහි කු ළු ගණකුළු එක ළු
ගජ මු ළු නැබු ළු සු ල කු ළු මුලු බල යහ ළු

14* "තරපහ අගලඹරු" කියාද, 15 † "සකුළු" කියාද තිබේ-ඒද මැනවි.

15 සිළු, වහ්නිසිඛාසමානවූ; කැකුළු, * තීක්ෂ්ණරශ්මියෙන් දක්නවූ; දළ, දංෂ්ට්‍රානමැති; කොකවැල්, බලාකාපඞ්ක්තියෙන්; උදුළු, උජ්ජ්වලිතවූ; සිරුරු, ශරීරය, කළු, ක්‍රිෂ්ණවර්ණවූ; මද, මදයෙහි; වෙළු, වෙඨනයවූ හෙවත් දැවටුනාවූ; කකුළු, කකීනවූ හෙවත් දැඩිවූ; ඕතුතැළු, භෘංගයන්තාඩනය කළාවූ; කන්තල, කර්ණසාලනමැති; නිළලෙලු, ජලලොලයන්ඇත්තාවූ; රුපු, ශත්‍රුනමැති හෝ හොත් ශත්‍රුවූ; රළු, කකීනවූ; සිමළු, ශ්‍රීසමහල වාවූ හෙවත් පහකළාවූ; පිහිකුළු, ප්‍රතිච්ඡන්නකළාවූ; ගණකුළුළුකළු, මෙඝකූට හා එකාකාරවූ; මුළු, සියල්ලෙන්; සුලකුළු, අත්‍යලඞ්කෘතවූ; නැබුළු, මහත්වූ; ගජමුළු, හස්තිසමූහයා; යහළු, මිත්‍රය; බල, නිරීක්ෂණයකරව........

ගිණිදලුවැනි තියුණුරැසින් යුතුවූ–දළනමැති කොක්පන්තින්ගෙන් දීලිසෙන්නාවූ–ශරීරය කළුපැහැඇත්තාවූ–මදයෙහිවෙළුනාවූ–රළුවූ මීමැස්සන් තැළීමකළාවූ–කන්තල නමැති මහ ජලරළ ඇත්තාවූ–සතුරුවූ දැඩිවූ ශ්‍රීසම පහකළාවූ (ඒ ඒ දිග් ආකාශය) වැසීමකළාවූ–වලාකුළු හා ඒකාකාරවූ–සියළු ආකාරයෙන්ම ඉතා අලඞ්කාර ඇත්තාවූ මහත් ඇත්සමූහයා මිතුර බලාපන්........

16 මදගල † වරණගළ පළකළ කුළු පුව ල
රුපුබල මොළ ගහළ හළ ලෙල පුරණ තු ල
නොවහල විරල රලපෙල හෙළ දහරස ල
රසුදුල ලකල හයපෙල බලසකි කොම ල

16 මදගල, මදගලිතවූ; වරණගළ, වාරණඝටයාහෙවත් හස්තිසමූහයා විසින්; පුවළ, ප්‍රෞඪවූ; කුළු, පර්වතකූටයන්; පළකළ, ප්‍රකාශකළාවූ; බළමොළ, උද්දාමගුණයෙන් ප්‍රචණ්ඩවූ හෙවත්චණ්ඩාභි චණ්ඩවූ; රුපු, ශත්‍රුනමැති; ගහළ, සම්බාධය හෙවත් ගැහැට; හළ, හළවාවූ; පුරණතුල, නගර නමැති අර්ණවාභ්‍යන්තරයෙහි; ලෙල, ලීලොපෙතවූ; නොවහළ, ප්‍රතිච්ඡන්නවූ; අවිරල, ඝණවූ; ‡ හෙළදහරසල, සෞවර්ණධාරාශ්‍රිතවූ; රලපෙල, තරඞ්ගපඞ්ක්තියකට බඳුවූ; රසුදුල, රශ්මියෙන් නොහොත් කිංකිණීකයෙන් උජ්ජ්වලිතවූ; ලකල, අලඞ්කෘතවූ; හයපෙල, අශ්ව පඞ්ක්තිය; කොමල, කෝමලවූ; සකි, මිත්‍රය; බල, නිරීක්ෂණය කරව........

මදවැහෙන්නාවූ ඇත්සමූහයා විසින්–මහත්වූ පර්වතකූටයන් ප්‍රකටකළාවූ–අතිශයින් චණ්ඩවූ සතුරු නමැති ගැහැට පහකළාවූ හෙවත් නැතිකළාවූ නුවර නමැති කිරිමුහුද ඇතුළෙහි ලෙලදෙන්නාවූ–නොවැසුනු තුනීනුවූ හෙවත්

---

* කැකුළු, කැකුළුවූ; දළසිළු, දන්තසිඛානමැති; කොකවැල්, බලාකාපඞ්ක්තියෙන් යීද බිණියහැකි........

16 † "වරලගල"–කියාද තිබේ. ‡ "විරල" තුනීවූ කියාද පුළුවන්වෙයි.

ගණවපැවත්තාවූ-සුදුපැහැඇති ජලධාරාවන් විසින් ආශ්‍රිතවනු ලැබවාවූ-රලපෙලකට බඳු උපමාඇත්තාවූ-රශ්මියෙන් නොහොත් (එල්වනලද) කුඩා මිණිගෙඩිවලින් දීප්තිමත්වූ-අලඞකාර ඇති අඤ්වපෙල මොලොක්වූ (ගුණ ඇති) මිතුරෙ බලාපත්......

17 රැඳි රජමිතුරු මහසෙන් උවිඳු කිවි ගු   රු
සුවිමල් කමල් සරමින් දද දන ඉසු   රු
යුතු හරිසඳු නිරිඳු විජයොත්පහ නිසු   රු
මෙලෙසින් මෙපුරවර පුරඳර පුර අයු   රු

17 රජමිතුරු, රාජමිත්‍රයන්විසින්ද; මහසෙන්, මහාසෙනාවන්විසින්ද; උවිඳු, උපාධ්‍යායන් විසින්ද; කිවිගුරු, කාව්‍යාචාර්‍ය්‍යයන් විසින්ද; රැඳි, රඳනු ලබන්නාවූ නොහොත්; රජමිතුරු, චන්‍ද්‍රසූර්‍ය්‍යයන් විසින්ද; මහසෙන්, මහාසෙනයා විසින්ද; උවිඳු, උපෙන්‍ද්‍රයා විසින්ද; කිවි, ශුක්‍රයා විසින්ද; ගුරු, බෘහස්පතියා විසින්ද; රැඳි, රඳනු ලබන්නාවූ; සුවිමල්, යහපත් පක්ෂිමාලාවෙන් හා; කමල්සර, පද්මතටාකයෙන්ද; අමින්, අප්‍රමානවූ; දද, ධ්වජයෙන්ද; දනඉසුරු, ධනාධිපතීන් නොහොත් ජනෙශ්වරයන්ද ඇත්තාවූ නොහොත්; සුවිමල්, අතිනිර්මලවූ; කමල්සර, පද්මාඞ්ගනාව හෙවත් ශ්‍රී කාන්තාවගෙන්ද; මින්දද, මීනධ්වජයා හෙවත් රතිස්වාමිහුගෙන්ද; දන ඉසුරු, වෛශ්‍රවණයා හෙවත් වෙසවණියාගෙන්ද යුක්තවූ; හරිසඳ, හරිශ්චන්ද්‍රයාට බඳුවූ; නිරිඳු, නරෙන්‍ද්‍රයාගෙන්ද; විජයොත්පහ, වෛජයන්තිනම් ප්‍රාසාදයෙන්ද; නිසුරු, අනෙකෛශ්වර්‍ය්‍යයෙන්ද; යුතු, යුක්තවූ නොහොත්; හරිසඳුනි, හරිචන්දනයෙන්ද; රිදු, මහත්වූ; විජයොත්පහ, වෛජයන්ති නම් ප්‍රාසාදයෙන්ද; නිසුරු, අනෙකසම්පත්තියෙන්ද; යුතු, යුක්තවූ; මෙපුර වර, මේ පුරොත්තමය; මෙලෙසින්, මේ (කියනලද) ආකාරයෙන්; පුරඳර පුර අයුරු, පුරන්‍දරපුරාකාරයි......

රජුන්ගේ මිත්‍රයන් හා (යෙසු) මහත් සෙනාවන් විසින්ද-උපාධ්‍යායන් හා-කාව්‍යාචාර්‍ය්‍යදත් ගුරුවරයන් විසින්ද- වාසයකරණු ලබන්නාවූ-නොහොත් චන්‍ද්‍රසූර්‍ය්‍යයන් හා-මහාසෙනයා විසින්ද-විෂ්ණුහා අසුරගුරු සුරගුරු විසින්ද (වාසය කරණුලබන්නාවූ) ඉතායහපත්වූ පක්ෂිපන්තීන් හා-පියුම් විලෙන්ද-අප්‍රමාණ කොහෙලියෙන්ද-ධනයෙන් අධිපතිබවට පැමිණියවුන් නොහොත්-ජනප්‍රධානීන්ද ඇත්තාවූ-නොහොත් ඉතා පිරිසිදුවූ-ශ්‍රීකාන්තාව හා අනඞ්ගයාද-වෙසවුණීයාද යනමොවුන්ගෙන් යුක්තවූ-හරිශ්චන්ද්‍ර නම් රජුහුන්වූ*නරශ්‍රෙෂ්ඨයාගෙන් හා- වෛජයන්ති නම් ප්‍රාසාදයෙන්ද-නොයෙක් ඉසුරෙන්ද යුතුවූ-නොහොත් රන්වන් සඳුනෙන් හා-මහත්වූ-වෛජයන්ති නම් ප්‍රාසාදයෙන්ද-නොයෙක් ඓශ්වර්‍ය්‍යයෙන්ද යුතුවූ-මේ උතුම් නුවර-සක්දෙවිඳුගේ නුවර සමානයි......

* හරිශ්චන්ද්‍ර නම්වූ-සත්‍යවචනයෙහි පිහිටි ගුණවත් සැපතින් අඩුනැති පුරාණ සිරි රජෙක්.

18 දෙ ස ඳු න් සපුමුහුලු සහසුරු වෙලෙප් ම තු
නා ද දු න් ගිරාපික සැලලිහිණි බිඟු පු තු
* දු ල න න් කුසුම්රොණවුල් වැලිතල දිමු තු
ගෙවු ය න් සියන්දූකැ ඇදගත නොහැකි සි තු

18 දෙසඳුන්, චිචඤ්ජනය; සපු, චම්පකය; මුහුලු, වකුලය; සහසුරු, සහකාරය හෙවත් මධුරාම්‍ර යන මොවුන්ගේ; වෙලෙප්මතු, විටපමස්තකයෙහි; නදදුන්, නාදදානයකළාවූ; ගිරා, ශුකය; පික, කෝකිලය; සැලලිහිණි, ශාරිකාපක්ෂියා; බිඟු, භෘඞ්ගය යන මොවුන්ගෙන්; පුතු, පුත්‍රාවූ; දුල, දිලිසෙන්නාවූ; නන්කුසුම්රොන්, අනෙකපුෂ්පපරාගයෙන් නොහොත් රෙණුයෙන්; අවුල්, ආකුලවූ; වැලිතල, වාලුකාස්ථලයෙන්; දිමුතු, දීප්තිමත්වූ; ගෙවුයන්සියන්, ගෘහොද්‍යානයතාක්න්; දූකැ, දර්ශනයකොට; සිතු, චිත්තය; ඇදගත නොහැකි, ආකර්ෂණයකොට ගතනොහැක්කේය.

සුදුසඳුන්ය–රත්සඳුන්ය–සපුය මූනමල්ය හෙවත් මුගුණය–මීඅඹය (යන මේ) රුක්ශාඛා මතුභාගයෙහි (ඉඳ) නදකරන්නාවූ–ගිරවිය–පරපුටුය–සැලළිහිණිය–මීමැසිය යන මොවුන්ගෙන් යුක්තවූ–දිලිහෙන්නාවූ නොයෙක් මල් රේණුයෙන් අවුල්වූ හෙවත් ගැවසීගත්තාවූ වැලිතලාවෙන් දීප්තිමත්වූ–ගෙවල් සමීපයෙහි තිබෙන සියගණින් උයන්දැක (වෙන අතකට) සිත ඇදගත නොහැක්කේය.

19 සුරපුර මෙපුර දෙතටුව සව්සිරින් පු රා
මහබඹ මෙරතුලා කරැ බලනා වර කි රා
ලුහුබැවිනෙ දෙව්පුර රැඳුනෙව් සුනෙර සි රා
බටවැණි බරින් දෙරණට මෙපුර මනහැ රා

19 සුරපුර මෙපුර, දිව්‍යනගරය හා මේනගර නමැති; දෙතටුව, තලවය හෙවත් තට්ටුදෙක; සව්සිරින්, සකලෛශ්වර්‍ය්‍යයෙන්; පුරා, පූරණයකොට; මහබඹ, මහාබ්‍රහ්මයා විසින්; මෙර, මේරුව; තුලාකරැ, තුලාවක්කොට; කිරා, තුලනයකොට හෙවත් ප්‍රමාණකොට; බලනවර, අවලොකනයකරණවාරයෙහි; එදෙව්පුර, ඒ දිව්‍යනගරය; ලුහුබැවින්, ලඝුභාවයෙන්; සුනෙර සිරා, සුනෙරු මස්තකයෙහි; රැඳුනෙව්, රඤ්ජිතවූවාක්වැන්න; මනහැරා, මනොහරවූ; මෙපුර, මේනගරය; බරින්, භාරයෙන් හෙවත් බරබැවින්; දෙරණට, ධරණියට; බටවැනි, අවතීර්ණවූවාක් වැන්න.

---

* පුලනන් කුසුම්–සීදසමගර–එකල–පුල, ප්‍රුල්ලවූ; නන්කුසුම්–නොයෙක් පුෂ්පයන්ගේයි–ඒදමැනවි.

දෙව්නුවර හා මේ ජයවඩන නුවර නමැති (තරාදි) තට්ටු දෙක සියලු ඉසුරෙන් පුරවා මහබඹහු විසින් මෙර (මුදුනෙහි) තරාදිදන්ඩ සවිකර කිරමින් බලන දවසේදී-දෙව්ලොව සැහැල්ලු බැවින්-සුමෙරු පර්වතශීර්ෂයෙහි රැඳුනාක්වැන්න-සිත්කළුවූ සැපතින් අඩුනැතිව (පිරීපවත්නාවූ) මේ ජය වඩින නුවර-බරබව හෙතුකොටගෙණ පොළවට බැස්සාක් වැනිය......

20 ලෙ සේ පබළු රන්රිදී මුතුමිණි අක ර
ගො සේ පසඟතුරු සිව්රඟ සෙන් නිතො ර
වි සේ සවන් ඉසුරෙන් දිනූ අලක පු ර
කෙ (සේ වණම් එක මුවෙකින් සිරි මෙපු ර

20 පබළු රන්රිදී මුතුමිණි, ප්‍රවාලස්වර්ණ රජත මුක්තාමාණික්‍යයන්ට; අකරලෙසේ, ආකාරයක් වැනිවූ; පසඟතුරු, පඤ්චාඞ්ගික තූර්‍ය්‍යයන්ගේ හා, සිව්රඟසෙන්, චතුරංගීනිසෙනාවන්ගේ; ගොසේ, ඝොෂාවෙන්; නිතොර; නිරන්තරවූ; විසේසවන්, විශිෂ්ටවූ නොහොත් නානාප්‍රකාරවූ; ඉසුරෙන්, ඓශ්වර්‍ය්‍ය කරණකොටගෙණ; අලකපුර, අලකානම් නගරය; දිනූ, ජය ග්‍රහණය කළාවූ; මෙපුර, මේනගරයෙහි; සිරි, සම්පත්තිය; එකමුවෙකින්, ඒක මුඛයකින්; කෙසේ, කවරාකාරයෙකින්; වණම්, වර්ණනාකෙරෙම්ද

පබළුය රත්රන්ය රිදීය මුතුය මැණික්ය යන මොවුන්ගේ-උපදින ඉඩමක් සමානවූ (ආතතය-විතතය-ආතතවිතතය-ඝණය-සුසිරය යන) පඤ්චාඞ්ගික තූර්‍ය්‍යඝොෂාවෙන් හා, (ඇත්ය-අස්ය-රියය-පාබලය-යන) සිව්රඟ සෙනගගේද නාදයෙන් අතරක් නැත්තාවූ-විසිතුරුවූ නොහොත් නොයෙක් ආකාරවූ-ඓශ්වර්‍ය්‍ය (සම්පත්ති) යෙන් අලකමන්‍ද නම් රාජධානිය-(පරාජය කොට) ජයගන්නා ලද්දාවූ-මේ ජයවඩින නුවරෙහි ඇත්තාවූ ඓශ්වර්‍ය්‍යය (සැපත) එක මුඛයෙකින් කෙසේ වර්ණනා කෙරෙම්ද-නොහැක්කේ මය......

“තවද මේ පුරවරාධිප ප්‍රණත නරපති මකුටමණි විරාජිතචරණාරවින්ද යෙන් විරාජමානවූ මහා රාජාධිරාජයාගේ ගුණවර්ණනායෙක-එදනා කර්ණ සාඵල්‍යලබ”......තවත් කාරණයක්-මේ ජයවඩින නම් නගරොත්තමයට අධිපතිවූ-ප්‍රනාමය පිණිස නමිතවූ නරශ්‍රෙෂ්ඨයන්ගේ කිරීටමාණික්‍යයෙන් දීප්තිමත්වූ-පාදපද්මයෙන් විශෙෂයෙන් බබලන්නාවූ-මහාරාජාධිරාජයාගේ ගුණවර්ණනාවෙක්වෙයි-ඒ ගුණවර්ණනාව ශ්‍රවණය කිරීමෙන්ද-නාගේ කර්ණනලැබීමෙහි සඵලය ලබව......

21 සත කුම් බා  ගිරිසුරු ගුණැති තිරස  ර
මෙන කුම් බා  යොන් පාකළ රුපු අසු  ර
බද කුම් බා . සරි යදිදන නදන ක  ර
පැර කුම් බා * නරනිඳු දින මෙපුරව  ර

21 සතකුම්බා ගිරිසුරු, † ශාතකුම්භ පර්වතයවැනිවූ; තිරසරගුණැති, ස්ථිරසාරගුණ ඇත්තාවූ; කුම්බායොන්මේන, කුම්භයොනියා පරිද්දෙන්; රුපුසයුර, ශත්‍රුනමැති සාගරය; පාකළ, පානයකළාවූ නොහොත් පහ කළාවූ; යදිදන, යාචකජනයා; නදනකර, නන්දනකාරිවූ; බදකුම්බාසරි, භද්‍රඝටාකාරවූ; පැරකුම්බා නරනිඳු, පරාක්‍රමබාහු නරෙන්ද්‍රතෙම; මෙපුරවර, මේ නගරොත්තමයෙහි; දින, ජයගන්නා සේක්වා.

රන්ගිරිනම් පර්වතයමෙන් ස්ථිරවූ මහත්ගුණඇත්තාවූ-අගස්ති නම් ඍෂියා මෙන් සතුරු නමැති සාගරය පානයකළාවූ හෙවත් බිව්වාවූ-නොහොත් අවිද්‍යමානකළාවූ-යාචකජනයන් සතුටුකරණ ස්වභාවඇති බදුරු කළයක්වැනිවූ පරාක්‍රමබාහු නරෙන්ද්‍රයා-මේ උතුම්(ජයවර්ධන)නුවරෙහිජයගණ්වා.

22 දින කර කුලග මෙනිරිඳු අයුරු පුරඳු  රු
‡ ගන තෙද කලඹ දිවයුරු කිරණින් රුඳු  රු
වෙන මීහිපල් කල්පුල් නෙතුපුල් අතු  රු
දූන විකඳුලු පිණිබිඳු බලව විසිතු  රු

22 පුරඳුරු අයුරු, පුරන්දරයා සමානවූ; අග, අග්‍රවූ; දිනකරකුල, සූර්‍ය්‍ය වංශයෙහිවූ; මෙනිරිඳු, මේ නරෙන්ද්‍රයාගේ; ගණතෙදකලඹ, අවිරලවූතේජ පුඤ්ජ නමැති; රුදුරු, රෞද්‍රවූ; දිවයුරු කිරණින්, දිවාකරාංශුවෙන්; වෙනමිහිපල්කල්, අන්‍යමහීපාල කාන්තාවන්ගේ; පුල්, ඵුල්ලවූ; නෙතුපුල් අතුරු, නෙත්‍රොත්පලාන්තරයෙහි; කඳුලු, වාෂ්පනමැති; පිණිබිඳු, තුසාර බින්දූන්; දූනවි, ජනිත කරවන (උපදවන) ලද්දේය; විසිතුරු, විචිත්‍රයක්; බලව, නිරීක්ෂණයකර.

ශක්‍රයාවැනිවූ-උතුම්වූ සූර්‍ය්‍යවංශයෙහිවූ- මේ රජහුගේ-ඝනවූ තේජස් සමූහ නමැති-රලුවූ සූර්‍ය්‍යරශ්මීන් කරණකොටගෙණ-අන්‍යරජකළත්‍රයන්ගේ-පිපුනාවූ ඇස් නමැති උපුල් අතරෙහි-කඳුළු නමැති පිණිබිඳුන් ඉපදවූයේය, විසිතුරක (ආකාරයක්) බලව.

---

* "නරණිඳුසඳ දිනමෙපුර" කියාද තිබේ එදමැනවි. † "ශාතකුම්භ", රත්රන්විශෙෂයෙකි- ‡ "ගණතෙදකල" යිද තිබේ.

23 ග ණ ව ල් ගිරිඳු දුළු සෙවුනා විපු ල් ව න
සුද ලො ල් රදුන් සිළුමල් ගිගිණි ග ල් ව න
ම න ක ල් මෙරද සරණත තඹර තු ල් ව න
නි ය ම ල් කිලුටු කල පමණෙකි නිම ල් ව න

23 විපුල්වන, මහත්වූ; ගණ වන, ඝණවූ වනයන් හා; ගිරිදුදුලු, පර්වත ජජ්ජරයන් නොහොත් දරීයන්; සෙවුනා, සෙවනයකළාවූ; සුදලොල්, සුබ ලොභීවූ; රදුන්, රාජයන්ගේ; සිළුමල්, ශිඛාමාලාවන්; ගිගිණි, බොහෝසේ; ගල්වන, මුඛනකරවනු ලබන්නාවූ; මනකල්, මනොකලාවූ; මෙරද, මේ රාජයාගේ; සරණ, චරණය; තඹරතුල්වන, තාමරසයක් සමානවූයේය; නියමල්, නබපුෂ්පයන් විසින්; කිළුටුකල පමණෙකි, කලිෂ්ටකල ප්‍රමාණ යෙක්ය; නිමල්වන, නිර්මලවන්නේය.

මහත්වූගණ වනයන් හා පර්වත විවරයන් (ගුහා) සෙවනය කළාවූ-සුබ කිරීමෙහි ආසාඇති රජුන්ගේ-මුදුන්මාලාවන් බොහෝසේ ගලවවන්නාවූ- මනොඥවූ මේ රජහුගේ පාදය තාමරස (රත්නෙළුම්මල්) සමානවූයේය- නියෙහි (හටගත්) කුසුමයන් විසින් කිලුටුකරණලද පමණෙකි- මලනැති විය හෙවත් පිරිසිදුය යනුභාවයි.

24 යු ග ත පත සහ සපතසිය කිරණ බ ඳු
දි මු ත මොහු තෙදග රුපු අගිලැවිලු රු ඳු
දි ග ත දිවෙන යසදුමගුණ සුවඳ රැ ඳු
මලොත සරල් වරලස උනඹුවෝ මි ඳු

24 යුගත, යුගාන්තයෙහි; පත, ප්‍රාප්තවූ; සහසපතසිය, පද්මබන්ධුහුගේ; කිරණබඳු, රශ්මියසමානවූ; දිමුත, දීප්තිමත්වූ; මොහු, මේ රාජයාගේ; තෙදග, තෙජෝග්නිය; රුදු, මහත්වූ; රුපු, ශත්‍රුනමැති; අගිල්, අගරු (වනයෙ)හි; ඇවිලු, ජ්වලිතව හෙවත් ඇවිලී; ගුණසුවඳ, ගුණසුගන්ධය; රැඳු, රඤ්ජිතවූ; යස, කීර්තිනමැති; දුම, ධූමය; දිගත, දිගාන්තයෙහි; දිවෙත; ධාවනයකරණ කල්හි; උනඹුවෝ, ඔවුන් (ඒසතුරන්)ගේ අම්බිකාවෝ; මලොත, පුෂ්පයෙන් යුක්තවූ; සරල්, රැලිසහිතවූ; වරලස, ධම්මිල්ලයන්; මිඳු, මුක්තකළෝ.

කල්පාවිනාශ කාලයෙහි පැමිනියාවූ සූර්යයාගේ රශ්මියවැනිවූ දිලිහීම්ඇත්තාවූ මේ රජහුගේ මහත්වූ තෙජස්නමැති ගින්න-සතුරන්නමැති අගිල්වන යෙහි ඇවිලී (දැවීමෙන් හටගත්) ගුණසුවඳින් රැඳුනාවූ කීර්තිනමැති දුම් දිශාන්තරයෙහි හෙවත් ඒ ඒ දිශාවන්හි දුවන කාලයෙහි. ඒ සතුරන්ගේ භාර්යාවෝ (ඒ ගුණසුවඳ වැදීමට මෙන්) මලින්හෙවත් මල්දමින් යුක්තවූ රැලිසහිතවූ (තමතමන්ගේ) කොන්ඩා මිදූවෝය.

25 උ ර ගි ඳු  නිහර හර සුදහර ගඟ වීය  න
කෙලෙසිඳු  ඉඳු සිඳුරු සිඳුවර නිසිඳු සි  න
පි රි සි ඳු  කරන මෙනිරිඳු යස රස දස  න
කි රි_සි ඳු  පැමිණිවර කිතයුගය සිරිග  න

25 උරගිඳු, උරගේන්ද්‍රයාය; නිහර, නිහාරය; හර, මුක්තාහාරය; සුදහර, ශ්වේතාම්බරාගය; වියනගඟ, ආකාශගඞ්ගාවය; කෙලෙසිඳු, කෛලාසේන්ද්‍රය, ඉඳුසිඳුරු, ඉන්ද්‍රසින්ධුරග හෙවත් ඉන්ද්‍රවාරණයාය; සිඳුවර, සින්ධුවාරකුසුමය; නිසිඳු, නිශේන්ද්‍රය හෙවත් චන්ද්‍රයාය; යනමේ මඞ්ගල්‍ය වස්තූන් පරද්දෙන් සිත, ශුභ්‍රවර්ණවූ; මෙනිරිඳු, මේ නරේන්ද්‍රයාගේ; යසරස, යශසාරාසිය නොහොත් යසරස කීර්ත්තිනමැති ජලය; දසඅ, දිශාන්තරය; පිරිසිදුකරන, පිරිසිදුකරණකල්හි; නොහොත් යසරස, කීර්ත්ති නමැති ජලය; පිරි, පූරිතව; දසන, දිශාන්තරය; සිදුකරන, ශුධකරණ කාලයෙහි; කිතයුගය, ක්‍රෙතායුගය; * පැමිණිවර, ප්‍රාප්තවූකාලයෙහි, කිරිසිඳු, ක්ෂීරසින්ධුහුගේ; සිරිගත, ශොභාග්‍රහණය කෙළේය.

අනන්තනම් නාගරාජයාය–පිනිය මුතුහරය–සුදුපැහැය ඇති ඇතෙහි තවරණ චූණ්ණය හෙවත් සුණුය (පුයෙර්වගේ ජාතියි) අහස්ගඟය–ඊශ්වර යාය ඓරාවන නම් ඇත්රාජයාය–නිකාෂ්ලය–චන්ද්‍රයාය–යනමේ මඞ්ගල්‍ය වස්තූන්සෙයින්–සුදුපැහැය ඇත්තාවූ මේ රජනුගේ කීර්ත්තිසමූහය–නොහොත් කීර්ත්තිනමැති ජලයපිරි–දිශාන්තරය (නොයෙක් දිශාවන්) පිරිසිදු කරණ කාලයෙහි ක්‍රෙතායුගයෙහි කිරිමුහුදේ ස්වභාවගත්තේය.

26 ලෙව් * දන මනැසකරවන සහතොස විපු  ල
මෙනිරිඳු රුවට පරදිනුවට පලමු කා  ල
මෙහෙසුරු දලැසගින් කලබව ගතවිකා  ල
† සිනෙහුය මදනහට එමයසි සෙනට මූ  ල

26 ලෙව්දන, ලොකවාසි ජනයාගේ; මනැස, මනොඅක්ෂින්; සහතොස කරවන, තොසසහිත කරවන්නාවූ; විපුල, මහන්තවූ; මෙනිරිඳු, මේනරේන්ද්‍රයාගේ; රුවට, රූපයට; පරදිනුවට, පරාජයවීමට; පලමුකල, ප්‍රථම කාලයෙහි; මෙහෙසුරු, මහෙශ්වරයා විසින්; දලැසගින්, ලලාටනෙත්‍රාග්නියෙන්; ගත, ගාත්‍රය; විකලකලබව, විකාර කල භාවය; (යන යමක්ඇද්ද) මදනහට, අනංගයාහට; සෙනට, ශාන්තියට; මූල, මූලයවූයේ; එමය, ඒ කාරණයමයයි; සිනෙහුය, චින්තයය වේමය.

---

25 * ක්‍රෙතායුගයෙහි සියළුවස්තුව සුදුළු–ඒකාලේ කිරිමුහුද දුනටවඩා අතිශයින් සුදළු–26–† දනමනකරවන සිද–‡ සිනෙයි සිද–

ලෝකවාසී ජනයන්ගේ සිත් නෙත් සතුටුකරවන්නාවූ-මහත්වූ මේ රජ හුගේ රූපලක්ෂණයට පරදින්නාවූ පළමුවෙන් (කල්ඇතුව) ඊශ්වරයා විසින් (තමාගේ) නලලෙහි තිබෙන ඇසේගින්නෙන් (දවා) ශරීරය විකාර කළබවය (යන යමක් ඇද්ද) අනංගයාහට සැපයට මූලිකවූයේ ඒ කාරණ යමයයි සිතමවෙයි.

27 සවුලුකුල කමලකර දිමුතු දියණෙන | න
මෙනර පවර සුනිමල් පැවැතුමින් යු | ත
පසිදු දියත භුවනත යලිතුවණ නෙ | ත
මෙසක්සුවලස පැමිණි * සවණත සත | න

27 සවුලුකුල, සවුලු වංශනමැති; කමලකර, පද්මාකරයට; දිමුතු, දීප්තිමත්වූ; දියණෙන, ජනද්නෙත්‍රයාට හෙවත් සූර්යයාට බඳුවූ; සුනිමල්, අතිනිර්මලවූ; පැවැතුමින්, ප්‍රවෘත්තීන්ගෙන්; (පැවැත්මෙන්) යුත, යුක්තවූ; මෙනරපවර, මේ නරෝත්තමයාගේ; දියත, ලෝකයෙහි; පසිදු, ප්‍රසිද්ධවූ; භුවනත, නෙත්‍රයද; යලි, නැවත; භුවණනෙත, ස්වර්ණනමැති නෙත්‍රයද; [illegible] මේඝසුන්දරයෙ; සතත, නිරන්තරයෙන්; සවණත, කර්ණාන්තයට; යපැමිණ, සම්ප්‍රාප්ත විය.

"සවුලුවංශ නමැති පියුම්විලට දිලිහෙන සූර්යයා වැනිවූ-ඉතා පිරිසිදුවූ පැවැත්මෙන්යුතුවූ-මේ රාජෝත්තමයාගේ ලෝකප්‍රසිද්ධවූ ප්‍රකෘතිඇසද නැවත ස්වර්ණනමැති ඇසද-යනමේ ඇස්දෙක නිතර කණට පැමිණියේය"

එනම් ප්‍රකෘතියෙන් තිබෙණ ලෝකයා අතරේ ප්‍රසිද්ධඇසද ස්වර්ණනමැති ඇසද යන ඇස්දෙකක් මේ රජහට තිබෙනබව හැමතැනම කියනවචනය බොහෝදෙනාගේ කන්වලට පැමිණෙයි අසන්ට ලැබෙයි යනුනාවයි.

28 තිලකව තිලකවන් † මොහු දිය ඉසුරු ප | තා
නිලකල ගෙණෑ කොපුල් අදි ගජසමින් යු | තා
වලකව වැදිවිසල් ගෙණෑ උවියහන අ | තා
සෙලකව නැගී තවරකීනෙව් පවන් ග | තා

28 තිලයව, ත්‍රිවිධ ලඞ්කාවට; තිලකවන්, තිලකයක් බඳුවූ; මොහු, මේ රාජයාගේ; දියඉසුරු, ජනේශ්වර්යය; පතා, ප්‍රාර්ථනාකොට. නිලකල, නීලකණ්ඨයෙ; [illegible]; කපොලයක්; ගෙණෑ, ග්‍රහණයකොට; ඇදි, අලංකාරකරණද්දැයි; ගජසමින්යුතා, ගජසීව්නිමිනෙන් යුක්තව; උම

* 27 පැමිණිය සිද සමහරපොතක 28 † 'නෙතුදිය'යි සයම්-එසේකල ද්‍රදිය, කෙවලවූ; [illegible], මේ රජහුගේ [illegible].

ගනන, ලව්යංගනාවගේ; අතා, හස්තය; ගෙණි, ග්‍රහණයකොට; විසල්, විශාලවූ; වලකට, වතයකට; වැදී, ප්‍රවිෂ්ටවූ; තෙලකට, තෛලය කට; නැගී, ආරූඪවූ; තවරති ව්‍ය. තපොරසකණියට: පටන්ගතා එව්, ආරම්භ ග්‍රහණය කළාක්වැන්න.

(රුහුනු—මායා—පිහිටි—යන) තුන්වැදෑරුම් ලංකාවාසීන්ට නොහොත් ලංකාංගණාවට තිලකයක්වැනිවූ මේ රජහුගේ ජය ඓශ්වර්‍ය්‍ය (සම්පත් සමාන සම්පත් ලැබේවයි) ප්‍රාර්ථනාකරගෙණ ඊශ්වරයා මනිබඑකබලක් අතින් හැරගෙණ—අදිනලද අලිහමක් ඇතිව උමාදේවියගේ අත අල්වාගෙණ මහත්වනයකටවැදී ත්‍රපිතයකට නැගී තපස්රක්ෂිවට පටන් ගත්තාක් මෙනි.

29 කිරණිඳු කුලකමල රණහසවත් ලකු ළු
මෙනිරිඳු *උදයගිරි සැදි මිණිකිරුළ කු ළු
පිරිසිඳු සිරවරණ පිරිසඳිනි නොහකු ළු
නෙතිරිඳු සුපුල්කර සියපත් විය මුකු ළු

29 කිරණිඳුකුල, කිරණේන්ද්‍රනෙවත් සූර්‍ය්‍යවංශනමැති; කමල, පද්මයට; ලකුළු, අලඞ්කෘතවූ; රණහසවත්, ස්වර්ණහංසයෙකුවැනිවූ; නොහොත් කිරණිඳුකුල. සූර්‍ය්‍යවංශ නමැති; කමල, පද්මය; ලකුළු, අලඞ්කෘතකළාවූ, රණහසවත්, ස්වර්ණහංසයෙකුවැනිවූ; මෙනිරිඳු, මේනරේන්ද්‍ර නමැති; උදයගිරි, උදය පර්වතයාගේ; නොහොත්—උදයපර්වතයෙහි; සැදි, සරසනලද; මිණිකිරුළු, මාණික්‍යකිරීට නමැති; කුළු, කූටයෙහි; නොහකුළු, අසංකුචිතවූ; පිරිසිඳු, පරිශුද්ධවූ; සිරවරණ, ශ්‍රීචරණ නමැති; පිරිසඳිනි, ප්‍රණිපාතය කරණකොටගෙණ; නෙතිරිඳු, අනේකනරේන්ද්‍රයන්ගේ; සුපුල්, සොතපුල්ලවූ; කර, හස්ත (තල) නමැති; සියපත්, සහස්‍රපත්‍රපද්මයනෙම; මුකුළුවිය, මුකුලිතවිය.

සූර්‍ය්‍යවංශ නමැති නෙළුම්විලට අලංකාර ඇති රණහංශයෙකු පරිද්දෙන් නොහොත්—සූර්‍ය්‍යවංශ නමැති පියුම සැරසූවාවූ රන්වන් හංසයෙකු වැනිවූ—මේ රජ නමැති උදය පර්වතයෙහි සැදුනාවූ—මැණික්ඔටුනු නමැති කූටයෙහි (මුදුනේ) නොහකුලනලද පිරිසිදුවූ ශ්‍රීපාදනමැති සම්පූර්ණචන්ද්‍රයා කරණකොටගෙණ නොයෙක් රජුන්ගේ පිපුනාවූ අතුල්නමැති පියුම්කුසුම් සමූහය තෙම—මුකුළුවූයේය හෙවත් හැකුළුනේය.

30 වැර ර සැර නොයෙක සිව්රඟ සෙනඟ පිරිවැ රූ
පුර ර වෙය පතඅරා අසිරාවන සිඳු රූ
වර ර මිණිකිරුළු සහ සිව්සැව බරණ ද රූ
හර ර ලොව් පසක් පුරඳුරු සිරිපැසිමෙ වි රූ

29 * උදයගිර සැදුම්ණිකිරුළකුළු—සම්භාර. 30 † වැරයර—සම්භාර.

30 වැරදැර, වීරසාරවූ හෙවත්-වීර්‍ය්‍යසාර ඇත්තාවූ; නොයෙක සිව්රඟ සෙනඟ, අනේක චතුරංගිනී සේනාව විසින්; පිරිවැරූ, පරිවාර කරණ ලද්දාවූ; වර, උතුම්වූ; මිණිකිරුළුසහ, මාණික්‍ය කිරීටයසමග; සිව්සැට බරණ, චතුෂ්ෂෂ්ට්‍යාභරණයන්; දරූ, ධාරණයකළාවූ; මෙවිරූ, මේ වීර තෙම; අයිරාවන සිඳුරූ, ඓරාවනසින්ධුරයාට හෙවත්-ඓරාවනහස්තියාට; අරා, ආරූඪව; පුරඹවි, නගරවිථියට; පත, ප්‍රාප්තවූ; නරලොවැ, මනුෂ්‍ය ලොකයෙහි; පසක්, ප්‍රත්‍යක්‍ෂවූ; පුරඳුරුසිරි, පුරන්දරශ්‍රිය; පැයි, ප්‍රකාශ කෙළේයි

මහත්වීර්‍ය්‍යඇති නොයෙක් චතුරංගිනී සේනාවන් විසින් පිරිවරණ ලද්දාවූ-උතුම් මැණික් ඔටුන්න සමග සූසැටක් (හැටහතරක්) ආභරණ දරන්නාවූ හෙවත් පැලන්දාවූ මේ වීරයා ඓරාවනනම් ඇතුපිටනැගී විථියට පැමිණියාවූ මනුෂ්‍යලොකයෙහි ප්‍රත්‍යක්‍ෂවූ හෙවත් ඇසින් දකින්ට ලැබුනාවූ ශක්‍රදෙවෙන්ද්‍රලීලාව දක්වූයේය

31 ක ර ද ර විරිඳු රණ රණ දිලි ලවග බ ඳ
ති ර ස ර *සුනෙර සරි මෙනිරිඳුගෙ මනන ඳ
පෙර ස ර සන තුබු යස දසදිගනැ ඇ ඳ
උ ර හ ර †ගිරය තෙලි මකුලුතු කිරිමුනු ඳ

31 කරදර, කෲරධාරීවූ; විරිදු, විරොධීන්ගේ හෙවත් විරුද්ධකාරයන්ගේ; රණරණ, යුද්ධනමැති ආරණ්‍යයට; දිලි, දීප්තිමත්වූ; ලවගබඳ, දවාග්නියක් බඳුවූ; තිරසර, ස්ථිරසාරවූ; (ගුණයෙන්) සුනෙරසරි, සුමෙරුපර්වතය සමානවූ; මනනඳ, මනොනන්දනීයවූ; මෙනිරිඳුගෙ, මේ නරෙන්ද්‍රයාගේ; යස, කීර්තිය; පෙර, පූර්වකාලයෙහි; සරසන, සරාසනයා හෙවත් පද්මාසනයා විසින්; දසදිගනැ, දසදිශාන්තරයෙහි; ඇඳ, අඤ්ජනයකොට; තුබු, තබන ලද්දාවූ; උරහරගිරය, ඊශ්වර පර්වතය; තෙලි, තුල්කාවේක්ද; කිරිමුහුද, ක්‍ෂීරසමුද්‍රයතෙම; මකුලුඋතු, මකුළුඋතුවෙක්ද

රළුස්වභාවක් දරන්නාවූ විරිදුන්ගේ හෙවත් විරුද්ධකරුවන්ගේ-යුද්ධ, නමැති වනයට දිලිහෙන ලැව් ගින්නක් වැනිවූ-ස්ථිරවූ මහත්ගුණයෙන් මහාමෙරු සමානවූ-හිත සතුටුකරවන්නාවූ මේ රජහුගේ කීර්තිය (මේ මේ හැටියයි) පූර්වකාලයෙහි මහා බ්‍රහ්මයා විසින් දසදිශාවෙහි (ඒ ඒ තැන) ඇඳීම කොට තබනලද්දාවූ-කෛලාස පර්වතය-තෙලිකූරෙක්ද-ක්‍ෂීරසාගරය තෙම-මකුළුඋතුසැටුවෙක්ද-තෙලි, තුල්කාවනම්; උරහරගිරය, කෛලාස පර්වතයවෙයි; මකුළුඋතු, මකුළු උතුකටුවනම්; කිරිමුහුද, ක්‍ෂීරසමුද්‍රය වෙයි; සීතළ ගැලපීමහොඳයි

31 * සුමෙර †ගිරිදු සිද සම්හර.

32 නූ නා වැලඳී සිරි මොනු තිලිණ යස ස කා
ගා නා සදෙහි සුරගන වෙණතබා ඇ කා
නානා දෙස වැනෙන නොලෙන තුති දස රු කා
පා නා වැනි සතොස සලමින් හිස නිස කා

32 සිරි, ශ්‍රීකාන්තාව විසින්; නූනා, මුසන්ධනොකොට; වැලඳී, ආලිඞ්ගිතවූ හෙවත් ආලිඞ්ගණය කරණ ලද්දාවූ; මොනු, මේ රාජයාගේ; තිලිණ, ත්‍යාගයද; යසසක, කීර්තිසමූහයද; සුරගන, සුරාඞ්ගනාවන් විසින්; වෙණ, වීණාව; ඇක, අඞ්කයෙහි; තබා, ස්ථාපනයකොට; ගානසදෙහි, ගායනා කරණකල්හි; නොලෙන්, මාරුතයෙන්; නානාදෙස, නානාදිසාවෙහි; වැනෙන, කම්පිතවන්නාවූ; අතු, ශාඛාවෙන්යුක්තවූ; තිදසරුක, ත්‍රිදසයෙහි වෘක්ෂජාතියවිසින්; නිසක, නිශ්ශඞ්කායෙන්; හිස, ශීර්ෂය; සලමින්, චාලනය කෙරෙමින්; සතොස, සන්තොෂය; පාණාවැනි, ප්‍රකාශ කරන්නාක්වැන්න.

ශ්‍රීකාන්තාව විසින් අත්නැර වැලඳගන්නාලද්දාවූ–මේ රජහුගේ ත්‍යාගි වන්තකමද–කීර්තිරාසියද–දිව්‍යාඞ්ගනාවන් විසින් වීණාව ඇකයෙහි තබා ගෙණ–ගායනා කරන්නාවූ කාලයෙහි–සුලඟින් නොයෙක් දිසාවෙහි වැනෙන්නාවූ ශාඛාවලින් යුතුවූ–දිව්‍යලොකයෙහි–(විද්‍යමානවූ) වෘක්ෂජාතිය විසින්–සැකනැතුව ඉසසලමින් (හොඳයි හොඳයි ඉතාම හොඳයි කියමින්) සන්තොෂය පහලකරන්නාක්මෙනි.

33 කි රි සමුදුර * වෙණු සුරවරණ තිදසි ඳු
කි රි හස තිවට කලදෝ ගිරමෙහෙසුරු ඳු
දි රි කරු සුලා සිටිනෝ නිතරම පුරු ඳු
ස රි සිරි පතාදෝ යසසට මෙනර නි ඳු

33 † කිරිසමුදුර, ක්ෂීරසමුද්‍රයතෙම; වෙණු, විෂ්ණුද; සුරවරණ, දිව්‍ය චාරණතෙම; තිදසිඳු, ත්‍රිදශෙන්ද්‍රයාද; කිරිහස, ශ්වෙතහංසතෙම; තිවට, බ්‍රහ්මයාද; කලදෝගිර, කලධෞත පර්වතයතෙම; මෙහෙසුරුද, මහෙශ්වර යාද; දිරිකරු, ධෛර්‍ය්‍යකොට; උසුලා, උද්වහනයකොට; සිටිනෝ, ස්ථානය

---

33 * 'වෙණු 'ද, සුරවරණ යි මාත්‍රා සමකරද කියති.

33 † ක්ෂීරසමුද්‍රය විසින් විෂ්ණුද–දිව්‍යචාරණයා විසින් ත්‍රිදශෙන්ද්‍රයාද ශ්වෙතහංසයා විසින් බ්‍රහ්මයාද–කලධෞත පර්වතය විසින් මහෙශ්වරයාද–ධෛර්‍ය්‍යකොට උද්වහනයකර (සිටිනේ) සිටිනුයේ නිත්‍යයෙන්ම පරිචිත වූ මේ නරෙන්ද්‍රයාගේ කීර්තියට සමානවූ සම්පත්තිය ප්‍රාර්ථනාකොටගෙන්ද යෝ—කියාද අපි කියනහැකි—

කරන්නෝය හෙවත් සිටින්නාහුය; නිතරම, නිරන්තරයෙන්ම; පුරුදු, පරිචිතවූ; මෙතරනිඳු, මේ නරේන්ද්‍රයාගේ; යසසට, කීර්තියට; සරි, සමානවූ; සිරි, ශ්‍රී හෙවත් සම්පත්තිය; පතාද්දෝ, ප්‍රාර්ථනාකොටද්දෝයෝ —

කිරිමුහුදතෙම විෂ්ණුද—ඓරාවණතෙම ශක්‍රයාද—සුදුහංසතෙම බ්‍රහ්මයාද—කෛලාස පර්වතය තෙම ඊශ්වරයාද—වෛධයීකර උසුලා සිටින්නෝය—(මෙසේ සිටින්නේ) නිතරම පුරුදුවූ මේ රජුගේ කීර්තියට සමානවන් නාවූ සැපතක් ප්‍රාර්ථනාකොටද්දෝ —

34 ද ඹ දෙණි අලකපුර වැසි දිනිසුරුපිල ස
ලො බ වන මෙරජුවෙතැ සරසවි සිරි නිවෙ ස
න ඹ රණ පිවි සැවි යොවුගවනුව සිසිල ස
බ ඹ දියබඳ දෙදෙන විඳිනෝවද වෙහෙ ස

34 දඹදෙණි, ජම්බුද්‍රෝණි නමැති; අලකපුර, අලකානම් නගරයෙහි; දිනිසුරු පිලස, ධනේශ්වරයා හෙවත් වෛශ්‍රවණයා පරිද්දෙන්; වැසි, වාසයකරන්නාවූ; මෙරජුවෙතැ, මේ රාජයාගේ සමීපයෙහි; සරසවි, සරස්වතීද; සිරි, ශ්‍රීකාන්තාවද; නිවෙස, වාසයකිරීමෙහි; ලොබවන, ලොභවූ කල්හි; වියොවග, වියොගාග්නිය; සිසිලසවනුව, සීතලස්පර්ශවනු පිණිස; නබර, තාමරසයටද; අණ, අර්ණවයටද; පිවිස, ප්‍රවිෂ්ටව; බඹදියබඳදෙදෙන, බ්‍රහ්ම විෂ්ණු දෙදෙනා; වෙහෙස, විහිංසනය; විඳිනෝවද, විඳින්නෝවද.

දඹදෙණිය නමැති අලකමන්ද නම් රාජධානියෙහි වෛශ්‍රවණයාගේ විලාසයෙන් වසන්නාවූ—මේ රජහුගේ ළඟ සරස්වතීද—ශ්‍රීකාන්තාවද—(යන දෙදෙනා) වාසයකිරීමට ආශාවඇතිවූ කල්හි වෙන්වීමෙන් හටගත්ශෝක නමැති ගින්න සීතලකිරීම පිණිස පිහුමට හෙවත් නෙළුම්විලටද—මුහුදටද—පැමිණ බ්‍රහ්මයා හා විෂ්ණුද—යනදෙදෙන වෙහෙස විඳින නැතැත්තෝවද (වෙහෙස විඳින්නෝයයන තේරුමයි —

35 මී න් ඉබු කුරුවරා නරසී ගොපලු වෙ ස
වෙ න් ගත් මෙ ඈ නන් විකරන් දුකැ සියැ ස
පි න් වත් අපනිරිඳු වෙනැ පවති නොකලෙ ස
ම න් නොස් වෙමින්වූ සුසිරි සඳ ඇමදව ස

35 මීන්, මීනවේෂයෙහි; ඉබු, කූර්මවේෂයෙහි; කුරු, වාමනකවේෂයෙහි; වරා, සූකරවේෂයෙහි; නරසී, නරසිංහවේෂයෙහි; ගොපලුවෙස, ගොපාලවේෂයෙහි; යනමෙ ඈ, මේ ආදිවූ; වෙන්ගත්, විෂ්ණුහු විසින් ගන්නාලද්දාවූ; නන්විකරන්, අනෙකප්‍රකාර(නොයෙක්)විකාරයන්; සියැස, ස්වකීය අක්ෂියෙන්; දුකැ, දකිනා

කොට; එකලෙස,(හැමදාම) ඒකාකාරයෙන්; පවතින, ප්‍රවෘත්තමානවූ හෙවත් ප්‍රවෘත්තිතවූ; පින්වත්, පුණ්‍යවන්තවූ; අපනිරිඳුවෙත, අපගේ නරේන්ද්‍රයා ගේ සමීපයෙහි; සිරිසඳ, ශ්‍රීකාන්තාතොමෝ; ඇමදවස, සෑමදවස්හී; මන් තොස්වෙමින්, චිත්තසන්තුෂ්ටවෙමින්; වුසු, වාසයකරන්නීය හෙවත් වාසයකළතැනැත්තිය.

මත්ස්‍යවේසය–ඉදිබු හෙවත් ඉබිවේසය–වාමනක හෙවත් ලකුන්ටක වේසය–ඌරු වේසය–නරසිංහ වේසය–ගොපාලක වේසය–යනමේ ආදිවූ විෂ්ණුහු විසින් ගන්නාලද නොයෙක් විකාර වෙශයන් තමන්ගේ ඇසින් දැක (කලකිරී හැමදම) එකහැපියට පවතින්නාවූ පින්ඇති අපේ රජ්ජුරු වන්ගෙ සමීපයෙහි–ශ්‍රීකාන්තාතොමෝ සෑමදවස්හිම සිත සතුටුවෙමින් වාසය කළාය.

36 අ ණ තද විකුම් පින් යසතෙද මිහුරු බ ණ
නැ ණ බල රුසිරු දප්සිරොතප් මෙත් කුළු ණ
ර ණ දිරි සැදු දන් සිල් සිහි මෙ ඇ ගු ණ
ග ණ සහ නිපන් මෙනිරිඳු තුළ සලකල ණ

36 තදඅණ, ප්‍රචණ්ඩආඥාව; විකුම, වික්‍රමය; පින්, පුණ්‍යය; යස, කීර්තිය; තෙද, තෙජසය; මිහුරුබණ, මධුරාලාපය; නැණ, ඥාණය; බල, ශක්තිය; රුසිරු, රුචිරය; (සහපත්කම) දප්, දර්පය; සිරොතප්, සිරොත්තාපය; මෙත්, මෛත්‍රිය; කුළුණ, කරුණාවය; රණදිරි, යුද්ධයෙහි ධෛර්‍ය්‍යය; සැදු, ශ්‍රද්ධාය; දන්සිල්, දානසීලය; සිහි, ස්මෘතිය; (යන) මෙ ඇ, මෙආදිවූ; ගුණගණසහ, ගුණසමූහය සමග; නිපන්, නිෂ්පන්නවූ; මෙ නිරිඳු, මේනරේන්ද්‍රයාගෙ; සලකලණතුළ, ශාලකල්‍යාණ වෘක්ෂයක් සමානයි.

තදආඥාවද–වික්‍රමයද–පින්ඇතිකමද–කීර්තියද–තෙජසද–මිහිරි වචනයද ප්‍රඥාවද–බලයද–සහපත්කමද–එසිය හෙවත් පසුබානොබස්නා ස්වභාවද–ලජ්ජාවිනතකද මෛත්‍රියත් කරුණාවද–යුද්ධයෙහි ධෛර්‍ය්‍යයද–ශ්‍රද්ධාවද–දන් දීමද–සිල්රැක්මද–(සුදුසුතැනට එළඹ සිටි) සිහියද–යනමේආදිවූ ගුණ සමූහය සමඟ උපන්නාවූ මේ මනුෂ්‍යෙන්ද්‍රයා (රජහු) * ශාලකල්‍යාණ වෘක්ෂයක් සමානයි.

---

36 * ශාලකල්‍යාණවෘක්ෂය එකමුහුර්තයකට හැටරියනක් වැඩෙනඑකක්ලු.

37 මහත සැපත මොහුගුණ තෙද පවස තය
සතත සහස නෙත දෙව්මැති පසව තය
වතත සවත දිත ගුරුසොමි බඹත තය
සමත මෙසුර සකහැර නතනො සම තය

37 මොහු, මේ රජයාගේ; මහතසැපත, මහත්වූ සම්පත්තීයද; ගුණ, ගුණයද; තෙද, තෙජසද; පවසතය, ප්‍රකාශකරනහොත්; සතත, බ්‍රහ්මයාද; සහසනෙත, සහශ්‍රනෙත්‍රයාද; දෙව්මැති, දෙවමන්ත්‍රියා හෙවත් බෘහස්පතීද; පසවතය, පඤ්චවක්ත්‍රයා හෙවත් ඊශ්වරයාද; වතත, වක්‍රහස්තයා හෙවත් ශණේශ්වරයාද; සවත, සත්මුඛයා හෙවත් සඩානනයාද; දිතගුරු, දෛත්‍යාචාර්ය්‍යයා හෙවත් ශුක්‍රයාද; සොමි, සෞම්‍යයා හෙවත් ශශිපුත්‍රයාද; බඹතය, බ්‍රහ්මකාන්තාව හෙවත් සරශ්වතීද;(යන)මෙසමත සුරසකහැර, මේ සමස්ත දිව්‍යසමූහයා හැර; නොහොත් සමත, සමීපවූ; මෙසුරසකහැර, මේ දිව්‍යසමූහයා හැර; අනත, අන්අනෙක්හි; නොසමතය, සමපියෙක් නැත්තේය.

මේ රජහුගේ මහත්වූ සම්පත් හා ගුණයද-තෙජසද-ප්‍රකාශකරණවානම් මහා බ්‍රහ්මරාජයාද-ශක්‍ර දෙවෙන්ද්‍රයාද-බෘහස්පතීද-ඊශ්වරයාද-ගණදෙවියාද-කතරගම දෙවියාද-සිකුරුද-බුදහුද-සරශ්වතීද-යන-මේ සියළු දිව්‍ය සමූහයා නොහොත්-සමීපවූ මේ දිව්‍යසමූහයා ඇර අන්තැනෙක්හි-සමතෙක් නැත්තේය.

38 පුවතර සව්සිරින් නරලොවට පත් මු දුන්
නඳකර යදිදනන් මෙන් සුරබිනව හ දුන්
මනහර බසින් විලසින් හෙබි මෙ නරනි දුන්
අවසර රැගන් සිරිපා තඹරදිමු දුන්

38 පුවතර, ප්‍රසිද්ධවූ; සව්සිරින්, සකලශ්‍රීයෙන්; නරලොවට, මනුෂ්‍ය ලොකයට; මුදුන්පත්, මස්තකප්‍රාප්තවූ; යදිදනන්, යාචකජනයන්; නඳකර, නන්දනකාරිවූ; සුරබිනවහදුන්, සුරභිනවනිධීන් පරිද්දෙන් හෙවත් සුරභී ධෙනුකාව හා (වෛශ්‍රවණයාගේ) නිධාන නවය වැනිවූ; මනහර, මනොහරවූ; බසින්, වචනයෙන්ද; විලසින්, ශරීරලාවණ්‍යයෙන්ද හෙවත් ශරීර ශොභාතිශයෙන්ද; හෙබි, සොභමානවූ; මෙනරනිදුන්, මේ නරෙන්ද්‍රයන්ගේ; සිරිපා තඹර, ශ්‍රීපාදනමැති තාමරසයට; මුදුන්, මස්තකය; දී, දෙනයකොට; අවසර, ඔකාසය; රැගන්, ග්‍රහණය කරන්.

ප්‍රසිද්ධවූ සකලශ්‍රීයෙන් මනුෂ්‍යලොකවාසීන්ගේ මුදුනට පැමිණියාවූ යාචක ජනයා සතුටුකරණ සවභාව ඇත්තාවූ සුරබිය හා ("පද්ම සඞ්ඛ මහාපද්මඃ," යනාදිවශයෙන් දක්වනලද වෛශ්‍රවණයාගේ) නිධානනවය සමානවූ-මනොඥවූ වචනයෙන්ද ශරීරයෙහි හොඳ වර්ණවත් ගතියෙන්ද-බබලන්නාවූ මේ මනුෂ්‍යොත්තමයාගේ ශ්‍රී පාදනමැති පියුමට මුදුනදී හෙවත් පාමුල හිසතබා වැඳ අවසර ඇරගන්.

---

37 මේකවියෙහි අපි මීට වෙනස්කොටද කියනහැකි.

39 පෙර මුනිඳුන් තමහට කළ ගුණ පව ර
කර සඳහන් සුරරද පිදු කිරුළ සු ර
තර සර ගිවි පහතුර වොරැඳි විසිතු ර
තර පතරැති පතරන් මිණි කරඬුතු ර

39 පෙර, පූර්වයෙහි; මුනිඳුන්, මුනීන්ද්‍රයන් විසින්; තමහට, තමාහට, කළ, කරණලද; පවරගුණ, ප්‍රවරවූ හෙවත් උත්තමවූ ගුණය; සඳහන්කර, ස්මරණයකොට; සුරරද, දිව්‍යරාජයා විසින්; පිදු, පූජිතවූ හෙවත් පුදනලද්දාවූ; කිරුළසුර, කිරීටාකාරවූ; තරසර, ස්ථිරසාරවූ; ගිවි, උච්චයවූ; පහතුර, ප්‍රාසාදාභ්‍යන්තරයෙහි; වොරැඳි, විරාජමානවූ; විසිතුර, විචිත්‍රවූ; තරපතර, රශ්මිසමූහය; ඇති, විද්‍යමානවූ; රත්මිණිකරඬුතුර, ස්වර්ණමාණික්‍යකරණ්ඩකාභ්‍යන්තරයට හෙවත් සමුද්ගාභ්‍යන්තරයට; පත, ප්‍රාප්තවූ~ පූර්වකාලයෙක්හි (ආයුෂමිදව වූහවී අපායෙහි උපදින්නට සිටි ශක්‍රයාලවා පින්කරවා ආයුෂාදිය ඇතිකර වීමෙන්) බුදුන් විසින් තමන්ට කරණලද උතුම්වූ ගුණය සිහිකොට ශක්‍රයා විසින් පූජාකරණලද ඔටුන්නවැනිවූ ස්ථිරවූ මහත්වූ උස්වූ ප්‍රාසාදයෙහි හෙවත් දළදා මන්දිරයෙහිවූ විසිතුරුවූ රශ්මි සමූහයක් ඇත්තාවූ ස්වර්ණමාණික්‍ය කරණ්ඩකාභ්‍යන්තරයට පැමිණියාවූ හෙවත් රත් මැණික් කරඬු ඇතුලට වැඩම්මවනලද්දාවූ.

40 * වි හි දූ කැළුම් සිත්ලෙව් සත නෙත තර ග
සු සැ දූ රදන හෙළදිවඹරැ ලසඳ ර ග
ඇ ම දූ සතන් නඳකළ සුර නර තුර ග
ද ළ දූ හිමිඳු වැඳ පල ලබ සග පව ග

40 සිතකැළුම්, ශ්වේතකාන්තිය; විහිද, විසර්ජනයකොට; ලෙව්සත, ලොකසත්ත්වයාගේ; නෙත, නෙත්‍රාව; නොහොත් නෙත්‍රයෙහි; තරග, තරංගාකාරය; සුසැද, සුසජ්ජිතකොට; හෙළදිවඹරැ, සිංහලද්වීපාම්බරයෙහි; ලසඳරග, බාලශශාංකයා හෙවත් චන්ද්‍රයා පරිද්දෙන්; රදන, රඤ්ජමානවූ; ඇමද, සැම දවස්හි; සුරනරතුරග, දිව්‍යමනුෂ්‍යෝරගයන්ගේ; සතන්, සන්තානයන්; නඳකල, නන්දනකලාවූ; දළදාහිමිඳු, දංෂ්ට්‍රාධාතු ස්වාමීන්ද්‍රයන්; වැඳ, වන්දනය හෙවත් නමස්කාරකොට; සගපවගපල, ස්වර්ගාපවර්ග ඵලය; ලබ, ලබ්ධකරව~ සුදුකැළුම් විහිදුවා ලෙව්සතුන්ගේ ඇසට නොහොත් ඇසෙහි රළ ආකාරය මනාකොට සාද සිහලදිව් අහස්හි (බාලගණඵන) ලාහඳමෙන් රදන්නාවූ සැමකල්හිම දෙව්මිනිසුන් හා නාගයන්ගේ සිත් සතුටුකළාවූ දළදා ස්වාමීන්ද්‍රයන්ට වැඳ දිව්‍යලොකයෙහි (සැප) ඵලය හා නිර්වාණයාගේද (සැප) ඵලය ලබව.

---

40 * විහිද කැලුම් සිතලෙව් සත } කිරණ රග–සතහී නෙක රග } යිද පොත්වල තිබේ.

D

41 දි න ර ත්න මාවන් තෙද යස කොත් න ගන
පැණර ත්න මාමිතුරෙන් සෙත් මග ම ගන
ව න ර ත්න මාලය යුතු උරතල ර ගන
ව න ර ත්න මා හිමි වඳු සඟ මහස ගන

41 දිනරත්නමාවන්, සූර්‍ය්‍යචන්‍ද්‍රයන්ටබඳුවූ; තෙදයස, තෙජකීර්ත්තිනමැති කොත්, ශ්‍රිංගයන් නොහොත් කෙතුන්; නගන, ආරොපණයකරන්නාවූ; පැණ, ප්‍රඥනමැති; රත්නමාමිතුරෙන්, රත්නමයවූමහාප්‍රදීපයෙන්; සෙත්මග, ශාන්තිමාර්ගය හෙවත් නිර්‍වාණ මාර්‍ගය, මගන, එෂනයකරන්නාවූ; උරතල, වක්‍ෂස්ථලයෙහි; රගන, නෘත්‍යයකරන්නාවූ; නොහොත්–රගනයුතු, රස්මි සෙන් යුක්තවූ; වනරත්නමාලය, විනයන වැති රත්නමාලාවක් ඇත්තාවූ; මහ සඟන සඟ, මහාසංඝයන් සමග; වනරත්නමාහිමි, වනරතන මහා ස්වාමීන්; වඳ, වන්‍දනය හෙවත් නමස්කාරකරව–සූර්‍ය්‍ය චන්‍ද්‍රයන්ට සමානවූ තෙජස් කීර්ත්ති නමැති කොත් උද්ගතකරන්නාවූ ප්‍රඥ නමැති මැණික්මය මහ පහණින් හෙවත් මහ පහණ කරණකොටගෙණ නිවන් මග සොයන්නාවූ උරස්ථලයෙහි නටන්නාවූ නොහොත් රස්මියෙන් යුක්තවූ විනය නමැති රුවන් මාලාවක් ඇත්තාවූ (සෙසු) මහා සංඝයාද සමග වනරතන මහා ස්වාමීන්ට නමස්කාර කරව.

42 දිත් රද පිණිස සුර පියුමැසි නමැති ලො ල
ගත් සිය අතින් කොතිනැ නැමෙර සිදුරැක ල
* ගත් තෙද රුසෙව් මහසෙන් දෙව්රදුනු දු ල.
සිත් සහ තොසින් නමදුව දෙනුව මනදෙ ල

42 පියුමැසි, පද්මයසි; නමැති, නාමාත්විතවූ; සුර, සුරවූ; දිත්රදපිණිස, දිතරාජයාපිණිස; ලොල, ලොලයෙන්; සිය අතින්, ස්වකීය හස්තයෙන්; ගත්, ග්‍රහණයකරණලද්දාවූ; කොතින්, කොන්තයෙන්; ඇනැ, ඝනනය කොට; මෙර, මෙරුව; සිදුරැසැල, ඡිද්‍රකලාවූ; තෙදරුසෙව්, තෙජප්‍රඥ්ජයට හෙවත් සූර්‍ය්‍යයාට බඳුවූ; ගත්, ගාත්‍රයකින්; උදුල, උජ්ජ්වලිතවූ; මහ සෙන් දෙව්රදුන්, මහාසෙන දිව්‍යරාජයන්; මනදෙල, චිත්තදෙහලය; දෙනුව, දෙනය පිණිස, සිත්සහතොසින්, චිත්ත සන්තොෂයෙන්; නමදුව, නමස්කාරකරව–පද්මය යන නම් ඇත්තාවූ සුරවූ අසුර රජහට (ඇනීම) පිණිස තමාගේඅතින් ගත්තාලද කොන්තයෙන් ඇන මෙරු පර්‍වතය සිදුරු කලාවූ තෙජස් සමූහය හෙවත් සූර්‍ය්‍යයාවැනිවූ ශරීරයකින් දිලිහෙන්නාවූ මහාසෙන යන නම ඇති දිව්‍යරාජයාට සිතේ ලොල්ව පවත්නා අදහස සිදු කරදෙනු පිණිස චිත්තයෙහි සන්තොෂයෙන් නමස්කාරකරන්.

---

42 * ගත් තෙද "රසෙව්" මහසෙන්දෙව් "රද" ඇටුල–ඌමහර.

43 දි න ක ර දිනැහතය සොමි ලදුරි ලගතු රු
ප න ව ර නැමැදූ තෙරුවන් සිතිනි පිවිතු රු
සි රි බ ර මෙනුවරින් මනරම් ඉටු මිතු රු
සි හි ක ර යතුරුකර කරණී මෙත් සුතු රු

43 දිනකරදින, අර්කවාරයෙහි; හතය, හස්තනම් නක්‍ෂත්‍රය (සමහව) සොමි, සෞම්‍යයා; ලදුරිලගතුරු, කන්‍යාලග්නයෙහි සිටින කාලයෙහි; පනවර, ද්විතීය වාරයෙහි; පිවිතුරු සිතින්, පවිත්‍රවූ චිත්තයෙන්; තෙරුවන්, ත්‍රිවිධ රත්නය; නමැදූ, නමස්කාරකොට; සිරිබර, ශ්‍රීභරිතවූ; මනරම්, මනෝරම්‍යවූ; මෙනුවරින්, මේ නගරයෙන්; ඉටු මිතුරු, ඉෂ්ටවූ හෙවත් ප්‍රියවූ මිත්‍රය; කරණී මෙත් සුතුරු, කරණීය මෛත්‍ර සූත්‍රය; සිහිකර, ස්මරණයකොට; යතුරු කර, යාත්‍රාකරව— "රවිවාරයෙහි හෙවත් ඉරිදා දිනයෙහි හස්ත නැකත සමහව බුදහු කන්‍යා ලග්නයෙහි සිටිනා කාලයෙහි දෙවෙනි දිනයෙහි පිරිසිදු සියින් තුණුරුවන් වැඳ ඉසුරෙන් බරවූ මනෝරම්‍යවූ මේ නුවරින් ප්‍රිය මිත්‍රය කරණීයමෛත්‍ර සූත්‍රය සිහිකොට යාත්‍රාකරන් හෙවත් පිටත්වෙයන්."

44 ලොල වඩවන ගජහය පුන්කලස් හි වි
කු ල ඟන සසක් * කුසතණ බමුණන් පෙර වි
න ල සෙව් ඉදිරිවන හෙනැමුවරද සැක වි †
බ ල සුබ නිමිති තොප යන පෙරමග පරෙ වි

44 ලොලවඩවන, ලොල වර්ධනය කරවන්නාවූ; ගජ, හස්තියා; හය, අශ්වයා; හිවි, උස්වූ; පුන්කලස්, පූර්ණඝටය; කුලඟන, කුලාඞ්ගනාව; කුසතණ සහ, ‡ කුසත්‍රිණ සහිතවූ, සක්, සංඛය; පෙරවි බමුණන්, පුරොහිත බ්‍රාහ්මණයා; මුවරද සැකවිහෙන, මකරන්ද සමූහව පතිතවන්නාවූ හෙවත් එන්නාවූ; නලසෙව්, මාරුතාශ්‍රයකලාවූ; ඉදිරිවන, අභිමුඛවනයයන; සුබනිමිති, ශෝභන නිමිත්තයන්; තොපයන, තොප විසින් ගමනයකරණලබන්නාවූ; පෙරමග, ප්‍රතිපථයෙහි; පරෙවි, පාරාපතපක්‍ෂියා; බල, නිරීක්‍ෂණයකරව— ලොභය නොහොත් ආසාව වර්ධනය කරවන්නාවූ—හස්තිය—අශ්වය—උස්වූ පුන්කලස්ය—කුලස්ත්‍රීය—කුසතණසහිතවූ හක්ගෙඩිය—පුරොහිත බ්‍රාහ්මණයා—(යනමොහුද) මල්පැනි සමූහව වැහෙන්නාවූ සුලඟ ඇසුරුකලාවූ—අභිමුඛ වනයද යන මනොඥවූ නිමිතින් තොප යන්නාවූ ඉදිරි මාර්ගයෙහි (සම්බවෙයි) පාරාපතය බලාපන්.

---

44 * සක් කුසතණ—† සක වි—සමහර—‡ ඌන පත්‍රයෙහි "හ" යන්න අගම් හකාරයි දන්නේ—

45 * නු බ මිණි අලුත් වනවනකත් අතු අති න
† ල ඹ මල්කැන් සෙමරින් විදැ විදැ පව න
· දෙ ඹ අතු සෙවනැ තුරු සැනපි ඉඳැ යෙහෙ න
නු බ සිතුලෙස ‡ මිතුරිඳු එතනින් වඩ න

45 නුබමිණි, නභොමාණික්‍යයා; අළුත්වන, අභිනවවන කල්හි; වනකත්, වන නමැති කාන්තාව විසින්; අතුඅතින, ශාඛා නමැති හස්තයෙන්; (ගන්නා ලද) ලඹ, ලම්බමානවූ; මල්කැත්, පුෂ්පස්තවක නමැති; සෙමරින්, චාමරයෙන්; (සලනලද) පවන, මාරුතය; විදැ විදැ, විජනය කොට කොට; දෙඹඅතු සෙවනැතුරු, පුන්නාගශාඛා ඡායාන්තරයෙහි–නොහොත්–දෙඹ අතුසෙවනැ, පුන්නාගශාඛා ජායාවෙහි; තුරු, සමන්තාෂයෙන්; සැනපී, සන්තර්පිතව; යෙහෙන, යහපත් පරිද්දෙන්; ඉඳැ, වාසයකොට; මිතුරිඳු, මිත්‍රෙන්ද්‍රය; නුබ, පුෂ්මත්හුගේ; සිතුලෙස, චිත්තවිලාසයට; එතනින්, ඒ ස්ථානයෙන්; වඩන, වඩින්න—"සුයසියා අලුත්වන කල්හි හෙවත් උදුවන කාලයෙහි වනය නමැති කාන්තාව විසින්; අතු නමැති අත්වලින් (ගන්නා ලද) එල්ලෙන්නාවූ මල් පොකුරු නමැති චාමරවලින් (සලනලද) පවන් විදිමින් දෙඹඅතු, ජායාන්තරයෙහි නොහොත් දෙඹඅතු සෙවනෙහි සතුටින් සැනපීමෙන් යහපත් පරිද්දෙන් වාසයකර නැවත උතුම් මිතුර උඹේ හිතේ කැමැත්තේ හැටියට එතනින් පිටත්වෙයන්.

46 සුවිමල්ල මැනිකුල–තිලකෙව් උදුල හැමක ල"
සිරිසඳ නොසින් රැඳි කුසුමෙව් a නොකල ම්බා

b සිරි ඇස තෙදැති නරනිඳු මේ පැරකු ම්බා
පනා බුදු සිරි සව්–සත වෙනැ කුළුණු දියුණු වැ.
කරවා දෙමාළින් මුනි මැඳුරක් මහ රූ
පුරවා සව්සිරින් කරැ තෙසින පිවිතු රූ

සියගුරු බිසෝ හිමිසඳ නමිනි පිරිවෙණ ක්
කරවා පැපිළියානෙහි මහසඟන නොයෙ ක්
වසනුව දෙවු වෙහෙරට පිවිසැ නොසිතුද ක්
ඉඳැ සැනපී ගත c සරතැස නිවා මද ක්

---

4: * "නුබමිණ"–"වන වන ගත්–ඕද.
† ලඹමල්කැණති ... මරින ..ද–"මද" පවන–ඕද–‡ සිතුලෙසින්–සමහර.
46 a පිදුංමෙව් ඕද—ඒද ඉතා මැනවි—b පිරියස—c සැරතැඋ–සමහර.

46 සුවිමල්, අති නිර්මලවූ; ලැම්ණිකුල, ලාම්ණි වංශයට; තිලකෙව්, තිලක යක් පරිද්දෙන්; හැමකල, සැමකල්හි; උදුල, උජ්වලිතවූ–සිරිසඳ, ශ්‍රීකාන්තාව විසින්; නොකලම්බා, ක්ෂුභිතනොකොට; රැඳී, රඤ්ජිතවූ; කුසුමෙව්, පුෂ්පයක්වැනිවූ; සිරි, ඓශ්වර්‍ය්‍යය; යස, කීර්ත්තිය; තෙද, තේජසය යන මොවුන්; ඇති, විද්‍යමානවූ; මේ පැරකුම්බා නරනිඳු, මේ පරාක්‍රමබාහු නරේන්ද්‍රයා විසින්; සවිසතහට, සකල සත්ත්වයා කෙරෙහි; කුළුණු, කරුණාව; දියුණුව, විගුණීව–නොහොත්–දිගුණව; බුදුසිරි, බුඩශ්‍රිය; පතා, ප්‍රාර්ථනාකොට; දෙමාළින්, විමාලකයෙන් යුක්තවූ; මහරු, මනොඥවූ; මුනිමැඳුරක්, සර්වඥ මන්දිරයක්; කරවා, කාරාපනයකොට; තෙසිත, ත්‍රිවිධ චීත්‍යය; පිවිතුරු කර, පවිත්‍රකොට; සවිසිරින්, සකල සම්පත්තියෙන්; පුරවා, පූර්ණයකරවා නොහොත් පූර්ණයකොට; පැපිළියානෙහි, පැපිළියානනම්ග්‍රාමයෙහි; සියගුරු බිසෝ හිමිසඳතමිනි, ස්වකීය මාතෘ මහෙසිකා ස්වාමිදූතතමියගේ නාමයෙන්; පිරිවෙණක්, පරිවෙණයක්; කරවා, කාරාපනයකොට; නොයෙක් මහසඟන, අනෙක මහා සංඝයන්ට, වසනුව, වාසයකරණු පිණිස; දෙවූ, දත්තකරවන ලද්දාවූ; වෙහෙරට, විහාරයට; උදක් තොසින්, කෙවල සන්තොෂයෙන්; නොහොත්–උදක්, සීඝ්‍රව; තොසින්, තොෂයෙන්; පිවිසැ, ප්‍රවිෂ්ටව; ඉඳා, නිසද්‍යයකොට; සැතපී, සන්තර්පිතව; නොහොත් සැතපිඉඳ; සන්තර්පිත වීමෙන් නිසද්‍යයකොට; ගත, ගාත්‍රයෙහි නොහොත් ශරීරයාගේ; සරතැස, ශ්‍රාන්තාය; (විඩාව) මදක්, ස්වල්පයක්; නිවා, නිර්වාපනයකොට.

“ඉතා පිරිසිදුවූ ලම්බකර්ණ වංශයට තිලකයක් * මෙන් සැමකල්හි දිලිසෙන්නාවූ–ශ්‍රීකාන්තාව විසින් කැලඹීම නොකොට වාසයකරණුලබන මලක් වැනිවූ–සම්පත්තියය–යසසය–තේජසය යන මොවුන් ඇත්තාවූ–මේ පරාක්‍රම බාහු රජහු විසින් සියලු සත්ත්වයන්කෙරෙහි කරුණාව හෙවත් දයාව දෙගුණයක් ඇත්තෙක්ව නොහොත් කරුණාව දියුණුකර–බුඩශ්‍රීය ප්‍රාර්ථනාකෙරෙමින් දෙමාලෙයකින් යුක්තවූ–මනොඥවූ බුදුගෙයක්(විහාරයක්)කරවා–පූර්වචෙතනා–මුක්ෂ්වන චෙතනා–අපර චෙතනා–(යන) තුන්හිත) පිරිසිදුකොට–සියලු සම්පත්තීයෙන් පුරවා–පැපිළියාන නම් ගමෙහි–තමන්ගේ මව් මෙහෙසි හිමි උතුමියගේ නාමයෙන් පිරිවෙණක් කරවා—නොයෙක් මහ සංඝයාවහන්සේලාට වැඩඉඳිම පිණිස දෙවනලද්දාවූ—විහාරයට හුදකලාවූ සන්තොෂ චිත්තයෙන්–නොහොත් සීඝ්‍රව සතුටු සිතින් පැමිණී සැතපිඉද–විඩාව හෙවත් ක්ලාන්තභාවය ටිකක් නිවීමකොට.”

47 සැ ඹ නා යක් අසුර බඹ නර මරු නොම ද
ම ඹ නා උදම් කෝ දල දප සිඳැ පසි ද
දි ඹ නා රදෙව් තිත් නළවන පත පසි ද
ව ඹ නා මැනවි මුනිරජ සිරිපා නැමැ ද

* සඳුන් ආදීයෙන් නලලෙහි අලඞ්කාරපිණිස කරණලද්දේ තිලකනම්.

47 සැඩ, වණ්ඩිවූ; නා යක් අසුර බඹ නර මරු, නාගය යක්ෂදානව බ්‍රහ්ම මනුෂ්‍ය මාරයන්ගේ; නොහොත් නා යක්, නාගය යක්ෂයන් හා; අසුර බඹ, දානව බ්‍රහ්මයන්ගේද; නර මරු, මනුෂ්‍ය මාරයන්ගේද; නොමඳ, අමන්දවූ; උදම්, උද්දාමවූ; කෝදල, කෝපාග්නි නමැති; නොහොත් දල, මහත්වූ; කෝ, කෝප නමැති; දප, දර්පය; සිඳු පසිඳ, ශීඝ්‍ර ප්‍රච්ඡින්නකොට; මඩනා, මර්දනය කරන්නාවූ; තිත්, තීර්ථක නමැති; නළවන, බටවනය; පසිඳ, ප්‍රච්ඡින්න කොට; පත, ප්‍රාප්තවූ; දිඩ, දෘඪවූ; නාරදෙව්, හස්තිරාජයෙකුවැනිවූ; මුනිරජ, මුනිරාජයාගේ; සිරිපා, ශ්‍රීචරණය; නැමැද, නමස්කාරකොට; වඩනාමැනව්, වැඩියමැනව්.

“වණ්ඩිවූ–නාගයක්ෂ–යක්ෂය–දානවය–බ්‍රහ්මය–මනුෂ්‍යය–මාරය යන මොවුන් ගේ–බොහෝවූ උද්ගතවූ හෙවත් උඩට නැංගාවූ–කෝප ගිනි නමැති නොහොත් මහත්වූ කෝප නමැති එඩිය හෙවත් ආඩම්බරකම සිඳලා විශෙෂයෙන් සිඳලා පොඩිකරන්නාවූ–(පූරණ කාශ්‍යපාදී) තීර්ථක නමැති බටවනය විශෙෂයෙන් සිඳ පැමිණියාවූ–දැඩිවූ ඇත්රාජයෙකුවැනිවූ–මුනිරජහුගේ ශ්‍රීපාදය වැඳ වැඩියමැනව හෙවත් ගමනයකළමැනව්.

48 පෑ යෙ න් අදර පබල කුරන්ගත් එ ඩිය
තෝයෙත් සිහිලුපුල් මුවරදවත් වැ ඩිය
ගී යෙ න් කොවුල්සර අඟවන මත් වැ ඩිය
ඒ යෙ න් එතර අඟනන් දකු අත් ඉ ඩිය *

48 අදරපැයෙන්, ඔෂ්ඨවර්ණයෙන්; පබලකුරන්, ප්‍රවාලාඞ්කුරයන්ගේ, එඩිය, දර්පය; ගත්, ග්‍රහණයකළාවූ; උපුල්මුවරද, උත්පල මකරන්දයෙන් යුක්තවූ; සිහිල් තෝයෙන්, ශීතල ජලයෙන් හෙවත් ශීතල ජලය කරණකොටගෙණ; වත් වැඩිය, වක්ත්‍ර ධොවනය කළාවූ; ගීයෙන්, ගීතිකාව කරණකොටගෙණ; මත්වැඩිය, මදවැඩුනාවූ; කොවුල්සර, කොකිල ස්වරය හෙවත් නාදය; අඟවන, සංඥකරවන්නාවූ; ඒයෙන්, සෙතුවෙන්; එතර, පාරිමතීරයෙහි; නොහොත් එතර, උත්තරීතව; අත්ඉඩිය, අත්ඉඩිය නම් ග්‍රාමයෙහි; අඟනන්, අංගනාවන්; දකු, දර්ශනයකරව.

“තොල්වල වර්ණයෙන් ප්‍රවාලාඞ්කුරයන්ගේ හෙවත් පබළුදළුවල එඩිතරකම හෙවත් පබලු දළුවල මැඩ නොපවත්නා හොඳ සැරපැහැය ගත්තාවූ (එනම්) ඉස්සරහට පැවාක්මෙන් පෙන්වීම් ආකාරයක්ගත්තාවූ–උපුල් මල් පැණියෙන් යුක්තවූ–ශීතලවූ–ජලයෙන් මූනසේදුවාවූ–ගීතිකාව කරණකොටගෙණ මදවැඩුනාවූ කොකිල නාදය අඟවන්නාවූ–ඒ දන්ඩෙන් නොහොත් පාලමෙන් ඒ තීරයෙහි නොහොත් එතරව (එගොඩහටවෙලා) අත් ඉඩිය නම් ගමෙහි ස්ත්‍රීන් දකපන්.”

48 * “අත්තිඩිය”–සීද තිබේ.

49 නි සා කර අයුරුවත් පැහැදූ බැබ ලියේ
ග සා පවන් හන්සළු කුලෙනි ඉගි ලියේ
ල සා නොවයනෙනලියඳූකැ නොවැමැ ලියේ
තොසා වඩන මිග බැසැ මොරටුව එ ලියේ

49 නිසාකරඅයුරු, නිසාකරයා පරිද්දෙන් හෙවත් චන්ද්‍රයා සමානව; පැහැදූ, ප්‍රසන්නව; බැබලියේ, භ්‍රාජමානවූ; වත්, වක්ත්‍රයෙන් යුක්තවූ; පවන් ගසා, මාරුත ප්‍රහාරයකොට හෙවත් මාරුත ප්‍රචණ්ඩව; හන්සළු, හඳිනලද සාටකයන්; ඉගිලියේ, ගලිතවූ; උකුලෙනි, ශ්‍රොණියෙන් යුක්තවූ නොහොත් ශ්‍රොණියෙන් යුක්තව; ලසානොව, අලසීනොව; යනෙන, ගමනාගමනය කරන්නාවූ; ලිය, කාන්තාවන්; දූක, දශීනයකොට; මැලියේනොවැ, මන්දවූවෙක් හෙවත් අලසීවූවෙක්නොව; මොරටුව එලියේ, මොරටු එලියෙහි; මගබැස, මාර්ගාවතීර්ණව; තොසා, තොෂයෙන්; වඩන, වඩින්න.

“ චන්ද්‍රයාට සමානව පැහැදී බබලන්නාවූ-මුහුනින් යුතුවූ-නුලඟ ගසාගැලවුනාවූ හෙවත් හඳිනලද වස්ත්‍රයන් ගිලිහුනාවූ උකුලෙන් යුතුවූ-අලසීනොව යන එන ස්ත්‍රීන් දූකලා (බලා නොඉඳ යන්ට) මැලිනැ නැත්තෙක්නොවී මොරටුඑලියනම් ප්‍රදෙශයෙහි මගටබැහැලා සන්තොසයෙන් ගමනය කරපන්.”

50 උගු සැව් ගුරු සයුර අලලන මඳර ගි රේ
අඟු පලඳන දද මිණි රැස් විසුල පු රේ
දිගු එලිකර තරුතර පෙණෙන නුබතු රේ
ලගු කළ රැව් දෙව් විමනතැ පාණදු රේ

50 උගුසැව්, ඉක්ෂුචාපයාගේ; ගුරු, පිත්‍රෘන් විසින් හෙවත් විෂ්ණුහු විසින්; මඳරගිරේ, මන්දර පර්වතයෙන්; සයුර, සාගරය; අලලන, ආලොලනය කරණ කල්හි; අඟුපලඳන, කෙයූරාභරණයෙහි; දද, තාරකා නමැති නොහොත්; දද, ධාරණයකරන්නාවූ; මිණිරැස්, මාණික්‍ය රාසිය; විසුලපුරේ, විශීර්ණවූවාක්මෙන්; දිගු, දිසාවන්; එලිකරු, ආලොකකොට; තරුතර, තාරකා සමූහය; නුබතුරේ, නභාන්තරයෙහි; පෙණෙන, දෘශ්‍යමානවන කල්හි; පාණදුරේ, පතනතොරනම් ග්‍රාමයෙහි නොහොත් පාසාණදූර නම් ග්‍රාමයෙහි; දෙව්විමනතැ, දිව්‍යවිමානයෙහි හෙවත් දෙවාලයෙහි; කළරැව්, කලත්‍රාණිරාව ඇත්ත හෙවත් කපොතය; ලගු, ලග්නවෙව.

“ උක් දුන්නගුගේ-හෙවත් උක් දුනු ඇත්තහුගේ (අනංගයාගේ) පියා හෙවත් විෂ්ණුහු විසින්-මහාමෙරුපර්වතයෙන් සාගරය කලම්බන කාලයෙහි අඟුපලඳනාවෙයි දරන්නාවූ මැණික් සමූහය-විසුරුණාක්මෙන් දිසාවන් ආලොකකොට තාරකා සමූහය ආකාශාන්තරයෙහි පෙණෙන කාලයෙහි පාණදුරේ දේවාලයෙහි පරෙවිය (උඹ) ලගින්.”

51 පෙරදිගඟන දිවයුරුරණදපනත ල
ගතර ලතින් දලනිඳු වසනතින්නී ල
නෙතැ නිඳි දූහැ සිහිකර තුණුරුවන් බ ල
ලැගිනි වෙසින් නැගිසිට කර පියස ස ල

51 පෙරදිගු, පූර්වදිශා නමැති; අඟන, අංගනාව විසින්; දිවයුරු, දිවාකර නමැති හෙවත් සූර්ය නමැති; රණදපණතල, ස්වර්ණ දර්පණතලය; රල තින්, තරංග නමැති හස්තයෙන්; දලනිඳු, ජලනිධි නමැති; නිලවසනතින්, නීලවස්ත්‍රාන්තරයෙන්; ගත, ග්‍රහණයකරණ කල්හි; නොහොත් ග්‍රහණයකල කල්හි–නෙතැ, නෙත්‍රයෙහි; නිඳි, නිද්‍රාව; දූහැ, දුරුකොට; තුණුරුවන්බල, ත්‍රිවිධරත්නයාගේ නොහොත් ත්‍රිවිධරත්නයෙහි බලය; සිහිකරු, ස්මරණය කොට; ලැගි, ලග්නවූ; නිවෙසින්, නිවෙසනයෙන්; හෙවත් නිවාසස්ථාන යෙන් නැගී, උද්ගතව; සිට, අවස්ථිතව; පියසසලකරු, පක්ෂචඤ්චලකොට.

“පූර්වදිශා නමැති ස්ත්‍රිය විසින්–දිවාකර නමැති රත්රන් ආදර්ශතලය–රල නමැති අතින් ජල නිධාන නමැති නිල් වස්ත්‍රය අතරෙන් ගන්නාකාලයෙහි–(ඉරපායනකොට) ඇසේ නින්ද දුරුකර–තුණුරුවන්ගේ නොහොත් තුණුරුවනෙහි බලය සිහිකොට–ලැග්ගාවූ නිවාසස්ථානයෙන් නැගිසිට පියාපත් චඤ්චලකර හෙවත් පිහාටුගසා.”

52 න ද නෙද පැවති යුගතග විලසින් නි බඳ
ස ඳ න ඳ කරණ විලසින් මදරද ප බඳ
බ ඳ අ ද රින් වැඩ සිදුවනලෙස ලො බඳ
යැ ද සු ද සුන් දෙව්ඳුට යාගන් ස බඳ

52 යුගනතගවිලසින්, යුගාන්ත වහ්නියකගේ ලීලාවෙන්; නිබඳ, නිරන්තරයෙන්; නදනෙද, ඝනබිධ තෙජස; පැවති, ප්‍රවෘත්තිතවූ; සඳනඳකරණ, චිත්තානන්ද කරන්නාවූ; විලසින්, ශරීරලාවණ්‍යයෙන්; මදරද, මන්මථරාජයා පරිද්දෙන්; පබඳ, ප්‍රසිද්ධවූ; සුදසුන් දෙව්ඳුට, සුදර්ශන දෙවේන්ද්‍රයාට; බඳ අදරින්, බද්ධාදරයෙන්; ලොබඳ, ලෝකයා ප්‍රතිබද්ධවූ; වැඩ, වෘද්ධිය; සිදුවනලෙස, සිද්ධවන පරිද්දෙන්; යැද, යාච්ඤාකොට; සබඳ, මිත්‍රය; යාගන්, යාත්‍රාග්‍රහණය කරන්.

“යුගාන්ත කාලයෙහි හෙවත් කල්පය කෙළවරවන කල්හි ගින්නක් පරිද්දෙන් නිතර තදවූ තෙජස පවත්නාවූ–සිත සතුටුකරන්නාවූ ශරීරයෙහි හොඳපැහැයෙන් අනංගයාමෙන් ප්‍රසිද්ධවූ සුදර්ශන දිව්‍යරාජයාට බැඳුනාවූ ආදරයෙන් ලෝකයා පිළිබඳවූ වැඩ සිද්ධවන පරිද්දෙන් යාච්ඤාකොට හෙවත් යැද මිත්‍රය යතුරුගත් හෙවත් යාම පටන්ගණිත්.”

53 කමීන් තලා ගිලි හැලි පංගන් නැ පිය
ලවන් පැහැය කළ විලසින් ගුරු මැ පිය
වසන් මුගුරු නොපහල දනිනුඩ සි පිය
මෙවන් ගොපලු අඟනන් දකු පොතුපි පිය

53 තලා, තුලසිද; ගිලිහැලි, ගලිතව පතිතවූ හෙවත් ගිලිහී හැලුනාවූ; පංගන්නැපිය, පංගන්නැපිද; කමින්, බාදනය කෙරෙමින්; ගුරුමැපිය විල සින්, ගෛරිකමෘත්තිකාව පරිද්දෙන්; පැහැයකල, ප්‍රභාව හෙවත් වර්ණ යකලාවූ; ලවන්, බජ්‍රයෙන් යුක්තවූ; වසන්මුගුරු, වස්ත්‍රමුද්ගරයන්; නොපහල, අධඃභාගයෙහිනුවූ; දනින් උඩ සිපිය, ජානුවෙන් ඌර්ධ්වභාගයෙහි සිපියාවූ; මෙවන්, මෙසවර්ණවූ නොහොත් මෙවන්, මෙබඳුවූ; ගොපලු අඟනන්, ගොපාලකාංගනාවන්; පොතුපිපිය, පොතුපිටිය නම් ග්‍රාමයෙහි දී, දකු; දර්ශනයකරව—

“තලාකොල හා ගැලවී වැටුනාවූ පාංගන්නැපිත් කමින් ගුරුමැටිවිලා සයෙන් වර්ණය ඇතිකලාවූ තොල්වලින් යුක්තවූ–වස්ත්‍රමුගුරු (මුගුරුමෙන් ගණ්ඨාකර ඉනේ දවටාපු වස්ත්‍රයන්) පහලටනැතුව දණින් උඩ සිපියාවූ–වැසි වලාකුළුවැනි කලුපැහැය ඇත්තාවූ නොහොත් මෙහි මුල කියනලද ආකාර ඇත්තාවූ–ගෝපාලයන්ගේ ස්ත්‍රීන් පොතුපිටිය නම්වූ ප්‍රදෙශයෙහිදී දර්ශනය කරන්—

“ තවද මග දෙපසතුරු පතර වෙසෙස අස ”—

තවද, තවත් කාරණයක්; මග දෙපස, (තොපයන්නාවූ) මාර්ගයාගේ උභය පාර්ශ්වයෙහි; තුරුපතර, වෘක්ෂසමූහයාගේ; වෙසෙස, විශෙෂය; අස, ශ්‍රවණය කරව—

54 සියඹර සබර කර මොර පහර කළුහර
සමදර ඩෙබර පර සොර තුවර අත්දර
සිඳුවර කෙසර කිණිහිර බිජුපුර මඳර
වනතුර * නොහැර තුරතුර වලබල මිතුර

54 සියඹර. තින්ත්‍රිණිකය; සබර, ලොත්ථය; කර, කාරය; මොර, මධුර සෘය; පහර, පඟුරුය; කළුහර, ක්‍රිෂ්ණසාරය; සමදර, සමුද්‍රරය; ඩෙබර, බදරීය; පර, පරය; සොර, සරලය; තුවර, ප්‍රපුණ්ණාඩය; අත්දර, වීරතරුය; සිඳුවර, සින්දුවාරය හෙවත් නිර්ගුණ්ඩීය; කෙසර, පුන්නාගය; කිණිහිර, කණ්ණිකාරය; බිජුපුර, මාතුලුඞගය; මඳර, මන්දාරය යන; තුරුඅතුරුවල, වෘක්ෂාන්තරයෙන් ආකුලවූ හෙවත් ගැවසීගන්නාලද්දාවූ; වනතුර, වනාන්ත රය; නොහැර, අත්නොහැර; මිතුර, මිත්‍රය; බල, නිරීක්ෂණයකරව—

---

54 * මගතුර–සමගර–මෙහි සතරවෙනි පදය මීට වෙනස්වද අපි කියන හැකි.

සියඹලාය—සබරය—කරය-මොරය-පතුරුය-සළු හරය-සම්භූරාය-ධෙබරය-(මසං) පරගස්ය—හොරය-තෝරය-අන්දරය-නිකය—දෙඹය-කිණිහිරිය-ලප්නාරංය-මඳුරාන යන (නොයෙක්) වෘක්‍ෂජාතීන් විසින් අකුලවූ හෙවත් ගැවසිගත්තාලද්දාවූ වනාන්තරය-අත්‍යන්තයෙන්ගැර මිත්‍රය බලව''

55 තලා අවුලුහැර රිවි සුඹුලු අැඳැ නිතී
දුලා වෙමින් ලූ සිරිමෙයල් තිලක ඇතී
වලා වරලසි කිපිල් සහ මල් කැණැතී
ලොලා * වඩන බල මල කිඳු එවන පෙතී

55 තලා, තාඩණයකොට; අවුලු, අකුලයන්; හැර, පහකොට; රිවිසුඹුලු වල්කලාවන් හෙවත් රිවි (ගස්වල) සුඹුලු; ඇඳැ, අච්ඡාදනයකොට; නිති, නිත්‍යයෙන්; දුලාවෙමින්, ජ්වලිතවෙමින්; ලූ, ලනලද්දාවූ; සිරමෙල් තිලක, ඇති, හරිතාලමය තිලකයන් ඇත්තාවූ; සිකිපිල්සහ, මයුරපිඤ්ජවන්හා; මල්කැනැති, පුෂ්පස්තවකයෙන් යුක්තාවූ; වරල, ධම්මිල්ලය; වෙලා, වෙඨනය; කොට; ලොලාවඩන, ලොලවර්ධනයකරන්නාවූ; මලකිඳු, මලකබඳුකිතෘෘන් එවනපෙති, ඒ වන පඞ්ක්තියෙහි; බල, නිරීක්‍ෂණයකරව

"තලා අවුල්හරිමින් රිවි (ගස්වල) පට්ට ඇඳ නිතර දිප්තිමත්වෙමින් (දීලිහෙමින්) ගල්වනලද සිරියල් තිලක ඇත්තාවූ-මොණරපිල් සමග මල් පොකුරු (බනා) කොන්ඩය වෙලා (ශගණ වසන) ලොභවර්ධනය කරන්නාවූ-වැදි ගැනුන් ඒ වනපෙතෙහි බලව''

56 එවන සබර සෙණ් දෑකැ මිරිකිමුව ගණ
ලෙවන පලු රොසින් කනවැනි ලවණ වණ
ගමන පැරැදූ හස ශන පිවිසි විල් වණ
කොවින හඬන වැනි සෙමෙලන්වර ලවණ

56 එවන, ඒවනයෙහි; සබරසෙන්, ව්‍යාධසෙනාව; දෑකැ, දර්ශනයකොට; මිරිකි, මර්දනයවූ; මුවගණ, මෘගසමූහයාවිසින්; ලවණවණ, අධරවර්ණඇත්තේයයි නොහොත් අධරවර්ණවූ; ලෙවණපලු, ලොහිතවර්ණ පල්ලවයන්; රොසින්, රොෂයෙන්; කනවැනි, භක්‍ෂණයකරන්නාක්මෙනි; ගමන, (ව්‍යාධාඞ්ගනාවන්ගේ) ගමනයට; පැරැදූ, පරාජිතවූ; හසගණ, හංසගණයා; නොහොත් හසඟන, හංසාඞ්ගනාතොමෝ; වනවිල්, වනතටාකයට; හෙවත් වනයෙහිවිල් වලට, පිවිසි, ප්‍රවිෂ්ටවිය; සෙමෙලන්, කොකිලයන්විසින්; වරලවණ, ධම්මිල්ල වර්ණයටනොහොත් වරලවණ, ධම්මිල්ලයෙහි වර්ණය තමන්ගේ වර්ණයට සමානයයි, කොවින, † කොපයෙන්; හඬනවැනි, රොදනයකරන්නාක්මෙනි

55 * ලොලායතෙන-බලවල කිඳුරු වනපෙතී-සමගර.
56 † "කෙවින" කෙකින් විසින්-සිද-කියති-මයුරවෙනුනු තුමූ-සිද.

ඒ වනයෙහි වැදි සෙනාව දැක–(බයින්) මිරිකුනාවූ–මුව සමූහයා විසින් (තමන්ගේ) තොල්වැතිවූ ලේපාට බාල පත්‍රයන් ශංකාපයෙන් බාස්සිනියා කරන්නාක්මෙනි හෙවත් කන්නාක්මෙනි–(වැදිගැනුන්ගේ)ගමනට පැරැදි–හංස සමූහයා නොහොත් හංසාඞ්ගනාතොමෝ–වනයෙහි එල්වලට පැමිනි පේස–කොකිල සමූහයා විසින්–(වැදි ගැනුන්ගේ) කොන්ඩාවල පැහැය තමන්ට සමාන පැහැය ඇත්තේයයි කෝපයෙන් හඬන්නාක්මෙනි.

57 සරා වසන් කරැ තුටු මල් කැකුළු යෙ න
අරා කැලෑතුරුවල උන් රිසින් කා න
ගිරා කැලැන් දැක නැමුනෙව් කරල් ග න
පුරා ත දෙල ඇල් කෙත්වල කෙළ යෙහෙ න

57 සරාවසන්කරැ, සවරාවසානයකොට; මල්කැකුළුයෙන, මාලාකලිකායෙන් හෙවත් පුෂ්පකුඩ්මලයෙන්; තුටු, තුෂ්ටවූ; කැලෑතුරුවල, අරණ්‍ය වෘක්ෂයන්හි නොහොත් වනයෙහි වෘක්ෂයන්ට; අරා, ආරූඪව; කනරිසින්, ඛාදනය කරණ රුචියෙන් හෙවත් භක්ෂණය කරණ ඊප්සාවෙන්; උන්, නිශද්‍යකලාවූ; හෙවත් උන්නාවූ; ගිරාකැලැන්, කිර සමූහයන්; දැකැ, දෘශනයකොට; නැමුනෙව්, නම්‍රවූවාක්මෙන්; හෙවත් අනු අවනතවූවාක්මෙන් (පවත්නාවූ) කරල්ගණ, සශ්‍යමඤ්ජරී සමූහ ඇත්තාවූ; නොහොත් කරල් ගණ, සශ්‍යමඤ්ජරියෙන් ඝණවූ; ඇල්කෙත්වලැ, ශාලික්ෂෙත්‍රයන්හි; තදෙල, තාගේ දෙගලය; පුරා, පූරණයකොට; යෙහෙන්, යහපත් පරිද්දෙන්; කෙළ, ක්‍රීඩාකරව.

"හඬා අවසානකර–මල් කැකුළුවලින් නොහොත් මල්වලින් හා කැකුළු වලින් සතුටුවූ–වනයෙහි වෘක්ෂයන්හි නොහොත් වනයෙහි වෘක්ෂයන්ට නැගී බාස්සිනියා කරණු කැමැත්තෙන් හෙවත් කනුකැමතිව–උන්නාවූ ගිරා සමූහයන් දැකලා බයින් නැමුනාක්මෙන් කරල් සමූහ ඇත්තාවූ නොහොත් විකරල් වලින් ගහණවූ–ඇල් කෙත්වල–තාගේ ආසාව (කැමැත්ත) සම්පූර්ණකොට–යහපත් ආකාරයෙන් සෙල්ලම්කරව".

58 අ යා නෙත් බලන රුසිරි * අන ගිය
නොයා දෙන බැහැරවුවන් සම ගිය
කි යා සරන † ඇල්ගෙ විලිය ලිය ගිය
තොයා සඹද ඒ අසමින් නොලැ ගීය

58 නෙත්අයා, නෙත්‍ර උන්මීලනයකොට; බලන, (ලෝකයා විසින්) නිරීක්ෂණය කරණු ලබන්නාවූ; අනගිය, අනඝවූ හෙවත් අගය කිය නොහැක්කාවූ; රුසිරි, රූපශ්‍රී ඇත්තාවූ; සමගියවූවන්, සමඞ්ගීභූතවූවන් හෙවත් එක්

58 * "රුසිරු" පිද–† "සරණ" පිද.

වුවත්; බැහැර, බාහිරයට; නොයාදෙන, යානොදෙන්නාවූ හෙවත් ගමනය කළ නොදෙන්නාවූ ඇල්ගෙවිලිය, ශාලිගොපකාඞ්ගනාවෝ; ලියගිය, ලයාන්විත ගිතිකාවන්; කියා, කථනයකොට නොහොත් කථනයකෙරෙමින්; සරත, සඤ්චාරණයකෙරෙත්ය; සබඳ, මිත්‍රය; ඒ අසමින්, ඒ ගිතිකා ශ්‍රවණයකෙරෙමින්; නොලැගිව, ලග්ණනොව; නොයා, නෝ ගමනයකරව හෙවත් ප්‍රයානයකරව.

(ලෝවැස්සන් විසින්) ඇස්ඇර බලනු ලබන්නාවූ-අගයකළ නොහැකි (මනා) රූපශ්‍රී ඇත්තාවූ-සමීපයට පැමිණියවුන් (ඔවුන්දෙසම බලා ඉන්නවාමිස) බැහැරකට යන්ට නොදෙන්නාවූ (ස්වභාව ඇති) ඇල් ගොවින්ගේ සත්‍රිහු ලතාඇති හෙවත් හොඳ තාල ඇති ගිතිකා කියමින් හැසිරෙත්ය-මිතුර ඒ ගිතිකා නාද අසමින් එහි නොඇලී උඹ ගමන්කරන්.

59 එ තැ නි න් නයන විලිකුන් කොම්වැලැ සැ ‌ ‌ දුනු
සො බ ම න් එ ඇල් ගෙවියෝනන්ගේ දි ‌ ‌ ලුනු
පැ හැ ස න් දසන් වරණට සෙසිනි පැරැ ‌ ‌ දුනු
වි ල සි න් දිසිය ගෙලෙවැල් ලාගෙණ එ ‌ ‌ ලුනු

59 එතැනින්, ඒ ස්ථානයෙන්; නයන, නාගමනය කරණකල්හි; වැලැ, ලතාවන්හි; සැදුනු, සජ්ජිතවූ; විලිකුන්, පරිණතවූ; කොම්, බිම්බඵලයෝතුම්බ (කෙසේද) සොබවන්, සොභමානවූ; එ ඇල් ගෙවියෝනන්ගේ, ඒ ශාලිගොපිකාඞ්ගනාවන්ගේ; දිලුනු, දීප්තිමත්වූ; පැහැසන්, ප්‍රභාවෙන් සඤ්ජනනවූ; දසන්වරණට, දන්තාවරණයට; පැරැදුනුසෙසිනි, පරාජිතවූහෙයින්; ගෙලෙ, ග්‍රීවයෙහි; වැල්ලාගෙණ, රජ්ජුන්බන්ධාගෙණ; එලුනුවිලසින් ඕලම්බිතවූවන්ගේ ලීලාවෙන්; දිසිය, දෘශ්‍යමානවෙත්ය.

"ඒ කියනලද තැනින්-නායන කාලයෙහි ලතාවන්හි හෙවත් වැල්ලව සැදුනාවූ-පැසී ඉදී එල්ලී තිබෙන කොම්වැල ගෙඩි කෙසේද කීවොත්-සොභමානවූ හෙවත් සිත් සතුටුකරන්නාවූ-ඒ ශාලි ගොපිකාඞ්ගනාවන්ගේ දිලිසෙන්නාවූ කාන්තියෙන් ගැවසීගන්නාලද්දාවූ—තොල්වලට පැරදුනු හෙතුවෙන් (ඉතින් අපි ඉන්නේ කුමකටද කියා) බෙල්ලේ වැල් ලාගෙණ එල්ලුනවුන්මෙන්-දකින්ට ලැබෙත්ය.

60 රුකු ඝිම් සිටිනදී ලිය ලිය ගෙණැ වෙත ‌ ‌ ට
දු කු දී සාමු වහුයෙහි පැනැ පැනැ හිස ‌ ‌ ට
එ කු වන් වෙසෙස් ඇතිවන වනපෙහි නෙපි ‌ ‌ ට
ද කු ගොස් ඉසුරු බර මනනදන කලුනො ‌ ‌ ට

60 රුක්ගිම්, වෘක්ෂ නමැති ස්වාමීන් විසින්; ලියලිය, ලතා නමැති කාන්තා වන්; * වෙතට, සමීපයට; ගෙණැ, ග්‍රහණයකොට; සිටියදී, ස්ථානයකරණ කල්හි; සාමුවගු ශාඛා මෘගයෝ තුමූ; හිසට, ශීර්ෂයට; පැනැ පැනැ, ස්කම්පනය කොට කොට හෙවත් ප්‍රස්කන්දනය කොට කොට; දකුදී, දුඃඛ දෘනය කොට; යෙති, ගමනයකෙරෙත්; එකුවන්, නිරන්තරයෙන්; වෙසෙස්, විශිෂ්ටය; (විචිත්‍රය) නොහොත් විශෙෂය; ඇතිවන විද්‍යමානවන්නාවූ, වනපෙති නෙපිට, වන පඞ්ක්තියෙන් අපරභාගයට; ගොස්, ගමනයකොට; මනනඳන, මනොනන්දනය කරන්නාවූ; ඉසුරුබර, ඓශ්වර්‍ය්‍යයෙන් භාරවූ–නොහොත්–ඉසුරුබර, ඓශ්වර්‍ය්‍ය භාරයෙන්–හෙවත් ඒ ඉසුරු සමූහයෙන්; මිනනඳන, චිත්තානන්ද කරන්නාවූ; කලුතොට, කාලතිර්ථය හෙවත් කලුතොට නම් ප්‍රදෙශය; දකු, දර්ශනයකරව–

"රුක් නමැති හිමියන් විසින් වැල් නමැති ලියන් ලඟට රැගෙණ සිටිද්දී වඳුරෝ මස්තකයට හෙවත් මුදුනට පැන පැන ගමන්කෙරෙත්ද–නිතර විසිතුරු ඇතිවන්නාවූ නොහොත් වෙනස ඇතිවන්නාවූ–වනපෙතින් එපිට හට ගොසින් සිත සතුටුකරණ ඉසුරෙන් බරවූ නොහොත් ඉසුරුබරින් සිත් සතුටුකරන්නාවූ කලුතරනම් ප්‍රදෙශය දකපන්.

61 ස ම න ල ගිරි ගිජිඳු දිය ගණුව සමුදු ර
දි ඟු ක ළ සලෙල දිඟු සොඬ සිරි පැ නිතො ර
රැ ලි ර ල පෙළින් බබලන කළුගඟිනෙත ර
ඔ ල මො ල නොවී පවනින් කර පියාස ර

61 සමනලගිරි, සමන්තකූටපර්වත නමැති; ගිජිඳු, ගජෙන්ද්‍රයා විසින්; සමුදුර දිය, සමුද්‍ර ජලය; ගණුව, ග්‍රහණයකරණුපිණිස; දිඟුකල, දීර්ඝකරණ හෙවත් ප්‍රසාරණය කරණලද්දාවූ; සලෙල, ලීලා සහිතවූ; දිඟු, දීර්ඝවූ; සොඬ; සුණ්ඩයාගේ; සිරි, සොභාව; නිතොර, නිරන්තරයෙන්; පැ, ප්‍රකාශකළාවූ, රැලිරලපෙළින්, රැලියෙන් හා තරඞ්ග පඞ්ක්තියෙන්; බබලන, භ්‍රාජමානවන්නාවූ; කළුගඟින්, එනම් ගඞ්ගාවෙන් හෙවත් ක්‍රිෂ්ණ ගඞ්ගාවෙන්; එතෙර, පාරිමතීරයට; පවනින්, මාරුතයෙන්; ඔලමොලනොවී, චණ්ඩාති චණ්ඩනොව හෙවත් දුඃඛදුඃඛ ප්‍රාප්තනොව; පියාසරකර, පක්ෂප්‍රසාරණය කරව හෙවත් පක්ෂයන් කරණකොටගෙණ චරණයකරව–

"සමනලගිරි නමැති ඇත් රජු විසින් මුහුදේ දිය ගැණීම පිණිස දිඟුකරණ ලද ලෙල්දීම් සහිතවූ–දික්වූ සොඬවැලක සොභාව නිතර පෑවාවූ (දිය) රැලි යෙන් හා රලපෙලින් බබලන්නාවූ කළුගඟින් එගොඩහට සුලඟින් දැඩි දුකට නොපැමිණ පියාපත් කරණකොටගෙණ ගමනයකරන්.

---

* 60 ලියලිය; ලතානමැති කාන්තාවෝ–

62 ම ද න  දුවන් නිවෙසට වදිනැ දිනැ පෙ ර
දු ල න  වනෝර රන් රඹකද අග සොඳු ර
රු දු න  ලකල් වැටුපෙව් දනිනි මනහ ර
සි පි න  දෙතෙර ලද අඟනන් බල මිතු ර

62 මදන, මන්මථයා විසින්; දුවන්, ජඝන නමැති; නිවෙසට, නිවාසයට; වදින, ප්‍රවිෂ්ටවනු ලබන්නාවූ; පෙරදින, පූර්වදිනයෙහි; දුලන, දිලිසෙන්නාවූ; සොඳුර, සුන්දරවූ; වනෝර, ව්‍රණහාරු නමැති; රන්රඹකඳ අග, ස්වර්ණ රම්භාස්කන්ධාග්‍රයෙහි; රුදුන, රජිතවූ නොහොත් රජමානවූ; ලකල්, අලඞ්කෘතවූ; වැටුපෙව්, ප්‍රදීප ශිඛ වැනිවූ; දනිනි, ජඞ්ඝාවෙන්; මනහර, මනොඥවූ; දෙතෙර, උභයතීරයෙහි; සිපින, ස්ථානයකරන්නාවූ; ලද, තරුණවූ; අඟනන්, අංගනාවන්; මිතුර, මිත්‍රය; බල, නිරීක්ෂණයකරව.

“අනංගයා විසින් උකුල් නමැති වාසස්ථානයට හෙවත් ගෙටවදිනු ලබන්නාවූ පළමුවෙනි දවසෙහි හෙවත් පළමුකොට මල්වරවන දිනයෙහි * දිලිසෙන්නාවූ–ශොභාපත්වූ වටවූ කලවා නමැති රන් කෙසෙල්කඳ අග රුඳුනාවූ අලංකාර ඇත්තාවූ පහන්දල්ල හෙවත් පත්තුවෙන පහන්දැල්ල වැනිවූ සිහින් කකුලෙන් (කෙණ්ඩයෙන් මනොහරවූ හෙවත් සිත්කළුවූ–(ගංගා) ඉවුරු දෙකෙහි සිටින්නාවූ තරුණ ස්ත්‍රීන් මිත්‍රය බලාපන්.”

63 * ග ඳ වි ය  නොයන දිස්නාමෙන් කෙලෙස කු ල
ම ද වි ය  එතෙර ඉවුරස සැදි වෙහෙර දු ල
න ද වි ය  එහි සිය නෑ දකැ යනෙන කෙ ළි
රු ද වි ය  නොලැබැ නික්මෙව සකිසඳ කොම ල

63 ගඳවියනොයන, (උපහාර පුෂ්පාදීන්ගේ) සුගන්ධයවාතයට නොපැමිණෙන්නාවූ හෙවත් සුගන්ධය විනාශයට නොයන්නාවූ; කෙලෙසකුලමෙන්, කෛලාසකූටය පරිද්දෙන්; දිස්නා, (ශ්වේතවර්ණයෙන්) දිශ්‍යමානවන්නාවූ; මදවිය, මදවයස් ඇත්තාවූ; දුල, ජ්වලිතවන්නාවූ හෙවත් දීප්තිමත්වූ; වෙහෙර, විහාරයක්තෙම; එතෙර, පාරිම්තීරයෙහි; ඉවුරස, ආලි සමීපයෙහි හෙවත් තීරාසන්නයෙහි; සැදි, සැදීතවූ; නොහොත්–එතෙර, පාරිමතීර යෙහි; ඉවුරස, ආලි සමීපයෙහි; සැදී, සැදීතවූ හෙවත් සදනලද්දවූ; වෙහෙර, විහාරය; දුල, දීප්තිමත්ය; එහි, ඒ විහාරයෙහි; කෙළ, ක්‍රීඩාකොට; යනෙන, ගමනාගමනය කරන්නාවූ; සියනෑ, ස්වකීය ඥාතීන්–නොහොත්–ස්වකීයයන් හා ඥාතීන්; දකැ, [illegible]; නදවිය, නන්දනව හෙවත් සන්තුෂ්ටව, රුදවිය; (ඔවුන් විසින්) [illegible]; නොලැබැ; ලබ්ධනොකොට; කොමල, [illegible]; නික්මෙව, නිෂ්ක්‍රාන්ත වෙව.

* ගැනැනු [illegible] වසප් මංගල්‍යය පිණිස කෙසෙල් කඳන් දෙරකඩ [illegible] එහි අග පහන් දල්වමි සිරිතක්ල.

63 * ගදවියනොයන, ගදප්‍යට නොගියාවූ හෙවත් උපන් පසු නොයන ලද්දවූ–උපන්නට පස්සෙ නොගියාවූ යන තේරුමයි–සඳවිය නොයන–ගඳ විය නොකළ–හදවිය නොකන–සිද–සමහර.

("ශ්‍රද්ධාවන්තයන් විසින් පුදනලද මල්සුවඳ ආදිය නිතර පවත්නාහෙයින්) සුවඳනැත්ති නොයන්නාවූ-යොවත් සුවඳ නිතර පවත්නාවූ-කෙලෙස්කුල පරිද්දෙන් (හොඳ සුදුපැහැයෙන් යුතුව) පෙනෙන්නාවූ (අලුත සාදනලද හෙයින්) මද වයස් ඇත්තාවූ-එගොඩහ (ගඟේ) ඉවුර සමීපයෙහි සාදනලද දාගැබ හෙවත් විහාරය දිලිසීම් ඇත්තේය-ඒ විහාරයෙහි ක්‍රීඩාකර යන එන (තුඹේ) සඞ්කීයයන් හා ඤාතීන් දකලා (සතුටුව ඒ ඤාතීන් හා සඞ්කීය යන් විසින් රැඳවීමට උත්සාහකලත් [illegible]) රැඳීම ලබන්නේ නැතුව මොලොක්වූ උතුම් මිතුරෙ නික්මියන.

64 එක සුරඟන පැහැසර රුසිරෙන් දු ල්ල
එක එක බසින් වඩවන සලෙලුන් ලො ල්ල
සක එක සකින් දිටු සරලන සිව්මැ ල්ල
දක හොලසව පරෙවිඳු සඳ කලමු ල්ල

64 සුරඟණ එක, සුරඟනාවන් හා ඒකාකාරවූ; පැහැසර, ප්‍රභාසාරවූ; හෙවත් මහත් ප්‍රභා ඇත්තාවූ; දුල්ල, දීප්තිමත්වූ; රුසිරෙන්, රූපශ්‍රීයෙන් යුක්තවූ; එක එක බසින්, ඒක ඒක වචනයෙන; සලෙලුන්, සල්ලාලයන්ගේ; ලොල්ල, ලොලත; වඩවන, වර්ධනය කරවන්නාවූ; සක, චක්ෂුවගේ-නොහොත් චක්ෂුෂවෙහි; එකසකින්, ඒකාංශයෙකින්; දිටුසර, දිෂ්ටි නමැති සැරයන් හෙවත් බාණයන්; ලන, හෙලන්නාවූ; සිව්මැල්ල, සුඛුමාලිනීන් ගෙන් යුක්තවූ, කලමුල්ල, කලම්බුල්ල නම් ගාමය; දක, දශීනයකොට, පරෙවිඳුසඳ, පාරෙවතෙන්ද්‍රොත්තමය; නොලසව, අනාලසව.

"දෙවඟනන් වැනිවූ (ඒකාකාරවූ) මහත් කාන්ති ඇති දිලිසෙන්නාවූ-රූපශ්‍රීයෙන් යුක්තවූ-එක එක වචනයකින් ඉන්ද්‍රියන්ගේ ආසාව වඩවන් නාවූ ඇසේ එක අංශයකින් හෙවත් කොණකින් දිෂ්ටි නමැති ඊතල් හෙලන් නාවූ හෙවත් විදින්නාවූ සිව්මැලි අඟනන්ගෙන් යුක්තවූ-කලමුල්ල නම් ගම හෙවත් කලපුමුල්ල නම් ප්‍රදෙශය දක-පරෙවියන්ට උතුම් පරෙවිය ආලසී නොව.

65 ස ම ද අනඟ රඟ දෙන වැලිතලා ර ස
නොම ද නෙරලුතුරු සෙවනනැ මග දෙප ස
න ස ද ලෙසට සැතපී මාවතට බැ ස
නෙතැද පිඩන පය්‍යාගල සිරි විල ස

65 * සමද, මද සහිතවූ; නොහොත්-සමද, සමෙමාදයෙන්; අනඟරඟ, දෙන, අනඞ්ගරඞ්ග දානයකරන්නාවූ; නොහොත්-අනඟ, මන්මථයාට (අනඞ්ගයාගේ) රඟදෙන, රඞ්ගදානය කරන්නාවූ; වැලිතලාරස, වාලුකා

65 * සමද, සමෙමාදනීයවූ-සන්තුෂ්ටවූ-සුවඳ සහිතවූ-යනාදි වශයෙන්ද අරුත් කියහැකි.

සඵලරාශි ඇත්තාවූ; මගදෙපස, මාර්ගයාගේ උභය පාර්ශ්වයෙහි; තාම්‍ද, අමන්‍දවූ හෙවත් බොහෝවූ; තෙරලතුරු, නාලිකෙර වෘක්‍ෂයන්ගේ; සෙවන තැ, ඡායාන්තරයෙහි; නැඟදලෙසට, නාගේන්‍ද්‍රයවූ පරිද්දෙන්; සැතපි, සන්තර්පිතව; මාවතට, මහාපථයට; බැස, අවතීර්ණව; පස්යාගලු, පස්යාගල නම් ග්‍රාමයෙහි; ස්රිවිලස, ශ්‍රීවිලාසය; නෙතැ, නෙත්‍රයෙහි; ඇඳැ, අඤ්ජනය කොට; වඩන, ප්‍රධානයකරන් හෙවත් වඩින්න.

මත්විම් සහිතවූ නොහොත් සතුටින් අනංගයාගේ හැඩිම දෙන්නාවූ වැලි තලා සමූහ ඇත්තාවූ මග දෙපසෙහි බොහෝවූ නෙරළු රුක් හෙවත් පොල් ගස් සෙවෙනෙහි නාගයන් හිතේගැටියට සැතපි (පිබිද) මහ මගට බැස පස්යාගල නම් ගමෙහි සිරිවිලාසය හෙවත් ආකාරය ඇසෙහි ඇඳගෙණ හෙවත් මනානැතිනොවන ආකාරයෙන් හොඳින් ඇසින් බලාගෙණ වඩින්න.

66 දු ල ය මල් සැරය ලැබැගෙණැ මල් සැ විව
මු ල ය හිඳැපු ලුපු නොපැවැතිරි විහ විව
ලොලය වඩන අසමින් ලියගි රැ විව
ප ල ය බලාගෙණ මත්ගොණ කල රැ විව

66 මල්සැවිව, මාලාසාධකයාගේ; දුලය, දීප්තිමත්වූ; මල්සැරය, පුෂ්පබාණය; ලැබැගෙණ, ලබ්ධකොටගෙණ; රිවිහවිව, සූර්‍ය්‍යාතපය හෙවත් සූර්‍ය්‍යරශ්මිය; නොපැවැති, ප්‍රවෘත්තිනූවූ; පුලුපුමුලය, නාලිකෙර වෘක්‍ෂමූලයෙහි; ඉඳ, වාශයකොට; ලොලයවඩන, ලෝලවර්ධනයකරන්නාවූ; ලියගීරැවිව, ලයාන්විත ගීතිකාරාවය-නොහොත්-ලිය, කාන්තාවන්ගේ; ලොලය වඩන, ලෝලවර්ධනයකරන්නාවූ; ගිරැවිව, ගීතිකාරාවය; අසමින්, ශ්‍රවණය කෙරෙමින්; කලරැවිව, පාරාපතය; මත්ගොණ, මත්ගොණ නම් ග්‍රාමය; බලාගෙණ, නිරීක්‍ෂණයකොටගෙණ; පලය, පිටත්වෙව.

අනංගයාගේ දිලිහෙන්නාවූ විසිතුරුවූ මල් ඊතග ලබාගෙණ-සූර්‍ය්‍යරශ්මිය නොපවත්නාවූ පොල්රුප්පේ හෙවත් පොල්ගස්සෙවනේ වාශයකොට ආශාවඩන්නාවූ නොයෙක් තාලඇති හොඳ ගීතිකා නාදය නොහොත් ලියන්ගේ ගීතිකා නාදය අගමින් පරෙවිය මත්ගොණ නම් ගම නොහොත් මත්ගොණ නම් ප්‍රදෙශය අවලොකනයකොටගෙණ පිටත්වෙයන්.

67 * අ රා අ ත ය පැනැ අඹරා මුගුරු හෙ ල
බො රා ම ත ය නාත් දෙඩුමෙන් කාලවිකා ල
පු රා මි ත ය අභවන මොල බඹුරු කැ ල
ප රා ප ත ය දකු පෙරමනැ බේරුව ල †

67 * ආරාඅතය—බෝරා-පුරා-පාරා-සිද-† බේරුගල-තැල-සිද-තිබේ—‡ බඹුරු-බර්බර-කපටක-සිද කියත්-68 a අභතන්-රඟදෙන-සමහර-එකල අංගනාවන් විසින්—රංගදනය කරණු ලබන්නාවූ—රඟදෙන, රංගදානය කරණ කල්හි-සිද හැකි.

67 හෙලමුගුරු, හෙල්ල මුද්ගරයන්; අතැයූ, හසනාසව; අරා, ආරූඪ කොට; පැනැ, ප්‍රසාරණයකොට; අඹරා, ආවර්තනයකොට; බොරමනස; බොහෝවූ සුරාමත්තායෙන් යුක්තවූ; නත්දෙබුමෙන්, නානාවිධ කර්තනයෙන්; කලවිකල, ආකෘතිවිකෘතිප්‍රාප්තවූ හෙවත් කිලිවිකලවූ; පුරාමැනය, පූර්ණීතය හෙවත් අධිකවූ මැත භාවය; අඟවන, සංඥාකරවන්නාවූ; චොල, චණ්ඩවූ; බඹුරුකැල, පුෂ්පන්ධක සමූහයා ඇත්තාවූ; ‡ පෙරමගැ, ප්‍රතිපථයෙහි; බෙරුවල, බෙරුවල නම් ග්‍රාමය; පරාපතය, පාරාපත නම් පක්ෂියා; දකු, දර්ශනයකරව.

හෙල්ලදමුගුරුද අතට පමුනුවා හෙවත් අතට රැගෙණ (ඉදිරියට) පැන අඹරවා (අමාරලා) බොහෝවූ සුරාමතින් නොයෙක් ආකාර වචන දෙඩීමෙන් ශුභවූ (යහපත්) කාලය (අයහපත්) විකාරකාලයක්වූ (ඇතුවට වැඩියෙන්) සම්පූර්ණකොට (කට) මැනකම අඟවන්නාවූ (එනම්) –පූර සාරම–පූර්වම නැති බලපුලුවන්කම් අඟවන්නාවූ) චණ්ඩවූ (කාමභෝගීන්ගේ සෙනසුන්වල අතුරණලද) මල් හා වර්චස් පහකරණහෙයින් පුෂ්පන්ධක නම්වූ බඹුරු සමූහයා ඇත්තාවූ (උභයත) ඉදිරිමාර්ගයෙහිවූ බෙරුවල නම් ග්‍රාමය පරෙවිය දකපන්.

68 ර න් තැ පි අයුරු තුඟු පින් පියයුරු උදු ල
ම න් අ පි කරණ අඟනෝ රඟදෙත ඉපි ල
උ න් සැ පි බලා සිටි සලෙලුන් නොපෑ ඇ ල
බෙ ම් තො පි නෙතෙර සැතපෙව් කාලි කෝවි ල

68 රත්තැපි අයුරු, ස්වර්ණතට්ටකාකාරවූ; තුඟු, තුඞ්ගවූ හෙවත් උච්චවූ; පින්, පීනවූ; උදුල, උජ්ජ්වලිතවූ හෙවත් දිලිසෙන්නාවූ; පියයුරු, පයෝධරයන් ඇත්තාවූ; මන්අපිකරණ, මනොභිලාෂා කරන්නාවූ හෙවත් චිත්තාසාවඩන්නාවූ; නොහොත් සිත්සතුටුකරන්නාවූ; අඟනෝ, අඞ්ගනාවෝ; ඉපිල, උත්පතිතව හෙවත් ඉල්පී; රඟදෙත, රංගදානයකෙරෙත්ය, උන්සැපි, ඔවුන්ගේ සංස්ථානය හෙවත් ස්වභාව; බලා, අවලොකනයකොට; ඇලැනොපෑ, ආවර්ජනයනුවූ හෙවත් ඇලය ප්‍රකාශනොකලාවූ–නොහොත් ඇලය ප්‍රකාශනොකොට; සිටි, ස්ථානයකලාවූ; සලෙලුන්, සල්ලාලයන් ඇත්තාවූ; බෙම්තොපින්, භීමතීර්ථයෙන්; එතෙර, පාරිමතීරයෙහිවූ; කාලි කෝවිල, එනම් කෝවිලෙහි; සැතපෙව, සන්තර්පිතවෙව.

රන්තැපිවැනිවූ–උස්වූ පිරුණාවූ දිලිසෙන පයෝධරයන් ඇත්තාවූ–සිතේ ලෝබඇතිකරණ–ස්ත්‍රීහු (දීයෙහි) ඉලිප්පී රඟදෙත්ය (සෙල්ලම්කෙරෙත්ය) ඔවුන්ගේ ආකාරය බලා පැත්තකට ගැරෙන්නේ නැතුව (ඔවුන්දෙසම බලා) සිටිනාවූ ඉලන්දාරීන් ඇත්තාවූ බෙම්තොටින් එතෙරහිවූ–කාලිගේ කෝවිලේ සැතපෙන්.

69 එත දද රද රද එගුවන වාසයට *
අඳුරු රුපුන් වන් සඳ වන වාසයට
ගොසින් තොසින් බෙම්හොම වන වාසයට
වදු මිතුරිඳු රැ දිනැවන වාසයට

69 දදරදරද, විජරාජනමැති රාජයා; එගුවන, ඒ ගගණනමැති; වාසයට, වාසස්ථානයට නොහොත් එගුවන, ඒ ගගණයෙහි; වාසයට, වාසය පිණිස; එත, ආගමනයකරණ කල්හි; අඳුරුරුපුන්, අන්ධකාරනමැති ශත්‍රෘන් වනවාසයට, විරහවාශයට හෙවත් විප්‍රවාසයට; (වාසයකිරීමෙන් වියොගයට) වන්සඳ, පැමිණිකල්හි; රුදිනැවන, රාත්‍රිදිනයෙහි වන්නාවූ, වාසයට; වාසය පිණිස; තොසින්, තොෂයෙන්; ගොසින්, ගමනයකොට; බෙම් තොට, හිමතීර්ථයෙහි; වනවාසයට, වනවාසනම් විහාරයට, මිතුරිඳු, මිත්‍රෙන්ද්‍රය; වදු, ප්‍රවිෂ්ටවෙව…

චන්ද්‍රයානමැති රජහු ඒ (ප්‍රදෙශයෙහි) අහස නමැති ගෙට නොහොත් ඒ පලාතේ අවකාශයෙහි විසීම පිණිස එන කල්හි අඳුරුනමැති සතුරන් (සිටිතැනින් වෙන්වීමටහෙවත් සිටිතැන්වල නැතුව අඳුරු, දුරුවූකල්හි රෑ දවසෙහි පැමිනෙන්නාවූ වාසය පිණිස (රුනැවතීමට) සතුටින් ගොසින් බෙම්තරනම්ගමේ වනවාස විහාරයට උතුම් මිතුරෙ පැමිනෙව.

70 එ ව් රිවි හිමි විල්කත කිරණ රත් ප ත
එ ව් කියවන බිහුරුව් වතිනි සිය ප ත
සි ව් දිගිනෙන එසඳෙහි නල සුවඳ යු ත
ය ව් මමිතුර වැඳැ මුනිඳුන් බැතින් සි ත

70 රිවිහිමි, සූර්‍ය්‍යනමැති ස්වාමියා විසින්; විල්කත, තටාකාම්බිකාවට, එව්, එවනලද්දාවූ; කිරණ, රශ්මිනමැති; රන්පත, ස්වර්ණපත්‍රය; සියපත, සතපත්‍රනමැති; වතිනි, වක්ත්‍ර (යෙන්)ය; කරණකොටගෙණ; කියවන එව්, කියවන්නාක්මෙන් බිහුරුව්, භ්‍රමරාවය (යම්කලෙක්හි) පවතීද, සුවඳයුත, සුගන්ධයෙන් යුක්තවූ; නල, මාරුතය; සිව්දිගින්, සතරදිසාවෙන්; එන, ආගමනයකරන්නාවූ; එසඳෙහි, තත්කාලයෙහි; මමිතුර, මාගේමිත්‍රය; සිතබැතින්, චිත්තභක්තියෙන්; මුනිඳුන්, මුනීන්ද්‍රයන්; වැඳ, වන්දනයකොට; යව්, ගමනයකරව…

හිරුනමැති හිමියාවිසින් විල්නමැති ගැනීට එවනලද රැස්නමැති රත්රන් පත්‍රය හෙවත් ලියමන නෙළුම්මල්නමැත් මුඛය කරණකොටගෙණ කියවන්නාක්මෙන් මීමැස්සන්ගේ නාදය (යම්වෙලාවෙක්හි) පවතීද සුවඳින් යුතුවූ සුලඟ සතරදිගින් එන්නාවූ ඒ (උදය) කාලයෙහි–මාගේ මිත්‍රය සිතෙහි භක්තියෙන් යුක්තව බුදුන් වැඳ ගමන්කරන්

* 69 "එතදදරද එගුවනවාසයට" සී:–සමහර එසේද හැකි

71 නි ල් ල  දු  ල ය වන පෙතැ මුවගණ කෙළි  ණ
වැල් ල  තු  ල ය මුතු රැසතුල මන නද  ණ
පු ල් ල  දු  ල ය කුසු මැති තුරු සුමු සොබ  ණ
නි ල් ල  පොල ය දකිමින් එපිටයා ගෙ  ණ

71 නිල්ලදුලය, නීලවර්ණයෙන් දීප්තිමත්වූ, වනපෙතැ, වනපඞ්ක්තියෙහි, මුවගණ, මෘගසමූහයා; කෙළින, ක්‍රීඩාකරණු ලබන්නාවූ; නොහොත් මුවගණ, මෘගසමූහයා; කෙළින, ක්‍රීඩාකරණු ලබන්නාවූ; වනපෙත, වනපඞ්ක්ති ඇත්තාවූ; මුතුරැසතුල, මුක්තාරාශිතුල්‍යවූ නොහොත් අතුල, ආභරණය කරණලද්දාවූ; මුතුරැස, මුක්තාරාශි පරිද්දෙන්; මනනඳන, මනොනන්දනය කරන්නාවූ; වැල්ලතුලය, වාලුකාස්ථලාභ්‍යන්තරයෙහි; පුල්ල, ප්‍රඵුල්ලවූහෙවත් පිපුනාවූ; දුලය, දීප්තිමත්වූ; කුසුමැති, පුෂ්පාන්විතවූ; තුරුසුමු, වෘක්ෂසමූහයෙන්, සොබන, ශොභනවූ හෙවත් බබලන්නාවූ; නිල්ලපොලය, නිල්ලපොලය යනනම් ඇති ප්‍රදෙශය, දකිමින්, දර්ශනය කෙරෙමින්; එපිට, (එයින්) එපිටගට, යාගෙණ, යාත්‍රාග්‍රහණය කොට ගෙණ

නිල්පැහැයෙන් දිලිසෙන්නාවූ-වනපඞ්ක්තියෙහි මුවසමූහයා විසින් සෙල්ලම්කරණුලබන්නාවූ මුතුරැසක්වැනිවූ නොහොත් අතුරණලද මුතුරැසක් මෙන් හිතසතුටු කරන්නාවූ-වැලිතලාව ඇතුලත-පිපුනාවූ දිලිසෙනමල් ඇති රුක්සමූහයෙන් බබලන්නාවූ-නිල්ලපොලය යන නම්ඇති ප්‍රදෙශය දකිමෙන් (එයින්) එපිටගට ගොසින්

72 ග ස්  බඩසෙය උස් ඉඩමෙව් ලඳ ලිය *  ළු
තො ස්  වඩවන ඇස් අඩදිටි නිකල් මු  ළු
දෙ ස්  සැඹමඳ බස් තුඹ තුඹ අම එ ක  ළු
ගො ස්  වැඩකරු කොස්ගොඩ සැනපෙව යහ  ළු

72 උස්ඉඩමෙව්, උච්චභවනාකාරවූ; ගස්බඩසෙය, වෘක්ෂාසනනජායාවන්හි; ලියඅළු, ලතාවැනිවූ; ලඳ, තරුණිවූ; ඇස් අඩදිටිනි, අක්ෂ්‍යාර්ධදෘෂ්ටියෙන්, තොස්වඩවන, තොෂවර්ධනය කරවන්නාවූ; තුඹතුඹ, තුණ්ඩයක්පාසා (පවත්නාවූ) සැඹදෙස්මඳ, චණ්ඩදෙෂයෙන් මඳවූ; අමඑකළු, අමෘතයහා එකාකාරවූ; බස්, වචනඇත්තාවූ; කල්මුළු, කාන්තාසමූහයා වසන්නාවූ; කොස්ගොඩ, කොස්ගොඩනම් ග්‍රාමයට; ගොස්, ගමනයකොට; වැඩකරු, වෘද්ධිකාරකවූ; යහළු, මිත්‍රය; සැනපෙව, සන්තර්පිතවෙව

* 72 "ලගලියළු"යි සමහර එකල ලන, (උඹමෙයන්නාවූ) සමීපයෙහි; උස්ඉඩමෙව්, උච්චභවනාකාරවූ; ගස්බඩසෙ වෘක්ෂමූලච්ඡායාවන්හි; ලියළු, ලතාවැනිවූ නොහොත් ලියළු, ලතාකුලයන් පරිද්දෙන්" යි අර්ථකියනහැකි.

(උඹසන මග සමීපයෙහි) උස්ගෙවල්වැනිවූ රුක් අසබඩ සෙවන් ඇති තැන්වල (හටගත්) වැල්වැනිවූ–තරුණියන් ඇත්තාවූ–ඇසෙහි අඩකින් හෙවත් එක්පැත්තකින් (හෙලන) දෘෂ්ටිසංඛ්‍යාත බැලීමෙන් සතුටුවඩවන් නාවූ–මුඛයක් පාසා (පවත්නාවූ) සැඩදෙසින් (වන්හි) දෙසින්මදැවූ අමෘත යවැනිවූ (කර්ණප්‍රිය) වචන ඇති ස්ත්‍රී සමූහයා වසනකොස්ගොඩ යන නම් ඇතිගමට ගොසින්–වැඩ සිදුකරණ මිතුරේ සැනපෙව හෙවත් සැනපියන්.

73 අ යු රු   තිසර තන බැඳ රන් පටින්   පටින්
මි යු රු   තෙපුල් තෙපලන ලිය කටින්   කටින්
සොඳුරු   සලෙළ මුළු දූතැ එන වටින්   පිටින්
මි තු රු   වඩින් මනහර වැලිතොටින්   තුටින්

**73** තිසර අයුර, හංසාකාරවූ; තන, පයොධරයන්; රන්පටින් පටින්, ස්වර්ණපට්ටයකින් පට්ටයකින්, බැඳ, බන්ධනයකොට; කටින්කටින්, කටිකටින්; මියුරුතෙපුල්, මධුරාලාපයන්; තෙපලන, කථනයකරණුලබන්නාවූ; ලිය, කාන්තාවන්; දූත, දර්ශනයකොට; වටින්පිටින්; හාත්පස බාහ්‍යයෙන්; එන, ආගමනය කරන්නාවූ; සොඳුරු, සුන්දරවූ; සලෙළුමුළු, සල්ලාල සමූහ ඇත්තාවූ; මනහර, මනොහරවූ; වැලිතොටින්, වැලිතොටනම් ග්‍රාමයෙන්; මිතුරු, මිත්‍රය; තුටින්, තොෂයෙන්; වඩින්, වඩින්න~

හංශයන්වැනිවූ පියයුරන් (වෙනවෙනම) රන්පටියකින් පටියකින් බැඳී මකොට කටිකටින් මිහිරි වචන කියනුලබන්නාවූ ස්ත්‍රීන් දූත වටපිට දිශා වලින් එන්නාවූ සොඳුරුවූ ඉලන්දාරි සමූහයාඇති මනහැරවූ හෙවත් සිත් ගන්නාස්වභාවඇති වැලිතරනම් ගමින් මිතුර සතුටින් ගමන්කරන්.

74 මැ ල ව   රිවි රැසින් සිව්මැලි තොපවෙ   රය
තු ල ව   මුතු පලක් මැදනිල් මිණි ග   රය
ග ල ව   සිලිල් සර තැස පැහැර බැහැ   රය
ලොලව   නොරඳ මහදම්පා මුව දෙ   රය

74 රිවිරැසින්, සූර්‍යරශ්මියෙන්; මැලව, මලානිකව හෙවත් මලානිකවූ හෙයින්; සිව්මැලි, සුබුමාලිවූ හෙවත් නිදුක්වූ; තොපවෙරය, තොපගේ ශරීරය; නිල්මිණිගරය, නිලමාණික්‍යහාරයෙක්හි නොහොත් නීලමාණික්‍යහාරයාගේ; මැද, මධ්‍යයෙහි; මුතුපලක්තුලව, මුක්තාඵලයක් සමානව; සිලිල්, සලිලයෙහි; ගලව, ගලිතව හෙවත් නිමග්නව, සැරතැස; ශ්‍රාන්ත භාවය, බැහැර, බාහ්‍යයට; පැහැරය, ප්‍රහාරණයකොට හෙවත් පහකොට; ලොලව, ලෝලව; මහදම්පා මුවදොරය, මහදම්පානම් නදීමුඛ ද්වාරයෙහි; නොරඳ රඤ්ජමානනොව~

රිවිරශ්මිකරණකොටගෙණ මලානිකවූ හෙයින් සිව්මැලිවූ (දුක්නැතිවූ සැපසේ වැඩුනාවූ) තොපගේ ශරීරය–නිල්මැණික් දමයෙක්හි (නිල්ම

ණික්වැලෙක්හි නොහොත් දමයන්තියගේ මැද බුතුඇටයක් සමානව–දියෙහි ගිලී–විඩාව (තලානතයනමන්ගේ ශරීරයෙන්) පිටතට පහකර ලෝබවී (අා සාවී) මාදම්පෙ කියන ප්‍රදේශයෙහි වෝදර නොපැවති (රඳන්නේනැතිව)

75 කමලැ ස   සමාගමවන සඳෙහි සිරිස   ද
මුහුල ස   ඉනී ගිලි කුසුමෙව් බහු ලැමැ   ද
ගහරැ ස   පෙනෙන ගුවනත සේරුස නොම   ද
අද හ ස   විලස සැදිතොටගමු වෙහෙර ර   ද

75 කමලැස, පද්මාක්ෂියා හා; සමාගමවන සඳෙහි, සංයොගවන කාලයෙහි; සිරිසඳ, ශ්‍රීකාන්තාවගේ; මුහුලස, ධම්මිල්ලය; ඉනී, බූතනව; බහු, ඒ පද්මාක්ෂියාගේ; ලැමද, හෘදමධ්‍යයෙහි; ගිලි, ගලිතවූ; කුසුමෙව්, පුෂ්පයන් පරිද්දෙන්; නොමඳ, අමන්දවූ හෙවත් බොහෝවූ; සේරුස, සෙවතරශ්මියෙන් යුක්තවූ; ගහරැස, තාරකාසමූහය; ගුවනත, ගගණයෙහි හෙවත් අාකාශයෙහි; පෙණෙන, දෘශ්‍යමානවනකල්හි; සැදි, සජ්ජිතවපවත්නාවූ හෙවත් සැරසුනාවූ; තොටගමුවෙහෙර, තිර්ථ ග්‍රාමවිහාරයෙහි; අදහසවිලස, අධ්‍යාසයවූ පරිද්දෙන්; රඳ, රජමානවෙව.........

විෂ්ණුහු සමග එක්වන කාලේදී ශ්‍රී කාන්තාවගේ (මල්දමාබැඳපු) කොන්ඩය ඉනිහෙවත් ලිහිල්වී ඒ විෂ්ණුගේ ලැපැත්ත මැද ගැලවී වැටුනුමල් මෙන් තාරකාසමූහය අාකාශයෙහි පෙනෙනකාලයෙහි සැරසී (අලඞ්කාරව) තිබෙන තොටගමු විහාරයෙහි උඹේ අදහසේහැටියට කැමති පරිද්දෙන් රඳන් හෙවත් නවතින්.

76 දිවයු රු   පෙන * පෙනෙන සිඳුඋරඟ ගෙළෙලඹ   ද
දිවයු රු   රතම්ණෙක සිරිසර පාතස   ද
දිවයු රු   සියනාත දෙව්හිමිඳුන් නමැ   ද
දිවයු රු   මගම වැදුයාගන් මිතුරු ස   ද

76 සිඳු, සමුද්‍රනමැති; උරඟ, නාගයාගේ; පෙන, ඵෙනනමැති; පෙනෙන, භොගානතරයෙහි නොහොත් භොගයෙහි; දිවිඅයුරු, ප්‍රදීපාකාරයෙන්; ගෙළෙ, කණ්ඨයෙහි හෙවත් ග්‍රීවයෙහි; බඳ, බඩවූ; රතම්ණෙක, රක්තමාණික්‍යයකගේ, සිරිසර, ශ්‍රීසාරය; දිවයුරු, සූය්‍ය්‍යයා; පාතසඳ, ප්‍රකාශකරණකල්හි; දිවයුරුසිය, සූය්‍යබිබසඥවූ; නාතදෙව් හිමිඳුන්, නාථදෙවස්වාමීන්‍ද්‍රයන්ට; නමැද, නමස්කාරකොට; දිවයුරුමගට, දිවාකරමාර්ගයට හෙවත් දිවාකරපථයට; වැදු, ප්‍රවිෂ්ටව; මිතුරුසඳ, මිත්‍රොත්තමය; යාගත්, යාත්‍රා ග්‍රහණයකරන්.........

මුහුදනමැති නාගයාගේ පෙනනමැති පෙණය ඇතුලෙන් හෙවත් පෙණයෙහි–පහණක්මෙන් කණ්ඨයෙහි බැඳිතිබෙණ රතුමැණිකක්හුගේ; ශ්‍රී

* 76 පෙනෙන–සමගර.

සාරය සූත්‍රයා දක්වනකාලයෙහි ආදිත්‍යබන්ධුවූ නාථදිව්‍ය ස්වාමිපුත්‍රයන්ට නමස්කාරකොට ආකාශයට පැමිණී උතුම් මිත්‍රයසාගත් හෙවත් ගමන් ගණිත්.

77 පෙත්මගැ දකුණු දිගැ-රත්තැඹිලි රත්නරඹා—
දුනුකේ කුසුම් රෝණතුල-එතරවයා මොලපුවෙන්.........

77 පෙත්මගැ, ප්‍රතිපථයෙහි; දකුණුදිගැ, දක්ෂිණාදිසාවෙහි; රත්තැඹිලි රත්, ස්වර්ණසත්තිරාරණ්‍යයන්; නරඹා, නිරීක්ෂණයකොට; දුනුකේ කුසුම්රොත්, ධනුකෙතකී හෙවත් රාජකෙතකී පුෂපරේණුන්; අතුල, ආස්තරිතවූ හෙවත් ආස්තරණයවතුලැබූවාවූ; මොලපුවෙන්, මොලපුවානම්ක්ෂුද්‍ර නදියෙන්; එතරව, උත්තාරිතව හෙවත් පාරිමතීරප්‍රාප්තව; යා, සාක්‍රාකර හෙවත් ගමන්කර.........

"ඉදිරිමාර්ගයෙහි දකුණුදිසාවෙහි රත්තැඹිලි වනයන්බලා දුනුකේමල් රෙණුවැටී ඇතිරිම වතුලැබූ මොලපුවයන නම්ඇති කුඩානදියෙන් හෙවත් ඔයෙන් එතරවී ගොයින්.

78 ලි ය න් කියන ගී විඳැමල් කඩින් කඩින්
ස සි න් සැදුනු වෙල්යා දූක මඩින් ගොඩින්
ක ම් න් ගොදුරු බැසැ මුංවතු බඩින් උඩින්
සෙමින් සිටම සකිමාවේ කඩින් වඩින්

78 මල්කඩින් කඩින්, පුෂ්පඛණ්ඩනයකෙරෙමින්; ඛණ්ඩනයකෙරෙමින්; ලියන්, කාන්තාවන්විසින්; කියන, කථනයකරණුලබන්නාවූ; ගී, ගීතිකා රසය; විඳැ, විඳනයකොට; මඩින් ගොඩින්, කදීමභූමියෙහිද ස්ථලභූමියෙහිද නොහොත් මඩින්ද ගොඩින්ද; සසින්, සශ්‍යයෙන්, සැදුනු, සජ්ජිතවූ හෙවත් සැරසුනාවූ; වෙල්යා, (එකාබද්ධවූ) යාවූක්ෂේත්‍රපඞ්ක්තීන්; දූකැ, දර්ශනයකොට; උඩින්, ඌර්ධ්වභාගයෙන්; බැසැ, අවතීර්ණව; මුංවතුබඩින්, මුද්ගවැකු ආසන්නයෙන්; ගොදුරු, ගොචරයන්; කමින්, ඛාදනයකෙරෙමින්, සෙමින් සිටම, අතුරිතව පැවතීමෙන්ම හෙවත් හෙමිහිටම; සකි, මිත්‍රය; මාවේකඩින්, මාවේකඩනම් ප්‍රදෙශයෙන්; වඩින්, වඩින්න.........

මල් කඩකඩා ස්ත්‍රීන් විසින් කියනු ලබන්නාවූ-ගීතිකාවන්ගේ රසයවිඳ මඩින්ද ගොඩින්ද සශ්‍යයෙන් සැදුනාවූ-වෙල්යායවල් දූක උඩින් බැහැලා මුංවතු අහබඩින් ගොදුරුකා හින්හැරේම මිතුරේ-මාවේකඩ කියන පලාතෙන් නික්මියන්.

79 ල ප් අඹුවෙ න් මීස සඳ සදිසි උවනි න
තෙප් කඹුවෙ න් මෙන් නෙතගිත් පහර දෙ න
ඔ ප් වැඹුවෙ න් ලිය සරිලිය දූකැසොබ න
සි ප් කඹුවෙ න් යා සැතපී යාද ස න

79 ලප්අඩුවෙන්මිස, ලාංඡනය ලාඤ්ඡනයෙයින් මිස; සඳසඳිසි, චන්ද්‍රයාසමාන වූ, උවතින, වක්ත්‍රයෙන් යුක්තවූ; තෙප්කඩුවෙන්වෙන්; තෙඩින්හා කඩුවෙන් පරිද්දෙන්; නෙතගින්, නෙත්‍රාග්‍රයෙන් හෙවත් නෙත්‍රකොටියෙන්; පහරදෙන, ප්‍රහාරදානයකරන්නාවූ; ඔප්වැඩු, ඔපයවඩිනයවූ; වෙන්ලියසරි, විෂ්ණුකාන්තාව සමානවූ. හෙවත් ශ්‍රීකාන්තාවවැනිවූ; සොබණ, සොභණවූ හෙවත් බබලන්නාවූ; ලිය, කාන්තාවන්; දුක, දශීනයකොට; සැතපී, සන්තර්පිතව; සිප්කඩුවෙන්, සිප්කඩුවනම් ග්‍රාමයෙන්; යාදසන, යහපත්දශීනීයය; යා, ගමනයකරව

"(සස) ලපය ලාඤ්ඡනයෙයින්මිසක් සඳවැනි මුහුනුවලින් යුතුවූ තෙබයන නම්ඇති අසිනා ආවුධවිශෙෂයෙන් හා කඩුවෙන්ද පහර දෙන්නාක්මෙන් නෙත්කොණින් පහරදෙන්නාවූ-ඔපයවැඩුනාවූ ශ්‍රීකාන්තාවවැනිවූ බබලන ස්ත්‍රීන්දුක සැතපි හෙවත් සැනසී සිප්කඩුව යන නම්ඇති ගමින් යහපත් දුකුම් කටයුතු තැනැත්ත ගමන්කරව

| | | |
|---|---|---|
| 80 සේ පෙ ලි නා | සුසැදුනු පොල්වතු කැ | ටි ය |
| සේ පු ලි නා | තල එන සන ගැටි ගැ | ටි ය |
| නේ ර ලි නා | යන නැව් සමුදුර වැ | ටි ය |
| මී කෙ ලි නා | කලැ වදු උඩුගල් පි | ටි ය |

80 සේපෙලිනා, ජායාපඞ්ක්තියෙන්; සුසැදුනු, සජ්ජිතවූ; පොල්වතුකැටිය, නාරිකෙලවස්තු සමූහඇත්තාවූ; සන, ඝනවයා; ගැටිගැටිය, ඝණ්ටනව ඝණ්ටනව හෙවත් ගැහැටි ගැහැටි; එන, ආගමනයකෙරන්නාවූ; සේපුලිනා තල, ශ්වෙතවාලුකාස්ථල ඇත්තාවූ; නේරලිනා, අනෙකතරංගයෙන්; සමුදුරවැටිය, සමුද්‍රයෙහි පතිතව; යන, ගමනයකරන්නාවූ; නැව්, නෞකාවන් ඇත්තාවූ; උඩුගල්පිගිය, උඩුගල්පිටිය යන (නම්ඇති ප්‍රදෙශයට) මීකෙළිනා කල, මධුපක්‍රීඩාසමයෙහි; වදු, ප්‍රවිෂ්ටවෙව

"සෙවන්පන්තිවලින් මනාව සැදුනාවූ පොල්වතු කැටි ඇත්තාවූ ඝණ යන් ගැටි ගැටි එන්නාවූ සුදුවැලිතලා ඇත්තාවූ-නොයෙක්රල කරණ කොටගෙණ මුහුදේවැටී යන නැව්ඇත්තාවූ-උඩුගල්පිටිය යන නම් ඇති ප්‍රදෙශයට මීමැස්සන් ක්‍රීඩාකරණ කාලයෙහි හෙවත් ඒ පැවැත්ම ඇති සැන්දෑකාලයෙහි (හවස) පැමිණෙව.

| | | |
|---|---|---|
| 81 අ ව ර | සයුර සර තුරු රැඳි සරෙව් | ර න |
| ප ව ර | දිනිඳුවට තම බිඟුරුසෙව් | ව න |
| ප ව ර | අන්ලියන් සසගින් වන නි | ය න |
| එ ව ර | ලගින් රත්ගම්මුනිඳු මැදු | ර න |

81 අවරසයුර, අපරසාගරනමැති; සරතුරු, සරසි අභ්‍යන්තරයෙහි හෙවත් තටාකාභ්‍යන්තරයෙහි; රැඳි, රජිතවූ; රතසරෙව්, රක්තපද්මයක්

වැනිවූ; පවර, උත්තමවූ; දිනිඳු, සූර්‍ය්‍යයාගේ; වට, හාත්පස්හි; තම, අන්ධ කාරය; නිතුරුසෙව්, භෘඞ්ගරාශියක් පරිද්දෙන්; වන, වනකල්හි; පවර, පාපිවූ හෙවත් කුඩුත්තවූ වලලෑහයන්; අත්ලියන්, අත්‍යකාන්තාවන්හා; සසඟින්, සං සංසර්ගයකරණ්ණකොටගෙණ නොහොත් සංසර්ගයපිණිස; තිය තවන, නිශ්චයවනු ලබන්නාවූ (නිමකරගන්නාවූ; යම් අවකාශකාලයක් ඇද්ද)එවර, තත්කාලයෙහි; රත්ගම්, රත්ගමනම්වූ ග්‍රාමයෙහි; මුනිඳුමැදුරත මුනීන්ද්‍රමන්දිරයෙහි; ලඟින්, ලග්ණවෙයන්.

අපරදිසාවෙහි සාගරය නමැති විලැතුලැ රැඳුනාවූරතුනෙළුම් මලක්වැ නිවූ උතුම්වූ සූර්‍ය්‍යයාගේවෙට-අඳුරැ මීමැසිසමූහයක්සේ පවත්නා කාල යෙහි නිඤ්චිත පුරුෂයන් තමහට අයිතිනොවන අන්කාතුන් සමග සංසර්ග යකරණ්ණකොටගෙණ නොහොත් සංසර්ගය පිණිස නියමිය රහසේ කතාකර ගැණීමට අවකාශ ඇතිවන්නාවූ ඒ සවස් කාලයෙහි රත්ගමය යන නමැති ගමෙහි මුනීන්ද්‍රයන්වහන්සේගේ මැදුරෙහි හෙවත් විහාරයෙහිලඟින් නවතීන්

82 තුඟුතර තරඟ අත්සුත් බමර මැම හි තී න්
ඉ දු වර ඉ නුවන යාහස කර. නඹර වි තී න්
සිය කර හිමිහු දෑකැරඟ නෙව් විලඹුම තී න්
මම්තු ර එසඳ වඩිනේ මැනවී ගුවන තී න්

82 නිතින්, නිත්‍යයෙන්; තුඟුතර, තුංගතරවූ; තරඟ, තරඞ්ගනමැති; අත්, හස්තයෙන්ද; බමර, භ්‍රමරනමැති; බැම, භෲයෙන්ද; සුත්, සුක්තවූ; විලඹු, නටාකාම්බිකානොමෝ; (යම්කාලයෙක්හි) ඉඳුවර, ඉන්දීවරනමැති; නුවන්, නෙත්‍රයන්; අයා, විවෘත්තකොට; නඹර, තාමරසනමැති; වතින්, වක්ත්‍ර යෙන්; හසකර, හාශ්‍යයකොට; සියකර, සතරංසිනමැති; හිමිහු, ස්වාමියා; දෑකැ, දර්ශනයකොට; මතින්, මත්තයෙන් හෙවත් සන්තුෂ්ටයෙන්; රඟනෙවි නෘත්‍යකරන්නියක්මෙන් යම්කාලයෙක්හිවේද; එසඳ, තත්කාලයෙහි; මම් තුර, මාගේමිත්‍රය; ගුවනතින්, ගගණාන්තරයෙන්; වඩිනේ, වඩින්න නො හොත්, වඩිනේ ගමනය කරන්නේවීනම් මැනවි, මනොඥයි.

"නිතර උස්වපවත්නා රලනමැති අතින්ද මීවැසිනමැති බැමයෙන්ද සුත් නවූ විල්නමැ ති අඹුනොමෝ (යම්වේලාවක මහනිල්මල් නමැති ඇස් ඇර නෙළුම් මල්නමැයි මුහුනින් සිනාසී සූර්‍ය්‍යනමැති හිමියාදැක සතුටින් මත්වී නටන්නියක් මෙන් යම්කාලයෙක්හිවේද එවේලාවට මගේ මිතුරේ ආකාශ යෙන් ගමනයකරන්නේවීනම් යහපත්වෙයි.

83 පො ල ඹා සපිරි සිරිලක්තුනු ව හේ යා
නෙ එ ඹා සුසැදි පුලපුල් මල් ව යේ යා
ස සො බා ගොනා ගෙහෙළකෙස් වැපී ර හේ යා
න ර ඹා පියාසරකර ගිමී ග ' හේ යා

83. පොලඹා, ප්‍රලොභනකොට නොහොත් ප්‍රලොභකරමින්; සපිරි, සම්පූර්ණවූ හෙවත් පිරුණාවූ; සිරි, සම්පත්තියෙන් යුක්තවූ; ලක්, ලඞ්කානමැති; තුනුවහෙයා; තන්වඞ්ගිය විසින් නොහොත්, තන්වංගියගේ; නෙලුඹා, නෙලුඹුකුසුමය හෙවත් කිංජපුෂ්පය; පුල, පුල්ලවූ; උපුල්මල්වගේයා, උත්පල පුෂ්පවර්ගය යනමෙයින්; සුසැදි, සුසජ්ජිතවූ, සසොබා, සොභාසහිතව, ගොතා හෙලූ, ග්‍රන්ථනයකොට හෙලනලද්දාවූ නොහොත් හෙලුවාවූ; කෙස්වැටිරහෙයා කෙශකලාපාකාරවූ; ගිම්ගහෙයා, එනම්ගංගාව හෙවත් ගිම්ගඟ; නරඹා, නිරීක්ෂණයකොට; පියාසරකර, පක්ෂයන් කරණකොටගෙණ චරණයකරව හෙවත් පක්ෂප්‍රසාරණයකරව නොහොත් පක්ෂප්‍රසාරණයකොට—

“(ලොකයා ලෝබ) සතුටුකිරීමෙන් පිරුණාවූ ඉසුරුඇති ලඞ්කානමැති ස්ත්‍රිය විසින් නොහොත් ලඞ්කාඞ්ගනාවගේ නෙලුම්මල්ය පිපුනාවූ උපුල්මල් වර්ග යනමෙයින් මනාව සැදුනාවූ බැබලීම් සහිතවූ ගොතා හෙලනලද කෙස්වැටියක ආකාර ඇත්තාවූ ගිම්ගඟ බලා පියාපත් කරණකොටගෙණ ගමන්කරව නොහොත් ගමන්කොට—

84 ස රා සොඳින් මහසයුරත මුලු ල් ලේ
පෙ රා රැගෙණැ රන් මුතු මිණි සිය ල් ලේ
ස රා තුබූමෙන් සල්පිල් උදු ල් ලේ
පු රා මෙසිරි දූකැ යාගන් ගා ල් ලේ

84. මහසයුරත, මහාසමුද්‍රයෙහි නොහොත් මහාසමුද්‍රයාගේ; මුලුල්ලේ; සියල්ල; සොඳින්, සෞන්දර්‍ය්‍යයෙන් හෙවත් සුන්දරාකාරයෙන්, සරා, සඤ්චාරණයකොට; රන්මුතුමිණි, ස්වර්ණමුක්තාමාණික්‍යය (යන), සියල්ලේ, සියල්ල, නොහොත් සියල්ලේ රන්මුතුමිණි, සකල ස්වර්ණමුක්තාමාණික්‍යයන්; පෙරා, පරිස්සාවනයකොට හෙවත් ගබ්රා; රැගෙණ, ග්‍රහණයකොට; සරාතුබුමෙන්, අලඞ්කෘතකොට තැබූ පරිද්දෙන්; උදුල්ලේ, උජ්වලිතවූ; සල්පිල්, ආපනයන්ගෙන් හෙවත් සල්පිලන්ගෙන් යුක්තවූ; ගාල්ලේ, ගාල්ලෙහි; (එනම් නුවරෙහි), පුරා, සම්පූර්ණවූ; මෙසිරි, මේ සම්පත්තිය හෙවත් අධිකවූ ධනය; නොහොත්; මෙසිරි, මේ සොභාව හෙවත් මේ දීප්තිය; දූකැ, දර්ශනයකොට; යාගන්, යාත්‍රාග්‍රහණයකරන් නොහොත් යාත්‍රා ග්‍රහණයකොට—

“මහසයුරෙහි හැමතැනම හොඳින් හැසිරී හෙවත් ඇවිද රත්රන් මුතු මැණික් (යන) සියල්ල පෙරා හැරගෙණ තැබූවාක්මෙන් දිලිසෙන්නාවූ කඩපිල්වලින් යුතුවූ(කඩපිල් ඇත්තාවූ) ගාල්ල යන නම් ඇති නුවරෙහි පිරුණාවූ මේ බොහෝවූ ධනය නොහොත් .මේ දීප්තිය දූන ගමන්ගණීන්”—

85 ස ල ග මී යු රු සහ යුරු සමතු ව න් නේ
ම ලු ග බම රු රැව් තුරු හිසැ සැදෙ ' න් නේ
ම ලු ග ලූ තු රු සහ තුරු ඉන් කර න් නේ
බ ල ග මී තු රු වි සි තුරු මීරිරු න් නේ

85. සලග, ශෛලාග්‍රයන්හි; මීයුරු, මධුරයන් විසින්ද; සහයුරු, සහකාර වෘක්ෂාග්‍රයන්හි; නේසම්තුවන්, අනේක කොකිලයන් විසිනද; තුරුහිසැසැ, (අන්‍ය) වෘක්ෂ මස්තකයෙන්හි වෘක්ෂමස්තකයෙක්හිවූ; මලග, පුෂ්පාග්‍රයන්හි,

බමරු, භ්‍රමරයන් විසින්ද; රව්දෙන්නේ, රාවදානයකරණ ලද්දේය; ඉන්, ඒ කරණකොටගෙණ, මලග, අනංගයාගේ; ලහුරු, මහත්වූ; තුරු සඝ, තූයඝී යට සමානභාවය; කරන්නේ, කරණලද්දේය; මිතුරු, මිත්‍රය; මිරිපැන්නේ, මිරිපැන්නනම් ග්‍රාමයෙහි; විසිතුරු, මේ ආකාර විචිත්‍රය, බලග, බලාගනුව—

"ගල්මුදුන්වල මොණරුන් විසින්ද මී අඹරුක් මුදුන්වල නොයෙක් කොවුලන් විසින්ද (සෙසු) රුක්මුදුනෙක්හි රුක්මුදුනෙක්හිවූ මල්අග මීමැස්සන් විසින්ද නදදෙන ලද්දේය. ඒ හෙතුවෙන් අනංගයාගේ මහත් තූයඝීනාදයට සමානභාවය කරණලද්දේය. මිතුර මිරිපැන්න නම් ගමේ (මේ ආකාරවූ) විසිතුරුබලාගන්"—

86 න ල වැ ද සසල සිහිලඹ රල ග ලා යා
ම හ න ද කරණ පලහෙළ වැලි ත ලා යා
මූ ව ර ද වගල ඉවුරසතුරු නි ලා යා
ස කි ස ද වඩින් ලනුමෝදර බ ලා යා

86. නලවැද, මාරුත ප්‍රවිෂ්ඨව; සසල, චංචලවූ; ගලායා, ගලායන්නාවූ; සිහිලඹරල, සිසිරාම්බුරාශි ඇත්තාවූ හෙවත් සීතලජල තරඞ්ගයෙන් යුක්තවූ, මහනදකරණ, මනොනන්දනයකරන්නාවූ; පළ, ව්‍යාප්තවූ හෙවත් පැතුරුණාවූ; හෙළ, ධවලවූ; වැලිතලායා, වාලුකාස්ථලයෙන් යුක්තවූ; ඉවුරස, ආලිසමීපයෙහි; මූවරද, මකරන්දයන්; වගල, වැගිරෙන්නාවූ; නිලායා, නීලවර්ණවූ; තුරු; වෘක්ෂයෙන් යුක්තවූ; ලනුමෝදර, ලනුමෝදරනම් (ග්‍රාම) ප්‍රදෙශය; බලායා, නිරීක්ෂණයකොට; සකිසඳ, මිත්‍රොත්තමය; වඩින්, ගමනයකරන්—

"සුලඟවැදීමෙන් චංචලව ගලායන්නාවූ සිහිල්වූ ජලරලයෙන් හෙවත් ජලසමූහයෙන් යුක්තවූ සිතසතුටුකරන්නාවූ පැතුරුණාවූ සුදුවැලිතලායෙන් යුතුවූ ඉවුරුලඟ මල්පැනි වැහෙන්නාවූ නිල්පැහැයඇති රුක්වලින් යුක්තවූ ලනුමෝදර යන නම්ඇති ප්‍රදෙශයබලා උතුම් මිත්‍රය ගමනයකර'ව'—

87 ප ල් ල ව බැබලි නාතුරු ගිනි සිළු සඳි සි
නි ල් ල ව ගිලී පෙති වැලි අඟුරු අළු රැ සි
ලොල්ල ව බලා මෙවිලසකිය නොවැස නො සි
පොල්ල ව මදක් සැතපීයන් නොවී ලැ සි

87. නාතුරු, නාගවෘක්ෂයන්ගේ; බැබලි, භ්‍රාජමානවූ; පල්ලව, කිසලයන්; ශිඛිසිළුසඳිසි, වහ්නිශිඛා සමානය; නිල්ලව, නීලවර්ණව; ගිලී, ගලිතවූ; පෙති වැලි, පත්‍රභා වාලුකා රාශිය; අඟුරු අළුරැසි, අංගාරභා භස්මරාශියක් වැන්න; මෙවිලස, මේ විලාසය; ලොල්ලව, ලෝලව, බලා; නිරීක්ෂණයකොට; බිය නොවැ, භීතිප්‍රාප්තනොව; සගනාසි, සගොත්‍රභව; පොල්ලව, පොල්ලවනම් ප්‍රදෙශයෙහි, මදක්, ස්වල්පයක්, සැතපී, සන්තර්පිතව; ලැසිනොවී, ආලසිනොව; යන්, ගමනයකරන්—

"නාවෘක්ෂයන්ගේ බබලන්නාවූ ලාදළු ගිනිදළුවැනිය නිල්පාටවූ වැටුනාවූ පත්‍ර හා (එහි විද්‍යමානවූ) වැලිරාශිය අඟුරු හා අලුරැසක්වැනිය මේ ආකාරය ලෝබව (ආලේඇතුව) බලා බයනොවී සතුටුව පොල්ලව යන නම්ඇති ප්‍රදෙශයෙහි පීකවේලාවක් සැතපී අලසභාවයක් නැතිව ගමන්කරන්"—

88 * පැ ක ර වනා නෙත් මදපස්වෙනිසැ ර ය
† සේ ක ර උවම් පැහැසරවත් මනහ ර ය
ආ ක ර යුරු පිහිපි ලියමිණී ඇම්ව ර ය
පෝක ර පිටිය බලමින් යව මගතු ර ය

88. නෙත්, නෙත්‍රයෙන්; මද, අනඞ්ගයාගේ; පස්වෙනිසැරය, පඤ්චමබාණය; පැකරවනා, ප්‍රකාශකරවන්නාවූ; සේකරඋවම්, චන්ද්‍රයාටබඳු උපමාඇත්තාවූ; පැහැසර, ප්‍රභාසාරවූ; වත්, වක්ත්‍රයෙන්; මනහරය, මනොහරවූ; ලියමිණී, කාන්තා නමැති මාණික්‍යයන්; ඇම්වරය, සැමිකල්හි, පිහිපි, ප්‍රතිෂ්ඨිතවූ; ආකරයුරු, ආකරයක් සමානවූ; පෝකරපිටිය, පෝකරපිටියනම් ප්‍රදෙශය; බලමින්, නිරීක්ෂණය කෙරෙමින්; මගතුරය, මාර්ගාන්තරයෙහි; යව, ගමනකරව—

"ඇස්වලින් අනංගයාගේ පස්වෙනිසැරය (එනම් උපුල්සැරය හෙවත් පස්වෙනිවූ මල් ඊගහ) ප්‍රකාශකරවන්නාවූ චන්ද්‍රයා සමානයයි උපමාකළයුතුවූ මහත් බැබලීම්ඇති මුහුනුවලින් සිත්පැහැර ගන්නාවූ ලියන්නමැති මැණික් සැමකාලයෙහිම) පිහිටියාවූ ආකරයක් (උපදින ඉඩමක්) වැනිවූ පෝකරපිටිය යන නම්ඇති ප්‍රදෙශය බලමින් මගතුරෙහි ගමන්කරව"—

89 ක ර කැ වි යා නොමදෙන සත පටුදෙ ලෙ න ‡
කු සු ම වි යා සැව් දියමෙන් බැම ලෙ ලෙ න
ති සූ ල වි යා කල්බඳකල් බඳකෙ ළෙ න
ම හ නැ වි යා පොකුණටවදූ කෙළි දෙ ලෙ න

89. සත, (දුටුවාවූ) සත්වයන්ට; කරකැවි, ආවර්තිතව; යානොමදෙන, ගමනකිරීම නොමදෙන්නාවූ; පටුදෙලෙන, පටුවූලලාටයෙන් යුක්තවූ; කුසුමවියා, පුෂ්පබාණයාගේ; සැව්, චාපයෙහි; දියමෙන්, ජීයවැනිවූ; ලෙලෙන, ලලිතදෘනයකරන්නාවූ; බැම, භෲඇත්තාවූ; තිසුලවියා, ත්‍රිශූලායුධයාගේ (ඊශ්වරයාගේ) කල්බඳ, කාන්තාව වැනිවූ; කල්බඳ, කාන්තාවන් විසින්; කෙළෙන, ක්‍රීඩාකරණු ලබන්නාවූ; මහනැවියා පොකුණට, මහනැවියානම්වූ පුෂ්කරණීයට; කෙළිදෙලෙන, ක්‍රීඩා දෙහලයෙන් නොහොත් ධූරයෙන් යුක්තව; වදූ, ප්‍රවිෂ්ටවෙව—

"දුටුවාවූ සත්වයන්ට (බලාගෙනසිට ආපසු) කරකැවියන්නට නොමදෙන්නාවූ පලල්නැති නලලින් යුක්තවූ අනංගයාගේ දුන්නෙහි දිය (ලනු) පරිද්

* පැකරවන.
† සේකරවන්.
‡ පටු, පුලුල්නුවූ (සිහින්වූ) දෙලෙන, ලලාටයෙන් යුක්තවූ; සිද හැකි.

දෙන් ලෙලදෙන බැමඇත්තාවූ ඊශ්වරයාගේ කාන්තාව (උමයංගනාව) වැනිවූ කාන්තාවන් විසින් සෙල්ලම්කරණු ලබන්නාවූ මහනැවියා (යන නම්ඇති) පොකුණට ක්‍රීඩාආසාවෙන් නොහොත් ක්‍රීඩාව පෙරටු (මුල්)කරගෙණ පැමිණෙණව—

"තවද විකසිත කුමුද කුවලය කමල කල්හාරාදී කුසුමසමූහයෙන් හා හංසකාදම්බ කාරණ්ඩවාදී විවිධ පක්ෂිජාතීන්ගෙන් මනොහරවූ ඒ පුෂ්කරණියෙහි"—

"තවත් කාරණයක් පිපුනාවූ, සුදුඋපුල්ය; නීල්උපුල්ය, පියුම්ය, හෙවත් නෙළුම්ය; හෙල්මැලිය යනාදීවූ මල්සමූහයෙන්; හා හංසය, කාලහංසය හෙවත් විල්කුකුල්ය, (හංශ විශෙෂයක්වූ) කාරණ්ඩවය යනාදීවූ නොයෙක් පක්ෂිජාතීන්ගෙන්ද සිත්කළුවූ (සිත්සතුටු කරවන්නාවූ) පොකුණෙහි"—

90 පු ලා තුරු කුසුම් කඩමින් කෙළ ඇවි ද
ම ලා නිකවඩා බිඳු පෙනුනු සඳ බ ද
නි ලා කෙස්වැටිය බැඳ රත් වසන් ඇ ද
බ ලා සිටුව දියකෙළිනා ළඳුන් සො ද

90. පුලා, පුල්ලවූ; තුරු, වෘක්ෂයන්හි; කුසුම්, පුෂ්පයන්; කඩමින්, ඔවිනත්‍යකෙරෙමින්; කෙළ, ක්‍රීඩාකොට නොහොත් ක්‍රීඩාකෙරෙමින්; ඇවිද, ආහිණ්ඩනයකොට; මලානිකව, මලානිකවී; බඳ, බඳෙහි; ඩාබිදු, ස්වේදබින්දූන්; පෙනුනුසඳ, දෘශ්‍යමානවූකල්හි; නිලා, නීලවර්ණවූ; කෙස්වැටිය, කෙසකලාපය; බැඳ. බන්ධනයකොට; රත්වසන්, රක්තවස්ත්‍රයන්; ඇඳ, අච්ඡාදනයකොට; දිය කෙළිනා, ජලක්‍රීඩාකරන්නාවූ; සොඳ, සුන්දරවූ; ළඳුන්; කාන්තාවන් (ගේ විලාසය); බලා, නිරීක්ෂණයකොට; සිටුව, ස්ථානයකරව—

"පිපුනාවූ රුක්වල මල්කඩමින් සෙල්ලම්කර ඇවිදීමෙන් මලානිකවී ශරීරයෙහි ඩහදිය බින්දූන් පෙනුනුකල්හි නිල්පාට කෙස්වැටිය බඳිමින් රතුරෙදී ඇඳ දියකෙළින්නාවූ සොඳුරු කතුන්ගේ ආකාරයබලා හිටපන්"—

91 ම න් නොසකරු නරඹා කොමලඟක ව ත
දු න් රසවත් රසපහරින් පිය උර ත
ව න් සිහනිය ඇත්කුඹුතලැ උරිරු යු ත
මෙ න් මුතුදිසි දියබිඳු සඟ කොකුම් මු ත

91. කොමලඟක, කොමලාඞ්ගියකගේ; වත, වක්ත්‍රය, නරඹා, නිරීක්ෂණයකොට, මන්නොසකරු, විස්තකොෂයකොට; පිය. වල්ලභයා විසින්; උරතා ඩක්ෂයට; දුන්, දානයකරණලද්දාවූ; රසවත්, රසවත්තාවූ; රසපහරින්, ජලප්‍රහාරයකරණකොටගෙණ; සිහනිය, සිංහනාදය; වන්, ප්‍රවෙශවූ; ඇත්කුඹුතලැ, හස්තිකුම්භස්තලයෙහි; උරිරුයුත, රුධිරයෙන් යුක්තවූ; මුතුමෙන්, මුක්තාවන්පරිද්දෙන්, කොකුම් සහ, කුංකුමය සමග; මුත, මුක්තවූ; දියබිදු, ජලබින්දු සමූහය; දිසි, දෘශ්‍යමානවිය—

"කොමලාඞ්ගියකගේ හෙවත් ස්ත්‍රියකගේ මූනබලා පිනසතුටුකර හිමියා විසින් උරයට හෙවත් ළැපැත්තට ගසනලද රසවත්වූ දියපහරින් සිංහයාගේ නියපොතු වැදුනාවූ ඇතාගේ (පෙර) කුම්භ ලේසහිතවූ මුතුඇටමෙන් කොකුම් සමග මිදුනාවූ දියබිඳු සමූහය පෙනුනේය"—

92 සිරිමත් මතඟනක දුන්දිය පහරක ට
ගමනොත් බමරු ගුම්කරු නොසතුටි නෙවි ට
පැමිනෙත් ඔවුන් හිම්සවණෙත් නිලුපුල ට
වැදගත් ගැහැට ගියවැනි පමුනත ලෙස ට

92. සිරිමත්, ශ්‍රීමත්වූ; මතඟනක, මත්තාඟනාවකු විසින්; දුන්, දානයකරණ ලද්දුවූ; දියපහරකට, ජලප්‍රහාරයකට; නොසතුටින්, අසන්තුෂ්ටයෙන්; එවිට, එකල්හි, ගුම්කර, ඝොෂාකොට; ගමනොත්, ගමන්පැමිනියාවූ; බමරු, භ්‍රමරයෝ; ඔවුන්, ඒ මත්තාඞ්ගනාවන්ගේ; හිමි, ස්වාමීන්ගේ; * සවණොත්, ශ්‍රවණ නමැති නොහොත් ශ්‍රවණයෙහි හොත්තාවූ; නිලුපුලට, නීලොත්පලයට; පැමිණෙත්, ප්‍රාප්තවෙත්; (කුමක්පිණිසද) වැදගත්, සපත්‍රී ග්‍රහණයකරණ (වැද ගන්නා) ලද; ගැහැට, සඝටනය; පමුනතලෙසට, පමුනුවන පරිද්දෙන්; ගියවැනි, ගමනයකලාක්වැන්න—

"ශ්‍රීඇත්තාවූ (ක්‍රීඩා මදදියෙන්) මත්වූ ස්ත්‍රියකු විසින් ගසනලද දියපහරකට නොසතුටු වීමෙන් ඒ වේලාවට නාදකර ගමන්ගත්තාවූ මීමැස්සෝ ඔවුන්ගේ ස්වාමීහුගේ සවන්නමැති නිළුපුලට නොහොත් කණෙහි බඳණලද නිල්මහනිල් මලට පැමිනෙත්ස(ඒ කුමටද) වැදගන්නාලද ගැහැට කියනපරිද්දෙන් කියාක්මෙනි—

93 දියරල වැදීමෙන් තමපිය තමකර ණ
නියරද කොකුම් කලලින් මුසු වනපොර ණ
සියපත් විලස් නොහැඳිනැ දූකැ රතකිර ණ
ලිගඅන් සමග සැකැ දිගැසක් වූ උර ණ

93. දියරල වැදීමෙන්, ජලතරඞ්ගයන් ප්‍රවිෂ්ටවීම කරණකොටගෙණ; තම, තමාගේ, පියතම, වල්ලභයාගේ; කරණ, හස්තයන් සම්බන්ධවූ, නියරද, නඛ පඞ්ක්තිය නොහොත් නඛරාජින්හු; පොරණ කොකුම් කලලින්, පුරාණ කුංකුමකර්දමයෙන්; මුසුවන, මිශ්‍රවූකල්හි; සියපත් විලස්, සතපත්‍ර විලාසවූ; රත කිරණ, රක්තප්‍රභාව; දූකැ, දර්ශනයකොට; නොහැඳිනැ, සඤ්ජානනයනොකොට; සැක, සඞ්කිතවූ, දිගැසක්, දීර්ඝාක්ෂියක්; අන්ලිය සමග, අන්‍යාඞ්ගනාවකු සමග; උරණවූ, කොපවූවාය—

"දියරැලිවැදීම හෙතුකොටගෙණ තමහිමියාගේ අගේ නියපෙළ (එහි නාන්නාවූ කාන්තාවන්ගේ පයොධරාදියෙහි ගල්වාතිබුන දියටමිශ්‍රවූ) පරණ කො

* හිවි, සඤ්ඡන්නවූ හෙවත් ගවසනලද්දාවූ නොහොත් හිඳි උච්චවූ—ඊදහැකි

කුමුඹින් මිශ්‍රවූකල්හි නෙළුම්පත්වැනිවූ රතුපැහැයඳුන (ඒ වර්ණය කෙසේවූ ලේදැයි) නොදුන (තම්බිම්යා අන්තැනකත් ඇළුම් ඇත්තේදෝහෝයි සංකා ඇත්තාවූ දිගැසියක් නොමෝ අන් අඟනකු සමග කිපුනිය,,—

94 ප හ ර ත කෙළි රිසින් පියතම ලියකව ත
සි ලි ල ත ගිලුනු නැත්නෙත දිය බිඳුදිමු ත
දූ ත ප ත වසර කිසිකලැ කපටලෙස ඇ ත
ලොව සත රැකෙණු සැබවිය සමහරු විප ත

94. කෙළිරිසින්, ක්‍රීඩාරුචියෙ (ඊර්ෂ්‍යාවෙ) න්; පියතම, වල්ලභයා විසින්, ලියකවන, කාන්තාවකගේ වක්ත්‍රයට; පහරන, ප්‍රහාරණයකළ කල්හි; සිලිලත; සලිලාභ්‍යන්තරයෙහි; ගිලුනුනැතින්, නිමග්නවූ ස්ථානයෙන්; දිමුත, දීප්තිමත්වූ; දියබිඳු, ජලබින්දූන්; එත, එනකල්හි; කපටලෙසඇත, ව්‍යාජ විලාසඇත්තාවූ; කිසිකලැ, කශ්චිත් කාන්තාවක්නොමෝ; අවසර, ඔකාශය; දූනැ, ජනනයකොට; පත, ප්‍රාප්තවිය; සමිහරු, සමහරෙකුගේ, විපත. විපත්තියෙහි; ලොව, ලෝකයෙහි; සත, (සමහර) සත්වයාගේ; රැකෙණු, රක්ෂාවීම; සැබව්, සත්‍යයෙකි—

"සෙල්ලම් කැමැත්තෙන් ස්වාමියා විසින් (තම) ලියකගේ මුහුනට (වතුර) ගැසූකල්හි (ඒ තැනැත්තිය) දියේ ගිලුනු තැනින් දීප්තියඇති දියබින්දූන් එනකල්හි කපටි (ව්‍යාජ) ආකාර අදහස් ඇත්තාවූ (අන්) කිසි ගැහැනියක් (ඒ) අවකාශය දූන (එනනට) පැමිනියාය සමහර අයෙකුට (යම්) විපතක් වූවාද (ඒ කරණකොටගෙණ තවත් සමහර) ලෝකයෙහි සත්වයන්ගේ රැකීම සැබෑවකි,,—

95 දියකෙළිනා ලෙස දකිමින් තළිත් න ඳා
* පොකුණුබු නොමොද සමගව උන් කෙළින ස ඳා
කලදෝ සිළිලයසි ඇරගත් විතින් † එ ඳා
සිතේ දුටුව පැලඹෙණ හස පියුම් මැ ඳා

95. පියුම්මැද, පද්මමධ්‍යයෙහි; පැලඹෙන, ප්‍රකම්පයෙන් ලම්බමාන වන්නාවූ; හෙවත් විශේෂයෙන් එලි පවත්නාවූ; හස, හංශයන් (ගේ ආකාරය) දුටුව, දර්ශනකළහොත්; තලුන්, කාන්තාවන් විසින් නොහොත් කාන්තාවන්ගේ දියකෙළිනාලෙස, ජලක්‍රීඩා කරණලෙසය හෙවත් ආකාරය; දකිමින්, දර්ශනය කෙරෙමින්; නඳා, නන්දනව නොහොත් නන්දන (සන්තුෂ්ට) වූ; පොකුණුබු, පුෂ්කරණී නමැති අම්බිනාව; නොමොද, නොමෝත් (තමනුත්); උන්සමගව; ඔවුන් (හා) සමංගී භූතව (එක්ව); කෙළිනසඳා, ක්‍රීඩාකිරීම සඳහා; එදා, එද වස්හි; විතින්, වංකයෙන් හෙවත් පානයකළයුතු භාජනයෙන්; ඇරගත්තා හැරගන්නාලද; කලදෝ සිලිලයසි, කලධෞත සලිලයසි; සිතේ, චින්තනය වෙයි—

* පොකුණු අඹද—සී—අච්චුපොතේ පමණයි.
† "සිතින්,, සමහර, එකල, සිතවණියෙන්.

පිටනොගොස් (ඒ පොකුණෙහි) ගනඑම්මල් මැදම ඇලී සිටින්නාවූ හංශයන් දුටුගොත් පොකුණෙහි කතුන් විසින් නොහොත් කතුන්ගේ දියකෙලින. ආකාරය දැකීමෙන් සතුටුවී පොකුණු නමැති අඹුවද තමතුන් ඒ දියකෙළිනාකතුන් සමග සෙල්ලම් කිරීමපිණිස. ඒ දිනයෙහි පියයුතු භාජනයකින් හැරගන්නාලද පිදීවතුරයයි සිතෙයි—

95 හසරද සරණ පසසිරදී සිලිල් පි ට
මේ මේ තොපටයස් දෙනවැනි සියොතුන ට
දියකා කෙවැනි එහි යුගපිය විදු සි ට
දුනමැනවැයි යනවැනි මෙපමණක් ම ට

96. සිලිල්පිට, සලිල පෘෂ්ඨයෙහි හෙවත් සලිල මතුභාගයෙහි; පසසිරදී, පක්ෂ රෙඛාදෘතයකොට; සරණ, සඤ්චාරණය කරන්නාවූ; හසරද, හංසරාජතෙම; (කෙවැනිද); සියොතුනට, පක්ෂීන්ට; මේ මේ, මේ මේ ප්‍රමාණය; තොපටයයි, තොපහටයයි, දෙනවැනි, දනයකරන්නෙක් වැන්න; දියකා, චාතක සකුණ තෙම කෙවැනි, කෙබදුද (කීවොත්); එහි, ඒ පුෂ්කරණියෙහි; යුගපිය, යුග්ම පක්ෂය; විදු, ප්‍රසාරණයකොට; සිට, ස්ථානයකොට; මෙපමණෙක්, මේ ප්‍රමාණයෙක් හෙවත් මේ පිකපමණක්; මට, මාහට; දුන, දනයකළහොත්; මැනවැයි මනොඥයයි; යනවැනි, කියන්නෙක්මෙනි—

"දියමතුපිට පියාපත්වලින් ඉරිඇඳගෙණ හෙවත් ඉරිඇඳෙන පරිද්දෙන් හැසිරෙණ හංසරාජයා කෙබඳුද (කීවොත් සෙසු) පක්ෂීන්ට මේ මේ පමණ තොපටයයි (බෙදා) දෙන්නෙක් වැන්න—දියකා පක්ෂියා (කෙබඳුද කිවොත්) ඒ පොකුණෙහි පිහාටුදෙක දිගැර හිටගෙණ මේ (ඊක) පමණක් මට දුන්නොත් මැනවැයි කියන්නෙක් වැන්න,,—

97 ර ත් සර කැකුලකම තුඩුදී හසෙක් මො ල
සි ත් සහ තොසින් සෙද විදහා පුබුදුක ළ
ප ත් නු අනඟ රස අඟනකට කරැ දෙ ළ*
ම ත් සලෙලකු ගිනවැනි අවල කෙළි කෙ ළ

97. (ඒ පොකුණෙහි) මොල, මණ්ඩවූ; හසෙක්, හංසයෙක්තෙම; රත්සර කැකුලකට, රක්තපද්ම කලිකාවකට හෙවත් කුඩිමලයකට, තුඩු, චඤ්චුව; දී, දානයකොට; සිත් සහතොසින්; චිත්තසන්තොෂයෙන්; සෙද, වහා; විදහා, ප්‍රසාරණයකොට; පුබුදුකළ, ප්‍රබොධකෙළේය; අනඟරස, අනංගරසය; පත්නු, ප්‍රාප්තනුවූ; අඟනකට, අංගනාවකට; දෙළකරැ, දෙළකොට හෙවත් ආසාකොට; මත්සලෙලකු, මත්ත සල්ලාලයෙකු විසින්; අවලකෙළි, අවලක්‍රීඩාව; කෙළ, ක්‍රීඩාකොට; ගියවැනි. ගමනයකළාක්වැන්න—

---

* ලොල—යි—සමහර ඒද මැනවි.

"(ඒ පොකුණේ) සැන්ඩවූ හෙවත් වණ්ඩිවූ හංසයෙක් රතුනෙළුම් මල්කැකලකට තුඩුදී හෙවත් තුඩගසා ගිනසතුජින් ඉක්මනින් (පත්‍ර) දිගෑර පුබුදු කෙලේය (ඒ කුම්ක්මෙන්ද) අනංගයාගේ රසය නොපැමිණියාවූ හෙවත් මල් වරතුවූ බාල්‍යවයස්ඇති අඟනන කෙරෙහි ලොබකර (රාගමදදීයෙන්) මත්වූ ඉලන්දුරියෙකු විසින් රතික්‍රීඩාව ක්‍රීඩාකර ගියාක්වැන්න"—

98 පි ය කර ලකරවන් තම ගතට ඇමක ලී
න් ය තම දැක සිඳින බව පියුමන් එක ලී
සි ය හිමිහට කියනුව විල්කත් සස ලී
සි ය පත් අතින් ගණනෙව් පෙතියෙන් ඇඟි ලී

98. තමගතට, තමාගේ ගාත්‍රයට; ඇමකලී, සැමකල්හි, පියකර, ප්‍රියකරවූ ලකරවන්, අලඞ්කාරයන් හෙවත් ආභරණයන් බඳුවූ; පියුමන්, පද්මයන්; එකලී, තත්කාලයෙහි; සිඳිනබව, ඡේදනයකරණ භාවය; නියතම, නියචයෙන්ම හෙවත් නියමයෙන්ම; දැක, දර්ශනයකොට; සියහිමිහට, ස්වකීය ස්වාමියාහට; කියනුව, කර්නයකරණුපිණිසමෙන්; විල්කත්, තටාකනමැති කාන්තාතොමෝ, සසලී, චඤ්චලව; සියපත්, ශතපත්‍රනමැති; අතින්, හස්තයෙහි, පෙති, පත්‍රනමැති; ඇඟිලියෙන්, අංගුලින් කරණකොටගෙන; ගණනෙව්, සංඛ්‍යාකරන් නියක් වැන්නිය—

"තමාගේ ශරීරයට සැමකාලයෙහිම ප්‍රියකරන්නාවූ ආභරණයන්(සැරසිලි) වැනිවූ නෙළුම්මල් ඒ කාලයෙහි කඩණබව නියමයෙන්ම හෙවත් ඒකාන්තයෙන්ම දැක තමාගේ ස්වාමියාහට කියනුපිණිසවාගේ විල්නමැති ස්ත්‍රීතොමෝ චඤ්චලව නෙළුම්මල් නමැති අතෙහි පත්‍රනමැති ඇඟිලිවලින් ගණන්කරන් නියක් වැනිවී"—

99 කෙළිනු සිලිල් මෙවිලස මනකල් කළු න
දි මු නු දසන් පැහැසරදර පැහැ නෙති න
ගණු තු රත තඹර නිලුපුල් සල තෙලෙ න
අ මු තු ලදින් දියසිරි රඟනෙව් තොස් න

99. මෙවිලස, මේ ආකාරයෙන් හෙවත් උක්ත ප්‍රකාරයෙන්; මනකල්, මනොකල්‍යවූ හෙවත් ප්‍රියාත කාන්තාවූ; කළුන, කාන්තාවන් විසින්; සිලිල්කෙළිනු, සලිල ක්‍රීඩාකරණු ලබනකල්හි; දිමුනු, දිප්තිමත්වූ; දසන්පැහැ, දන්තප්‍රභාව හෙවත් දන්තමරීචිය කරණකොටගෙණ නොහොත් දන්තමරීචිය විසින්; සර, ශ්වේතපද්මයන්ද; අදරපැහැ, ඔෂ්ඨවර්ණය හා; නෙතින, නෙත්‍රවර්ණයද කරණකොටගෙණ, නොහොත්; අදරපැහැනෙතින, ඔෂ්ඨවර්ණය හා නෙත්‍රවර්ණයද විසින්; රතතඹර නිලුපුල්, රක්තතාම්‍ර රසයන් හා නිලොත්පලයන්ද, ගණුතු ග්‍රහණයකළකල්හි; තෙලෙන, මාරුතයෙන්; සල, කම්පිතවූ; දියසිරි, ජලනමැති ශ්‍රීකාන්තාතොමෝ නොහොත් ජලයාගේ සොභාව (කෙසේද); අමුතුලදින්. අමුත්තක් ලත්හෙයින්; තොසින, තොෂයෙන්; රඟනෙව්, නෘත්‍යකරන්නියක් වැන්න—

"(මූලකියනලද) මේ ආකාරයෙන් සිත කැමැතිකරවන්නාවූ ශොභාඇති කතුන් විසින් දිගෙහි සෙල්ලම්කරණු ලබන කාලයෙහි (ඒ කාන්තාවන්ගේ) දිලිසෙන්නාවූ දන්තකාන්තීන් විසින් සුදුපියුම්ද තොල්වල (රතු) වර්ණය හා නෙත්‍ර (වලනිල්) වර්ණයද විසින් රතුඋපුල් හා නිලුපුල්ද ගන්නාලද කාලයෙහි සුලඟින් කම්පාවනලද දියනමැති ස්ත්‍රීකාන්තාව නොහොත් දිගයෙහි සොභාව (කෙසේද කිවොත්) අමුතුවෙන්ද (හෙලපියුම් රත්පියුම් නිලුපුල්) ලැබූන සතුටින් නටන් නියක් වැනිවිය.

100 පැ ළ දිගු සුනිල් මිණිතරයුත බිතෙහි ල ඹා
ප ළ පැහැ පලොල්වන් මිණිතල් වැටෙක සු බා
අ ල සඳ අයඳ බිඹුපොද සපිරි සිහිලැ ඹා
කෙ ළ අවසන් පත්වන පියඹ ලෙස ලො බා

100. සුනිල්, මනානිලවර්ණවූ; මිණිතරයුත, මාණික්‍යරශ්මියෙන් යුක්තවූ, පැළදිගු, පශ්චිමදිශානමැති; බිතෙහි, භිත්තියෙහි ලඹා, ලම්බමානවූ; පලොල් වන්, පාටල වර්ණයට හෙවත් ශ්වෙතලොහිතයට බඳුවූ; පැහැ, ප්‍රභාව; පල, ව්‍යාප්තවූ; මිණිතල්වැටෙක, මාණික්‍ය තාලවෘන්තයකගේ; සුබා, සොභාව, අසඳබිඹු; සූර්‍ය්‍යබිම්බය, අලසඳ, එලවූකල්හි; නොහොත් ප්‍රකාශකලකල්හි; පොද, සුන්දරවූ; සපිරි, සම්පූර්ණවූ, සිහිලඹා, සීතලජලය; පියඹ, ප්‍රියාම්බිකාවන් විසින්; ලොබාලෙස ලොභ(ආසාව)ඇතිනාක්; කෙළ, ක්‍රීඩාගතාව; අවසන්පත්වන, අවසානප්‍රාප්ත වනකල්හි—.

"ඉතා නිලවර්ණවූ මාණික්‍යරශ්මිය ඇත්තාවූ බස්නාහිර දිසානමැති භිත්තියෙහි එල්ලෙන්නාවූ සුදු රෙල්වන් පැහැය ඇති මාණික් තල්අත්තක ශ්‍රීයාව හිරුමඩල විසින් ප්‍රකාශකලකල්හි ප්‍රිය අඹුවන් විසින් කැමැත්ත හෙවත් ආසාව ඇතිනෙක් සෙල්ලම්කර අවසානයට පැමිනිකාලයෙහි,,—

101 සැ ඳ වෙල වසන් නිලඹර මුහුල සිනිබ ඳ
සොඳ පෙර දිගු දිගුනෙත සැදි නලල් මැ ඳ
ස ඳ න * තලාවටසිරිගත සුපුන් ස ඳ
ර ඳ ම මිතුර අග්බෝවෙහෙර මනන ඳ

101. සැඳවෙල, සන්ධ්‍යාවලාහක නමැති; වසන්, වස්ත්‍රයෙන් හා; නිලඹර නිලාම්බරය නමැති; බිඳ, බන්ධනයකරණ ලද්දාවූ; මුහුලසිනි, ධම්මිල්ලයෙන්ද යුක්තවූ; සොඳ, සුන්දරවූ; පෙරදිගු, පූර්වදිශානමැති; දිගුනෙත, දීර්ඝනෙත්‍රිකාවගේ; නලල්මැද, ලලාටමධ්‍යයෙහි; සැදී, සජ්ජිතකරණලද; සඳනතලාවම, චන්දන තිලකා වෘත්තිකාවකගේ නොහොත්, චන්දනතිලකාවකම බඳුවූ; සිරි සොභාව; සුපුන්සඳ; සම්පූර්ණ චන්ද්‍රයා විසින්; ගත, ග්‍රහණයකලකල්හි; මමිතුර මාගේ මිත්‍රය; මනනඳ, මනොනන්දනවූ; අග්බෝවෙහෙර, අග්‍රබෝධි විහාර යෙහි; රඳ, රඤ්ජමානවෙව—

* තලාවක සිරිගත—පිද—සම්හරු කියත්.

"සවස්වේලෙහි සැදෙන විලාකුළු නමැති රෙද්දෙන් හා නිල්පාට ආකාශය නමැති බඳිනලද කොණ්ඩයෙන්ද යුක්තවූ සොඳුරුවූ පෙරදිග (නැගෙණහිර දිසා) නමැති දිගැසියගේ නලලමැද සාදනලද සුදුසඳුන් තිලකා ව්‍රත්‍යය කගේ නොහොත් සුදුසඳුන් තිලකාවකට බඳුවූ විලාසය සපිරිසඳ, විසින් ගන්නාලද කල්හි මගේ මිතුරෙ හිතසතුටු කරන්නාවූ අග්‍රබොධිවිහාරයෙහි නවත්න්.

102 පෙරදිග තිරිඳු පැහැසරදිගු රැහැන ගෙ ණ
* හල නිලඹර ගණරණහස් පතක් මෙ න
බබලන ලහිරු මොහොතෙක් මුනි ගුණ මෙනෙ න
සිහිකර නමැදූ සෙද යාගන් ගුවනති න

102. පෙරදිග, පූර්වදිශාවෙහිවූ; නොහොත්; පෙරදිග, පූර්වදිශා නමැති; නිරිඳු, නරෙන්‍ද්‍රයා විසින්; පැහැසර, ප්‍රභාසාර (මහත්ප්‍රභා) නමැති; දිගු, දීර්ඝවූ; රැහැන, රජ්ජුව; ගෙණ, ග්‍රහණයකොට; නිලඹර, නීලාම්බරයෙහි, හල, හරිනලද්දාවූ; ගණරණ, ඝණස්වර්ණමයවූ; අහස්පතක්මෙන, ආකාශ පත්‍රයක් පරිද්දෙන්; ලහිරු, බාලාකියා; බබලන, භ්‍රාජමානවනකල්හි; මොහොතෙක්, මුහුර්තයෙක්හි; මුනිගුණ, සර්වඥගුණය; මෙනෙන, චින්තනයෙන්; සිහිකර, ස්මරණයකොට; නමැදූ, නමස්කාරකොට; සෙද, සිත්‍රව; ගුවනතින; ගගනයෙන්; යාගන්, යාත්‍රා ග්‍රහණයකරන්—

"පූර්වදිශා සංඛ්‍යාත නැගෙණහිරදිසාවෙහිවූ නොහොත් නැගෙනහිරදිසාන මැති රජහු විසින් මහත් රැස්නමැති දික්වූ රැහැන අල්වාගෙණ නිලාකාශයෙහි හරිනලද්දාවූ ගනකමඇති රත්රන්මයවූ අහස්පතක් හෙවත් සරුංගෝලයක්මෙන් බාලසූරියා බබලන කාල්යෙහි මොහොතක් (පමණ) කල් බුදුන්ගේ ගුණය සිතෙන් සිහිකර වැඳ ඉක්මනින් ගමන්ගණීන්,,

103 දි ලි හෙම් පබළ මුතු මිණිවත් පැහැ විහි දී
බ ලි නම් පසිදු විප්වෙස් ඈ දනන් රැ දි
† ගිලි දම් තිසර බරණින් හෙබි ලියන් සැ දී
වැ ලි ගම් පටුන වදු සව්සිරි පිරි ඹරැ දී

100. පැහැවිහිදි, ප්‍රභාවිසජ්ජිතවන්නාවූ; හෙම්, හෙමය හෙවත් ස්වර්ණය; පබළු, ප්‍රවාලය; මුතු, මෞක්තිකය; මිණි, මාණික්‍යය යන; අවන්, ආපනයන්ගෙන්; දිලි, දීප්තිමත්වූ; බලි, බලවත්වූ; නම්පසිදු, නාමයෙන් ප්‍රසිද්ධවූ, විප්, විප්‍රය; වෙස්අ, වෛශ්‍යය යනාදිවූ; දනන්, ජනයන් විසින්; රැඳි, රඤ්ජිතවූ; ගිලිදම්, ග්‍රීවාදාමය; තිසර, ‡ මුක්තාහාරය යන; අබරණින්, ආභරණයන්ගෙන්; හෙබි, සොභමානවූ; ලියන්, කාන්තාවන්ගෙන්; සැදී, සජ්ජිතවූ; සව්සිරි. සකලශ්‍රීයෙන්; පිරි, පූරිතවූ; ඹරැඳි, විරාජමානවූ, වැලිගම්පටුන, වාලුකාග්‍රාම පට්ටනයට; වදු, ප්‍රවිෂ්ටවෙව—

* හලනිලඹරෙහි—සමහර.
† ගෙලිදම්—යිද—සමහර.
‡ තිසර—රස්නාදාමයයිද යෙත්.

රැස්විහිදෙන්නාවූ රත්රන්ය පබළුය මුතුය මැණික්ය යන (මෙසින් සදනලද) සල්පිල්වලින් දිලිසෙන්නාවූ බලය ඇත්තාවූ නමින් ප්‍රසිද්ධවූ බමුණු වෙළඳ යනාදිවූ ජනයන් විසින් රඳනු ලබන්නාවූ කරේපළඳින (රත්රන්ආදී) දම්වලින් හා මුතුහරය යන ආභරණයන්ගෙන්ද බැබලීම් ඇත්තාවූ කතුන්ගෙන් සැදුනාවූ සියලු ඉසුරෙන් පිරී බබලන්නාවූ වැලිගම්පටුන (යන නම්ඇති ප්‍රදෙශය) ට පැමිනෙව,,

104 පැහැයෙන් නැහැස්මෙන් අගයෙන්ද කිරුමෙ න
මෙ ඇමින් මදින් මද සැලසීමෙන් රැගෙ ණ
ඉසු රෙ න් පසිදු දියදෙස් වෙසවුණු * සෙයි න
වෙල ඳු න් බලන් මග සල්පිල්වල හිඳි න

104. පැහැයෙන්, ප්‍රභාවෙන්ද; නැහැස්මෙන්, නිකස ඝසනයෙන්ද; අගයෙන්ද, අර්ඝණය හෙවත් අගය කිරීමෙන්ද; කිරුමෙන, (තුලා ආදියෙන්) කිරීමෙන්ද; (යන) මෙඇමින්. මේ සියල්ලෙන්; මදින්මද, මඳයෙන් මඳව; සැලැසීමෙන්. සිඩකිරීමෙන්; (සැලැස්වීමෙන්); රැගෙණ, හැරගෙණ; ඉසුරෙන්, ඓශ්වර්‍ය්‍යයෙන්; දියදෙස්, ලොවට සාක්ෂිවූ; වෙසවුණුසෙසින, වෛශ්‍රවණයා පරිද්දෙන්, පසිදු, ප්‍රසිද්ධවූ; මග, මාර්ගයෙහි; සල්පිල්වල, ආපනයන්හි; හිඳින, වාශයකරන්නාවූ; වෙලඳුන්, වාණිජයන්; බලන්, අවලොකනයකරන්

“වණ්යෙන්ද උරගා බැලීමෙන්ද (වැඩිගණන් කිම්ආදී වශයෙන්) අගයකිරීමෙන්ද (තරාදි ආදියෙන්) කිරීමෙන්ද යනමේ සියලු ආකාරයෙන් පිකෙන් පිත සැලැස්වීමෙන් (ලාබ) ඇරගෙණ (පැමිනියාවූ) ඉසුරුමත්කමින් (පද්මය මහාපද්මය යනාදිවූ නිධාන නවයක් ඇතිහෙයින් පොහොසතෙක් බව) ලොකයාට සාක්ෂිවූ හෙවුත් ලොකයා සාක්ෂිසහිතව දන්නා පොහොසතෙක්වූ වෙසවුණී රජ්ජුරුවන් වැනිවූ (පොහොසත්කම්ඇති) මග කඩපිල්වල ඉන්නා වෙලෙන්දන් (ගේ ආකාරය) බලාපන්,,

105 න ර දියෙහි ලූකස්තුරිසෙ වෙලඳු න
පු ර ඉඳින ගුම්නැතිබමරු සමගි න
† කි ර දෙනන වැදලුන් දූකැ ඉඟිල ය න
න ර සවන බලපිවිසර ගැහැ විය න

105. සෙවෙලඳුන, ජෙනවාතිජයන් විසින්; තරාදියෙහි, තුලාවෙහි; ලූ, බහාලණලද්දවූ; කස්තුරි, කස්තූරින්හි; නොහොත්; වෙලඳුන, වාණිජයන් විසින්; තරාදියෙහි, තුලාවෙහි; ලූ, බහාලන ලද්දවූ; කස්තුරිසෙ, කස්තූරීන් පරිද්දෙන්; හෙවත් කස්තූරීන් සමානව; පුරා. පූර්ණව; ඉඳින, වාසයකරන්නාවූ; ගුම්නැති;

* හැම්පොත්වලම “වෙසමුණු,, කියාමය ඒ කලකපටන් නොසැලකිමෙන් ගබාහෝදෙන අතරේ ලියකියමන්වල පුරුදුවී එන දොෂයකැයි හඟිමි.

† “කිරාඅඳ ඝන,,—සමගරු.

සොඳා තැත්තාවූ; බඹරු සමගින, භ්‍රමරයන් සමගින්; කිරා, තුලනයකොට; දෙන, දානයකරණ කල්හි; අන, හසනය; වැද, සඬනව හෙවත් සපයිව; ඉගිලයන, ඉගිලියන්නාවූ; උන්, ඒ භ්‍රමරයන්; දැකැ, දර්ශනයකොට; නරාසවන, (හසින්) තුෂ්ණවන්නාවූ නොහොත් කොපවන්නාවූ; පිපිසර, ප්‍රත්‍යන්තයන්හි (පිපිසරපලාත්වල); ගැහැවියන, ගොපිකාවන්, බල, නිරීක්ෂණයකරව—

"දක්ෂවූ වෙලඳුන් විසින් නරාදියෙහි ලනලද්දාවූ කස්තූරියෙහි නොහොත් වෙළෙන්දන් විසින් තරාදියෙහි ලනලද කස්තූරි වැනිවූ හෙවත් කස්තූරි සමානව පුරාම (පිරී) ඉන්නාවූ ශබ්දනැති (නිශ්ශබ්දවූ) මීමැස්සන් සමග කිරාදෙනකල්හි අනවැදී ඉගිලියන ඒ බඹරුන් දැකලා බයවෙන නොහොත් තරහවෙන පිපිසර (පලාත්වලින් පැමිණි) ගැල්ගෙවි ලියන් බලාපන්,,—

105 තල් අතු සොලවමින් කරැ කලකලනි නාද
ගල් මතු ගඟුල් හැලි විහිගුම් ගිගුම් ඇද
මල් වතුපෙලින් එන මඳසුවඳ නලවිද
පොල් වතු මෝදරින් යාගන්නැ සකි සද

106. තල්අතු, තාලශාඛාවන්; සොලවමින්, චලනයකරමින් හෙවත් කම්පිතකරවමින්; කලකල නිනද, කලකල යන නාදය; කරැ, කොට; ගල්මතු, ශෛල මස්තකයෙහිවූ නොහොත් ශෛල මතුභාගයෙන් ස්‍යන්දනය වන්නාවූ; ගඟුල්, නිර්ඣරයන්ගේද: හැලි, ආලීන්ගේද; නොහොත්; ගඟුල්හැලි, නිර්ඣර සංඛ්‍යාත ආලීන්ගේද, විහිගුම්, විශෙෂයෙන් සීඝ්‍රවූ; නොහොත්, විහිගුම්: විශෙෂයෙන් උච්චයවූ; ගිගුම්, ගර්ජනාව; ඇද, ආකර්ෂණයකොට; මල්වතුපෙලින්, පුෂ්ප වෘක්‍ෂ පඞ්ක්තියෙන්; එන, ආගමනයකරන්නාවූ; සුවඳ, සෞරභ්‍යයෙන් හෙවත් සුගන්ධයෙන් යුක්තවූ; මඳනල, මන්‍දමාරුතය; නොහොත්; සුවඳ මඳනල, සුගන්ධ මන්‍දමාරුතය; විඳ, විඳිනයකොට; නොහොත්; මඳනල: මන්‍දමාරුතයාගේ; සුවඳ, සුගන්ධය; විඳ, විඳිනයකොට; පොල්වතුමෝදරින්, නාරිකෙලවස්තු ශද්‍රොණීමුඛයෙන්; සකිසඳ, මිත්‍රොත්තමය; යාගන්නැ, යාත්‍රාග්‍රහණය කරන්—

"තල්ගස්වල අතු හොලවමින් කලකල යන නාදකොට ගල්මුදුනෙහිවූ නොහොත් ගල්මුදුන්වලින් වැහෙන්නාවූ දියපාරවල්වලද දියඇලවල්වල විශෙෂයෙන් ඉක්මනින් (සැරෙන් බසින්නාවූ) නාදය ඇදගෙණ මල්වතුපෙලෙන් එන්නාවූ සුවඳඇති මඳසුලඟ (වැදීමෙන් ලබන සැපත) විඳිමින් (පොල්වත්තසම්පයෙන් මුහුදට වැටීතිබෙන නදීමෝයඇති හෙයින්) පොල්වතුමෝදර යන නම්ඇති ප්‍රදෙශයෙන් උතුම් මිතුරෙ යාගන්න,,—

107 නිල් දුම් සොන් වැලෙව් ගුම්ගත් මිහිලොලු න
මිල් දම් තුරු වෙලෙප් යුතු වෙලෙමින් ඉඳි න
පොල් ගෙම් තැඹිලි පුවකුගු රඹවන සොබ න
මල් අම්බලම දකැ සැනපෙමින් යාගෙ ණ

107. නිල්සොන් වැලෙව්, ධූමයෝනි පඞ්ක්තීන් පරිද්දෙන්; නිල්, නීලවර්ණවූ; ගුම්ගත්, ඝොෂා ග්‍රහණයකලාවූ; මිහිලොලුන. මධුලොලයන් එසින්; වෙලෙමින්, වෙඨනය වෙමින්; ඉඳින, නිසිදනය කරන්නාවූ; වෙලෙප්යුතු, විටපයෙන්

යුක්තවූ හෙවත්; ශාඛාස්කන්ධයෙන් යුක්තවූ, මල්දම්තුරු, පුෂ්ප ජම්බුවෘක්ෂ සන්ගෙන්ද; (එවේලාවට මල්තිබුනු ජම්බුගස්වලින්ද); පොල්. නාළිකේරය; හෙම්තැඹිලි, හේම හෙවත් ස්වර්ණසන්නිභරස; පුවක්, පූගය; උගු, ඉක්ෂුය; රඹ, රම්භාය, යනමොවුන් සම්බන්ධවූ; වන, වනයන්ගෙන්; සොබන, සොභමානවූ හෙවත් බබලන්නාවූ; (ප්‍රදේශයෙහි කරණුලෙ:): වල්අම්බලම්; එනම් විශ්‍රාමසාලාව,හෙවත් වල්අම්බලම යන නම්ඇති විශ්‍රාම සාලාව; දුටු, දර්ශනයකොට; සැපාපෙමිනි, සන්තර්පිතවෙමින්; යාගෙණ, යාත්‍රාග්‍රහණයකොට ගෙණ—

"වැසිවලාකුළු පන්තීන්මෙන් නිල්පැහැ ඇත්තාවූ නාදකරන්නාවූ මීමැස්සන් දුවවෙමින් ඉන්නාවූ අතුකඳින් යුතුවූ මල්තිබෙන ජම්බු නොහොත් දම්ගසින්ද පොල්ය රන්තැඹිලිය පුවක්ය උක්ය කෙසෙල්ය යනමොවුන් සම්බන්ධවූ වනයන්ගෙන්ද බබලන්නාවූ (වනයතිබෙන ප්‍රදේශයෙහි සාදනලද හෙසින්) වල්අම්බලම යන නම්ඇති අම්බලම දුක (එහි) සැනපී ගොසින්,,—

108 මි හි ක ත සුනිල් මුහුලු සමෙන් තරවැ බැ ඳී
වනපෙ ත මැද කුසුම් සුඹුලෙක සිරින් සැ දී
සි ය ග ත පැපෑ එනසුරකැලට එහි රැ ඳී
ගමනොත සෙහෙත් මිතුරිඳු සඳ තොසින් සෙ දී *

108. මිහිකත, මහීකාන්තාවගේ නොහොත් මහීකාන්තාව විසින්; තරවැ, ස්ථිරව; බැඳි, බන්ධනයකරණලද්දවූ; සුනිල්, අතිනීලවූ; මුහුලුසමෙන්, ධම්මිල්ලය පරිද්දෙන්; (දිශ්‍යමාන වන්නාවූ හෙවත් පෙනෙමින පවත්නාවූ); වනපෙත මැද, වනපඞ්ක්ති මධ්‍යයෙහි (දී); කුසුම් සුඹුලෙක, පුෂ්ප චුම්බටකයකගේ නොහොත් පුෂ්පමාලාවකගේ; සිරින්, ශොභාවෙන්; සැදි, සජ්ජිතවූ; සියගත, ස්වකීය ගාත්‍රයෙහි; පැ, ප්‍රභාව හෙවත් වර්ණය; පැ, ප්‍රකාශකොට; එන, ආගමනයකරන්නාවූ; එහි, ඒ වනයෙහි; රැඳි, රංජිතවූ; සුරකැලට, දිව්‍යසමූහයාට; තොසින්, තොෂයෙන් (යුක්තවෙමින්); සෙදී, ශීඝ්‍රව; මිතුරිඳුසඳ, මිත්‍රෙන්ද්‍රයාත් තමය; ගමනොත, ගමන් ප්‍රාප්තවූයේනම්; යෙහෙකි, යහපතෙක්ය,,—

"මිහිකත හෙවත් පොළොව නමැති ගැහැනිය විසින් තරකොට බඳිනලද ඉතා නිල්පැහැඇති කොන්ඩයමෙන්(පෙනෙමින් තිබෙන)වනසමූහය මැද්දී මල්සුඹුලුවකගේ නොහොත් මල්දමකගේ ශ්‍රියාවෙන් සැරසී සවකීය ශරීරයෙහි පැහැය ප්‍රකාශකොට හෙවත් පෙන්වාගෙණ එන්නාවූ ඒ වනයෙහි රඳන්නාවූ දිව්‍යසමූහයාට සන්තොෂයෙන් (යුතුවෙමින්) වහා මිතුරන්ට ප්‍රධාන උතුම් මිතුරෙ ගමන් පැමිනියේ විනම් හෙවත් ගමන්ගත වූයේනම් (ඒ) යහපතෙක්ය,,.

109 සු රි ඳු න් සදිසි සිළුමිණි කුලු සත පා ය
දි රි ගෙ න් ගිරිඳු සරියසසින් පිණී පා ය
සි රි බ න් හැන් පිහිටි විජයබ නර පා ය
සි රි ව න් දෙලෙහි සැතපෙව පිය සත පා ය

* යෙදී—පිද—සමහර ඡද මැනවි.

109. සතපාය කුල, සූර්‍ය්‍යවංශයට; සිළුමිණි, ශිඛාමාණික්‍යයක්වූ හෙවත් සිළුමිණකට බඳුවූ; සුරිඳුන් සදිසි, සුරේන්‍ද්‍ර සාදෘශ්‍යවූ, දිරියෙන්, ධෛර්‍ය්‍යයෙන්; ගිරිඳුසරි, ගිරෙන්‍ද්‍රයා හෙවත් පර්වතරාජයා සමානවූ; යසසින්, කීර්තියෙන්; පිණිපායැ චන්‍ද්‍රයා සමානවූ; විජයබ නරපාය, විජයබාහු නරශ්‍රේෂ්ඨයා විසින්; සිරිබන්නැන්, ශ්‍රීබන්ධන ස්ථානයෙහි; පිහිට, ප්‍රතිෂ්ඨිතවූ; සිරිවන්දෙගලෙහි. ශ්‍රීමන්දිරයෙහි; පියසතපාය, පක්ෂසන්තර්පණයකොට; සැතපෙව, සන්තර්පිත වෙව—

“සූර්‍ය්‍යවංශයට හෙවත් සූර්‍ය්‍යවංශයෙහි වූවන්ට සිළුමිණක් සමානවූ හෙවත් ඔවුන්ගේ අගතිබෙණ මැණිකවැනිවූ ශක්‍රයා සමානවූ (ලීලාඇති) ධෛර්‍ය්‍ය (බල) යෙන් මහමෙර සමානවූ යසසින් චන්‍ද්‍රයා වැනිවූ විජයබාහු නරොත්තමයා විසින් ශ්‍රීබන්ධනය කරණලද ඉඩමෙහි පිහිටියාවූ සිරිමැඳුරෙහි පියාපත් සංසිඳුවාගෙණ සැතපියන්„—

110 ප ඟු ර න් සහ සිඟුරු ගැවසුනු සුනිල් අ  ති න්
ව ගු ර න් නොයෙක් පවන මල්අස ලවන පෙ  ති න්
ම ගු ර න් කා නැගෙණ වන තුරු දියතරු  ති න්
ප ඟු ර න් වෙල්එලිය දකයන් නැවෙන් ප  ත් න්

110. පඟුරන් සහ, පඟුරු වෘක්ෂයන් හා; සිඟුරු, සිඟුරු ලතාවන් විසින්ද; ගැවසුනු, සඞ්කීර්ණවූ, සුනිල් අතින්, අතිනීල හස්තයෙන් හෙවත් ශාඛාවෙන් උපලක්ෂිතවූ; අසලවනපෙතින්, උපවන පඞ්ක්තියෙන් හෙවත් ආසන්න වනපඞ්ක්තියෙන්; (හමන්නාවූ) පවන, මාරුතයෙන්; මල්, පුෂ්පයන්; වගුරන්නෙන්, වගුරුවන හෙයින්; වනතුරු, වනාන්තරයෙහි; (විද්‍යමානවූ) දියත, ජලයෙහි; (වසන්නාවූ); මගුරන්, රෝහිත මත්ස්‍යයන් විසින්; (ඒ පුෂ්පයෝ); රුතින්, රුචියෙන්; කානැගෙණ. ඛාදනයකොට ගෙණ හෙවත් උඩ ගතවනු ලබන්නාවූ; පඟුරන් වෙල්එලිය, පඟුරු ආරණ්‍යයෙහිවූ වෙල්එලිය; (පඟුරණනම් ප්‍රදෙශයෙහි වෙල්එලිය) දැකැ, දර්ශනයකොට; වෙන්පතින්, වෙනාසපර්ශයෙන්; යන්නැ, ප්‍රයානය කරන්න—

“පඟුරු (පඹුරු) ගස් හා (එක්ව) හිඟුරුවැල් ගෙවූනාවූ හෙවත් ගැවසුනාවූ ඉතා නිල් අතුවලින් යුතුවූ සමීපවන පෙගලන් (හමන්නාවූ) සුලඟින් මල්වැගිරවීම කරවන හෙයින් රේමසුන් විසින් (ඒ මල් වැටෙනකල ආහාරයට සුදුසු දෙයෙකැයි) නැමැත්තෙන් (මල්) කාගෙණ නැගෙණු ලබන්නාවූ පඟුරු අරණ හෙවත් පඹුරණ (යන නම්ඇති ප්‍රදෙශයෙහි) වෙල්එලිය දැකලා අහස්මගින් යාගන්”—

111 නො ස රු ප් පා කරණු එන කුරුළු නැ  ලා
නො ස ත ප් පා සොලවනමැක පෝරු දි  ලා
ක ස රු ප් පා වෙලෑ කිරිවත් ගොයම්ව  ලා
* නො ස ත ප් පා යව ඇල්ගෙවි ලියන් කි  ලා

* අගපදේ„ නොසනප්පා, සන්තර්පනය නොකොට, (සැපතට නොපමුනුවා) කියාද හැකි.

111. නොසරුප්පා කරණුව, (සස්‍යයන්) අසාරුප්‍ය කරණුපිණිස හෙවත් නොසරුප්කිරීමට; එන, ආගමනයකරන්නාවූ; කුරුළුකැලා, කුරල සංඝාතය හෙවත් පක්ෂිසමූහයා; නොයතප්පා, සන්තර්පනය නොකොට හෙවත් සැතපීම නොකරවා; සොලවන, චාලනය කරණුළුබන්නාවූ, වැකපෝරුවැලා, වඩිකළුල කාවලින් හෙවත් වැකපෝරුවැල් ඇත්තාවූ; කිරිවන්, ක්ෂීර පූර්ණවූ; (කිරිවැදුනාවූ) ගොයම්, සස්‍යයෙන්; අවලා, ආකූලවූ හෙවත් ගැවසීගත්තාවූ, කසරුප් පාවෙලැ, කසරුප්පා (නම්) වෙලෙහි; (පොල්රුප්ප කසරුප්පනම්); ඇල්ගෙවි ලියන්, ශාලිගොපිකාංගනාවන්; බලා, අවලොකනයකොට; නොසනප්පා තෝසන් තර්පිතව; යව, ගමනයකරව—

"නුසුදුස්සක් හෙවත් ගොයමට නොසැහෙන අන්දමක් කිරීමට එන්නාවූ පක්ෂිසමූහයා සැපතට නොපමුනුවා හොලවන්නාවූ වැකපෝරුවැල් ඇත්තාවූ කිරිවැදුනු ගොයමින් ගැවසුනාවූ හෙවත් අවුල්වූ පොල්රුප්ප සමීපයෙහිවූ වෙලෙහි (පැමිනීසිටින) ඇල්ගොවියන්ගේ ලියන් (ගේ දිසාව) බලා උඹ සැනසී හෙවත් (ශිතසතුටුකර ගැණීමෙන්) සැපතට පැමිනි (සැනසී) ගමන්කරන්„.

112 බි ගු බ ට ක ල ට තඹරට සුවඳට රෙණ ව
මූ තු ප ට ලෙ ස ට සැදිවැලිපිට දෙන දව ට
ලි ය දු ට නොසි ට සහතුට නෙතට සැපත ට
එ ම වි ට ම ග ට බැසැයව මහතොට ගම ට.

112. රෙණට, පරාගයාගේ හෙවත් රෙණුන්ගේ; සුවඳට, සුගන්ධයපිණිස; තඹරට, තාමරසයට; බිගු, භෘඞ්ගයන්; බටකලට, අවතීර්ණවූ කල්හි; මුතුපට ලෙසට, මුක්තාපට්ටයකගේ විලාසයට; සැදි, සජ්ජිතවූ හෙවත් සැදුනාවූ; වැලිපිට, වාලුකා පෘෂ්ඨයෙහි හෙවත් වාලුකාස්තල මතුභාගයෙහි; දවටදෙන, පැලඹීම දෙන්නාවූ; හෙවත් දූවටෙන්නාවූ; ලිය, කාන්තාවන්; දුට, දර්ශනයකළ කල්හි; නෙතට, නෙත්‍රයාගේ; සැපතට, සම්පත්තියපිණිස හෙවත් සැපය පිණිස; සහතුට, සන්තුෂ්ටව හෙවත් සන්තොෂයෙන්; නොසිට, ස්ථානය නොකොට; එමවිට, එම කාලයෙහි, මගට, මාර්ගයට; බැසැ, අවතීර්ණව; මහතොටගමට, මහාතීර්ථ ග්‍රාමයට; යව, ගමනයකරව—

"මලෙහි හටගත්තාවූ මල්මයවූ දූවිලිවල සුවඳට නෙළුම්මලට මීමැස්සන් බැස්සකල්හි මුතුපටක් පරිද්දෙන් (මුතුවලින් සැදුන රෙද්දක්මෙන්) සැදුනාවූ වැලි (තලාව) මත්තෙහි දූවටෙන්නාවූ හෙවත් ඒ වැල්ලෙහිම සැරණී කතා සැපසේ ඇවිදින්නාවූ කතුන් දුටුකල ඇහැට සැපපිණිස සතුටින් නව තින්නේ නැතිව ඒ වේලාවටම මගට බැහැලා මාතර යන නම් ඇති ගමට නොහොත් මාතොට සමීපයෙහිවූ ගමට ගමන්කරන්„—

113 කා ලැ ම දෙවුන් හා දලයන් ඉදි තිතො ර
කෑ ලෑ ම නැතිව දෙස් පිරිසිඳින බැවහ ර
සී ල ම සිහිල් පිරිහේ මැඳුරත් සොඳු ර
පා ල ම යෙහෙන් සැතපීයන් නැම මිතු ර

**113.** ඇමකාල, සැමකල්හි; දෙටුන් හා, ජෙෂ්ඨයන් සමග; දලයන්, ජල යන්ත්‍රිකයන් විසින් නොහොත්; දලයන්, ජලයන්ත්‍රිකයන්ගෙන්, (ඔරු පාරු ආදියෙන් ජලයෙහි යාත්‍රාකරන්නන්ගෙන්); නිතොර, නිරන්තරව; ඉදි, සමුඩිවූ, කැලම්නැතිව, අතිශයින්ම අවිද්‍යමානකොට; දෙස්, දෙස්සයන්; පිරිසි දින, පරිච්ඡින්නය කරන්නාවූ; බැවහර, ව්‍යවහාරයක් ඇත්තාවූ; සිලම, ඝුවහා වෙන්ම, සිසිල්, * සිසිර භාවයෙන් පිරි, පූරිතවූ; පාලම, සේතුවෙහිවූ; සො දුරු, සුඳුරුවූ, හේමැදුරන්, සෞධමන්දිරයෙහි; ගෙහෙන්, සහපත් පරිද්දෙන්; සැතපී, සහාර්පිතව; මම්තුර, මාගේ මිත්‍රය; යන්නැ, ප්‍රයානයකරන්න.

"හැමදවස්වලම (එහි කටයුතුකරවන) ප්‍රධානීන් හා (ඔරු පාරු අගුල් ආදියෙන්) ජලයෙහි ගමන්කරන්නන්ගෙන් පාඩුනැතිව තිබෙන හෙවත් පවත්නාවූ කොහෙත්ම නැතිකොට දෙස්කඩා බිඳහරින්නාවූ බැවහාරයක් ඇතතාවූ සැබවින්ම සිසිල් බවෙන් පිරුණාවූ පාලමෙහි (සාදන ලද්ද) වූ සොඳුරු මැදුරෙහි (ගෙයි) හොඳින් සැතැපී මගේ මිතුරෙ ගමන්කරන්..

114 දෙ තොර මුහුළු සල් දෙඹ පුල් වලා අගි න්
නි තො ර සපිරි සිහිලඹැ නිල් වලා රගි න්
වැ ති ර කෙළිණ මත්ගජ නිළවලාගඟි න්
එ තෙ ර පියාසරකරැ නිල් වලාමගි න්

**114.** දෙතෙර, උභයතීරයෙහි; මුහුළු, වකුලය හෙවත් මූනමල්ය; සල්, සාලය; හෙවත් සල්ය; දෙඹ, කෙසරය යන; පුල්, ඵුල්ලවූ; අගින්, වෘක්ෂයෙන්, අවලා, ආකුලවූ, නිල්වලාරසින්, නීලවලාහකා කාරයෙන්; නිතොර, නිරන්තරයෙන්; සපිරි, සම්පූර්ණවූ සිහිලඹැ, සීතලාම්බුවෙන් උපලක්ෂිතවූ; මත්ගජ, මත්තහස්තීන් විසින්; වැතිර, වැතිරී හෙවත් (කැමැත්තෙන්) ඇදවැටී; කෙළින, ක්‍රීඩාකරණු ලබන්නාවූ; නිල්වලාගඟින්, නිලවලාහක ගඞ්ගාවෙන්; එතෙර, පාරිම තීරයට, නිල්වලාමගින්, නිලවලාහක මාර්ගයෙන්; පියාසරකර පක්ෂප්‍රසාරණයකොට

"ඉවුරු දෙකෙහි මූනමල්ය † හල්ය දෙඹය යන පිපුනාවූ රුක්වලින් අවුල්වූ හෙවත් ගැවසීගත්තාවූ නිල්වලාකුළුමෙන් හැමවේලේම පිරීතිබෙණ සීතල ජලයෙන් යුතුවූ මත්ඇතුන් විසින් (කැමැත්තෙන්) ඇදවැටී (ඉඳගෙණ) සෙල් ලම්කරණු ලබන්නාවූ නිල්වලා ගංගාවෙන් එගොඩහට ආකාශමාර්ගයෙන් පියාසරකරලා"

115 මී පා සවන සිරිපා සර සරණ පෙ මා
මා පා විර බාහාරවූ සාමින් හ මා
මා පා පටන් වැද්ද එතැනින් මිතුරු තු මා
තා පා සතපමින් යාගත් නිවා ගි මා

* සිසිල්, සසිරාම්බුවගේ; පිරි, ප්‍රවාහ ඇත්තාවූ; ගහ, නදියෙහි; සොඳුරු, සුඳුරුවූ; පාලම, සේතුවෙහිවූ; මැදුරත්, මන්දිරයෙහි—සිදු—කියහැකි.
† මූනමල්වලට මුගුණය කියාත් සමහර පලාත්වල කියති.

115. අසවන, (තමන්ට) ආශ්‍රයවන්නාවූ; මීපා, මහීපාලයන්ගේ; නොහොත්; මීපා, මහීපාලයාගේ; සිරිපාසර, ශ්‍රීපාදපද්මයෙන්; පෙමා, ප්‍රේමයෙන්, සරණ, සරසනලද්දාවූ; මාපාවීරබා, මහාපාද වීරබාහු විසින්; හෙවත් මහපදවි සක් ලත් වීරබාහු යන නම්ඇත්තහු විසින්; තමාතමින්, තමන්ගේ නාමයෙන් හෙවත් ස්වකීය නාමයෙන්; කරවූ, කාරාපිතවූ හෙවත් කරවනලද්දාවූ; මාපාපටින්, මාපාපට්ටනයට හෙවත් මාපාපටුනට; වැදූ, ප්‍රවිශවූ; මිතුරුතුමා, මිත්‍රොත්තමය; නාපා, නාගේ පාදයන්, නොහොත් පක්ෂයන්; සනපමින්, සත්කාර්පණය කෙරෙමින්; හෙවත් සැපතට පමුනුවමින්; ගිමා, ග්‍රීෂ්මය; නිවා, නිර්වාපනයකොට; එතැනින්. ඒ ස්ථානයෙන්; යාගන්, යාත්‍රාග්‍රහණයකරන් * —

“තමන්ට ආශ්‍රයවූ හෙවත් තමන් විසින් ඇසුරුකරණ ලද්දවූ රජුන්ගේ නොහොත් රජුගේ ශ්‍රීපාදනමැති නෙළුම්මලින් අලංකාර කරණලද මහතිල මක්කාරයා (මහතිලමේ) විසින් “මාපා” යන තමන්ගේ නාමය මුල්කොට ඇතිව කරවනලද මාපාපටුනටවැදී උතුම් මිතුර නාගේ පාදයන් හෙවත් පියාපත් සැපතට පමුනුවමින් (සංසිඳුවමින්) ගිම්නිවා (ගෙණ) ඒ භූමියෙන් ගමන්කරන්” —

116 සක්කල් සදිසි ලියපද පහර වැදගෙ ණි
අක්මුල් නොහැර මල්පිපි හෝපළු සොබ ණි
දික්ගල් තලින් සුතු සිකිකැන් පිලඹර ණි
උක්ගල් බැවුල ගෙවමින් මගට බැසැගෙ ණි

116. සක්කල් සදිසි, ශක්‍රයාගේ කාන්තාවන් සමානවූ; ලිය, කාන්තාවන්ගේ; පදපහර, පාදප්‍රහාරය; වැදගෙණ, ස්පර්ශ ග්‍රහණයකොට හෙවත් වැදගැණී මෙන්, අක්මුල්, අග්‍රමූලයන්; නොහැර, අත්නොහැර; මල්, පුෂ්පයන්; පිපි, පුෂ්පිතවූ; හෝපළු, අශෝකවෘක්ෂයෙන්; සොබණි, සොභමානවූ; සිකිකැන්, ශිඛී ස්කන්ධයන් හෙවත් මයුරසමූහයන් විසින්; පිලඹරණ, පිඤ්ඡ ව්‍යාපනය කරණලබන්නාවූ; දික්ගල්තලින්සුතු; දිඝී ගල්තලාවෙන් යුක්තවූ; උක්ගල් බැවුල, උග්ගල්බැවුල යන නම්ඇති ප්‍රදේශය; ගෙවමින්, නිෂ්ඨාකරෙමින්; මගට, මාර්ගයට; බැසැගෙණ, අවතීර්ණ ග්‍රහණයකොට හෙවත් බැසැගෙණ —

“සක්දෙවිඳුගේ කතුන්වැනි (රූපශ්‍රීඇති) ලියන්ගේ පදපහර වැදගැණී මෙන් (එනම් ගස්මුල්උඩ යාම්ර්ම් ආදියෙන් එබඳු ගෑනුන්ට ගස්මුල් පෑගී මෙන් වන්නාවූ පයේපහර හෙවත් ස්පර්ශයවැදීම ගැණීමෙන්) අක්මුල්නැර මල්පිපීතිබෙන හෝපළුගස්වලින් බබලන්නාවූ මොණර සමූහයා විසින් පිල් (වලු) කරනවනු ලබන්නාවූ දික්වූ ගල්තලාවෙන් යුතුවූ උක්ගල් බැවුම ගෙලවර කරමින් මගට බැහැලා,, —

* ගිමා, ග්‍රීෂ්මය; නිවා, නිර්වාපනයකොට; නාපා, නාගේ පාදයන්; සනපමින්; සැපතට පමුනුවමින්; යාගන්, යාත්‍රාග්‍රහණය කරන්—සිද—කියහැකි.

117 සු පි පි ම ල් බ ම රු දූ ලී ත ම ලු වැ ලී මලාමැලි
තුටු කොවු ලී සකොලහලී සුපිපියලී වෙනොහිපුලි
ල ප ලූ හැ ලී සෙවනාව ලි පැහැ සුනිලි ගණවැදූලි
බ ල මෙ ම ලි තුරු සි ය ලි වලවිදුලි සිරිලක ලි

117 සුපිපි, සුපිෂ්පිතවූ; මලී, පුෂ්පයෙන් හා; බමරුදූලී, භෘඞ්ගජලායෙන්ද තමලුවැලී, තමාල ලතාවෙන් හෙවත් කොල්ලන් වැලින්ද; මලාමැලි, කුඩා මහත් පුෂ්ප වෘක්ෂයන්ගෙන්ද යුක්තවූ; තුටු, තුෂ්ටවූ; කොවුලී, කොකිලයන්ගේ; සකොලහලි, කොලාහල සහිතවූ; යලී, නැවත; සුපිපි, සුපුෂ්පිතවූ; වෝ නොහිපුලි. වනොත්පලයන්ද ඇත්තාවූ; ලපලූ; පල්ලවයෙන්; හැලී, සිතලවූ නොහොත්; හැලී, ධවලවූ; ලපලු; පල්ලවයන් ඇත්තාවූ; * සෙවනවලී, ඡායාවෙන් ආකූලවූ, සුනිලි පැහැ, මනා නීලවර්ණයෙන්; ගණවැ; සාන්ද්‍රව, උදූලී, උජ්වලිතවූ; මෙමලි තුරුසියලි, මේ පුෂ්පවෘක්ෂ සියල්ලෙන් යුක්තවූ; වලා වනය; බල, නිරීක්ෂණයකරව; විදුලිසිරි, විද්‍යුල්ලතාශ්‍රියෙන්; ලකලි, අලඞ්කෘතයි,,—

"මනාව පිපුනාවූ මලින් හා මීමැසි සමූහයන්ගෙන්ද කොල්ලන් වැල්වලින්ද කුඩා මහත් මල්රුක්වලින්ද යුතුවූ (මධුර ඵලරසාදියෙන්) සතුටුවූ කොවුල් පක්ෂීන්ගේ කොලාහල සහිතවූ නැවත (තවද) මනාවපිපුනාවූ වනයෙහි උපුල් හෙවත් ගොඩමහනිල්ද ඇත්තාවූ ලාදළුවලින් සිතලවූ නොහොත් සුදුපාට දළු ඇත්තාවූ ගණව දිලිහෙන්නාවූ මේ මල්රුක් සියල්ල බලව වනය විදුලින්ගේ සොභාවෙන් (විදුලි ගහන්නාක්මෙන්) අලංකාරයි,,—

118 මෙ ණි ඳු නි ලී පැ හැ ඉ සි ලී එවනැ විලී පියුමුපුලි
ව ත ල ලෙ ලී ව ග ළු ම ලී රොණිනවලි එනගඟු
ස තු රු කැ ලී බ ම ව ස ලී යුතු සිහිලි පිරිසිලිලී
තු බ ති ය ලී ස කි එක ලී දෙලෙහිගිලි යවඉපි

118. ඉඳුනිලීමෙණ, ඉන්ද්‍රනිල මාණික්‍යයට බඳුවූ; පැහැ, ප්‍රභාව හෙවත් වර්ණය; ඉසිලී, උද්වහණයකලාවූ; වතල, විස්තෘතවූ හෙවත් පැතුරුණාවූ; පියුමුපුලි, පද්මොත්පලයන් ඇත්තාවූ; ලෙලී, ලිලොපෙතවූ, මලී, පුෂ්පයන්ගෙන්; වගල, වගුලාවූ හෙවත් වැගුරුණාවූ; රොණින්, රෙණුයෙන්; අවලී, අකුලවූ; නොහොත්; අවලී, ආකුලව; එන, ආගමනය කරන්නාවූ; ගඟුලී, නිර්ඣරයන් ඇත්තාවූ; විසලී, විශාලවූ; තුරුකැලී, පක්ෂිසමූහයාගේ; බමසහ † භ්‍රම

* සෙවනවලී, ඡායාවන්තී, ලපලු, බාලපල්ලවයන්, හැලී. පතිතව; සුනිලි පැහැ, මනානීලවර්ණයෙන්; ගණවැ, ඝණව; දිලී, දීප්තිමත්වූ; කියාද—මෙමලී තුරුසියලී, මේ පුෂ්පවෘක්ෂ සියල්ලෙන් යුක්තවූ; වලවිදුලිසිරි, වලාහක විද්‍යුල්ලතාශ්‍රියෙන්; ලකලී, අලඞ්කෘතයි; බල, නිරීක්ෂණයකරව—කියාද—තවත් ක්‍රියාකාරයකටද අරුත් බිණිය හැකිවෙයි.

† බම සහ—යන්තෙහි "හ'' කාරය—අගම්භ කරයි දන්නෙ.

සහිතවූ හෙවත් කරකැවීම් සහිතවූ; නොහොත්, විසලි, විශාලවූ; තුරුකැලී, වෘක්‍ෂසමූහයාගේ; බමසහ, භ්‍රමසහිතවූ හෙවත් ඒ අත මේ අත අතු කරකැවීම් සහිතවූ; එවනවිලී, ඒ වනතටාකයෙහි; සිහිලිපුනු. ශිශිර භාවයෙන් ප්‍රසන්නවූ; පිරි. පූරිතවූ; සිලිලී, සලිලය කාරණකොටගෙණ; නුබ, නභය; (ආකාශගතිය) කියලී, කථනයකොට ලූවාවූ; දෙලෙහි, කඳුරයෙහි, ගිලී, නිමග්නව (ගැලී); එකලී, තත්කාලයෙහි; ඉපිලී, ඉල්පී; සකි, සඛිය හෙවත් මිත්‍රය; යව. ගමනය කරව—

"ඉඳුනිල් මැණික්වැනි පැහැයඇති පැතිරී (හැමතැනම සැදී) තිබෙන නෙලුම් මහනිල් ඇත්තාවූ ලෙලදෙන මල්වලින් වැගිරෙණ රේණුයෙන් අවුල්වූ (බැසගෙණ) එනදිය උල්පත් (දියපාරවල් හොයවල්) ඇත්තාවූ (පැතිරී මෙන් මහත්වූ හෙයින්) විශාලවූ පක්‍ෂිසමූහයාගේ නොහොත් රුක්සමූහයාගේ (ඒ අත මේඅත අතු) කරකැවීම් සහිතවූ ඒ වනවිල්හිවූ සීතභාවයෙන් ප්‍රසන්නවූ ජලය කරණකොටගෙණ ආකාශයෙහි ආකාරය දකින්නාවුන්ගේ සිතටඇති කළාවූ (එබඳු කල්පනාවක් සිතෙහි දැමූවාවූ) දෙලෙහිගිලී ඒ කාලයෙහිම ඉලිප්පී මිතුරෙ ගමන්කරන්—

119 තු රු ප ත රා අ ත ර තරා රඳනගිරා කැල නිතොරා
කු සු ම ස රා රියසොඳු රා අදින වරා බැරි වැහැ රා
සැඟෙවී සොරා පැමිණී පුරා මෙසිරිසරා දැකැනොහැරා
තු ටි නු තු රා නසිත පු රා යවම්තුරා එවනතු රා

113. තුරුපතරා, වෘක්‍ෂසමූහයාගේ; අනරතරා, අනන්තරන්තරයෙහි; නිතොරා නිරන්තරයෙන්; රඳන, රඤ්ජමානවූ; ගිරානැල, ගිරසමූහයා කෙසේද; කුසුම සරා, පුෂ්පබානයාගේ; සොඳුරා, සුන්දරවූ; රිය, රථය; අදිනවරා, ආකර්‍ෂණය කරණ කාලයෙහි; බැරිවැ, භාරව හෙවත් (රථය අදින්ට) අශක්‍යව; හැරා, අත්හැර; සැඟවී, ගුප්තව; සොරා, චෞරභාවයෙන්; පැමිණිපුරා, ප්‍රාප්තවූවන් වැන්නේය නොහොත් ප්‍රාප්තවූ ආකාරයි; මෙසිරිසරා, මේ ශ්‍රීසාරය; නොහැරා, අත්නොහැර, දැකැ. දර්‍ශනයකොට; තුටින්, තොෂයෙන්; නසිත, තාගේ චිත්තය; පුරා, පූරණයකොට; උතුරා, උතුරවා, මිතුරා, මිත්‍රය; එවනතුරා, ඒ වනාන්තරයෙහි නොහොත් වනාන්තරයෙන්: යව, ගමනයකරව—

"රුක් සමූහයාගේ අතරතුරෙහිනිතර රඳන්නාවූ ගිරාසමූහයාගේ (ආකාරය කෙසේද) අනඞ්ගයාගේ සොඳුරුවූ (හොඳ) රථය අදිනකල්හි (ඒ රථය අදින්ට) නොහැකිව අත්ඇර හැංගී හොරෙන් පැමිනියවුන් වැන්නෝය මේ මහත් ශ්‍රියාව අත්නැර බලා සතුටින් තාගේ හිතපුරවාගෙණ උතුරවා (ඉතුරුණාවූ සිතින් ප්‍රසන්නව) මිතුර ඒ වනාන්තරයෙහි නොහොත් ඒ වනයෙන් ගමනය කරව;,—

120 * කැරැ සුසුමන් උපුල් ලො ලී
බොනපය මුව ශිඹ එස ලී
ඔවුන් නුවන් සඳැස් පෙ ලී
පිල්බර සිරි විලස් හැ ලී

* කරඬු කුමල් සුසුල්ලොලී, ලෙලී—පිද.

120. විසලි, විශාලවූ; ගිම, ග්‍රීෂ්මයෙන් යුක්තවූ; මුව, මෘගයන් විසින්; සුසු මන්නැරු, ශ්වාසංකොට; ලොලි, ලොලයෙන් යුක්තව නොහොත්, ලොලි, ලොලවන්නාවූ හෙවත් චඤ්චලවන්නාවූ; උපුල්, උත්පලයෙන් යුක්තවූ; පය, පානීයය හෙවත් ජලය; බොන, පානයකරණකල්හි; ඔවුන්, ඒ මෘගයන්ගේ; නුවන්, නෙත්‍රසමූහය, සඳැස්පෙලි, චන්ද්‍රාක්ෂිපිජා පඞ්ක්ති වැන්න; හැලි, නිර්ඣරයෝ; පිල්බරසිරිවිලස්, පිඡාභාරීත්ව බඳුවූ ශ්‍රීවිලාශ ඇත්තෝය; නොහොත්; පිල්බර, පිඡාභාරීත්ව බඳුවූ; අසිරිවිලස්, ආශ්චර්ය්‍යලීලා ඇත්තෝය—

“මහත් ග්‍රීෂ්මය ඇත්තාවූ මුවන් විසින් හුස්ම දමදමා ලොල්කමින් නොහොත් ලෙලදෙන (චඤ්චලවන) උපුල්මල් ඇත්තාවූ (ස්ථානවල) පැන්බොනකල්හි ඒ මුවන්ගේ ඇස්සමූහය සඳැස් පිළිපෙලක් වැනිය (ඒ හෙයින්) ඇලවල් මොනරුන්ට බඳුවූ ආශ්චර්ය්‍ය විලාශ ඇත්තාහුය,,—

121 සසලව වනකැලා එ න ම ල් කැලඹ ලා
රැඳිමුවරද ලොලා ම න ක ල් මිහි ලො ලා
තුඟුතුරු අග පුලා ස පු ම ල් සුවිපු ලා
උසනැගි දුම් තලා * පැහැදුල් දිවි ණ ලා †

121. වනකැලා, වනකලාපය; සසලව, චඤ්චලව; එන, ආගමනයකරන්නාවූ; මල්කැල, පුෂ්පකලාපය හෙවත් මල්සමූහය; බලා, අවලොකනයකොට හෙවත් එසනයකොට; මුවරද ලොලා, මකරන්ද ලොලයෙන්; රැඳි, රඤ්ජිතවූ; මනකල්, මනොකලාවූ; මිහිලොලා, මධුලොලයන් ඇත්තාවූ; තුඟු, තුංගවූ හෙවත් උච්චසවූ, තුරුඅග, තරු අග්‍රයන්හි; පුලා, ඵුල්ලවූ; සුවිපුලා, අතිශයින් විපුලවූ; සපුමල්, චම්පක පුෂ්පයෝ (කොසේද); උසනැගි, උච්චව නැංගාවූ; දුම්තලා, ධූමතලාවෙක්හි; පැහැදුල්, ප්‍රභාජ්වලිතවූ; දිව්තලා, ප්‍රදීපයන් මෙනි—

“වනසමූහය සෙලවී එන්නාවූ මල්සමූහය සොයාගණ මල්පැනිසට ආසාවෙන් නැවතුනාවූ සිත සතුටුකරන්නාවූ මීමැස්සන් ඇත්තාවූ උස්වූ රුක්අග පිපුනාවූ ඉතා මහත්වූ සපුමල් (කොසේද) උස්ව නැංගාවූ දුම්තලාවෙක්හි දිලිසෙන්නාවූ පැහැයෙන් යුතුවූ පහන් සිලුමෙනි (පහන්දළු සමානයි)”—

122 ගු ම් ග ත් මේ කුළුවත් මතැතුන් ගේ
‡ ද ම් ද ත් පැහැ දූකැ ලෙලවිදු අන් ගේ
පෙ ම් සි ත් කරුගණැ සෙබඩුන් ලැත්. ගේ
ස ම් ප ත් වූ ගිරිරඟ සිකි රග් ගේ

---

* දුම්තලා.

† දිවිණුලා—සිද—සමහර.

‡ දම්දත්, දුන්දත්, දුම්ගත්, පැහැදූකැ ලේවිදු අන්ගේ—කියාද—“දම්දත් පැහැ” දැමදත්ත මරීචිය—සිද—කිහිගහැකි.

122. ගුම්ගත්, ශොභාග්‍රහණයකළාවූ; මේ කුළුවන්, මෙඝකූට වණ්වූ හෙවත් මෙඝකූටවැනිවූ; මතැතුන්ගේ, මත්තහස්තීන්ගේ; ලෙළ, ලීලොපෙතවූ; විදු අන්ගේ, විද්‍යුල්ලතාවන්ගේ ආකාර ඇත්තාවූ; දත්දම් පැහැ, දන්තමාලා ප්‍රභාව හෙවත් දන්තපඞ්ක්ති මරීචිය; දුකැ, දර්ශනයකොට; ගණැ, ඝණයයි හෙවත් මෙඝයයි; පෙම්සිත්කර, ප්‍රෙමචිත්තයකොට; සෙබඩුන්, මයූරවධූන්; ලංගේ කර, සම්පයෙහිකොට; සිකි. ශිඛණ්ඩීහු හෙවත් මයූරයෝ; රන්ගේ, නෘත්‍යය පිණිස; ගිරිරඟ, ගිරිරංගයන්ට, සම්පත්වූ, සම්ප්‍රාප්තවූවෝය—

"ශොභාගත්තාවූ වැසිකලු කුළු (මුදුන්) වැනිවූ මත්ඇතුන්ගේ (කලුපැහැ සඳ) ලෙලදෙන විදුලි වැනිවූ දන්තමාලාවන්ගේ පැහැයද දුක වැසිකලුවයයි පෙම්සිත් (සතුටු) ඇතිකර මයුරවධූන් ළඟාකර (ශෙණ) මොණරු නැටීමට පර්වත නෘත්‍යමණ්ඩලයන්ට පැමිණියෝය"—

123 අ ද නා මින ෙනතු නදුනුය ෙනත ලු
සොබ නා පිපි කුසුමෙන සන්මුහු ලු
ර ද නා එහි දෙවඟණ කැන් බැබ ලු
ස ද නා තුරු සළුපටවැනි යහ ලු

123. යහලු, මිත්‍රය; මනනෙතු, මනොනෙත්‍රයන්; අදනා, ආකර්ශනයකරන්නාවූ; නදුනුයන්, නන්දනොද්‍යානය හා, එකලු, එකාකාරවූ; සොබණා, ශොභමානවූ; පිපි, පුෂ්පිතවූ; කුසුමෙන්, පුෂ්පයෙන්; සන්, සඤ්ජන්නවූ; මුහුලු, අශොක වෘක්ෂයෝ ගතසේද; එහි, ඒ වනයෙහි; රඳනා, රජයකරන්නාවූ, බැබලු, භ්‍රාජමාන වන්නාවූ; දෙවඟණකැන්, දිව්‍යාඞ්ගනා සමූහයා විසින්; සදනා, සජ්ජිතකරණු ලබන්නාවූ; උතුරුසළුපටවැනි, උත්තරසාටක පට්ටයන් වැන්නෝය—

"මිතුරෙ සිත්නෙත් අදින්නාවූ නදුනුයන හා ඒකා කාරවූ නොබින්නාවූ පිපුනාවූ මලින් ගැවසීගත්තාවූ හෝපලුරුක් නෙසේද කිවොත් ඒ වනයෙහි රඳන බබලන්නාවූ දෙවඟනන්රැස විසින් සදනු ලබන්නාවූ හෙවත් සැරසෙනු ලබන්නාවූ උතුරුසළුපටවල් වැන්නෝය,,—

124 ලි ය කැ ලේ ගත මුව කැ ලේ
මි හි ලො ලේ සර පුල්වි ලේ
ම ද ෙන ලේ ලිය පලු සැ ලේ
සි තු ඇ ලේ දුටුකලැ ව ලේ

124. ලියකැලේ, ලතාගුල්පයෙහි) යන, ගමනයකරන්නාවූ; මුවකැලේ, මෘගසමූහයන්ගෙන්ද; පුල්විලේ, ඵුල්ලතටාකයන්හි, සර, සංචාරණයකරන්නාවූ: මිහිලොලේ, මධුලොලයන්ගෙන්ද; මදගනලේ, මන්දමාරුතයෙන්; සැලේ, චඤ්චලවන්නාවූ, ලියපලු, ලතාපල්ලවයන්ගෙන්ද (යුක්තවූ); වලේ, ආරණ්‍යය; දුටුකලැ. දර්ශනයකළ කල්හි; සිතුඇලේ, චිත්තාලයවේ—

"වැල් කැලෑවෙහි යන්නාවූ මුවන්ගෙන්ද පිපුනාවූ විල්වල හැසිගරණ මීමැස්සන්ගෙන්ද මදසුලඟින් සැලෙන ලතාපලු(ලාපත්‍ර) යෙන්ද (යුතුවූ) වනය දුටු කල්හි සිත්ඇලෙයි,,—

125 ක න් ප සේ නිලුපුල් ග සේ
මෙ න් හ සේ ගමනින් ල සේ
ර න් රු සේ අඟනන් රැ සේ
සන් තො සේ දුකැ මං බැ සේ

125. කන්පසේ, කර්ණපාශයෙහි; නිලුපුල්, නීලෝත්පලයන්; ගසේ, ප්‍රවේශ කරණලද හෙවත් ගසනලද්දාවූ; හංසේමෙන්, හංසධේනූන් පරිද්දෙන්; ලසේ ගමනින්, ආලස්‍ය ගමනින් යුක්තවූ; රන්රුසේ, ස්වර්ණරූප සාදෘශ්‍යවූ, අඟනන් රැසේ, අංගනාසමූහයා; දුකැ, දකිනලකොට; සන්තොසේ, සන්තොෂයෙන්; මංබැසේ, මාර්ගාවතීර්ණව—

“කන්මලයෙහි හෙවත් කන්සිදුරෙහි නිල්උපුල් මල්ගසනලද්දාවූ හෙවත් ප්‍රවේශකරණ ලද්දාවූ හංසාංගනාවන්ට බඳුවූ ආලස්‍යවූ හෙවත් ඉක්මන්නූවූ ගමනින් යුතුවූ රත්රන්රූප සමානවූ ලක්ෂණඇති අංගනා සමූහයා දුක සතුටින් යුතුව මගටබැස,,—

126 යලිමල් කැ න් නව මල්ය ටි
සැදුනු ලෙසින් කරමුල් සැ ටි
පැහැදු වු ව න් වනලෙස අ ටි
ය ව බ ල මි න් අඟනන් සැ ටි

126. යලි, නැවත; නවසල්යටි, බාලසාලයෂ්ටියෙහි හෙවත් අභිනව සල් යටි; මල්කැන්, පුෂ්පස්තවකයන්; සැදූනලෙසින්, සජ්ජිතවූ විලාසයෙන්, කරමුල්සැටි, ග්‍රීවාමූලයෙහි විලාස ඇත්තාවූ; පැහැ, ප්‍රභාව හෙවත් වර්ණය, දුටුවන්, දකිනයකලවුන්; අජිවනලෙස, ලොභවන විලාස ඇත්තාවූ; අඟනන්, අංගනාවන්ගේ; සැටි, ආකාරය; බලමින්, අවලොකනය කෙරෙමින්; යව, ගමනය කරව—

“පසුව (තවත් කාරණයක්) අලුත්සල් කොපිලෙහි මල්පොකුරු සැදූනාක් මෙන් බෙල්ලේමුල (පසිතුරු) ආකාර ඇත්තාවූ (රන්රිදී දෑසමන් ආදීන් සම්බන්ධවූ මාලාවන් පැලැන්දාවූ ගෙලමුල) පැහැයදුටු අයගේ සිතට ලෝබඋප දවන විලාස ඇත්තාවූ අඟනන්ගේ ආකාරය බලමින් ගමන්කරන්,,—

127 කොකුම් ලියෙහි වැකී කොම ල
වඳිමින් තුඹ ගඟගෙ න් ර ල
පිවිසැ නැවත හිමවත ග ල
එන තලවිඳැ වඩු කෙළ කෙ ළ

127. කොමල, කොමලවූ; කොකුම්ලියෙහි, කුඞ්කුමලතාවෙහි; හෙවත් කොකුම් ශාඛාවන්හි; වැකී, චර්චිතව; රොන්රල, (පුෂ්ප) පරාග විසරය; තුඹගඟ තඟොගඞ්ගාවෙහි, වඳිමින්, ස්නානයවෙමින්; නැවත, ඉක්බිතිව; හිමවතගල, හිමාලය වනසටයට; පිවිසැ, ප්‍රවිශ්‍යව; එන, ආගමනය කරන්නාවූ; තල, මාරුතය; විඳැ, විඳිනයකෙරෙමින්, කෙළ: කෙළැ, ක්‍රීඩාකොට කොට; වඩු ඩබන්තැ—

“ගම්ගොලොක්වූ කොකුම් අතුවල තැවරී මල්රේණු සමූහය අහස්ගඟෙහි වැදී මෙන් පසුව හිමාලයෙහි වනපඞ්ක්තියට පැමිණ එන්නාවූ සුලඟ (වැදීමෙන් ලබන සුඛාස්වාදය) විඳිමින් සෙල්ලම්කරකර ගමන්කරන්න,.—

128 සැ ක ම න් කරණ නාගනයසි රුවිනුදු ළ
මු ක ර න් පියුමැ තුලැ අඟනන්ගෙ මනක ළ *
† ස ක ම න් බමරු මෙහෙයාරැඳි සලෙලු කැ ළ
දු ක ග න් මිතුරෙ පෙරමග නාග කෝවි ළ

128. උදුල, උජ්වලිතවූ; රුවින්, රූපයෙන්; නාගනයසි, නාගාඞ්ගනායසි; සැකමන්කරණ, සංකාවිතතය ඇතිකරන්නාවූ; මනකල, මනොකලාවූ, අඟනන්ගෙ, අංගනාවන්ගේ; මුක, වක්ත්‍රනමැති; රන්පියුමැතුල, සුවර්ණපද්මාභ්‍යන්තරයට; සලෙලුකැල, සල්ලාල සමූහයාගේ; සකමන්, චක්‍ෂුර්චිත්ත නමැති; බමරු, භ්‍රමරයන්; මෙහෙයා, ප්‍රේරණයකොට; රැඳි, රන්ජිතවූ, පෙරමඟ, ප්‍රතිපථයෙහි; නාගකෝවිල, එනම් කෝවිල හෙවත් කුඩා දෙවොල; දුක, දර්ශනය කොට; මිතුරෙ, මිත්‍රය; යන්, ප්‍රයානයකරන්—

“දිලිසෙන්නාවූ රූප (ශ්‍රී) යෙන් නාගමානවිකාවන්යසි සැකසිත් ඇතිකරන් නාවූ සිත්කැමතිකරණ (ලස්සනඇති) ගැනුන්ගේ මූනුනමැති රන්පියුම් ඇතුලට සිතේ ආසාවෙන් ඉලන්දුරි සමූහයාගේ ඇස් හා සිත්නමැති බමරුන් (මීමැස්සන්) පිටත්කොට රඳන්නාවූ ඉදිරිමග (උඹ යන ඉදිරියෙහි තිබෙන) නාගකෝවිල හෙවත් කුඩා දෙවාලය දැකලා මිතුරෙ ගමන්කරන්,,—

129 ක මි න් පියුම් රාමිණි සමුදුර බඩ ම
බොමි න් දිය ‡ මියුරුවන නිල්මිණි තඩ ම
සෙ මි න් ඇතුල වැදූ වැදගණි සුරු ඉඩ ම
එ මි න් පිටත ලැගගන් වැල්ලේ මඩ ම

129. සමුද්‍රබඩම, සමුද්‍රාසන්නයෙහිම හෙවත් මුහුදුබඩම; පියුම්රාමිණි පද්මරාග මාණික්‍යයන් රතුපියුම් පැහැඇති මැණික්, කමින්, ඛාදනය කෙරෙමින්; නිල්මිණි තඩම, නීලමාණික්‍ය ඛණ්ඩයන්ම වැනිවූ, මියුරුවන; මධුර වන්නාවූ; දිය, ජලය; බොමින්, පානයකෙරෙමින්; සෙමින්, අතුරිතව; ගණිසුරුඉඩම, ගණේශ්වර වාසස්ථානයෙහි; ඇතුල, අභ්‍යන්තරයට; වැදූ, ප්‍රවිෂ්ටව, වැද, වන්දනයකොට, පිටත, පෘෂ්ඨයට හෙවත් බාහ්‍යයට; එමින්, ආගමනය කෙරෙමින්; වැල්ලේමඩම, වැල්ලේමඩමෙහි; ලැගගන්, ලග්ණ ග්‍රහණයකරව හෙවත් ලැගුම්ගන්—

---

* මනදෙල.
† සැකවන්.
‡ මියුර පන්.

“මුහුදුබඩ බුරුතමල් හෙවත් රතුමැණික් කම්න් (රතු ගල්කැට ගිලමින්) නිල්මැණික් කඩක්ම වැතිවූ පැහැඇති මිහිරිවන්නාවූ දියඹොම්ය ඉක්මන් තොවී ගණදෙවියන්ගේ ඉඩම හෙවත් කෝවිල ඇතුලට වැදී වැදලා (එතනින්) පිටතට එමින් වැල්ලේ මඩමෙහි හෙවත් වැල්ලසමීපයෙහි සාදනලද මඩ ශමහි (මඩුවෙහි) ලැගුම්ගන්න,,—

130 දුනැතන් දිගත පිහිකුලු ගණඳුරු පුව ල
පැහැර හ'රිත් මෙන් සියම්ඬුලැ තුළුත ල
සහසකර වැටෙත පැහැසී සයුර * ර ල
පහලෙව් පෙනේ පිටතට වලබ ගිණිසි ල

130. නන්දිගත, නානාදිශායාතරයන්; පිහිකුලු, ප්‍රතිච්ඡන්නකළාවූ; පුවල ප්‍රෞඪවූ'හෙවත් මහත්වූ; ගණඳුරු, ඝණාන්ධකාරය; දුහැ, දුරුකොට, පැහැර' පැහැරගෙණ හෙවත් ගසාරගෙණ; සියම්ඬුලු, සවකියමණ්ඩලයට; ඇතුලුකල, අභ්‍යන්තරකළාවූ; බරින්මෙන්, භාරයෙන්පරිද්දෙන්; සහසකර, සහශ්‍ර කිරණයා; රල, තරඞ්ගය හා පැහැසී, සංයොගව; සයුර, සාගරයෙහි; වැටෙත, පතිතවනකල්හි; වලබගිණිසිල, වඩබාග්නි ශිඛාව; පිටතට, බාහ්‍යයට; පහලෙව්, ප්‍රකටවූවාක්මෙන්; පෙනේ, දෘශ්‍යමානවෙයි—

“නොයෙක් දිශාවන් වැසුවාවූ මහත්වූ ගණඅඳුරු දුරුකර ගලා හැරගෙණ තමන්ගේ මණ්ඩලයට ඇතුල්කළාවූ (අන්ධකාරයන්ගේ) බරින්වගේ සූය්‍ර්‍යයා රලසමග පැස්සී මුහුදේ වැටෙනකල්හි වඩබා ගිනිසිල පිටපැත්තට පහලවූවාක් මෙන් පෙණෙයි,,—

131 වි ය ලනු සියකරින් යුගතෙහි මහසයු ර
සි ය කුල පෙර සිරිත් කරුණෙන් සහසක ර
දි ය කඳ අතර එහි මෙතෙකැයි ඇති ගැඹු ර
ච ය ගිලුනෙව් බලනුව විමසා එව ර

131. යුගතෙයි, යුගාන්තයෙහි, මහසයුර, මහාසාගරය; සියකරින්, ස්වාංශුවෙන් නොහොත් ස්වකීය රශ්මියෙන්; වියලනු, ශුෂ්කකිරීම; සියකුල, ස්වකීය සූර්‍ය්‍යවංශයෙන්; පෙරසිරිත් කරුණෙන්, පූර්වචාරිත්‍ර කාරණයක් හෙයින්; සහසකර, සහශ්‍රකිරණයා; එහි, ඒ සාගරයෙහි, දියකඳ අතර, ජලස්කන්ධාන්තර යාගේ; ඇතිගැඹුර, විද්‍යමානවූ ගම්භීරය; මෙතෙකැයි, මේ ප්‍රමානයයි, විමසා බලනුව, විමංශනයකොට අවලෝකනය පිණිස; ගිලුනෙව්විය, නිමග්ණ වූවාක් මෙන්වූ; එවර, තත්කාලයෙහි—

“කප්කෙළවරෙහි මහමුහුද සිගරැස් නොහොත් ස්වකීය රැස්කරණකොට ගෙණ වියලවීම තමන්ගේ සූරියවංශයෙහි පෙරපටන් පැවතඑන සිරිත් කරු නක්හිසා හිරු ඒ සාගරයෙහි දියකඳගේ අතර ඇතිගැඹුර මෙපමණකැයි විමසා බැල්මපිණිස ගිලුනාක්මෙන්වූ ඒ කාලයෙහි,,

* රතුල—සිඳ—තිබේ එසේද මැනවි.

132 නුබසා ම්ඩුලු සැඳැවෙල ලපලු පැහැප තා
උදය ගරුක සඳම්ල් කැණෙකැ සිරිග තා
* කරපහරින් සැඳැඳුර තර පහර දෙ තා
දවගත එවි † කියෙතැල පැ ‡ මෙනි දස අ තා

132. නුබ, නභස (ආකාශය) නමැති; සාමඬුලු, ශාඛා මණ්ඩලයෙන්ද; පැහැපත, ප්‍රභාප්‍රාප්තවූ; සැඳැවෙල, සන්ධ්‍යාවලාහක නමැති; ලපලු, පල්ලව හෙවත් කිසලයෙන්ද උපලක්ෂිතවූ; උදයග, උදයපර්වත නමැති; රුක, වෘක්ෂයෙහි; මල්කැණෙකැ, පුෂ්පස්තබකයකගේ; සිරිගත, ශොභා ග්‍රහණයකළාවූ; සඳ, චන්ද්‍රයා; කර, රශ්මිනමැති; පහරින්, ප්‍රහරණයෙන් හෙවත් ආයුධයෙන්; සැඳැඅඳුර, සන්ධ්‍යාන්ධකාරයට, තර, ස්ථිරවූ හෙවත් දැඩිවූ; පහරදෙන, ප්‍රහාරදනයකරණකල්හි; නොහොත්; තර, මහත්වූ හෙවත් දැඩිවූ, පහරදෙන, ප්‍රහාරදානය කරණකල්හි; සැඳැඅඳුර, සන්ධ්‍යාන්ධකාරය; කිගයන්, භීතියෙන්; ඇලපැමෙනි, ඇලුන ප්‍රකාශකෙරෙමින්; දසඅන, දිශාන්තයට; දවගතඑවි, ධාවනය කොට ගත්තාක්මෙනි—

"ආකාශනමැති අතුසමූහයෙන්ද (හොඳ) පැහැයට පැමිනියාවූ සවස්වේලේ ඇතිවන වලාකුළු නමැති ලාපත්‍ර (දලු) යෙන්ද යුතුවූ උදයපර්වත නමැති රුකෙහි මල්පොකුරක සිරිය හෙවත් ප්‍රකාර (මොස්තර) ය ගත් චන්ද්‍රයා රැස්නමැති ආයුධයෙන් දැඩි පහරදෙන කාලයෙහි සවස ඇතිවන අන්ධකාරය † බයෙන් ඇලය පාමින් දිශා අන්තයට හෙවත් කෙළවරට දිවගත්තාක් මෙන්විය—

133 පු ලා කමල මුවරඳ පිණිස වැසි දී නා
ම ලා ගියෙන් දඳරද මෙරද වැදූ ගෙ නා
ලොලා වෙමින් බමරුන් තම වෙතට එ නා
බ ලා වෙනේ ලියගත මල් මුවෙනි සි නා

133. පුලා, පුල්ලවූ; කමල, පද්මයන්; දඳරද මෙරද, විජරාජ මරීචිය; වැදූගෙණ, සපර්ශ ග්‍රහණයකොට හෙවත් වැදගැණීමෙන්; මලායියෙන්, මලානිකව ගියහෙයින්; මුවරඳපිණිස, මකරන්දයට, වැසඉඳිනා, වාසයකොට නිසිදනයකරන්නාවූ; නොහොත්; මුවරඳ, මකරන්දයාගේ; වසපිණිස, සුගන්ධපිණිස; ඉඳිනා, නිසිදනය කරන්නාවූ; බමරුන්, භ්‍රමරයන්, ලොලාවෙමින්, ලොලවෙමින්; හෙවත් සාභිලාෂාවෙමින්; තමවෙතට, තමාගේ සමීපයට; එනා, ආගමනයකරණ කල්හි නොහොත්; ලොලාවෙමින්, ලොලවෙමින්; තමවෙතට, තමා සමීපයට; එනා, ආගමනයකරන්නාවූ; බමරුන්, භ්‍රමරයන්; බලා, අවලොකනයකොට හෙවත් භ්‍රමරයන් දෙසබලා; වෙනේලිය, වනය නමැති කාන්තාතොමෝ; මල්මුවෙනි, මාලාමුඛයෙන් හෙවත් පුෂ්පානනයෙන්; සිනාගත හාස්‍යග්‍රහණයකළාය—

* කරපතරින්.
† නැලපෙමිනි.
‡ දූකගත එවි—සිද.

"පිපුනාවූ නෙළුම්මල් සඳරැස වැදීමෙන් මැලවී ගියහෙයින් මල්පැනි බිමදුණීස (එහි බොහෝසේ) නැවතී ඉන්නාවූ මීමැස්සන් ආසාවෙමින් තමන්ගේ ලඟට එනකාලයෙහි නොහොත් ආශාවෙමින් තමන්ගේ ලඟට එන මීමැස්සන් දුක වනනමැයි ස්ත්‍රීතොමෝ මල්නමැති මුහුනින් සිනාගත්තාය,,

134 හැමගණඳුරු බොනවිර නිසඹුරු ග ත
පහන් බැවින් පිටතට සස ලෙසින් ව ත
පුල් නිලුපුල් යව්වන * කතක උවන ත
කලඳෝ කැව තලෙක † දිසිවැනි පැහැ දිමු ත

134. නිසඹුරු, නිශාකාරයා; හැමගණඳුරු, සමස්ත ඝණාන්ධකාරය; බොනවර, පානයකරණකල්හි; ගත, ගාත්‍රය හෙවත් ශරීරය; පහන්බැවින්, ප්‍රසන්න භාවයෙන්, පිටතට, පෘෂ්ඨයට හෙවත් බාහ්‍යයට; සසලෙසින්වත, ශශකාලෙස යෙන් හෙවත් සාවෙකුගේ ආකාරයෙන් වනකල්හි; පුල්නිලුපුල්, පුල්ල නීලොත් පලයට හෙවත් පුල්ලෙන්දීවරයට (සමාන ශරීරවර්ණය ඇති) යව්වනකතක, යෞවන කාන්තාවකගේ හෙවත් යොවුන්කතකගේ; උවනත, වක්ත්‍රයක්; කලදෝ; කැව තලෙක, කලධෞත දර්පණ තලයෙක්හි හෙවත් රිදීකැටපතෙක්හි දිසිවැනි, දිශ්‍යමානවූවාක් වැන්න—

"චන්ද්‍රයා විසින් හැම්ගණ අඳුරුම බොනකාලේදී ශරීරය පැහැදී තිබෙන බැවින් (ශරීරයෙන්) පිටිපැත්තට හාවෙකුගේ ආකාරයෙන් (අඳුරුපෙනීම) වන කාලයෙහි පිපුනාවූ නිල් උපුල්මල් වැනි (පැහැයඇති) ස්ත්‍රියකගේ මුහුන දීප්ති මත් රිදීකැටපතෙක පෙනෙන්නාක්මෙන්වෙයි;,—

135 විශේෂවන සරතුලැ එවෙතැ වන ප සේ
තොසේ බමර වැලගෙනපුල් කුමුදු දෙ සේ
ලසේනොවැ ගුවනඳුරු බිඳු තුසේ රැ සේ
දිසේ එයින් විසිරෙන අඳුරු බිඳුලෙ සේ

135. එවෙතැවනපසේ, ඒ සමීප වනපාර්ශ්වයෙහි; විශේෂවන, විසිතුරු වන්නාවූ; සරතුලැ, සරසි අභ්‍යන්තරයෙහි; (විද්‍යමානවූ) පුල් කුමුදුදෙසේ, පුල්ල කෞමුද දිශාවට; තොසේ, තොසයෙන්; බමර වැල, භෘංගාවලිය; ගෙන, ප්‍රාප්ත වනකල්හි; (ඔවුන්ගේ ආකාරය කෙසේද කිවොත්) සේරුසේ, ශ්වෙත රංසිහු; ලසේ නොව, ආලසී නොව; ගුවන, ගගනයෙහි; අඳුරු, අන්ධකාරය; බිඳුතු, භින්දනය කරණ කල්හි; එයින්, ඒ අන්ධකාරයෙන්; විසිරෙණ, විකීර්ණ වන්නාවූ; අඳුරු බිඳුලෙසේ, අන්ධකාර බින්දුන් පරිද්දෙන්; දිසේ, දෘශ්‍යමානවන්නු ලැබේ.—

ඒ (වැල්ලේ මඩමට) සමීප වනය පැත්තෙහි (තිබෙන) විසිතුරුවූ විල්ඇතුලෙහි ඇත්තාවූ පිපුනු කුමුදු මල්දෙසට සතුටින් එන්නාවූ මීමැසි සමූහයා (කෙසේද) චන්ද්‍රයා විසින් ආලසී නොවීමෙන් අහසෙහි අඳුරු බිඳිනකල්හි එයින් විසිරෙණ අඳුරු බින්දුන් පරිද්දෙන් දක්නා ලැබෙයි,,—..

* සමුවන් කතක.

† කැට පතෙක—පිද—135 ගෙන—පිද.

136 ම ල වල වරල් යුතු සඳුනෙන් සිහිල් ග තු න්
ම ල විය කෙළියැපැලඹෙනමොළසලෙලුකතු න්
ගෙල රැව් අසා හඬයසී සිහි පරෙවි ක තු න්
කා ල රැව් ගොසින් නොරැවිවි පහර පියප තු න්

136 මලවල, පුෂ්පාකුලවූ හෙවත් මලින් ගැවසීගත්තාලද්දාවූ; වරල්යුතු, වරලින් යුක්තවූ; සඳුනෙන්, චන්දනයෙන්; සිහිල්ගතුන්, ශිශිර ගාත්‍රා ඇත්තාවූ; මලවිය කෙළියැ, මාලායුධයාගේ ක්‍රීඩායෙහි; හෙවත් අනංග ක්‍රීඩාවෙහි; පැලඹෙන, ප්‍රකර්ෂයෙන් ලම්බමාන වන්නාවූ; හෙවත් අතිශයින් ඇලී පවත්නාවූ; මොළ, මෘදුවූ; සලෙලුකතුන්, සල්ලාල කාන්තාවන්ගේ; හෙවත් තරුණ කතුන්ගේ; ගෙලරැව්, ග්‍රීවා (භරණ) රාවය; අසා, ශ්‍රවණයකොට; සිය පරෙවි කතුන්, ස්වකීය පාරෙවත කාන්තාවන්ගේ; හඬයසී, නාදයසී; ගොසින්, ගමනයකොටකල රැව් කලරය හෙවත් කපොතය; නොරැවවි, වඤ්චිත නොවී; පිය පතුන්, පක්‍ෂපත්‍රයන්; පහර, ප්‍රහාරණය කරව—

"මල්වලින් අවුල්වූ හෙවත් ගැවසී ගත්තාලද්දාවූ වරලි (හිසකෙසි) න් යුතුවූ ගල්වනලද සඳුන්වලින් සිසිල්වූ ශරීර ඇත්තාවූ (කිසිවෙකුට ගරුසරු නැතිව තමතමන්ට කැමති කැමති පරිද්දෙන්) රතිකෙළියෙහි එල්ලී (ඇලිබැඳී) පවත්නාවූ ඉලන්දූරි ගෑනුන්ගේ කරේ (පැලඳි ආභරණයන්ගේ) නාදය අසා (තමාගේ) ස්වකීය ජාතියෙහි පරෙවි ධෙනුන්ගේ නාදයයසි (සිතා) ගොසින් පරෙවිය (නුඹ) රැවටෙන්නේ නැතිව පිහාටු ගසාපන්. හෙවත් පියාසරකරන්,,—

137 ලියවෙස් * උපුල් මල් තවසුන්ද දුහැනි නී
පිරිහුනු කෙරෙති ඉන් එම පැහැපත් † ගතී නී
දුකැ ලියපරෙවි දිනැසටවර රති සෙහී නී
ලොබ නොකර ‡ ම එහි නිදිගෙණැ රිසි ලෙසි නී

137. ලියවෙස්, කාන්තාවෙෂ ඇත්තාවූ; උපුල් මල්, උත්පල පුෂ්පයෝ; තවසුන්ද, තාපොවාරීත්ද; දුහැනිනි, ධ්‍යානයෙන්; පිරිහුනු කෙරෙහි, පරිහානී ඇත්තවුන් කෙරෙන්ය.; ඉන්, එසේහෙයින්; එම පැහැ, එම ප්‍රභාවයට; (හෙවත් එමවර්ණයට; එනම් එම රූපාකාරයට; පත්, ප්‍රාප්තවූ; ගතිනි, ගාත්‍රයෙන් හෙවත් ශරීරයෙන් යුක්තවූ; ඇසට, අක්‍ෂියට; වර, උත්තමවූ; රතිසෙසිනි, රත්‍යුද්ජනක සෙවත් ආශාව වන පරිද්දෙන්; ඉඳින, වාසය කරන්නාවූ, පරෙවිලිය, පාරේවත කාන්තාවන්; දුකැ, දර්ශනයකොට; ලොබනොකරම, ලොභ නොකොටම; එහි, ඒ ස්ථානයෙහි; රිසි ලෙසිනි, රුචිවූ පරිද්දෙන්; නිදිගෙණැ, නිද්‍රා ග්‍රහණයකොට;—

* සියවෙස්—සිද.

† පැහැගත්.

‡ ලොබ නොවිකොට එහි නිදිගෙණැ—සිද—පැහැපත්, ප්‍රභා ප්‍රාප්තවූ; එම ගතිනි එම ආකාර ශරීරයෙන් යුක්තවූ—හැකි.

“ලියන්ගේ වෙස් ඇත්තාවූ (නාරී) උපුල්මල් (නාරි ලතාමල්, උතුම් ගුණ ඇති) තාපසයන් වහන්සේලාද; ධ්‍යානයෙන් පිරිහුන ඇත්තන් කෙරෙත්ය, ඒ හෙතුවෙන් (ඒ නිසා) එම පැහැයට හෙවත් එම ආකාරයට පැමිනි ශරීරයෙන් යුතුව ඇසට උතුම් ආලය වැඩෙන පරිද්දෙන් ඉන්නාවූ, පරෙවි බෙතුන් දුකැ (ඔවුන් කෙරෙහි) ආලය නොකොට, ඒ ඉඩමේ (තුඹ) කැමති ආකාරයෙන් නිදගෙණ (ඉදලා)—.

138 විඳ මුළුරැ රතිසැප සමහන් දියු ණු
මදන ගිනේ අඟනන් ඇඟ සන්සිඳු ණු
මඳ පවනින් මලිග්‍ය රොන් සුණු වැකු ණු
සෙද දිලිහිනි යලි පෙරැ නැගුමට අරු ණු

138. මුලුරැ, සමස්ත රාත්‍රියෙහි; සමහන් රතිසැප, සාම්‍යශ්‍රීරති සෞඛ්‍යය; හෙවත් සමගිකාම සැපය; දියුණු, දිගුණව; (දෙකොටසක්) විඳ, විඳනයකොට; නොහොත් විඳනය කිරීමෙන්; මදන අගනෙ, අනංගාග්නිය; සන්සිඳුණු, සන්සුන්වූ; අඟනන්, අංගනාවන්ගේ; ඇඟ, අංගයෙහි හෙවත් ශරීරයෙහි; මඳපවනින්, මන්ද මාරුතයෙන්; මලිගිය රොන්සුණු; වලිද්ද පුෂ්පරේණු චූර්ණය; වැකුණු, චර්චිතවූ කල්හි නොහොත් චර්චිතවිය; (ඒ හෙතුවෙන්) සෙද, සීඝ්‍රව හෙවත් වහා—අරුණු නැගුමට පෙර, අරුණෝද්ගමනයට පූර්වභාගයෙහි; යලි, නැවත; දිලිහිනි, (කාමාග්නිය) ජ්වලිතවූලැබී—.

“රැය මුලුල්ලෙහි සමගිවූ කම්සැප දෙගුණයක් (දෙකොටසක්) විඳ කාමගින්න සංසිඳුනාවූ අඟනන්ගේ ශරීරයෙහි මඳපුලඟින් (අවුත්) වලිද්ද මල්රේණු තැවරුණු කල්හි (ඒ හෙතුවෙන් එකෙණෙහි) වහාම අරුණ නගින්ට පලමුව නැවතත් කාමගින්න දිලිහෙනුලැබිය—

139 වෙතවන් පහල නද කොලහලිනි දද රැ සි න්
නදවන මුහුනු යුතුහැම දිගඟනන් වි සි න්
බබලන කිරණ දිගුලනු බැඳැ නොයෙක ලෙසි න්
ගොඩලන රණ සැලෙවි දිවයුරු සයුර කු සි න්

139. වෙතවන, උපවනයෙහි; දදරැසින්, ධ්වජරාශීන් විසින්; පහල, ප්‍රකට කරණලද්දාවූ; හෙවත් පතුරවන ලද්දාවූ; නද කොලහලිනි, නාද කොලාහලයෙන්; නදවන, නදන වන්නාවූ, හෙවත් සන්තුෂ්ට වන්නාවූ; මුහුනු යුතු, මුහුනුවලින් යුක්තවූ; හැමදිගඟනන් විසින්, සමස්තදිගවධූන් විසින්; බබලන, භ්‍රාජමාන වන්නාවූ; කිරණ, රශ්මිනමැති; දිගු ලනු, දීර්ඝරජ්ජුන්; (පඹුනුවා) නොයෙක ලෙසින්, අනෙක ලෙශයෙන් හෙවත් නොයෙක් ආකාරයෙන්; බැඳැ, බන්ධනයකොට; සයුරකුසින්, සාගර කුක්ෂියෙන්; ගොඩලන, එලප්‍රවෙශ කරණ ලද්දාවූ; හෙවත් ගොඩගන්නා ලද්දාවූ; රණ සැලෙවි, ස්වර්ණ ථාලියක් පරිද්දෙන් හෙවත් රන් සැලක්මෙන්; දිවයුරු, දිවාකරයා; (පවත්නාවූ)—

"සමීප වනයෙහි පක්‍ෂි සමූහයන් විසින් ගසනලද ගඩ හෙවත් පතුරුවන ලද නාද කොලාහලයෙන් සතුටු වන්නාවූ මුනුවලින් පුතුවූ සියලු දිසා නමැති ස්ත්‍රීන් විසින් බබලන්නාවූ රැස් නමැති දීගලනු (රැන්වලින්) නොයෙක් ආකාරයෙන් බැඳ සයුරු කුසින් ගොඩට ලන්නාවූ රන් සැලියක් මෙන් ඉරු (පවතින්නාවූ)—

140 ප සි දු රාමසන්දර වෙසිදු ගෙන මී   න
ගණී දු විමනැ අලුයම් බෙර ගණ ගොසි   න
පු බු දු දෙමල කිවිමීයුරන් සහ තොසි   න
සි නි දු කෙකා නදවන් තියු ගිතිය   න

140. අලුයම්, ප්‍රාතඃකාලයෙහි; රාම සන්දර වෙසිදුගෙ නමින, රාමචන්‍ද්‍රනම් වෛශ්‍යයාගේ නාමයෙන්; පසිදු, ප්‍රසිඩවූ; ගණීදුවිමනැ, ගණේශ්වර විමානයෙහි; හෙවත් ගණදෙවි කොවිලෙහි (ගසනලද) බෙර, භේරිනාද නමැති; ගණගොසින, ඝණඝොෂාවෙන් හෙවත් මේඝනාදයෙන්; පුබුදු; ප්‍රබුඩවූ හෙවත් නින්දෙන් අවදිවූ; දෙමල කිවි, ද්‍රවිඩ කාව්‍ය කාරක නමැති; මීයුරන්, මයුරයන් විසින්; සහතොසින, තොස සහිත ඒමෙන්; (පවත්වනලද) සිනිදු සනිග්ධවූ; කෙකානදවින්, කේකානාද හෙවත් කෙකාධ්වනි වැනිවූ; තියුති, ස්තුති ගීතිකාවන්; කියන, කථනය කරණුලබන්නාවූ;—

"උදය කාලයෙහි රාමචන්‍ද්‍ර සන නම් ඇති වෛශ්‍යයාගේ හෙවත් වෙලඳ වංසයෙහිවූ පළමුවෙනියාගේ නමින් ප්‍රසිද්ධවූ (පුරාණ කාරවා තිබෙන)ගණදෙවි කොවිලෙහි (ගසනලද) බෙරශබ්ද නමැති මේඝනාදය (ඇසීම) කරණකොට ගෙණ (නින්දෙන්) අවදිවූ දෙමල කවිකාර නමැති මොණරුන් විසින් (පවත්වනලද) සිනිදුවූ මොණර නාදයවැනිවූ ස්තුතිගීතිකා කියනුලබන්නාවූ,

141 පෙර දිගු සර සැපත් දිවයුරු රණතිස   ර
න ර සර තුඩින් ගණදර සෙවෙලද නෙව   ර
හැ ර නෙතැ නිදි නැගිසිට මිතුරිදු එව   ර
ව ර මුනිගුණ සිහිකරැ වඩන මගතු   ර

141. පෙරදිගු, පූර්වදිශා නමැති; සර, සරයිනට හෙවත් තඩාකයට; සැපත් සම්ප්‍රාප්තවූ; දිවයුරු, දිවාකරයා හෙවත් සූර්‍ය්‍යයා නමැති; රණ තිසර, ස්වර්ණ හංශයා; වර, උත්තමවූ; නර, රශ්මි නමැති; සර, සාරවූ හෙවත් මහත්වූ; තුඩින් තුණ්ඩයෙන් හෙවත් වංචුවෙන්; ගණඳර, ඝණාන්ධකාර නමැති; සෙවෙල්, ශෛවාලය; අදන, භක්‍ෂණය කරන්නාවූ; එවර, ඒත්කාලයෙහි; මිතුරිදු, මිත්‍රෙන්‍ද්‍රයා; නෙතැ, නෙත්‍රයෙහි; නිදි, නිද්‍රාව; හැර, පහකොට; නැගි, උද්ගතව, සිට, ස්ථිතව; වර, උත්තමවූ; මුනිගුණ, සර්වඥ ගුණය; සිහිකර, ස්මරණයකොට; මගතුර, මාර්ගාන්තරයෙහි, වඩණ, වඩින්න—

"පෙරදිග හෙවත් නැගෙණහිර දිශා නමැති විලට පැමිණියාවූ හිරු නමැති රණ හංශයා විසින් උතුම් රැස් නමැති (මුඛයෙන්) මහත්වූ තුඩින් ගණඅඳුරු නමැති සෙවෙල් අනුභව කරන්නාවූ ඒ කාලයෙහි මිතුරිඳුනි ඇසේ නින්ද දුරුකර නැගී සිට උතුම් මුනි ගුණය සිහිකර මග තුරේ වඩින්. හෙවත් ගමන් කරන්—

142 වඩුතුපුල් සුරරද—සයුරිති නොදින මිහිකල’’
ලූ පියවිලිය සිරිගත්—ගාගන් මගුල් වැල්ලෙන්.

142. උපුල් සුරරද, උත්පලවර්ණ දිව්‍යරාජයා; සයුරතින්, සාගරයෙන්, වඩුතු, වඩනා කල්හි; මිහිකල, මහිකාඟනාව විසින්; එදිනෑ, ඒ දිනයෙහි; ලූ, ලනලද්දාවූ හෙවත් ආස්තරණය කරණලද්දාවූ; පියවිලියසිරි, පාදපටශ්‍රිය; ගත්, ග්‍රහණයකලාවූ; මගුල් වැල්ලෙන්, මගුල් වැල්ල යන ප්‍රදේශයෙන්; යාගන්, යාත්‍රාග්‍රහණය කරන්—

“උපුල්වන් දෙව්රජහු සාගරයෙන් වඩින්නාවූ කාලයෙහි මිහිකත විසින් ඒ දවසේදී අතුරණලද පාවාඩයක ශොභාව ගත්තාවූ මගුල් (වැල්ල යනනම් ඇති) වැල්ලෙන් ගමන්කරව—

143 සඳනවෙනෙන් කිසලකැ ගෙන් සසල කො ට
මලය ගිනෙන් මඳපවනෙන් එන වෙත ට
සිහිල සිනෙන් දුහැ ගිම නෙන් සෙමෙන් සි ට
තුඹ වදනෙන් පලමු වෙනෙන් වෙහෙරන ට

143. සඳනවෙනෙන්, චන්දනවනයෙහි; කිසලකැගෙන්, පල්ලව සමූහය; සසල කොට, චංචලකොට; මලයගිනෙන්, මලය පර්වතයෙන්; වෙතට, සමීපයට; එන, ආගමනය කරන්නාවූ; මඳපවනෙන්, මන්දමාරුතයාගේ; සිහි ලසිනෙන්, සීතලාශ්‍රයෙන්; ගිමනෙන්, ග්‍රීෂ්මය; දුහැ, දුරුකොට; සෙමෙන් සිට අතුරිනව; තුඹා පුණ්‍යමත්හු; පලමුවෙනෙන්, ප්‍රථමයෙන්; වෙහෙරනට, විහාරයට නොහොත් වෙහෙර අතට; වදනේ, වදින්න—

“සඳුන් වනයෙහි දලු හෙවත් ලාපත්‍ර සෙලවීම්කොට මලය පර්වතයෙන් (තාමන්ගේ සමීපයට) එන්නාවූ මඳසුලඟෙහි සීතල ඇසුරු කිරීමෙන් ගිමන් හැර සෙමින්සිට තුඹ පලමුකොට විහාරයට නොහොත් වෙහෙර අතට වදින්—

144 ඇමදු සිතු පැහැදු වදිනා ලොවැදු රු
මුනිඳු පෙර සඑඳු වැඩු සෑ අයු රු
සුබඳු ලෙස සුසඳු ඇඳි සිතුරැ තු රු
වටදු ගෙගතුලදු ගැබ එඳු මිතු රු

144. ඇමදු, සැමදවස්හි; සිතු පැහැදු, චිත්තප්‍රසන්නව; ලොවැදුරු, බ්‍රහ්මයා විසින්, වදින, වන්දනය හෙවත් නමස්කාර කරන්නාවූ; මුනිඳා, මුනීන්ද්‍රයාගේ; පෙර, පූර්වකාලයෙහි; සඑදු, ශ්‍රාවකධාතූන්; වැඩු, වඩම්මවන ලද්දාවූ; හෙවත් පමුනුවා නිධානකරණ ලද්දාවූ; සෑ අයුරු, චෛත්‍යයාගේ ආකාර ඇත්තාවූ; හෙවත් සෑය වැනිවූ; සුබඳුලෙස, සුභ දර්ශන කරණ විලාසයෙන්; සුසඳු, සුසජ්ජිතකොට; උතුරු, උත්තමවූ; සිතුරු, චිත්‍ර රූපයන්; ඇඳි, අඬ්ජනය කරණලද්දාවූ; වටදු, ගෙයතුල, වට්ටල ධාතු ගර්භාභ්‍යන්තරයෙහි; දුගැබ, ධාතු ගර්භය; මිතුරු, මිත්‍රය; වඳු, වන්දනය කරව—

"හැම්දම සිත පහදවා බ්‍රහ්මයන් විසින් වඩිනලද්දවූ මුනිතුමන්ගේ (බුදුවීම පිණිස මහණවෙනවිට මුදු අහසට දැමූ තමන් වහන්සේ පලඳූවෙන් හැදපොරොවා තිබුන) සළු ධාතූන් වහන්සේලා වඩම්මවන ලද්දවූ සැය වැනිවූ යහපත් වැඩසිදුවෙන ආකාරයෙන්, සාදු උතුම් සිතුයම් රූප අඳිනලද්දාවූ වටදාගෙය තුල විද්‍යමානවූ ධාතු ගබඩාවට මිතුරෙ වඳින්—

145 ගු ණ බෝ මුනිරජුට මුලු තුන්ලෝ කිරූ එ
පෙර ලෝ ඇදුරූ පුදනුව බැරම ලොවින එ
ක ල දෝ යටග බැඳ නිල්මිණි සත එක එ
වැ ද බෝ දුම්දු මොක්පුර සිරි ලබ යහ එ

145. මුලුතුන්ලෝ, සමස්ත ත්‍රිවිධලොකයට; කිරූඑ, කිරීවූ; ගුණබෝ; ගුණබහුලවූ; මුනිරජුට, මුනිරාජයාට; පුදනුව, පූජා පිණිස; පෙර, පූර්වයෙහි; ලෝඇදුරූ, ලෝකාචාර්‍ය්‍යා හෙවත් බ්‍රහ්මයා විසින්; බැරම ලොවින්, බ්‍රහ්ම ලොකයෙන්; අලූ, එලවන ලද්දාවූ; කලදෝ යටග, කලශධෞත යෂ්ටාග්‍රයෙහි; බඳ, බන්ධනය කරණ ලද්දවූ; නිල්මිණිසත, නීලමාණික්‍ය ඡත්‍රසක් හා; එක එ, ඒකාකාරවූ; බෝදුම්දු, බොධිද්‍රැමෙන්‍ද්‍රයාට; වැඳ, වන්දනයකොට; යහඑ, මිතුය; මොක්පුර සිරි, මෝක්ෂපුරශ්‍රිය; ලබ, ලබ්ධකරව—

"තුන්ලෝවාසිවූ සියල්ලන්ගේ ඔවුන්න වැනිවූ බොහෝ ගුණඇත්තාවූ මුනිරජහට පිදීම පිණිස පෙරකලෙහි බ්‍රහ්මයා විසින් බඹලොවින් (මෙලොවට) ගෙණෙන ලද්දාවූ රිදී යෂ්ටියෙහි හෙවත් කෝටුවෙහිඅගා බඳිනලද්දාවූ නිල් මැණික් කුඩයක් සමානවූ බෝ රුක් රජුට වැඳ මිතුරෙ මොක්පුරයෙහි සිරිලබන්—

146 සු වි සි අසෙකි සතලා අම නිවන් පු රා
සැ සි සි මුනිඳු සැපසේ සැතපුනු අසු රා
පැ දි සි රිවි කිරණ ගෑ විලස ඉතනැ රා
තෝනිසි ලෙසින් වඳු ඔත්පිළිම හිමිව රා

146. සුවිසිඅසෙකි සත, චතුර්විංශති අසංඛ්‍ය (සංඛ්‍යා) සත්වයා; අමනිවන් පුරා, අමෘත නිර්වාණ පුරයෙහි නොහොත් අමානිවන් පුරයට; ලා, හෙලා (පමුනුවා) සැසිසි මුනිඳු, ශාක්‍යසිංහ සෑෂීවූ මුනීන්ද්‍රයා; සැපසේ, ආනන්දජනකාකාරයෙන් නොහොත්; සැපසේ, සැපතින් යුතුව හෙවත් සැපවූ පරිද්දෙන්; සැතපුනු අසුරා, සන්තර්පිතවූ හෙවත් විශ්‍රමණයට පැමිනිආකාරයට නොහොත් සැතපුනු ආකාරයෙන් (යුතුව කරවන ලද්දවූ) රිවිකිරණ, සූර්‍ය්‍යකාන්තිය; ගෑ විලස, ආලේපකල ලීලාවෙන්; හෙවත් ගෑවාවූ විලාසයෙන්; දිසි, දෘශ්‍යමාන වන්නාවූ; පැ, ප්‍රභාවෙන්; මනහැරා, මනොහරවූ හෙවත් සිත් පැහැර ගන්නාවූ; ඔත් පිළිම හිමිවරා, හොත් ප්‍රතිමා ස්වාමි උත්තමයාට; තෝ, ත්‍වමේ; නිසි ලෙසින, සුදුසු පරිද්දෙන්; වඳු, වන්දනය කරව—

“සුපිපි (විසිතුර) අසඞ්ඛ්‍යයක් සත්වයන් අමා (මහ) නිවන් පුරයෙහි නොහොත් නිවන් පුරයට පමුනුවා ශාක්‍ය සිංහ රුසිවූ මුනිඳුන් සැපසේ සැතපුනාවූ ආකාරයට (කරවන ලද්දාවූ) රිවිකිරණ ගවාක්ෂයෙන් පෙනෙන පැහැයෙන් සිත් ගන්නාවූ (සිතේ ආලය උපදවන) ඔත් පිළිම හිමිඳු තුමන්ට උඹ නිසිඅයු දමින් වඳින්—

147 සැ ඩ ලෙවි * මරු පැරදු ඉඳ බෝතුරු ලගෙහ හි
දි ඩ දි පි රුවෙල් කසුබන්ලූ අටමගෙ හි
මැ ඩ පැ වි කරණ දිවි පවඳුරු † සතන ගෙ හි
වැ ඩ සි වි පිළිම හිමි වඳු සිරි පිළිමගෙ හි

147. බෝතුරු ලගෙහි, බොධි තරු සමීපයෙහි; ඉඳ, නිසද්‍යකොට; සැඩලෙවි, චණ්ඩ ශොභා ඇත්තාවූ; මරු. මාරයා හෙවත් මැරයා; පැරදු, පරාජයකළාවූ; දිඩදිපි, දිඪදීප්ති ඇත්තාවූ; උරුවෙල් කසුබන්, උරුවෙල කාශ්‍යපයා හා අන්‍යයන්; අටමගෙහි, අෂ්ටාඞ්ගාය්‍ය මාර්ගයෙහි; නොහොත් අෂ්ටාඞ්ගාය්‍ය මාර්ගයට; ලූ, ප්‍රාප්තකොට ලූවාවූ; සතන, සන්තාන නමැති; ගෙහි, ගෘහයෙහි; පවි අඳුරු, පාපාන්ධකාරය; මැඩ, මර්දනයකොට; පැවිකරණ, බලත්කාරන්නාවූ; හෙවත් පොතක කරන්නාවූ; දිවි, ප්‍රදීපයක් වැනිවූ; සිරි පිළිමගෙහි, ස්ථිති ප්‍රතිමා ගෘහයෙහි හෙවත් සිරි පිළිම ගෙයි; වැඩසිටි, වැඩසිටියාවූ; (ආකාරයට කරවනලද) පිළිම හිමි, ප්‍රතිමා ස්වාමීන්; වඳු, වන්දනය කරව—

“බෝරුක මුල වැඩහිඳ ගෙණ චණ්ඩි ලීලා ඇතිවූ (වසවර්ති මාරයා නොහොත් පංචවිධ) මාරයන් පරාදකළාවූ දෘඪ දීප්තිඇති උරුවෙල කාශ්‍යපයා හා සෙසු එක්දස් දෙදෙනෙක් පමණ ජටිලයන්ද (සම්මාදිට්ඨි සම්මාසංකප්පො ස නාදිවූ) ආය්‍ය අෂ්ටාඞ්ගික මර්ගයට පමුනුවා ලූවාවූ සන්තානය හෙවත් සිත්නමැති ගෙයි පව්නමැති අඳුරු මැඩ පොඩිකරන්නාවූ පහනක් වනිවූ සිරි පිළිමගෙයි වැඩසිටිනා (ආකාරයට සාදාතිබෙන බුදුන්ගේ) පිළිම ස්වාමීන්ට වඳින්—

148 ස ල තු ‡ රු වැඹින් සුලකළ තුන් මහල් ගෙ දු §
නි ල තු රු කික්ණි බඳ රන් දද පෙල සුසැ දු
දු ල තු රු වැලෙව් පලගෙහි මුතු ලැල් සිනි දු
ග ල තු රු මුල පාගෙහි මහ සඟන ව දු

148. සලතුරුවැඹින්, ශෛලාකාරස්තම්භයන්, නොහොත්; සලතුරු, ශෛලාසාරණයකරණලද්දාවූ; වැඹින්, ස්තම්භයෙන්; සුලකළ, අත්‍ය ලඞ්කෘතවූ, තුන්මහල්, ත්‍රිමාලකාගයන් (ප්‍රසාදය); සැදූ, යොජිතකරණලද්දාවූ; කිකිණිබඳ, කිංකිණික බඳවූ; රන්දදපෙල, ස්වර්ණධ්වජ පඞ්ක්තියෙන්, නිල තුරු, නිරන්තරව; සුසැදු, සුසජ්ජිතකළාවූ; දුල, දීප්තිමත්වූ, තුරුවැලෙවු, තාරකාපන්තින්මෙන්; පලගෙයි, පටලාග්‍රයෙහි හෙවත් ඡදනාග්‍රයෙහි; සිනිදු, ස්නිග්ධවූ; මුතුලැල්, මුක්තාලතිකාවන් ඇත්තාවූ; ගලතුරු, ගලතුරුනම්වූ; මුලපායෙහි; මුලප්‍රාසාදයෙහි හෙවත් පලමුවෙනි ප්‍රාසාදයෙහි; මහසඟන, මහාසංඝයන්ට, වඳු, වන්දනාකරව—

* සැඩතෙවි— † දිවු පවිදුරු—සි, සමහර— ‡ සැලතුරු— § මහල්රුදු—යිදු.

“නොයෙක් ගල්ජසීන්ගෙන් සාදනලද වැම්වලින් යුතුවූ නොහොත් ගල් අතුරණලද්දවූ වැම්වලින් ඉතා අලංකාර ඇත්තාවූ තුන්මහලින් යුතුව සොද නලද්දාවූ කුඩා මිණිගෙහි බඳිනලද රන්කෙහෙලියෙන් අතුරු නැතිව මනාව සැදුවාවූ හෙවත් සැරසුවාවූ දිලිසෙන්නාවූ තාරකා වැල්පරිද්දෙන් පියසිඅග (එල්වනලද) සිනිදු මුතුවැල් ඇත්තාවූ ගලතුරුනම්වූ පළමුවෙනි ප්‍රාසාදයෙහි (වැඩවසන) මහසංඝයාවහන්සේලාට වඳින්—

149 දුල ස ක් ව න් පිරිසිදු සිව්සිල් සොඳු රූ
තල ස ක් ව න් බිඳි මිසදිටු තුරුපඳු රූ
සල ස ක් ම න් තරකරවිසු තෙරු නැඳු රූ
බල ස ක් ම න් රත්පත් සුලු පාමැඳු රූ

149. දුල, දීප්තිමත්වූ හෙවත් දිලිසෙන්නාවූ; සක්වන්, සඞ්ඛයක් වැනිවූ නොහොත්; දුල, දුර්ලභවූ, සක්වන්, චක්‍ෂුවක් පරිද්දෙන් (ගෞරව සහිතව රක්‍ෂාකරණලද) සොඳුරු, සුන්දරවූ හෙවත් මනොඥවූ; සිව්පිරිසිඳුසිල්, චතුපාරිශුද්ධි ශීලයන් ඇත්තාවූ; මිසදිටු, මිථ්‍යාදිෂ්ටි නමැති, තුරුපඳුරු, වෘක්‍ෂගුම්බයන් නොහොත් මහාගුම්බයන්; බිඳි, භින්දනය හෙවත් භග්නකලාවූ; තල සක්වන්, මාරුතචක්‍රයක් වැනිවූ; අසල, ආශ්‍රයකරණලද, සක්මන්, චඞ්ක්‍රමණය හෙවත් සක්මන්කිරීම; තරකර, ස්ථිරකොට හෙවත් පටන්ගත් සක්මන් කිරීමෙහි දැඩිකොට, විසු, වාසයකලාවූ හෙවත් පැවත්තාවූ; ඇදුරුතෙරුන්, ආචාර්ය්‍ය ස්ථවිරයන් ඇත්තාවූ; සක්මන්, චඞ්ක්‍රමන (මාලක) යන් හා; රත්පත්,* රක්තවර්ණ ප්‍රාප්තවූ නොහොත් රහත්බවට පැමිනි ස්ථානවූ, සුලුපා, චුල්ලප්‍රාසාදයන් හා; මැදුරු, (මහා) මන්දිරයන්ද; බල, අවලොකනයකරව—

“දිලිසෙන සකක් නොහොත් ඇසක්වැනිවූ නොහොත් දුර්ලභවූ ඇසක්මෙන් (ගරුකොට රකිනලද) සොඳුරුවූ (ප්‍රාතිමොක්‍ෂ සංවරශීලය ඉන්ද්‍රියසංවරශීලය ආජීව පාරිශුද්ධි ශීලය ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීලය යන) සතරවැදෑරුම් පිරිසිදුවූ සිල්ඇත්තාවූ බොරුදිෂ්ටි නමැති රුක්පඳුරු බින්දාවූ සුලන් සුලියක් හෙවත් චක්‍රයක්වැනිවූ සක්මනෙහි (ඒ අත මේ අත ගමනාගමනය හෙවත් කරකැවීම එනම් ඇසුරුකරණලද සක්මන්කිරීමෙහි තිරකර (දැඩිකොට නැර) වාශයකලාවූ ඇදුරුතෙරුන් ඇති සක්මන්මලු හා (සාදිලිංගන් ආදිය ගැමෙන්) රතු පැහැයට පැමිනියාවූ නොහොත් (වාශයකිරිමෙන්) රහත්බවට පැමිණියාවූ (ඉඩම්වූ) කුඩා ප්‍රාසාදත් (මහා) මන්දිරත් බලන්,,—

150 හ ර සු ර පෙතැලි රූකැටයම්† කලපි ඹු ව
ත ර ස ර ලකල නිල්මිණි වැඹිනි සමු ඹූ ව
පු ර ද ර සබාසුරු දැකැ මහවත් ම ඹු ව
පු ර ව ර බලා එනලෙස පරෙවිඳු ව ඹූ ව

* රත්පත් රහතන් රජුන් පැමිනි, යි දයෙත්.

† කටහන්—සිද තිබේ, ඒද ඉතා මැනවැයි හඟිමි,

150. හරපුර, ඊශ්වරදෙවසාගේ; පෙනැලිරූ, පොතළිලික රූපයන් හා; කැටයම්, කොට්ටනයෙන්කළ කම්ය හෙවත් කැටයම්ද; පිඩුවකළ, පිණ්ඩීකෘතවූ හෙවත් පිණ්ඩව (පිඩුකොට එක්කොට) කළාවූ; හරසර, ස්ථිරසාරවූ; ළකළ, අලඞ්කෘතවූ හෙවත් විත්‍රකානනවූ; නිල්මිණිවැඹිනි, නීලමාණික්‍යසතම්භයෙන්; සමුඩුව, සමූඩීවූ; පුරදරසබාපුරු, පුරන්දර සභාවෙහි ආකාර ඇත්තාවූ; මහවත් මඩුව; මහාවෘත්තිමණ්ඩපය; දුකැ, දශීනයකොට; පුරවර, පුරොත්තමය; බලා. අවලොකනයකොට; එනලෙස, ආගමනය කරණලෙසයෙන් හෙවත් එන ආකාරයෙන්; පරෙවිඳු, පාරෙවතෙන්ද්‍රය; වඩුව, වඩිව, හෙවත් වඩින්න—

"ඊශ්වරදෙවියන්ගේ පෙනැලිරූපයන් සමග කැටයම්ද සමුහව හෙවත් එක් කොට (ගලපා) කළාවූ ස්ථිරවූ මහත්වූ සිතැකැමැති කරන්නාවූ නිල්මැණික් වැම් (කනු) වලින් සැදුනාවූ සක්දෙවිඳුගේ (සුදම්දෙව්) සබය සමානවූ මහත්වූ රුශ්චිඳින මඩුව දුකැ (නැවතැ) උතුම් දෙව්නුවර) දෙවුන්දර බලා එනපරිද්දෙන් පරෙවිඳුනි ගමන්කරන්,,—

151 සිරිවස් ලකුණුරැඳි—දෙරවත් පුරෙව් හොබ නා
එසුරිඳු පුරවැණුම් නව—පඬුරුකර පත්නාන ව

51. සිරිවස්ලකුණු, ශ්‍රීවත්සලක්ෂණ ඇත්තහු හෙවත් විෂ්ණුහු විසින්; රැඳි, රඤ්ජිතවූ; දෙරවත් පුරෙව්, බාරවතී නගරය හෙවත් දෙරවත්නම් නුවර පරිද්දෙන්; හොබනා, ශොභමාන වන්නාවූ; එසුරිඳු, ඒ සුරෙන්ද්‍රයාගේ; පුරවැණුම්, නගර (පුර) වර්ණනා නමැති; නවපඬුරු, අභිනව ප්‍රාභෘතයන්; නා, පුෂ්මත්හුගේ; අතට පත්කර, හස්තප්‍රාප්තකරව—

විෂ්ණුහු විසින් රඳනුලබන්නාවූ දෙරවත්නම් නුවරමෙන් බබලන්නාවූ ඒ සුරිඳුහුගේ නුවර වර්ණනා කිරීම් නමැති අළුත් පඬුරු හෙවත් තෑගි උඹේඅත මඇරගන්—

152 සතකුම්යුතු පහමතු තැරැළි කෙලව ර
පිහිටිපියුම් රා රුවණින් කැලුම්බ ර
රත්පැහැගත් සිසිළුවනට ලියනෙපු ර
පැරැද අවර රිවිවෙස්ගත් එව්එව ර

152. පහමතු, ප්‍රාසාදමස්තකයන්හි; සතකුම්යුතු, සාතකුම්භනම් ස්වර්ණයෙන් යුක්තවූ; කැරැලි කෙලවර, ශ්‍රිඞ්ගකොටියෙහි; පියිවි, ප්‍රතිෂ්ඨිතවූ; පියුම්රාරුවණින්, පද්මරාග මාණික්‍යරත්නයන්ගෙන් (නිස්කෘාන්ත වන්නාවූ) කැලුම්බර, කාන්තිභාරය කරණකොටගෙණ; රත්පැහැ. රක්තප්‍රභාව; ගත්, ග්‍රහණයකළාවූ, සිසි, ශීතරශ්මිහු හෙවත් චන්ද්‍රයා; එපුර, ඒ නගරයෙහි, ලියන්; කාන්තාවන්ගේ; උවනට, වක්ත්‍රයට; පැරැද, පරාජිතව; එවර, තත්කාලයෙහි; අවරරිවිවෙස්, අපරසූර්‍යවෙෂය; ගත්එව්; ග්‍රහණයකළාත්වැන්න—

පහමුදුන්වල (තබනලද) ශාතකුම්භනම් රත්‍රනින්යුතුවූ කැරැලිඅග පිහිටි රතුමැණික්වලින් නික්මෙන්නාවූ රැස්සමූහය කරණකොටගෙණ රතුපැහැයවූ චන්ද්‍රයා (කෙසේද කිවොත්) ඒ නුවර ගෑනුන්ගේ මූනුවලට පැරැදී එවේලාවෙදී අවරවඩිය හිරුගේ වෙෂය ගත්තාක්මෙනි—

153 එපු රඹ දද අතින් සන්කර නොවිල ස
බඳරසුනද වහසිබැණූ ඇසෙනලෙ ස
නොපරිසිවක් ඇරගණුවයි සුරන් රැ ස
වෙතකැඳවා රවටනවැනි ඇමදව ස

153. එපුරඹ, ඒ පුරාම්බිකාව; අලසනොවී, ආලසීනොව; දදඅතින්, ධ්වජ නමැති හස්තයෙන්; සන්කර, සංඥකොට; බඳ, බන්ධනයකරණලද්දාවූ; රසුනද, රසනාදය හෙවත් මාධුර්‍ය්‍යක්‍ෂුද්‍ර කිංකිණිකානාද නමැති; වහසි, හාශ්‍ය (යෙන් යුක්ත වචනයන්; ඇසෙනලෙස, ආසන්නවනලෙශයෙන් හෙවත් ශ්‍රවණය වන වරිද්දෙන්; බැණූ, භාෂණයකොට; නොප, පුළ්මතුන්ලාට; රිසිවත්, රුචිවූ වස්තූන්; ඇරගණුවයි, හරණයකරවයි හෙවත් හැරගණිවයි, සුරන්රැස; දිව්‍යසමූහයා; වෙතට, (තමා) සමීපයට; කැඳවා, ආමන්ත්‍රණයකොට; ඇමද වස, සැමදවස්හි; රවටනවැනි, රවටන්නාක්මෙනි—

“ඒ නුවරනමැති ගෑනී අලසනොවී කෙහෙලි (කොඩි) නමැති අතින් සංඥ කර (ඒ කොඩිවල) බඳිනලද කුඩාමිණිගෙඩි නාදයනමැති සිනාවෙන්යුක්ත වචන කියා නොපට කැමැති වස්තූන් ඇරගණිව්යයි දිව්‍යසමූහයාට (තමන්ගේ) සමීපයට කතාකර හැමදම (කරණ) රැවටීමක්මෙනි—

154 ප හ මි ණි බිතුතුලැ මත මතඟ සේ යා
ස පැ මි ණි බිඟු නොනැලෙනුනම් කෙසේ යා
පි රි හි ණි මල් දුනු දුනුදිය රැ සේ යා
සැ ර සි ණි ඉන්නෙත නිඳි මියුලැ සේ යා *

153. පහ, ප්‍රාසාදයන්ගේ; මිණිබිතුතුලැ, මාණික්‍ය භිත්ති අභ්‍යන්තරයෙහි; මතුමතඟ, මත්තමාතඞ්ගයන්ගේ; සේයා, ඡායාවට; සපැමිනි, සම්ප්‍රාප්තවූ; බිඟු, භෘඞ්ගයන්ගේ, නොනැලෙනුනම්, තාඩනයනොවිමනම්; කෙසේයා, කෙසේවේද (තාඩනයවේමය); මල්දුනු, පුෂ්පබාණතෙම, දුනුදියරැසේයා; ධනුර්ගුණ සංහති යෙන් හෙවත් දුනුදිය රාශියෙන්;නොහොත්;මල්දුනු, පුෂ්පබාණයාගේ;දුනුදිය රැසේයා, ධනුර්ගුණ සංහතිතොමෝ; පිරිහිණි, පරිහාණිවී, නොහොත්; බිඟු, භෘඞ්ගයන්ගේ, නොනැලෙනු නම්, තාඩනය නොවීම සිදුවූයේනම්; මල්දුනු, පුෂ්පබාණතෙම; දුනුදිය රැසේයා, ධනුර්ගුණ සංහතියෙන්; කෙසේයා, කවරා කාරයෙකින්; පිරිහිණි, පරිහාණිවිද; ඉන්, එසේ (පරිහාණිවූ) හෙයින්; මියුලැසේයා, මෘගාක්‍ෂිකා සමූහයතෙම; නෙතැ, නෙත්‍රයෙහි; නිඳි, නිද්‍රාවෙන්; සැරසිණි, අලඞ්කෘතවී හෙවත් සජ්ජිතවී—

ප්‍රාසාදවල මැණික්බිත්ති ඇතුලෙහි (පෙනෙන) මත්ඇතුන්ගේ සෙවන දැක (සැබෑ ඇත්තුයයි සිතා රැවටී සතුටුව මදපිණිස ගිජුව) පැමිණියාවූ හෙවත් පැමිනී මිණිබිතෙහි හැපුනාවූ ඊමැස්සන්ගේ නොනැලීම නම් කෙසේවේද (නැළීම වේමය) අනඞ්ගයා දුනුදිය සඞ්ඝයෙන් නොහොත් අනඞ්ගයාගේ

---

* සැරහිණි ඉන්නෙතගිනි මියුලැසේයා—ඇතැම්.

දුනුදිය (දුනුලනු) සමූහය පිරිහුණේය ඒහිසා යුවතින්ගේ ඇස්හින්දෙන් සැරසුණේය හෙවත් හොඳින් ඇසට නින්දගියේය යනුභාවයි— මිමැසිවැල අනංගයාගේ දුන්නේ ලනුවටඑ බවුන් තැළි මැරීමෙන් දුනු ලනුව පිරිහී ගියේය එබැවින් යුවතින්ට විදින්ට අනංගයා අප්‍රොහොසත්වීය හෙවත් විදින්ට නොහැක්කේ විය ඒ හෙතුවෙන් අනංගයාගේ ප්‍රහාරවලින් පීඩාවක් නැතිව යුවතින්ගේ ඇස්වලට හොඳින් නින්දගියාය යනුයි—

155 වෙසෙසක් එකම ගෙණැ අහසින් යන විත ර
අ ප ස ක් හමුව යව්දූයි මතු ශයන් නිතො ර
ස හ ස ක් වෙමින් එහි අස්පෙළ කුර ගෙරණැ ර
දි ය ස ක් තුරඟ නොපෙණෙන ලෙස වැසූ පු ර

155. අහසින්, ආකාශයෙන්; යනවිතර, ගමනයකරණ ප්‍රමාණයක්වූ; එකම වෙසෙසක්, එකම විශෙෂයක්; ගෙණැ; ග්‍රහණයකොට; අප, අස්මත්හුගේ; සක් හමුව, චක්ෂුසම්මුඛයෙහි; මතුයෙන්, මස්තකයෙන්; නිතොර, අනවරතයෙන්; යව්දූයි, ගමනයකරව්දූයි; සහසක්වෙමින්, සාහසිකවෙමින්, එහි, ඒ නගරයෙහි; අස්පෙල, අශ්වපඞ්ක්තිය; කුරරොන්, ඛුරරෙණූන්; ඇර, හරණය හෙවත් ගෙපසනයකොට; දියසක්, ජගදක්ෂිදුගේ හෙවත් සූර්‍ය්‍යයාගේ, තුරඟ, තුරඞ්ගයන්; නොපෙනෙනලෙස, අදෘශ්‍යමානවන පරිද්දෙන; නොහොත්; සක්, ශක්‍රයාගේ; තුරඟ, තුරඞ්ගයන්; නොපෙණෙනලෙස, අදෘශ්‍යමානවන පරිද්දෙන්; දිය, ලොකය; වැසූඅයුරු, ඡාදනයකළ ආකාරයි—

අහසින් යන පමණක්වූ එකම වෙනසක් හැරගෙණ අපේ ඇස්හමුයෙහි හෙවත් අපේ ඇස්වලට ඉදිරි (සමීප) කොට මතුභාගයෙන් (මුදුනෙන්) නොර හැඳුව යව්ද කියා රළු (සාහසික ඇති) වෙමින ඒ නුවර (නැසිගෙරන) අශ්ව පඞ්ක්තිය විසින් කුරරේණූන (උඩට) ඇර සූර්‍ය්‍යයාගේ අශ්වයන් නොපෙණෙන පරිද්දෙන් වැසුවාක්මෙනි—

156 එ පු ර ලිය සරල් දිගුනිල් වරල්ව ලේ
ත ඹ ර උවන් මදහස පණැදූ මනක ලේ
ස ම ර සරණ සලෙලුන් සිත් මියුල් කැ ලේ
නො හැ ර විදූ ඇවිදී සැරපසිනි ඇමික ලේ

156. එපුර, ඒ නගරයෙහි; ලිය, කාන්තාවන්ගේ; සරල්, ඍලිසහිතාවූ; දිගු, දීඝීවූ; නිල්වරල්, නීලකෙශනම්වූ; වලේ, වනයෙහි; තඹර, තාමරශවැනිවූ; උවන්, වක්ත්‍රයන්හි; මදහස, මන්දස්මිත නම්වූ, පන්, පත්‍රයන්; ඇඳූ, අඳිමින් හෙවත් ගවසා (ඇතිකර); * මනක ලේ, මනොකල්‍යයෙන; සරණ, සඤ්චාරණයකරන්නාවූ; සලෙලුන්, සල්ලාලයන්ගේ; සිත්, චිත්තනම්වූ; මියුල්කැලේ, මෘගසමූහයා; නොහැර, හරණය නොකොට හෙවත් අත්නොහැර; සමර, අනංගදෙම; සැරපසිනි, ශරපඤ්චකයෙන්, † ඇමකලේ, සෑම කල්හි; විදූ, විජ්ඣනයකොට; ඇවිදී, ආහිණ්ඩනය කෙරෙයි—

---

* පණැද—පන්, පත්‍රයන්, අඳ, භක්ෂණයකෙරෙමින්— සිදු, යෙත්.

† අනඞ්ගයාගේ සැරපස නම් { අරවින්දම ශොකඤ්ච, චූතඤ්ච නවමල්ලිකා, උත්පලඤ්චෙතිපඤ්චෙතෙ,පඤ්චබාණශ්‍යසායකාඃ.

ඒ නුවර ලියන්ගේ රැලිසහිතවූ දික්වූ නිල්කෙස් නමැති වනයෙහි හෙලුම් මල්වැහිවූ මහුනුවල මදසිනානමැති පත්‍රයන් අදිමින් සිත්සතුටින් හැසිරෙණ ඉලන්දරින්ගේ සිත්නමැති මුවසමූහයා අත්නොහැර අනංගතෙම සැරපසින් හැමකල්හිම විද ඇවිදියි—

157 අකුසුපහර බියෙන නව් ගජකුඹු රුවැ ති
එපුරැ කතුන් තුඟුපියයුරු විලස් ග ති *
එහිද දුතහු නදනියකුසු පහර දෙ ති
උඩගු නද ගුණන්හට සැප කොනැත ඇ ති

157. ගජකුඹු, හස්තිකුම්භයෝ; අකුසුපහර, අඞ්කුශ ප්‍රහාරයට; බියෙන්එව්, භීතියෙන් මෙන්; එපුරැ, ඒ නගරයෙහිවූ; රුවැති, රූපශ්‍රී ඇත්තාවූ; කතුන්, කාන්තාවන්ගේ; තුඟු, තුඞ්ගවූ හෙවත් උච්චවූ; පියයුරුවිලස්, පයෝධරවිලාශය: ගති, ග්‍රහණයකළෝය; එහිද, ඒ පයෝධරයෙහිද; දුතහු, ධූර්තයෝ; නද, සම්බන්ධවූ; නියකුසුපහර, නඛාඞ්කුශ ප්‍රහාරය; දෙති, දානයකෙරෙත්ය; උඩගු, උද්ධතවූ; නදගුණන්හට, සම්බන්ධගුණ ඇත්තවුන්ට; සැප, සෞඛ්‍යය; කොනැතැ, කවර ස්ථානයෙක්හි; ඇති, විද්‍යමානද—

ඇතුන්ගේ කුම්භයෝ හෙවත් ශිෂියෝ (ඔලුගෙඩි) හෙන්ඩු පාරට බයෙන් මෙන් ඒ නුවර වසන රූපශ්‍රී ඇත්තාවූ ස්ත්‍රීන්ගේ උස්වූ පියයුරන්ගේ ආකාරය ගත්තෝය, (එහෙම නුමුත්) ඒ පයෝධරවලත් (ස්ත්‍රී ධූර්තාදී) ධූර්තයෝ නදනිය නමැති අකුසුපහර දෙත්ය උඩගු වූ නදගුණ ඇත්තවුන්ට සැප කවරතැනෙක ඇත්තේද (නැත්තේමය)—

158 මන් සන් තොස වඩන එනුවරෙහි වේමැ ද
තැන් තැන් සුසැදී සල්පිල් නැවමිණි මෙර ද
හන් බන් සේ වනෙහි වෙනපත් දනන් වැ ද
නන් වන් ගුජර පටසළු සිරි රැපැසි සො ද

158. මන්සන්තොස, චිත්ත සන්තොෂය; වඩන, වර්ධනයකරන්නාවූ; එනුවරෙහි, ඒ නගරයෙහි; වේමැද, වීථිමධ්‍යයෙහි; තැන් තැන්, තණ්හි තණ්හි; සුසැදි, සුසජ්ජිතවූ; සල්පිල්, ආපනයන්හි; නව, නවවිධවූ නොහොත්; නව, අභිනවවූ; මිණිමෙරද, මාණික්‍ය මරීචිය; එහි වෙනපත්, ඒ සල්පිල් සමීප ප්‍රාප්තවූ; දනන්, ජනයන් විසින්; හන්බන්, අවජාදනය බන්ධනය කරණලද්දවූ, සේවත්, සේවන වස්ත්‍රයන්ට; වැද, ස්පර්ශව හෙවත් වැදී, නන්වන්, නානා වර්ණවූ; සොද, සුන්දරවූ; ගුජරපටසළුසිරි, ගුර්ජර පට්ටසාටකශ්‍රීය; ඇරපැයි, ගෙණහැර දක්වී—

සිතෙහි සතුට ,වඩන්නාවූ ඒ නුවර වීථිමැද (දෙපැත්තේ) තැනින් තැන මනාව සැදී (සැරසී) තිබෙන්නාවූ සල්පිල්වල නවවැදෑරුම්වූ නොහොත් අලුත්වූ මැණික්කාන්තිය ඒ සල්පිල් සමීපයට පැමිනි ජනයන් විසින් හඳින බඳිනලද සුදුරෙදිවලට වැදී නොයෙක් පැහැ ඇත්තාවූ සොඳුරුවූ ගුර්ජර දෙශයෙහි පටසළුවල ආකාරය ගෙණහැර දක්විය—

* විලස්ගතු—කියයුතු තැන, එලිසමය පිණිස, විලස්ගති—සි ඝි.

159 දෙපස එපුර සුසැදුනු සැපතින් නොම දෙ
නිවෙස තුරින් නික්මුනු සුවඳ දුම්කඳ
සවස නැගු පහන් පෑ තෙදිනි බියවැදෙ
නොලස දිවන වැනිවිය නිසඳුරු පබඳ

159. නොමද, අමඳවූ; සැපතින්, සම්පත්තියෙන්; සුසැදුනු, සුසජ්ජිතවූ; එනුවර, ඒ නගරයාගේ; දෙපස, උභයපාර්ශ්වයෙහි; නිවෙසතුරින්, නිවෙසනාන්තරයෙන්; නික්මුනු, නිෂ්ක්‍රාන්තවූ; සුවඳ දුම්කඳ, සුගන්ධ ධූමස්කන්ධය; සවස, සායාන්හකාලයෙහි; නැගූ, ආරෝපනයකරණ (දල්වන) ලද්දාවූ; පහන්පෑ, ප්‍රදීප ප්‍රභාවගේ නොහොත්; පහන්, ප්‍රදීපයන් විසින්; පෑ, ප්‍රකාශකරණලද, තෙදිනි, තෙජස කරණකොටගෙණ; නිසඳුරුපබඳ, නිසාන්ධකාර ප්‍රබන්ධය හෙවත් සන්ධ්‍යාන්ධකාර සමූහය; බියවැද, භීතිප්‍රාප්තව; නොලස, අනාලශ්‍යව, දිවන වැනිවිය, ධාවනය කරන්නාක් මෙන් විය—

බොහෝවූ සැපතින් මනාව සැදුනාවූ ඒ නුවර (මග) දෙපැත්තේ ගෙවල් අතරෙන් නික්මෙන්නාවූ සුවඳ දුම්කඳ කෙසේද සවස්වේලෙහි නගන (දල්වන) ලද ප්‍රදීපයන් විසින් පතුරුවනලද තෙජස හෙවත් ආලෝකය කරණකොටගෙණ නිසඳුරුරැස හෙවත් සවස්වේලේ ඇතිවූ අඳුරු සමූහය බියවැදී වහා දිවන්නාක් මෙන් වූයේය—

160 නුදුරුවැ නුබට සිටිවහසල් බිහිදෙරිනි
අඳුරුවැ නොදිසි සුරරද පහමිණි රසිනි
සොඳුරුවැ සැදුනු එනුවර දෙව්පුර නමිනි
අඳුරුවැ වණනු අනතය දහසක් වතිනි

160. නුබට, නභයට; නුදුරුවැ, අදූරව හෙවත් අවිදූරව; සිටි, ස්ථිතවූ හෙවත් පිහිටියාවූ; වහසල් බිහිදෙරිනි, වාරකොෂ්ඨ බහිර්වාරයෙන් උපලක්ෂිතවූ; සුරරද, දිව්‍යරාජයාගේ; පහ, ප්‍රාසාදයෙහි; මිණිරසිනි, මාණික්‍ය රශ්මියෙන් උපලක්ෂිතවූ හෙයින්; අඳුරුවැ, අන්ධකාරව; නොදිසි, දෘශ්‍යමාන නූවූ; සොඳුරුවැ, සුන්දරවැ; සැදුනු, සජ්ජිතවූ; දෙව්පුර නමිනි, දෙව්නුවර යන නාමයෙන් උපලක්ෂිතවූ; එනුවර, ඒනගරය; අඳුරුවැ, අන්ධකාරව හෙවත් විචිත්‍රාලොකය මන් දව එනම් සංක්ෂෙපයෙන්; වණනු, වර්ණනා කරනහොත්; දහසක්වතිනි, සහශ්‍ර සංඛ්‍යා වක්ත්‍රයෙන් නොහොත් සහශ්‍ර සංඛ්‍යාවක්ත්‍ර ඇත්හෙයින්; අනතය, අනන්තයාය—

අහසට නුදුරුව සිටියාවූ වාහලින් හා, තොරණින් යුතුවූ විෂ්ණුදිව්‍ය රාජයාගේ ප්‍රාසාදයෙහි මැණික් රස්මියෙන් යුක්තවූ හෙයින් අඳුරුව නොපෙණෙන්නාවූ හෙවත් ආලෝකය ඇතිව පෙණෙන සොඳව සැදුනාවූ (මෙකල) දෙවුන්දර යන නමින් යුතුවූ ඒ නුවර වර්ණනා කරණවා නම් (සම්පිවන්නේ) දහස්ගණන් තුඩින් හෙවත් දෙදහසක් මුඛ ඇති හෙයින් අනන්ත නම් නාගරාජයා ය (වෙණකාවුද)—

161 මුනි වර නරවරන් නිවෙසෙහි නිබඳ වැ ස
පුව තර බැවින් තොප නොමඹනු පසඟ ගො ස
දව සැර නුවර දක්මෙන් තුරු පෙළෙණ ත හ ස
මමිතු ර වැඩම කරදෙව් රජගෙට සතො ස

161. මුනිවර, නරවරන්, මුනිඋත්තම, නරොත්තමයන්ගේ, නිවෙසෙහි; නිවාසස්ථානයෙහි හෙවත් නිවෙශනයෙහි; නිබඳ, නිරන්තරයෙන්; වැස, වාසය කොට; පුවතරබැවින්, ප්‍රසිද්ධභාවයෙන්; තොප, යුෂ්මත්තෙම; පසඟගොස, පඤ්චාඞ්ගික (තූර්‍ය්‍ය) ඝොෂාවට, * නොමඹනු, සිතිප්‍රාප්ත නොවන්නේමය (එහෙයින්); නුවර දක්මෙන්, නගර දර්‍ශනයෙන්; අවසැර, දිවසාතික්‍රමණය කොට; අහස, ආකාශයෙහි; තුරුපෙළෙණ, තාරකා ද්‍රශ්‍යමානවත්ම හෙවත් දෘශ්‍යමාන වනකල්හි; මමිතුර, මාගේ මිත්‍රය; සතොස, සන්තොෂයෙන්; දෙව්රජ ගෙට, දිව්‍යරාජ ගෘහයට, වැඩමකර, ගමනයකරව හොහොත් ගමනයකොට—

(බුද්ධාදි) මුනිවරයන් රජුන් නොහොත් තාපසයන් උතුම් මිනිසුන්ගේ ගෙවල්වල නිතර ඉඳ ප්‍රසිද්ධබැවින් උඹ පසඟතුරු ගොසට බයනොවන්නේමය (ඒ නිසා) නුවර දැකීමෙන් දවාල ඉක්මවා අහසේ තාරකාපෙළෙණ කාලයෙහි මගේ මිතුරෙ සන්තොෂයෙන් දෙව්රජහුගේ ගෙට වැඩමකරන් නොහොත් ගමන් කොට (ගොසින්)—

162 ම ල වල මුහුළු බැඳැගෙණැ විලවුන් ස ර ග
පැ ල දි මිණි බරණ මල්වැල් සහ ස ර ග
සු ල කුළු මෙවන් නළු නලඟන තැන් ස ර ග
බ ල රඟ මඬල පරෙවිඳු සඳ පැහැ ස ර ග

මලවලා, පුෂ්පාකුලකොට; මුහුළු, ධම්මිල්ලයන්; බැඳැගෙණැ, බන්ධනය කොට ගෙණ; විලවුන්, විලෙපනයෙන්; අඟ, අඞ්ගය හෙවත් ශරීරය; සරා, සජ්ජිතකොට හෙවත් සරහා; සරඟමල් වැල්සහ, ශෘඞ්ගාර පුෂ්පමාලාවන් සමග; මිණිබරණ, මාණික්‍යාභරණයන්ද; පැලඳි, පිලන්ධනය කළාවූ; මෙවන්, මෙබඳුවූ (උක්තප්‍රකාරවූ); සුලකුළු, අතිවිත්තකාන්තවූ හෙවත් අත්‍යලඞ්කෘතවූ; සරඟ, රංගසහිතවූ; නළුනලඟනතැන්, නාටක නාටකාඞ්ගනා සමූහඇත්තාවූ; රඟමඬල, රඞ්ගමණ්ඩලයන්; පැහැසරඟ, ප්‍රභාසාර අඞ්ගයක්ඇත්තාවූ; පරෙවිඳු සඳ, පාරෙවතෙන්ද්‍රොත්තමය; බල, අවලොකනය කරව—

මල්අවුල්කර හෙවත් මලින් ගවසා කොන්ඩාබැඳගෙණ (ඇඟෙ නාවරණ සුවඳසුනු ආදී) විලෙපනයෙන් ඇඟසරහා අලඞ්කාර පිණිස පලඳින මල්වැල්

* පඤ්චාඞ්ගික තූර්‍ය්‍යයෝ නම්—ආතතං (මෙව) විතත මාතත විතතඝණං.
සුසිරංචෙති තූරියං පඤ්චඞ්ගික මුදීරිතං—

ආතත නම්- තම්මැට්ටම්ආදී එක්මුහුනින්යුත් තූර්‍ය්‍යයසි විතත නම් දෙමුහුන ඇති දවුල් ආදියයි, ආතත විතත නම් සර්‍වභාගයෙන් වෙලනලද පනාබෙර ආදියයි, සුසිර නම් වස්කුලල් ආදියයි, ඝණනම් කයිතාලම් ආදියයි—

සමග මැණික්අබරණද පැලන්දවූ මෙහි මුලකියනලද ආකාරඇති ඉතා හිත කැමතිකරණ නැටුම් සහිතවූ නැට්වුවන්හා නැට්වුවන්ගේ ගැනුන්ද ඇති රඟමඩුලු හෙවත් නවන මණ්ඩපයන් මහත් කාන්තිමත් ශරීරයක්ඇති පරෙවිඳු තුමෙනි බලන්—

163 තු රැ ණ අබරණ දිනයෙහි රඟ නා
ග ව ණ* නදිහට පුදකල ලෙසි නා
මි ණි ණ බඳ බිම ඉසිපුල් මලි නා
ය මු ණ ගඟැපෙණ සිරි සිලි සොබ නා

තුරුණා අබරණ, තාරානාථාභරණයා හෙවත් චන්ද්‍රාභරණයා විසින්; රඟණා දිනයෙහි, රංගයකරණා දිනයෙහි හෙවත් නෘත්‍යය කරණකාලයෙහි; ගවනා නදිහට, ගොනාර්නදීයට හෙවත් පසුපසීනදියට; පුදකලලෙසිනා, උපහාර හෙවත් (පුජා) කලාක්මෙන්; මිණිනාබඳ, මාණික්‍යබඩවූ; බිම, භූමිතොමෝ, ඉසි, සික්ත‍වනය කරණලද්දවූ; උපුල්මලිනා, නීලොත්පල පුෂ්පයෙන් තො හොත්; පුල්මලිනා, වුල්ල (නීල) මාලායෙන්; යමුනාගඟැ; කාලින්දීනම් ගඞ්ගා වෙහි; සොබනා, ශොභමාන වන්නාවූ; පෙණසිරි, ඵෙණශ්‍රීය; ඉසිලී, උද්වහ නයකලාය —

ඊශ්වරයා විසින් නටනුලබන දිනයෙහි අහස්ගඟට පුදකල පරිද්දෙන් නිල් මැණික්වලින් බැඳි පවත්නා බිම්තොගමෝ ඉසිනලද නිල්උපුල් මලින් නො හොත් පිපුනාවූ නිල්පැහැඇති මල්වලින් යමුනානම් නදියෙහි බබලන පෙන වල ශොභාව හෙවත් දීප්තිය ඉසිලීය—

164 මු තු වැ ල සුලකල තනයුග එක ලා
හ ස වැ ල වැනි බිසකුරු ගත නිම ලා
නුරු වැ ල නිල්මිණි යුගදුල පතු ලා
බි ගු වැ ල වටකල වැනි රත කම ලා

164. එකලා, ඒකාන්තාවන්ගේ; මුතුවැල, මුක්තාවලියෙන්; සුලකල, අත්‍ය ලඞ්කෘතවූ; යුගතන, යුග්මථනයෝ හෙවත් පයොධරයෝ දෙශදන (කොපේද); නිමලා, නිර්මලවූ; බිසකුරුගත්, බිසාඞ්කුරග්‍රහණය කළාවූ; හසවැලවැනි, හංශාවලින්මෙනි; නිල්මිණි, නීලමාණික්‍යමයවූ; නුරුවැල, නූපුර වලයාවෙන් යුක්තවූ; දුල, දීප්තිමත්වූ; යුගපතුලා, යුග්මපාදතලයෝ (කොපේද), බිගුවැල භෘංගාවලීන් විසින්; වටකලා, පරික්‍ෂෙපකරණ ලද්දවූ; රතකමලාවැනි, රක් තපද්මයන් මෙනි—

ඒ කතුන්ගේ මුතුවැල්වලින් මනාව අලඞ්කාරකරණලද යුග්ම පියයුරු(කො පේද) පිරිසිදු නෙළුම්දැලිගත් හංශවැල් (පඞ්ක්තීන්) වැනිය. නිල්මැණික්මයවූ නූපුරයෙ (පාවලල්ලෙ) න් යුතුවූ දිලිසෙන්නාවූ දෙපතුල් (කොපේද) මීමැසි සමූ හයන් විසින් වටකරණලද රතු නෙළුම්මල්මෙනි—

* සවණ.

165 පියපුරු කිණිහිරි කැකුළෙක අ න් දමි
දසනග රැස්වැනි ගෙලෙ දූසම න් දමි
ලෙලවන කොමලත් පැහැසර ර න් දමි
අඟනන් දුට නොතිබේ තව සු න් දමි

165 කිණිහිරි කැකුළු, කණිකාර කුඩ්මලයන්හා; එකඅන්දම්, ඒකාකාරවූ; පියපුරු, පයොධරයන් ඇත්තාවූ; ගෙලෙ, ග්‍රීවයෙහි (පිළන්ධිතවූ) දූසමන්දම් වැනි, ජාතිසුමනපුෂ්පදාමාකාරවූ; දසනගරැස්, දශනාග්‍රරශ්මි හෙවත් මරීචිඇත්තාවූ; පැහැසර, ප්‍රභාසාරවූ; රන්දම්, සුවර්ණදාමාකාරවූ; ලෙලවන, ලලිතකරවන්නාවූ; කොමලත්, කොමලහස්තයන් ඇත්තාවූ; අඟනන්, අංගනාවන්; දුට, දර්ශනයකළහොත්; තවසුන්, තපශ්වීන්ගේ; දම්, (ගුණ) ධර්මය; නොතිබේ, ස්ථාපනයනොවේ—

කිණිහිරිමල් කැකුලුවැනි පියපුරු (තන) ඇත්තාවූ, කරෙහි පලඳිනලද දැසමන් මල් දම්වැනි, දත්අගින් විහිදෙන රැස් ඇත්තාවූ, මහත් පැහැයඇති, රත්රන් දම් වැනිවූ, චඤ්චලකරවන මොලොක් අත්ඇති, අංගනාවන් (ස්ත්‍රීන්) දුටුවොත් තවසුන්ගේ (බ්‍රහ්මචර්‍ය්‍යා සංඛ්‍යාතගුණ) ධර්මය නොතිබෙයි—

166 සි ත් කලු විලසින් මදලස ගමනි නි
යු ත් සෙවනලු තැන වැඩි මියුරන් වැ නි
ග ත් පැහැතලෙ නැඳලා අඹදළු වෙ නි
සි ත් තුටු වෙයි අඟනන් රඟ දැකුමෙ නි

166 සිත්කලු, විලසින්, චිත්තකාන්තවූ විලාසයෙන්හා; මඳලසගමනින්යුත්, මන්දාලස්‍යගමනින් යුක්තවූ; සෙවනලුතැනැ, ඡායාකුලස්ථානයෙහි, වැඩි වර්ධිතවූ; මියුරන්වැනි, මයූරවර්ණවූ හෙවත් මයූරාකාරවූ නොහොත් මයූරයෙකුන් වැනිවූ; අතලෙන්, හස්තතලයන් කරණකොටගෙණ; ලාඅඹදළුවෙනි, තරුණාම්බ්‍ර කිසලයයන්; පැහැ, ප්‍රභාව; ඇදූ, ආකර්ෂණයකොට; ගත්, ග්‍රහණයකලාවූ; අඟනන්, අංගනාවන්ගේ; රඟ, ආකාරය නොහොත් රඟ, නෘත්‍යය; දැකුමෙනි, දර්ශනය හේතුකොටගෙණ; සිත්තුටුවෙයි, චිත්තසන්තුෂ්ටවේයි හෙවත් චිත්තානන්දවෙයි—

සිත් කැමැතිකරවන්නාවූ ලීලාවෙන් හා, මිඳුවූ අලසගමනින්ද යුතුවූ, සෙවනින් ගැවසීගත්තැන වැඩුනාවූ මයූරාකාරවූ නොහොත් මොණරදෙනුන් වැනිවූ (තමතමන්ගේ) අල්ලවල්වලින්, ලා අඹදළුවල පැහැයඇදලාගත්තාවූ (එතම් අඹදළුවල වැනි පැහැයඇති අතුල්ඇත්තාවූ) අඟනන්ගේ ආකාරය, නොහොත් නැටීම, දැකීමෙන් සිත් සතුටුවෙයි.

167 ලෙලදු න් නව තඹ පලුවන් පා දේ
තබ මි න් නිවරදෑ මද්දල නා දේ
ගය මි න් පාතාගිතෙන් කී දේ
අඟන න් රඟ දුටුවන් සිතු පා දේ

167 ලෙලදුන්, ලලිතාඞ්ගනයකළාවූ; නවතඹපලුවන්, අභිනව තාම්‍රපල්ලවාකාරවූ; පාදේ, පාදයන්; මද්දලනාදේ, මද්දලනම් භෙරිනාදයට නොහොත් මුදංග භෙරිනාදයට; නිවරදූ, විරුඬනොකොට; තබමින්, ස්ථාපනයකෙරෙමින්; ගිතෙන්, ගීතිකාවෙන්; කිදේ, කථනයකරණලද්දෙය; ගයමින්, ගායනාකෙරෙමින්, පාණා, ප්‍රකාශකරන්නාවූ; අඟනන්, අංගනාවන්ගේ; රඟ, නෘත්‍යය නොහොත් ආකාරය; දුටුවන්, දශීනයකලවුන්ගේ; සිතු, චිත්තය; පැදේ, ප්‍රසන්න වෙයි—

ලෙලදුන්නාවූ අලුත්වූ තඹපාට පලු හෙවත් දළුවැනි පාදයන්, මද්දලනම් බෙරනා දයට, (මද්දලනම් බෙරපදේ ගහනහැටියට) නොවරදවා තබමින්, ගිතිකාවෙන් කියනලද්දේ ගායනාකෙරෙමින්, පෙන්වන්නාවූ, අගනන්ගේ නැටිම නොහොත් ආකාරය දුටුවන්ගේ සිත් පැහැදෙයි—

168 ල සි ත ලලිත විදුලි සේ ය
දි සි ත ලියන් නොකම සේ ය
චි සි ත කියන ගී ර සේ ය
න සි ත නොපටුවේ තො සේ ය

168 ලසිත, බබලන්නාවූ; ලලිත, ලෙලදෙන්නාවූ; විදුලිසේය, විද්‍යුල්ලතා පරිද්දෙන්; දිසිත, දිශ්‍යමානවූ; ලියන්, කාන්තාවන් විසින්; නොකමසේය, ක්‍ෂමානොවීමෙන් හෙවත් සහානොවීමෙන්; (නොනැවතී) කියන, කථනයකරණලබන්නාවූ; චිසිත, විචිත්‍රවූ; ගිරසේය, ගිත්කාරසය කරණකොටගෙණ; නසිත, නාගේචිත්තයෙහි; තොසේය, තොෂය; නොපටුවේ, පටුනොවෙයි හෙවත් ව්‍යාප්තවෙයි—

බබලන ලෙලදෙන විදුලිමෙන් දකින්වලැබෙන කතුන් විසින් නොනවත්වා කියනුලබන විසිතුරු ගිතිකාවන්ගේ රසය කරණකොට ගෙණ, තාගේසිතේ (ඇතිවන) සතුට පටුනොවෙයි හෙවත් කුඩානොවෙයි—

169 තර ඟ අයුරු කොමල අ තේ
උ ර ඟ න වන් රුසිරු යු තේ
ව ර ඟ න රඟ දෙන දිමු තේ
නර ඟ අවෙස වූවොයි සි තේ

169 තරඟඅයුරු, තරඞ්ගාකාරවූ, කොමලඅතේ, කොමලහස්තයෙන් යුක්තවූ උරඟනවන්, උරගාඞ්ගනාවන් වැනිවූ; රුසිරුයුතේ, රූපශ්‍රියෙන් යුක්තවූ; දිමුතේ, දීප්තිමත්වූ; වරඟන, වරාඞ්ගනාවන් විසින්; රඟදෙන, රංගදානයකරණකල්හි; නරඟඅවෙස, අනඞ්ගාවිෂ්ටය; වූවොයි, වූවේයයි; සිතේ, චින්තනයවෙයි—

රලමෙන් (ඔසවනලද) මොලොක් අත්වලින් යුතුවූ නාගාඞ්ගනා (නාගකන්‍යා) වන් වැනි රූපශ්‍රියෙන් යුතුවූ, දිලිහෙන උතුම් අඟනන් විසින් නැටීම්දෙනුලබන කල්හි හෙමින් නටනකල්හි, අනංගයා ආවිෂ්ටවූ හෙවත් අනංගයා ආවෙශවූ තැනැත්තියෝයයි සිතෙයි—

170 මුදුනෙන් බැම යුවලින් දිගු නුවනින් ගෙලෙප සිනි
යුග තින් රතැඟිලියෙන් උරතලයෙන් මැද දෙ සිනි
වමොරින් පුලුලුකුලින් දඟ,යුවලින් පතුල සිනි
රැඟුමෙන් කළ කරණින් සොඳ අඟනන් දකු තො සිනි

170 මුදුනෙන්, මූර්ධනියෙන් හෙවත් මස්තකයෙන්ද; බැම්යුවලින්, භ්‍රෑයුග්මයෙන්ද; දිගුනුවනින්, දීර්ඝ නෙත්‍රයෙන්ද; ගෙලෙපසිනි, ග්‍රීවයෙහි පාර්ශ්වයකින්ද; යුගතින්, යුග්මහස්තයෙන්ද; රතැඟිලියෙන්, රක්තාඞ්ගුලියෙන්ද; උරතුලයෙන්. උරස්තලයෙන්ද; මැදදෙසිනි, මධ්‍ය ප්‍රදෙශයෙන්ද; වමොරින්, වාමොරුයෙන්ද; පුලුලුකුලින්, ප්‍රථුලවූ ශ්‍රොණියෙන්ද; දඟයුවලින්, ජඞ්ඝායුග්මයෙන්ද; පතුල්සිනි, පාදතලපාර්ශ්වයෙන්ද; නොහොත් පතුලසිනි, පාෂ්ණිවලින්ද; (යන) කරණින්, ශරීරයෙන් හෙවත් ශරීරයෙහි ඒ ඒ තැන් කරණ කොටගෙණ; කළ, කරණලද්දාවූ; රැඟුමෙන්, නෘත්‍යයෙන්; සොඳ, සුන්දරවූ, අඟනන්, අංගනාවන්; තොසිනි, තොෂයෙන්; දකු, දර්ශනයකරව—

මුදුනෙන්ද, බැමදෙකින්ද, දික්වූ ඇස්වලින්ද, බෙල්ලේ පැත්තකින්ද, දෙඅතින්ද, රතු ඇඟිලිවලින්ද. උරතලාවෙන් හෙවත් පලල්වූ ලැපැත්තෙන්ද; (ශරීරයෙහි) මැද දිශාවෙන්ද, වම්වූ කලවාදෙකින්ද, පලල්වූ උකුල්වලින්ද, කෙන්ඩාදෙකින්ද, පතුල සමීපයෙන් හෙවත් පතුලේ පැත්තකින්ද, නොහොත් කුඩාපතුල්වලින්ද, (යනමෙකි) ශරීරයෙහි ඒ ඒ තැනින් කරණලද නැටීමෙන්, සොඳුරුවූ අඟනන් සතුටින් දකින්—

171 කිඳු රන් බස කොවුලන් නද පසුකර මියුර සිනේ
කිය මින් ගී රඟමින්සිරි අඟනක් සරත සිනේ
ලිහි ලින් වත වරලින් මුත දුනු සෝබිඳු ග තිනේ
නුව නින් රත මෙඇමින්රඟ සලෙලකුමෙන්තෙවුනේ

171 කිඳුරන්, කින්නරයන්ගේ; බස, වචනයද, කොවුලන්, කොකිලයන්ගේ; නද, නාදයද; මියුරසිනේ, මධුරරසයෙන්; පසුකර,පරාජයකොට; ගී කිය මින්, ගීතිකා කථනයකෙරෙමින්; රඟමින්, නෘත්‍යය කෙරෙමින්, සරතසිනේ, ශ්‍රාන්තභාවයෙන්; සිරි, ස්ථානයකළාවූ; අඟනක්, අංගනාවක්; වත, වස්ත්‍රයාගේ ලිහිලින්, සිථිලත්වයෙන්ද; මුත, මුක්තාවූ; වරලින්, ධම්මිල්ලයෙන්ද; සෝබිඳු දුනු, සෞදබින්දුන් ජනිතවූ; ගතිනේ, ගාත්‍රයෙන් හෙවත් ශරීරයෙන්ද; රත, රක්තවර්ණවූ; නුවනින්, නෙත්‍රයෙන්ද; (යන) මෙඇමින්, මේ සියල්ලෙන්;රඟ සලෙලකුමෙන්; රංග සල්ලාලයෙකු පරිද්දෙන්; තෙවුනේ, විරාජමානවී—.

කිඳුරු නදහා කොවුල්නදද, (තමන්ගේ) මිහිරිනදින්, පරාජයකර, ගීකිය මින් නටමින් විඩාවටපැමිණෙමින් සිටියාවූ, අඟනක්ගොනාමෝ. වස්ත්‍රයාගේ බුරුල්බවෙන්ද, මිදුනාවූ කොන්ඩයෙන්ද, ඩහදිය හටගත් ශරීරයෙන්ද, රතුපැහැ ඇති ඇස්වලින්ද, යනමේ කියනලද සියල්ලෙන්, නටන ඉලන්දාරියෙකුමෙන බැබලීය—

172 දෙහිරු න් තඹරන් ගෙණැරෙන් යතමෙන්
කියමින් ගිතය වෙසෙ සේ
පද යෙ න් පදයට තබමින් දෙපතුල් සන්තර
රන්රසු තොල සේ
න ල ඹ න් අතුරෙන් අඟනක් රඟගත් විලසක්
වෙසතර සක සේ
සුර කැ න් මැද උන් සහසැස් අබියෙස්
උරුවෙස් රඟගත් විල සේ

172. දෙහිරුන්, හිරෙළුසන් විසින්, තඹරන්, තාමරස වනයෙහි නොහොත් තාමරසයන්ගේ; රෙන්, රෙණුන්; ගෙණැ, ග්‍රහණයකොට, යතමෙන්, ප්‍රයාතයකරණ පරිද්දෙන්; වෙසෙසෙස්, විශිෂ්ටවූ; ගිතය, ගීතිකාව; කියමින්, කථනය කෙරෙමින්; පදයෙන් පදයට, පද්‍යයෙන් පද්‍යයට හෙවත් (ගි) පදෙන් පදේට දෙපතුල්, විපාදයෙන් හෙවත් පාදතල මඤය; තබමින්, ස්ථාපනය කෙරෙමින්; තොලසේ, අතලයව, රන්රසු, ස්වර්ණ කිංකිණිකායන්; සන්තර, ශබ්දකොට; නලඹන් අතුරෙන්, නාටිකාම්බිකාන්තරයෙන්; අඟනක්, අංගනාවක්, වෙසතර, වසඟකොට, සකසේ, චක්‍රයක් පරිද්දෙන් නොහොත් සක්කච්චයෙන් (සකස් කොට); රඟගත්, රංගග්‍රහණයකලාවූ; විලසක්, විලාශයක් (භෙදය); සුරකැන් මැද, දිව්‍යසමූහයා මධ්‍යයෙහි, උන්, නිසීදනයකලාවූ; සහසැස්, සහස්‍රාක්ෂියාගේ; අබියෙස්, අභිමුඛයෙහි; උරුවෙස්, උරුවසීය විසින්; රඟගත් විලසේ, රංගග්‍රහණයකල ආකාරයි.

මීමැස්සන් විසින් පියුම් වනයෙහි නොහොත් පියුම්මල්වල රෙණු රැගෙණ ගමන්කරණ (කාලයෙහි පවත්නා මිහිරි නාදය) මෙන් විසිතුරුවූ ගීතිකා කියමින් (ගි) පදෙන් පදේට පතුල්දෙක තබමින් කුසීතනොව (දක්‍ෂව) රත්රන් රසුගෙඩි හෙවත් රත්‍රන්මය කුඩා මිණිගෙඩි සමූහය නාදකෙරෙමින් නටන අඹුන් අතරෙන් එක් අඹුවක් (බලාසිරිත්තන්) වසඟකර සකක්මෙන් කරකැවෙමින් නොහොත් සකස්වූ පරිද්දෙන් නැටූ අන්දමක් කෙසේද කිවොත් දිව්‍යසමූහයා මැද උන්නාවූ දහස් ඇස් ඇත්තහුගේ හෙවත් ශක්‍රයාගේ ඉදිරියෙහි උරුවසී නම් දෙවඟන විසින් නටන්ට පටන්ගණුලැබූ ආකාරයි.

173 * ඇසඳුන් එසත්තන් වණින්යුත් කලු ත්තේ
රුව න් ව න් රසන්දම් කැළුම්කැත් පෙනෙ න්නේ
ඔ වු න් දු න් † වෙසින්ගත් සතක්මෙන් බමන්නේ
අඳු න් ව න් ගුවන්වන් විදුන්වන් එතැ න්නේ

173. කලුත්තේ, කාන්තාවන්ගේ නොහොත්; නේකලුන්, අනේක කාන්තාවන් විසින්; හන්, අවජාදනසකරණලද; තන්වණින්යුත්, නානාවණියෙන් යුක්තවූ; වසන්, වස්ත්‍රයන්ගේ; ඇසින්, අක්ෂියෙන්; රූවන්වන්, රත්නප්‍රභාවූ

* "අහසින්" සිද.
† "වෙසින්" සිද—සමහර.

නොහොත්; රුවන්වන්, (මාණික්‍ය) රත්න බන්ධනය කරණලද්දාවූ; රශ්මි, රශ්නාදාමයන්ගේ; කැලුම්කැන්, කාන්ති සමූහය; පෙනෙනන්නේ, දෘශ්‍යමානවන්නේය; * ඔවුන්, ඒ කාන්තාවන් විසින්; දුන්, දානයකරණලද නොහොත්; දුන්, ජනිතකරවණලද්දාවූ; වෙයින්, වෙගයෙන්; ගත්, ශරීරය; සකක්මෙන්, චක්‍රයක් පරිද්දෙන්; බමන්නේ, භ්‍රමණය වන්නේය; එතැන්නේ, ඒ ස්ථානය; විදුන්වන්, විද්‍යුල්ලතා ප්‍රවිෂ්ටවූ; අඳුන්වන්, අඤ්ජනවණිවූ, ගුවන්වන්, ආකාශයවැන්න—

, ස්ත්‍රීන්ගේ නොහොත් නොයෙක් ස්ත්‍රීන් විසින් හඳිනලද නොයෙක් පැහැයෙන් යුතුවූ වස්ත්‍රයන්ගේ ඇස්වලින් (පිටතට මිණි) රුවන් පැමිනියාවූ (පෙනෙන) නොහොත් මිණිරුවන් බැඳ කරණලද්දාවූ මෙබලාදාමයන්ගේ (රතු නිල්මැණික් ආදිය බැඳ කරණලද ඉන්ද්‍රනීල පෙතිවැල් හවඩි ආදියෙහි) රැස් සමූහය පෙනෙන්නේය, ඒ කතුන් විසින් දෙනලද නොහොත් උපදවන ලද වෙගයෙන් ශරීරය සකක්මෙන් කරකැවෙන්නේය, ඒ ඉඩම (ඒ වෙලාවට) විදුලි පැමිණියාවූ අඳුන් පැහැය ඇති අහස වැනිය—

174 කෙ ළ වන දිගු නෙත නිලුපුල සේ යා
ලෙ ල පවනින් රන්ලිය විල සේ යා
න ල ගත රඟනා දැකැ නොල සේ යා
න ළ ල නැතු වනනැ රඟ සැල සේ යා

**174.** නිලුපුලසේයා, නීලොත්පලාකාරවූ; දිගුනෙත, දීර්ඝනෙත්‍රයන්; කෙළ වන, ක්‍රීඩාකරවන්නාවූ; පවනින්, මාරුතයෙන්; ලෙල, ලීලාපෙතවූ; රන්ලිය විලසේයා, ස්වණිලතාකාරවූ; නොලසේයා, අනලස්ව, රඟනා, නෘත්‍යයකරන්නාවූ; නලඟන, නාටිකාඞ්ගනාවන්, දැකැ, දර්ශනයකොට; නලළැ, ලලාටයෙහිද; නුවනනැ, නෙත්‍රයෙහිද; රඟසැලසේයා, රඞ්ගය සැලසෙයි හෙවත් නැටීම සිඩවෙයි—

නිල් උපුල්වැනි දික්ඇස් සෙල්ලම්කර (නට) වන්නාවූ සුළඟින් සෙලවෙන රන්රන් වැල්වැනිවූ ආලසි (මැලි) නොව නටන නාටිකා අඟනන් දැකැ නලලෙහිද ඇසෙහිද නැට්ම සිදුවෙයි—

175 චන් චන් පුම ඇ දුනැ නල බේද ත් ‡
සත් තත් මියුරුව සහ වෙන නාද ත්
නොත්නත් දෙවඟන පාතා වාද ත්
වි ත් ද ත් නලඟන දකු සිතු පැද ත්

* නේකැලුම්කැන්, අනෙක කාන්තිසමූහය; පෙනෙන, දෘශ්‍යමානවන්නාවූ; සිඳ—කියති.

† නලබේ. නාටකභෙද; දත්. ජනනය කළාවූ; ජනනයකොට—සිඳ—යෙත්.

‡ නලබේදත්, නාලභෙද—සිද—යෙත්.

175. චත් චත්පුට ඈ, චත්ය චත්පුටය යනාදිවූ; තලභේදත්, ‡ (නාටකා නාටිකාදී) නෘත්‍යභෙදද; මියුරුව, මධුරවූ; සත්තත් වෙණනාදත් සහ, සප්ත තන්ත්‍රී වීණානාදයද සමග; තත්දෙවඟන, අනඝ්‍ය දිව්‍යාංගනාවන් විසින්; නෙත්, නෙතුයෙන්; පානා, ප්‍රකාශකරණු ලබන්නාවූ; වාදත්, වාදයන්ද; (යනාදිවූ) විත්, විද්‍යාවන්, දත්, ජනනයකළාවූ; නලහන, නාටිකාංගනාවන්; සිතුපැදත්, චිත්තය ප්‍රසන්නකොට; දකු, දශිනයකරව—.

චත්ය චත්පුටය යනාදිවූ (නාටක නාටිකාදීවූ එක එක අන්දම්) නැටීම් භෙදයන්ද මිහිරිවූ සත්තත් ඇති වීණානාදයද සමග කොලවරක්නැති දෙවඟනන් විසින් (තම තමන්ගේ) ඇස්වලින් පෙන්වනු (පලකරණු) ලබන වාදයන්ද යන විද්‍යාවන් දනගත්තාවූ නාටිකා අඟනන් සිත පහදවා දකිත්—

176 ලානෙත් කෙළවරකළ අතවැණුම ට
ඒ නෙත් පත්තැන් ස්ත රස ගැණුම ට
සේ ප ත් * ලද තුනුවඟ රඟ ගෑණුම ට
පෝ සත් වියතුන් † නොදනිම් වැණුම ට

176. කළ, මනොඥවූ නොහොත්; කළ, කරණලද්දාවූ; අතවැණුමට, හස්තචාලනයට; නෙත්කෙළවර, නෙතුකොනිය; ලා, හෙලා; (බලාසිටින්නාවූ) ඒ නෙත් පත්තැන්, ඒ නෙත් ප්‍රාප්තකළ තැනැත්තන්ගේ; සිතරස ගැණුමට ස්තතරස ග්‍රහණයපිණිස, සේ, ජෙකවූ නොහොත්; ස්තරස ගැණුමටසේ, ස්තත රස ග්‍රහණයට පරිද්දෙන්; රඟගැණුමට, රංගග්‍රහණය පිණිස; පත්, ප්‍රාප්තවූ; ලද, තරුණවූ; තුනුවඟ, තන්වංගිත් (ගේ ආකාරය); වැණුමට, වණිනාකිරීමට; පෝසත්, ප්‍රඥවූ; වියතුන්, ව්‍යක්තයන්; නොදනිම්, ජනනය නොකෙරෙමි,

සිත්සතුටුකරන්නාවූ නොහොත් (නැටීගමන්සුතුව) කරණලද්දාවූ අතවැනීමට (අතවණන හැඬෙද්දක රට සතුටුව) ඇස්කොණ පමුණුවා හෙවත් ඇස් කොණින් බලා (සිටින්නාවූ) ඒ ඇස් පැමිණවීම හෙවත් ඇස්වලින් බැලීම කොට සතුටින් බලා ඉන්නා තැනැත්තන්ගේ සිතේ රසය (හොඳ කැමැත්ත) ගැණීමට දක්‍ෂවූ නොහොත් සිතේ හොඳකැමැත්ත ගැණීමටවගේ නැටීමට පැමිණියාවූ කෘශාංගින් හෙවත් ස්ත්‍රීන්ගේ ආකාරය (මේ ගම් අන්දම්යයි) වණිනාකිරිමට පුළුවන් ව්‍යක්ත (වැන්න) ගත් (මම) නොදනිම් යනු (කාව්‍යකාරීෘගේ කිමදී—

177 ලයනොව රද පහරණ යසු තා ල ශ
රඟ ඇදුරන් හැකි තිසි නොවි තා ල ය
නිලඟනදුට රඟදෙන එක තා ල ය
පරෙවඳ යඳ වොසවේ එක තා ල ය

* නදතුනු.

† නොදනී වැනුම්ට—යි.

177. ලයනොවරදා, ලය විරුඬනොකොට හෙවත් තාලය වෙනස්නොකර; කසුතාලය, කංසතාලයන්, පහරණ, ප්‍රහාරණය කරන්නාවූ, රඟඇදුරන්, රංගාචාය්‍ර්‍යයන් විසින්, කිසි නොවිතාලැයහැකි, කිසිවක් නොවිචාල හැක්කාවූ; එකතාලය, ඒකාකාරයෙන්; රඟදෙන, රංගදානය කරන්නාවූ; නලඟන, නාටිකාඞ්ගනාවන්; දුට, දර්‍ශනයකළහොත්; පරෙවිඳුසඳ, පාරෙවතෙන්‍ද්‍රොත්තමය; එකතා, ඒකාන්තයෙන්; ලය්, චිත්තය; නොසවේ, නොඇවෙසී—

තාලය වරද්දන්නේනැතුව කංසතාලයන් හෙවත් කසිතාලම් ගසන්නාවූ (නැටීමෙහි විශෙෂවිභාග හොඳින් දනගත්) නෘත්‍යාචාය්‍ර්‍යයන් විසින් (ඔහො මදනටන්නේ යනාදි වශයෙන්) කිසිවක් විචාල නොහැකිවූ (විචාරන්ට කියන්ට කිසිත් වරදක් නැත්තාවූ හොඳහැටි) එකඅන්දමට නටන්නාවූ නාටිකාංගනාවන් දුටුවොත් පරෙවියන්ට ප්‍රධානවූ උතුම් පරෙවිය නියතයෙන් (උඹේ) හිත සතුටුවෙසී—

178 විපුල් වන් යසැති ලොවපතළ පිරිසිදු
කොපුල් වන් රුවන් පස්කැත් කණින් සැදු
උපුල් වන් සමග රූ රස අඳුන් බඳ
උපුල් වන් සුරිඳු සිරිපා පියුම් වඳ

178. ලොව, ලොකයෙහි; පතළ, පත්‍රළවූ හෙවත් ව්‍යාප්තවූ; පිරිසිදු, පරිශුඬවූ; විපුල්වන්, විපුලවන්නාවූ; යසැති, කිර්ති ඇත්තාවූ; කොපුල්වන් කපොල ප්‍රාප්තවූ, රුවන්, රත්නමයවූ; පස්කැන, තාඩඞ්කයෙන්; සැදූ, සජ්ජිතකළාවූ කණින්, කර්ණයෙන් යුක්තවූ; උපුල්වින සමග, උත්පල වර්‍ණය හා රසඅඳුන්බඳ, රසාඤ්ජනයද වැනිවූ, රූ, රූපශ්‍රීයෙන් යුක්තවූ; උපුල්වන් සුරිඳු, උත්පලවර්‍ණ සුරෙන්‍ද්‍රයාගේ; සිරිපාපියුම්, ශ්‍රීපාද පද්මයට; වඳු, වන්දනයකරව—

ලෙව්හි පැතුරුනාවූ පිරිසිදුවූ මහත්වන යසස් ඇත්තාවූ කපොලයට පැමිනි රුවන්තෝඩුවෙන් සදනලද කණින් යුතුවූ නිල් උපුල්වල පැහැය සමග රස අඳුන්ද වැනිවූ (පැහැය ඇති) රූපශ්‍රීයෙන් යුතුවූ උපුල්වන් දෙවිඳුගේ සිරිපද තඹරවඳින්—

179 රන් මිණි ලතළ එසුරිඳු මුදුනත කිරුළ
රන් කෙසරිඳුට සරිකල මතැ අඳුන් කුළ
වන් යම් සතෙකු මහවතුරු තුල ගඟ කුල
දුන් අත් අසු ඃැ බිම්සඳ පතට හෝ වෙල [*]

179. එසුරිඳු, ඒ සුරෙන්‍ද්‍රයාගේ; මුදුනත, මස්තකයෙහිවූ; රන්මිණිලතළ, සවර්ණමාණික්‍යයෙන් අලඞ්කෘතවූ; කිරුළ, කිරීටය, අඳුන්කුලමතැ, අඤ්ජන කූට මාතඞ්ගයෙක්හි; රන්කෙසරිඳුට, සවර්ණකෙසරීන්ද්‍රයෙකුට; සරිකල, සමානකල හොත්; (ඒ උපමාව); මහවතුරුතුල, මහොඝය උත්තරිතවූ හෙවත් මහවතුර

* හෝ වැල—යිද තිබේ.

ඉසිරී යන්නාවූ; ගඟතුල, ගංගාභ්‍යන්තරයට; වන්, ප්‍රාප්තවූ; යම් සතෙකු, යම් සත්වයෙකු විසින්; ගෝ වෙල, (කුඩාවූ) ගංගාකූලය; බිම්සඳ, (විසාලවූ) භූමිකාභාගාව යයි (සිතා) පතට, (සම්ප) ප්‍රාප්තියපිණිස; අත්දුන්අයුරු, හසන දනයකල ආකාරයි~~

ඒ (උපුල්වන්) සුරිඳුගේ මුදුනෙහිවූ, රත්නින්හා මැණික්වලින් සැරසූනාවූ ඔටුන්න, අඳුන්කුළු මුදුනෙක්හි, රත්න් කෙසරීන්ද්‍රයෙකුට සමාන කලහොත් (ඒ උපමාව) මහවතුර ඉතුරුනාවූ (දෙගොඩතලාගෙන) ගඟක් ඇතුලට පැමිණියාවූ යම් සතෙකු විසින් (එහි කුඩාප්‍රදෙශයක්වූ) ගංගාඉවුරද්ධත (ඒ දූවූපිකට පමණක් විසාලවූ මිහිකතයයි සිතා ගෙහවත් මූලපොලවයයි සිතා ගොඩවීමට එනම් මිහි කතගෙ) සම්පයට යාමට අනදීමක් (කලා) සමානයි~~

180 ඉඳු මිණි යටග බඳමන සිකිණිඳු යුව ල
යුගපත් රඹ පැලෙන වැඩි යොවුනවනග ළ
කිව මෙළුවම් බැම ගහණනට පැහැදු ල
අදෝ කදෝ වැනිදෝ හිමීට සරික ල

180 (තවද, එසුරේන්ද්‍රයාගේ) පැහැදුල, ප්‍රභාජ්වලිතවූ; බැමගහණනට, භෲ (සහිත) ස්ථානයට; ඉඳුමිණියටග, ඉන්ද්‍රනීලමාණික්‍ය යෂ්ට්‍යග්‍රයෙක්හි; බඳ, බන්ධිතවූ; මනසිකිණිඳු යුවල, මනාශිඛීන්ද්‍රයුග්මයෙක්ය; වනගළ, වනඝටයෙක්හි; වැඩි, වර්ධිතවූ; යොවුන, යෞවනයෙන් යුක්තවූ; රඹපැලෙන, රම්භාපොතක යෙක්හි; පත්යුග, පත්‍රයුග්මයෙක්ය යන; මෙළුවම්, මේ උපමාවන්; කිව, කථනය කලහොත්; දෝහිමිට, ජ්‍යොතිස්වාමිහට; අදෝ, අවිප්ජිතවූ; කදෝ, ඛද්‍යොතකයෙකු; සරිකලවැනි, සමානකලාක්මෙනි~~

(තවත් කාරනයක්) ඒ හිමිහුගේ දිලිසෙන පැහැයඇති, බැම (සහිත) නාශිකාවට, ඉඳුනිල් මැණික්දණ්ඩෙහි අග බඳිනලද්දාවූ, මත්මියුරන් දෙදෙනෙක්ය, වන සමූහයෙහි වැඩුනාවූ තරුණවූ කෙසෙල්පැලයෙක්හි පත්දූගෙක (පත්‍ර දෙකෙක්ය යන) මේ උපමාවන් කිව්වොත් (බබලන) සූර්ය්‍යයාට, දිලිසීමනැති කනමැදිරියෙකු සමානකලාක්මෙනි~~

181 ර ත් මි ණි තෝඩු යුග හිමි සවණනැ සොබ න
ව ත් සිය පතය පොබියන ලෙසිනි ඇමදී න
ප ත් රිවි යුගය විනියෙසි කියත වෙසෙස් න
ම ත් ගජ රදුට නගුලිස සදිසි කල මෙ න

181 හිමි, (ඒ) ස්වාමීහුගේ; සවණන, ශ්‍රවණයෙහි; සොබන, සොභනවූ හෙවත් බබලන්නාවූ; රත් මිණිතෝඩුයුග, රක්තමාණික්‍ය තාඩ්ඩකයුග්මය; ඇමදවන, සැමදවස්හි, වත්සියපත, වක්ත්‍රනමැති සතපත්‍රය; පොබයනලෙසිනි, ප්‍රබොධ කරවන පරිද්දෙන්; වෙසෙසින, විශෙෂයෙන්; නොහොත් වෙසෙසින, විශිෂ්ටයෙන්; පත්, ප්‍රාප්තවූ; රිවියුගය වැනියයි, සූර්ය්‍යයුග්මයක් සමානයයි; කියන, කථනකරනහොත්, මත්ගජරදුට, මත්ත හස්තිරාජයාහට; නගුලිස, නඞ්ගල ශීර්ෂය; සදිසිකලමෙන, සදෘශකලාක්මැන්න~~

(ඒ වස්දෙව්) හිමිහුගේ කණෙහි බබලන්නාවූ රතු මැණික්මයවූ තෝඩුදෙක, හැමදවසෙහිම මුහුන නමැති නෙලුම්මල පුබුදුකරවණ පරිද්දෙන් (ලොව පැවැත්මට) වෙනස් අන්දමින් නොහොත් විසිතුරුආකාරයකින්, පැමිනියාවූ හිරු දෙදෙනෙකු සමානයයි, කියනහොත් (ඒ උපමාව) මත්ඇතෙකුට, නගු ලේඉස සමානකළාක්මෙනි.

182 ලොව නඳ කරණ අමකිරණින් යුත් නිම ලී
මූ ව සලකුණු දරණෙය මූව ලපසිය ලී
මු ව සිසි හිමි ඔහුගත් නෙත් යුග ඉසි ලී
කී ව ඉසුරුගෙ අබියස පේරහ කිය ලී

182. ලොව, ලොකයා; නඳකරණ, නඳන (සන්තුෂට) කරන්නාවූ; නිමලී, නිම්ලවූ; අමකිරණින්යුත්, අමෘතාංශුවෙන් හෙවත අමෘතරස්මියෙන් යුක්තවූ, සමූවලකුණු, සසමෘගාඞ්කතෙම හෙවත් චන්‍ද්‍රයා; සියලිමූවිලප, සකල මෘගාඞ්කය හෙවත් සකල මුගලක්‍ෂණය; දරණෙස, ධාරණයකරන්නේය; හිමි, (උත්පල වණ්දෙව) ස්වාමීහුගේ, මූවසිසි, මුඛසසාඞ්කතෙම හෙවත් මුඛනමැති චන්‍ද්‍රයා, ඔහු, ඒ සසකයා විසින්; ගත්, ග්‍රහණයකරන ලද්දවූ; නෙත්යුග, නෙත්‍රයුග්මය, ඉසිලී, උද්වහනය කොළෙයයි; කිව, කථනයකළහොත්; ඉසුරුගෙ, ඊශ්වරයාගේ; අබියස, අභිමුඛයෙහි; පේරහ, ප්‍රෙතයෙකුගේ ආකාරය (උපමාකොට) කියලී, කථනයකොට ලුවාක්මෙනි.

ලොකවාසින් තුටුකරන්නාවූ මලනැති (පිරිසිදුවූ) අමරසින් යුතුවූ චන්‍ද්‍රතෙම සියලු සාමුව (සාවගේ) ලකුන දරන්නේ වෙයි (මේ උපුල්වන්දෙව්) හිමිහුගේ මූහුන නමැති චන්‍ද්‍රයා ඒ සාවා විසින් ගන්නාලද ඇස්දෙක (පමණක්) ඉසුලූයේයයි කිව්වොත් ඊශ්වරයාගේ ඉදිරියෙහි ප්‍රෙතයෙකුගේ ආකාරය (උපමාකර) කියා ලූවාක් වැනිවෙයි.

183 දද සොඳ කුසුම් රොන්සැදි සරසවියක ල
රඳනා නිතොර එසුරිඳු දර මූවකම ල
පිරිඅම පියුම් රාමිණි විතෙනැයි උද ල
ගොපලත බඹුට ගොවි කීවෙද මතුරැතු ල

183. දද, දන්තනාමැති; සොඳ, සුන්දරවූ; කුසුම්රොන්, පුෂ්පරේණුයෙන්; සැදි සජ්ජිතවූ, සරසවියකල, සරස්වතී කාන්තාව විසින්, නිතොර, නිරන්තරයෙන්, රඳනා, රඤ්ජමානවූ, එසුරිඳු, ඒ සුරේන්‍ද්‍රයාගේ; මූවකමල, මුඛාම්බුජය හෙවත් මුඛපද්මය (සම්බන්ධවූ) අදර, ඔෂ්ඨයතෙම; අම්පිරි, අමෘතපූරිතවූ; උදල, උජ්වලිතවූ; පියුම්රාමිණි විතෙනැයි, පද්මරාග මාණික්‍ය වෘන්තයෙක්යයි; ගොපලත, කථනයකරතහොත්; බඹුට, බ්‍රහ්මයාට; ගොවි, ගොවියෙකු විසින්, කී, කථනයකරන ලද්දාවූ, වෙදමතුරුතුල, වෙද මන්ත්‍රයක් තුල්‍යයි හෙවත් වෙදමන්ත්‍රයක් සමානයි.

දත්නම්ැති යහපත් මල්රොනින් සැදුනාවූ සරස්වතී නම් කාන්තාව නිතොර හෙවත් නොරනැතුව රඳනු ලබන්නාවූ ඒ ශක්‍රදුගේ මූනනමැති නෙලුම්මල සම්බන්ධවූ අධරය හෙවත් තොල්දෙක අමායෙන් පිරුනාවූ දිලිසෙන රතුපිසුම් වණ්යඇති මැණික්වලින් (සෑදූ) නැටියෙකැයි කිව්වොත් (ඒ උපමාව) බ්‍රහ්මයාට ගොවියෙකු විසින් කියනලද වේදමන්ත්‍රයක් වැනිවෙයි.

184 අනත කුළුණු බරකල බැවිනි උරබි  ත
සිඟුවලගට ඉන් වෙහෙසක් වෙති * සත  ත
දුන් ඉඳුමිණි වැම්යුවලැයි කිව ලඹ  ත
රිවි අබියස ලූපහනැයි යෙති විය  ත

184. උරබිත, වක්ෂස් නමැති භිත්තියෙහි; අනතකුළුණු, අනන්තවූ කරුණාවෙන්; බරකල බැවිනි, භාරිතකල භාවයෙන්; සිඟුවලගට සූක්ෂ්මවූ හෙවත් කෘශවූ මධ්‍යප්‍රදෙශයට; ඉන්, ඒ කාරණකොටගෙණ; වෙහෙසක්, විහිංසනයක්; වෙති, * වේයයි; සතත, බ්‍රහ්මයා විසින් නොහොත්; සතත, නිරන්තරයෙන්; වෙහෙසක්, විහිංසනයක්; වෙති, වේයයි; දුන්, දානයකරණලද්දාවූ; ඉඳුමිණි වැම් යුවලැයි' ඉන්ද්‍රනිලමාණික්‍යස්තම්භ යුග්මයෙකැයි; ලඹත, ලම්බ හස්තයට; කිව, කථනයකලහොත්; රිවිඅබියස, සූර්‍ය්‍යයාගේ අභිමුඛයෙහි; ලූ, දල්වනලද්දාවූ; පහනැයි, ප්‍රදීපයන්යයි; වියත, ව්‍යක්තයෝතුමූ; යෙති, කථනය කෙරෙත්—

ළයනමැති භිත්තියෙහි අපමණ කරුණාවෙන් බරකල බැවින් සිහින්වූ මැද පෙදෙසට හෙවත් ඉඟටියට ඒ බර කරණකොටගෙණ වෙහෙසීමක්වෙයි සිතා බඹහු විසින් දෙනලද හෙවත් පිහිටුවනලද ඉඳුනිල්මැණික්වැම් (කණු) දෙකෙකැයි එල්ලෙන අත්යුගට කිව්වොත් (ඒ කීම) ඉරුගේ ඉදිරියෙහි පත්තුකරණලද පහන්වැතියයි වියත්හු කියත්ය—

184. මෙහි දෙවෙනිපදේ "වෙති" යනු බහුවචනයයි සමහරු කියතත්, දූන් දූන් "එති" "වෙති" "වෙනවාඇත" යනාදි බලාපොරොත්තුවීම් ආදියක් ප්‍රකාශවෙන මෙබඳු තැන්වල "ති,, යන්න නිපාත මාත්‍රයෙකැයි සිංහලභාෂාවේ තොරතුරු දන්නෝ සලකත්, බහුබස යයි නොගනිත්—

185 උරතල් සර තලින් බටගඟෙහෙ විලස  ද
නැබ පියුමට ගමනොත මත බිඟුවැල  ද
වසා රොදට සරිකල සුරරජුගෙ සො  ද
බරණැස සහල් නැලියට මිල කළෙව් ද  ද

185. උර, වක්ෂස් නමැති; නිල්සරතලින්, නීල තඩාගස්ථලයෙන්; බට, අවතීර්ණවූ; ගඟෙහෙ, ගංගාවගේ; විලසද, ලීලාවද; නැබපියුමට, නාභිනමැති පද්මයට; ගමනොත, ගමන් පැමිණියාවූ; මතබිඟු වැලද, මත්තභෘංගාවලියද; සුරරජුගෙ, දිව්‍යරාජයාගේ; සොද, සුන්දරවූ; වසාරොදට, වසාරාජියට; සරිකල, සමානකලහොත්; බරනැස, බාරානසී නගරයතෙම; දද, මුග්ධයෙකු විසින්; සහල්නැලියට, තණ්ඩුල නාළියට; මිලකළෙව්, මූල්‍යකළාක් වැන්න—

ළග හෙවත් ළැපැත්ත නමැත් නිල්පැහැය ඇති විල්තලාවෙන් බැස්සාවූ ගඟක විලාසයද නැබ නමැති පියුමට හෙවත් පියුමකරා ගමන්ගත් මීකී මත්වූ මැසි වැලද මේ දෙව්රජහුගේ සොඳුරුවූ (ළයේපටන්ගිය) රොමරෙඛාවට සමානකලොත් (අපමණ ඉසුරුඇති දෙලොස්යොදුන්) බරනැස්නුවර මෝඩයෙකු විසින් සහල්නැලියට මිලකළාක් මෙනි † —

* "වෙති,, සි—හැම පරණපොත්වලම.

† බරනැස සහල් නැලියට මිලකළ තොරතුර තණ්ඩුලනාලි ජාතකයෙන්ද දතයුතු.

186 පැහැපත් කලිඳු විලසින් මොලොක හෙල්මැ ලි
අම ව ත් සිනිඳු බවමද නලවන් සිහි ලි
ගජනත් එසුරරද වටොරට කරත තු ලි
සිරි ම ත් කඹුපුලට සරිකළ කඩොල් ම ලි

186. කලිඳු විලසින්, කාලින්දී නම් ගංගාව පරිද්දෙන්; පැහැපත්, ප්‍රභා ප්‍රාප්තවූ; හෙල්මැලි, නල්හාරයටබඳුවූ; මොලොක, මෘදුත්වයක් ඇත්තාවූ; අමවත්, අමෘතය වැනිවූ; සිනිඳුබව, සනිග්ධභාවයක් ඇත්තාවූ, මඳනලවන්, මන්දමාරුතය වැනිවූ; සිහිලි, ශෛත්‍යය හෙවත් සිතලය ඇත්තාවූ; එසුරරද, ඒ දිව්‍යරාජයාගේ; වටොරට, වෘත්තාරුවට; ගජනත්, හස්තිසොන්ඩය; තුලිකරත, තුල්‍යකරතහොත්, සිරිමත්. ශ්‍රීමත්තාවූ හෙවත් ශ්‍රීවත්තාවූ; කඹුපුලට, කණ්ඩොත් පලයට හෙවත් කුම්බුදෙත්පලයට; කඩොල්මලි, කණ්ඩුල පුෂ්පය; සරිකළා, සමානකළාක් මෙනි—

යමුනානම් ගඟ දියමෙන් පැහැයඇති බවට පැමිනි හෙවත් පැහැ ඇත්තාවූ හෙල්මැලි මෙන් මොලොක්වූ අමාවක් මෙන් සිනිඳුබව ඇත්තාවූ පික පික හමන සුලඟමෙන් සීතලගුණය ඇත්තාවූ ඒ දෙව්රජහුගේ වටවූ කලවයට ඇත්සොඬය සමානකලොත් (ඒ උපමාව) ශ්‍රීයාවඇති කඩුපුල්මලට එනම් නාලොවතිබෙන මහනිල්මල්වලට කඩොල්මල් සමානකලාක්මෙනි—

187 මු ල් මේ ලොවට ඔහු දඟසුවලට බැබ ලූ
පු ල් නු තැඹිලිමල් හියවුරු වැටුපු සි ලූ
නි ල් ගෙලෙ .ගෙලේ ලෙංහළුන් දුනුකෝ කැකු ලූ
තු ල් කළ කළ උවම් කිරිසයුරට හොවැ ලූ

187. මේ ලොවට, ඓහලෞකිකයට හෙවත් මෙලොවට; මුල්, මූලිකවූ, ඔහු, ඒ දේවයාගේ; බැබලූ, භ්‍රාජමානවූ; දඟසුවලට, ජඞ්ඝායුග්මයට; පුල්ලූවූ, ප්‍රල්ලඨවූ; තැඹිලිමල්, සන්නීර පුෂ්පයද; හියවුරු, තුනිරය (ජ්‍යොතාපුව)ද; වැටු පුසිලු, ප්‍රදීපසිඛාවද; නිල්ගෙලෙ, නීලග්‍රීවයෙකුගේ, ගෙලේ, ග්‍රීවයද; ලෙලෙහෙ ලුන්, ලේල්ලුද; දුනුකේකැකුළු, ධනුකේතකී හෙවත් රාජකෙතකී කුඩ්මලයද තුල්කළ, තුල්‍යකළහොත්; කිරිසයුරට, ක්ෂිරසාගරයට; හෝවැල, දියවරය හෙවත් කුඩා ගංවරයක් (කුඩා හෝවැලක් දියපාරක්); උවම්කළ, උපමාක ළාක්මෙනි—

(විෂ්ණු ආගමේ කියාපු අන්දමට) මේ ලෝකෙට මුල් නැතැත්තෙක්වූ ඒ (විෂ්ණු) දෙවියන්ගේ බබලන්තාවූ කෙන්ඩා දෙකට නොපිපුනු තැඹිලිමල්ද ජිතල බහන කොපුවද පහන්දලුවද මොනරාගේ බෙල්ල (ග්‍රීවයද) (ගංගාවල වසන) ලේල්ලු කියන මසුන්ද දුනුකෙය්යාමල් කැකුළුද යනමොහු සමානක ලහොත් (ඒ උපමාව) කිරිමුහුදට කුඩා හෝවැලක් හෙවත් බැසගෙණ යන කුඩාදියවැලක් උපමාකළාක් වැන්න—

188 හිරි තර පතර වැදූ නවපුල් රතකම ල
සිරි සර සුරතුරග * බබලන ලනඹ ද ල
සරි කල එසුරිදුගෙ සිරිපතුලට නිම ල
කිරි මිහිරට මොනොරෙකි එකියන නෙපු ල

188. හිරිතරපතර, සූර්‍ය්‍යරශ්මි ප්‍රස්ඵ්ජය නොහොත්; හිරි, සූර්‍ය්‍යා ගේ; තරපතර, රශ්මි ප්‍රසාරය හෙවත් රශ්මි සමූහය; වැදූ, ප්‍රවිෂ්ටවූ; නවපුල්, අභිනව ප්‍රඵුල්ලවූ; රතකමල, රක්තපද්මයද; සිරිසර, ශ්‍රීසාරවූ; සුරතුරග, දිව්‍යවෘක්ෂාග්‍ර, යෙක්හි; බබලන, භ්‍රාජමානවන්නාවූ; නඹ, නාම්මුවණිවූ, ලදලු, තරුණපත්‍ර සඳ; එසුරිදුගේ, ඒ සුරෙන්ද්‍රයාගේ; නිමල, නිර්මලවූ; සිරිපතුලට, ශ්‍රීපත්ලට; සරිකල; සදෘසකලහොත්; එකියන නෙපුල, ඒ කථනයකරණලද වචනය; කිරි මිහිරට, ක්ෂිර (යාගේ); මාධුර්‍ය්‍යයට, (සමානකලාවූ); මොනොරෙකි, මෝරුවෙක්ය—

හිරුරැස් සමූහය වැදී අලුත පිපුනාවූ රතුනෙලුම්මලද දෙව්රුක්අග බබලන්නාවූ නඹවන් ලාපත්‍රයද ඒ දෙවිඳුගේ පිරිසිදුවූ ශ්‍රීපාදයට සමානකලොත් ඒ කියනලද වචනය කිරෙහි මිහිරිකමට (සමානකලාවූ) මෝරුවෙක්ය (මෝරු සමානකලාක්මෙනි)—

189 හිමි සිරි සරණ නමදිනා සෙසු සුරන් හි ස
පැලඳි කිරුළු අගමුතු ලැලි ගිලි විල ස
පවසන උවම් කරු නියපතරට සක ස
දෙව්තුරුවර තුරු † කල වැන්න එකලෙ ස

189. හිමි, (වස්දෙව්) ස්වාමිහුගේ; සිරිසරණ, ශ්‍රීචරණය; නමදින, නමස්කාරකරන්නාවූ: සෙසුසුරන්, ශෙෂදිව්‍යයන්ගේ; හිස, සීශියෙහි; පැලඳි, පිලන්ධිතවූ; කිරුළුඅග, කිරීටාග්‍රයන්හිවූ; මුතුලැල්, මුක්තාලතිකාවන්, ඉගිලිවිලස, ගලිතවූ විලාශය නොහොත්; කිරුළුඅග, ‡ කිරීටාග්‍රයෙන්; ඉගිලි, ගලිතවූ හෙවත් ඉහුලුනාව: මුතලැල්, මුක්තා ලතිකාවන්ගේ; විලස, විලාසය හෙවත් ලීලාව; සතස, සන්තාවචවූ හෙවත් සකස්වූ; නියපතරට, නඛප්‍රසාරයට හෙවත් නඛප්‍රසද්ධයට; උවම්කරු, උපමාකොට; පවසන, ප්‍රකාශකරනහොත්; වරාතුරු, විකිරණ වෘක්ෂයන්; දෙව්තුරු, දිව්‍යවෘක්ෂයින් හා; එකලෙසකලවැන්න, ඒකාකාර කලාක්මෙනි—

(හැමතැනම් විශාලගුණ ඉන්න දෙවියාය කියන මේ දෙව්) හිමිහුගේ සිරිපා වඳින්නාවූ සෙසු දෙවියන්ගේ හිස්වල පැළඳිනලද කිරුළුඅග (තිබූන) මුතුවැල් ඉගිලි (සිරිපතුලේ ඇසිලිඅග වැටීතිබෙන) විලාසය නොහොත් ඔටුනු අගින් ඉසිලී (වැටීතිබෙන) මුතුවැල්වල ලීලාව සකස්ව (නොදැහැවිපවත්නා) නියපොතු සමූහයට උපමාකර කියතොත් (මේ උපමාව) වරාරුක් (ගස්) දෙව්රුක් (දිව්‍ය වෘක්ෂ) හා ඒකාකාර (සම සමාන) කලාක්මෙන් වෙසි—

* තුරග—සිඳ.
† මරාතුරු—සිඳ සමහර.
‡ අග, අගවූ; කිරුළු, කිරීටයන්ගෙන් කියාද හැකි.

190 වි දු ලේ වැනි එසුරිඳු සුනිල * මේකු ළ
බැමලේ මීසුරු කැන් අසුරඹුවන් කොම ල
ව රලේ පිල් තලල් රන්ගිරි තලැ අත ල
නිම ලේ එවන් විකුමන් කිම වණනු ය ල

190. එසුරිඳු, ඒ සුරෙන්ද නමැති, සුනිල, මනා නීලවර්ණවූ; මේ කුල, මෙඝ කූටයෙහි; විදුලේවැනි, විද්‍යුල්ලතාතුල්‍යවූ; කොමල, කෝමලවූ; අසුරඹුවන්, අසුරාම්බිකාවන්ගේ; බැමලේ, භ්‍රෑරේඛා නමැති; මීසුරුකැන්, මධුර සමූහයන් විසින්; වරලේ, ධම්මිල්ල නමැති; පිල්, පිඤ්ඡයෝ; තලල්, ලලාට නමැති; රන්ගිරිතලැ, ස්වර්ණ පර්වතතලයෙහි; අතල, ආභරණයක්කරණ ලද්දාහුය, නිමලේ, නිර්මලවූ; එවන්, එවැනිවූ; විකුමන්, වික්‍රමයන්; යළි නැවත; වණනු, වර්ණනාකිරීම; කිම, කිමෙක්ද—

ඒ (විෂ්ණු) සුරෙන්ද්‍රයා නමැති හොඳට නිල්පැහැය ඇති වැසිවලාකුළෙහි විදුලිවැනිවූ මොලොක්වූ අසුරාඞ්ගනාවන්ගේ බැම රේඛා නමැති මොනර සමූහයන් විසින් වරල් නොහොත් කෙසකලාප නමැති පිඤ්ජයෝ තලල් නමැති රත්‍රන් පර්වත තලාවන්හි අභරණ ලද්දාහුය පිරිසිදුවූ එවැනි වික්‍රමයන් නැවත වැණීම කුමක්ද—

191 තෙදීය තිසුරු පලඳිත † ඔහු යස අත ත
එනත ගෙලෙ මිණෙකැ සිරිපැයි තෙද දිමු ත
එම්ණ පැතු ‡ දෙ දෙනවැනි සැපත දෙ ත
මෙවැනි සුරිඳු නොසමත වණත මෙදිය ත

191. ඔහු, ඒ දිව්‍යරාජයාගේ; යස, කීර්තිය; තෙදියත, ත්‍රිවිධලොකයෙහි; ඉසුරු, ඓශ්වර්යය; පලඳිත, † පිළඳිනයකරන්නාවූ; අනත, අනන්තයාය; දිමුත, දීප්තිමත්වූ; තෙද, තෙජසතෙම; එනත, ඒ අනන්තයාගේ; ගෙලෙ, ග්‍රීවයෙහි; මිණෙකැ, මාණික්‍යයෙක්හි; සිරි, සෝභාව; පැයි, ප්‍රකාශකෙරේය; එමිණ, ඒ මාණික්‍යය; පැතුදේ, ප්‍රාර්ථනාකළදෙය; දෙනවැනි, දානයකරන්නාක්මෙන් (මේ සුරෙන්ද්‍රයාද) සැපත, සම්පත්තිය; දෙත, දානයකෙරේය; මෙවැනි, මෙබඳුවූ; සුරිඳු, සුරෙන්ද්‍රයා; මෙදියත, මේ ලොකයෙහි; වණත, වර්ණනාකරතහොත්; නොසමත, කවරහු සමර්ථවන්නෝද—

ඒ දෙව්රජහුගේ යසස තුන්ලොවෙහි ඉසුරු පලඳින්නාවූ අනන්තයාය දීප්තිය ඇත්තාවූ තෙජසතෙම ඒ අනන්තයාගේ කණ්ඨයෙහි මැණිකෙක සොභාව ගෙණහැර දක්වීය ඒ මැණික විසින් පැතූ පැතූ දෙය දෙන්නාක්මෙන් (මේ සුරෙන්ද්‍රයාද) සැපතදෙත්ය (එබැවින්) මෙබඳු දෙවෙන්ද්‍රයා වර්ණනාකරණවා නම් මේ ලෝකයෙහි කවරනම් නැනැත්තෝ සමර්ථවන්නෝද (සමර්ථ නොවන්නෝමය)—

---

* මේ කුළි—සමහර.
† පලඳිත පළඳියයි—සමහර.
‡ දෙත, දානයකරණ කල්හි—යිද් යෙත්.

192 දූත බස් අරුත් නොවැරැදූ හසර සලකර න්
පැණි සහ සිහිය නොවැරැදීලෙසට සලකර න්
රත ඹර බොරැඳි සුරිඳුට රුසිරු සලකර න්
ගෙණ ගිය අස් තැන තුම්තුරිඳුනි සැලකර න්

192. මිතුරිඳුනි, මිත්‍රෙන්ද්‍රයානෙනි; බස්අරුත්, වචනාර්ථයන්; නොවැරැදූ, විරුද්ධනොකොට; දූත, ජනනයකොට; හසර, (දූන්වියයුතු වචනාර්ථ) මාර්ගය නොහොත් (ගමනයකළයුතු) මාර්ගය; සලකාඅරන්, සංලක්ෂණයකොට රැගෙණ; පැණි සහ සිහිය, ප්‍රඥාව සමග සමෘතිය; නොවැරැදීලෙස ට, අවිරුද්ධ විලාසයට; අසලකරන්, ආසන්නකොටගෙණ; රණඹරණ, ස්වර්ණවර්ණාම්බරයෙන්; බොරැඳි, විරාජමානවූ; රුසිරු, රුචිරවූ හෙවත් චිත්තකාන්තවූ; සලකරන්, සලාඞ්කෘතවූ හෙවත් (පිළන්ධිත) ආභරණ සහිතවූ; සුරිඳුව, සුරෙන්ද්‍රයාට; (දූතුම්දීමපිණිස); ගෙණගිය, ග්‍රහණයකොට ගමනයකළාවූ; අස්තැ, සන්දේශයෙහි; තතු, තබය; සැලකරන්, ආරොචනයකරන්—

උතුම් මිතුරේ වචන හා අර්ත් නොවරද්දා දූතැගෙණ (සුරිඳුව දූන්වියයුතු වචනාර්ථ) මාර්ගය (නොහොත් ගමන්කළයුතු) මග සලකා (හිතට) ඇරැගෙණ නුවණ හා ඒ ඒ තැනට එලඹසිටිනා ඕනෑ කවයුතු කිරීමට දක්ෂවූ සිහිය නොහොත් ස්වානොචිත ප්‍රඥාසංඛ්‍යාත සිහිය වෙනස්නොවන අන්දමින් (හිතට) ලංකරගෙණ රන්වන් වස්ත්‍රයෙන් බබලන්නාවූ සිත කැමැතිකරණ (පැළඳි) අබරණ සහිතවූ දෙවිඳුට (දූන්වීමපිණිස) ගෙණගියාවූ පතිවිධ වචන සංඛ්‍යාත සන්දේශයෙහි ඇතිනතු දූතුම්දීපන්—

නොපුවතක් පෙරට දක්වම්දයත්—නොපුවතක්, කවර ප්‍රවෘත්තියක්, පෙරට, ඉදිරියට; දක්වම්දයත්, දර්ශනයකරවම්ද කීවොත්—

193 පෙර දූ සමග විසුවෙන් නෑසිය වැනි ති
අ ර තර මෙලොවැ වැඩයෙදුමෙන් හෝ කැමැ ති
ත ර දියැසුරු රතුනෙළුඹලසෙ වැඩු මැ ති
ක ර පෙම මිතුරු වෙතියනු දහමෙකි පැව ති

193. පෙරදූ, පූර්වජාතියෙහි; නෑසියවැ, ඥාති ස්වකීයව; නිති, නිත්‍යයෙන්; සමග විසුවෙන්, සමඞ්ගිභූතව (එක්ව) වාසයකළ හෙතුවෙන්ද; මෙලො, ඉහලොකයෙහි; අරතර, අභ්‍යන්තරව; කැමැති, රජ්ජිතවූ; වැඩයෙදුමෙන්, හෝ වෘඩියෝජනයෙන් හෝ; දියතර, ජලාභ්‍යන්තරය; ඇසුරු, ආශ්‍රයකළාවූ; වැඩුමැති, වැඩීම් ඇත්තාවූ, රතුනෙළුඹලසෙ, රක්තපුෂ්කරාඞ්කුරයක් පරිද්දෙන්, පෙම කර, ප්‍රෙමකොට; මිතුරුවෙති යනු, මිත්‍රවෙත්ය (යන) කීම; පැවැති, (පූර්වයෙහිපටන්) ප්‍රවෘත්තිනාවූ; දහමෙකි, ධර්මයෙක්ය—

පෙරජාතියෙහි නෑයන්ව ස්වකීයයන්ව නිතර සමගිව විසූ හෙතුවෙන්ද මෙලොව ඉතා වැඩිව කැමැතිවූ වැඩෙහි යෙදීමෙන්ද දියඅතරෙහි (දියයට) ඇසුරුකළාවූ වැඩීම ඇති (සැදීඑන) රතුනෙලුම් අඞ්කුරයමෙන් සෙනෙහෙකොට මිතුරුවෙත යන කීම (පෙරපටන්) පැවැති දහමෙක්ය—

194 එබැවින් වාසනා පින්බලයෙන් සොඳු රූ
වැඩී තැන් යතිඳුමෙකු සහවූ වෙනි මිතු රූ
ඔබ දන් වනලෙසට කී අස්නැ තොරතු රූ
දෙස වන් නමා සත්සුරිඳුනි ලෝ ඉසු රූ

194. එබැවින්, තද්භාවයෙන්; වාසනා පින්බලයෙන්; දෛව පුණ්‍යබල යෙන්; සොඳුරු, සුන්දරවූ; වැඩිතැන්, වර්ධිත ප්‍රාප්ත තැනැත්තෙක්වූ; යතිඳු මෙකු, යති උත්තමයෙකු හා; මිතුරුවූවෙනි, මිතුවූ හෙයින්, ඔබදන්වනලෙ සට, ඔබවහන්සේට නොහොත්; ඔබ. ඔවුන් වහන්සේ; දන්වනලෙසට, ජ්ඤාප නය කරවන පරිද්දෙන්; කී, කථනයකරණලද්දුවූ, අස්නැ, සන්දේශයෙහි; තො රතුරු, විශේෂවිභාග; ලෝඉසුරු, ලොකෛශ්වරවූ; සුරිඳුනි, සුරේන්ද්‍රයාණෙනි; දෙ සවන්, ශ්‍රවණද්වය; නමා, නම්‍රකොට; අසන්, ශ්‍රවණයකරන්—

ඒ බැවින් (ඒ නිසා) වාසනාවෙන් හා කුසලබලයෙන් උතුම්වූ (ඥාණගුණා දියෙන්) වැඩුනු තැනැත්තෙක්වූ යති උතුමෙකු හා මිතුරුදම් ඇතිවූහෙකු මෙන් ඔබවහන්සේට දැනුම්දීමපිණිස ඔවුන්වහන්සේ විසින් කියනලද පනිවිඩ වචනයෙහි නොහොත් පනිවිඩ වචනයාගේ තොරතුරු ලොවට නායකවූ සුරි ඳුනේ කන් අවනතකොට හෙවත් නමා අසන්—

195 කිහිරැලි උපුල්වන්—දෙව්රජුනි ගිරිහෙල පු ර
මුනිඳුන් වදන් මුදුනතත් ගත් සුරිඳු ස ඳ
නිරිඳුන් මෙලකැ රකිණුව බුදුසසුන් සො ඳ
වර දුන් බැවි නොබට—මකියන සුදුසු තෙපුලෙ ක
රජසිරි කිසෙව් ලත් දිවයුරු කුලෙනිපි ද
බුජබල නුවණ තරසර ගුණෙනි මන න ඳ
පසී රුසිරු නිරිඳුව මේ පැරකු ම් බා
විසිකර දදුළු විරිඳුන් ලය තා ම් බා
නිසිලෙසින් රකිවයි ලකා ඕලො ම් බා
රසී ගුණැති අයදින් මමිතුරඑ ම් බා

195. ගිරිහෙලපුර, ගිරිහෙල් නගරයෙහි; කිහිරැලි, කිහිරැලි වංශොද්භූතවූ හෙවත් කිහිරැලි වංශඇත්තාවූ; උපුල්වන් දෙව්රජුනි, උත්පලවර්ණ දිව්‍යරාජ යාණෙනි; මුනිඳුන්, මුනීන්ද්‍ර (සර්වඥ) යන්ගේ; වදන්, වචනය; මුදුනෙන්, මස්තකයෙන්; ගත්, ග්‍රහණයකලාවූ; සුරිඳුසඳ, සුරේන්ද්‍රොත්තමයා විසින්; මෙලකැ, මේ ලඞ්කාද්වීපයෙහි; නිරිඳුන්, නරේන්ද්‍රයන් හා; සොඳ, සුන්දරවූ, බුදුසසුන්, බුද්ධ ශාසනයද; රකිණුව, රක්‍ෂාකරණුපිණිස; ඔබට, ඔබවහන්සේට; වරදුන්බැවින්, වරදානය කරණලද හෙයින්, මකියන, මා විසින් (මතු) කථනයකරණු ලබන් නේ: සුදුසුතෙපුලෙක, යොග්‍යවූ වචනයෙක්ය (එනම්); දිවයුරු කුලෙනිපිද, දිවාකර වංශොද්භූතව හෙවත් සූර්‍ය්‍යවංශයෙහි උප්පජ්ජිතව; රජසිරිකිසෙව් ලත්, රාජ්‍යශ්‍රී අභිෂෙක ලද්දාවූ; බුජබල, බාහුබලයෙන්ද, නුවණ, ඥානබල යෙන්ද; තරසරගුණෙනි, ස්ථිරසාර ගුණයෙන්ද; මනනඳ, මනොනන්දනියවූ;

පස්ර්, පඤ්චබාණයාව, බඳුවූ; රුසිරු, රුචිරවූ නොහොත් රූපශ්‍රී ඇත්තාවූ; මේ පැරකුම්බා නිරිඳුට, මේ පරාක්‍රමබාහු නරේන්ද්‍රයාට; දුදුළු, රෞද්‍රවූ නොහොත් මෑඩනොපැවැත්විය හැකිවූ; විරිඳුන්, විරෝධීන්ගේ; ලය; හෘදය; තම්බා, පචනයකොට හෙවත් මෘදුකොට; විසිනර, වශඟකොට; ලක, ලඞ්කාවෙහි; (මේ රජහු) නොහොත්; ලක, ලක්‍ෂ්මිය හෙවත් ශ්‍රීකාන්තාව (මේ රජහුගේ සම්පයෙහි); ඕලොම්බා, විශ්‍රමණයකරවා; නිසිලෙසින්, සුදුසුපරිද්දෙන්; රකිවසි, රක්‍ෂාකරවසි; රසිගුණැති, රසවත්‍ගුණාන්විතවූ; එම්බා මම්තුර, පින්වත්වූ (එම්බා) මාගේ මිත්‍රය; අයදින්, ආයාචනාකරන්—

ගිරිහෙල් නම් නුවරෙහි සිහිරැලි වංශයෙහි උපන්නාවූ විෂ්ණුදිව්‍යරාජයා නෙනි මුනිරජුගේ හෙවත් බුදුන්ගේ වචනය මුදුනෙන් පිළිගත් උතුම් සුරිඳුන් විසින් මේ ලංකාවෙහි රජුන් හා සොඳ බුදුසසුනද රකිණුපිණිස ඔබවහන්සේට අවසර දුන්හෙයින මා විසින් කියනු ලබන්නේ සැහෙන වචනයෙක්ය (ඒ කවරේද) සූර්ය්‍යවංශයෙහි ඉපද රජසිරි අභිෂේක ලද්දාවූ බාහුබලයෙන් හා ඥාණබලයෙන්ද සපිරවූ මහත් ගුණයෙන්ද යුතුවූ හිත සතුටුකරන්නාවූ අනංගයාමෙන් සිත්කලුවූ නොහොත් රූපශ්‍රීයෙන් යුතුවූ මේ පරාක්‍රමබාහු රජහට රුළුවූ නොහොත් හික්මවිය නොහැකිවූ විරුඩකාරයන්ගේ හිත්වල (නොහික් මුනු වල් අඹුගති) තම්බමින් බුරුල්කර හික්මවා (ඔවුන් මේ රජුගේ) වශඟයට පමුණුවා ලංකාවෙහි සැපසේ වාසයකරවා නොහොත් ශ්‍රීකාන්තාව (මේ රජහුගේ සම්පයෙහි) වාසයකරවා සුදුසු ආකාරයෙන් රකිවසි රසවත් ගුණඇති එම්බා මගේ මිතුරේ අයදින් හෙවත් යාඥාකරන්—

196 සිරිලක් තිදසපුර—සුරතුරු අයුරු පුවත ර
උරබතුරු මැඳුරු සැදූ නවමිණි මිතු ර
සරබසුරු විකුම් දපහල රුපු කෙස ර
තියසක් සිව්උපා—සගුණෙන් අසුර ගුරු සු රු
පියුමඹා තන කොකුමතල බූජ තු රු
පැරකුම්බා නරනිඳු සඳුට සොහොවු රු
දිනිසුරු අයුරු තැනෙන මුළුලොවබැබ ළු
දිනිසුරු සඳිසි පැරකුම් නිරිඳු අලංකු ළු
දිනරන්විහල් මිදෙසුප් අනගි පවස ළු
දින් සඳියන්ව මෙනිරිඳු පළිනෙන් නැබු ළු

196. සිරිලක්, ශ්‍රීලංකා නමැති; තිදසපුර: ත්‍රිදශ නගරයෙහි; සුරතුරු අයුරු සුරතුරු ආකාරයෙන් හෙවත් පරසතු සුරදුමාකාරයෙන්; පුවතර, ප්‍රසිඩවූ; උරබතුරු, නෘදංහතාර නමැති; මැදුරු, මන්දිරය; සැදූ, සජ්ජිතකලාවූ හෙවත් අලඞ්කෘතකලාවූ, නවමිණි මිතුර: අභිනව මාණික්‍ය ප්‍රදීපයන් නොහොත්: නවමිණි මිතුර, නවවිධවූ මාණික්‍ය ප්‍රදීපයන් ඇත්තාවූ; රුපුකෙසර, ශත්‍රු නමැති කෙසරීන්ගේ; විකුම්දප, විකුම නමැති දර්පය, හල, හළවාවූ හෙවත් පහකලාවූ; සරබසුරු, ශරභ මෘගෙන්ද්‍රසමානවූ හෙවත් සරභ නම් මෘගයෙකුට-බඳුවූ; තියසක්, ත්‍රිවිධ ශක්තියෙන්ද; සිවුඋපා, චතුර්විධොපායෙන්ද; සගුණෙන්,

ශාඩ්ගුණ්‍යයෙන්ද; අසුරගුරු අසුරු, දානවාචාය්‍ර්‍යයාගේ ආකාර ඇත්තාවූ; පිලුමම්බා, පද්මාම්බිකාවගේ හෙවත් ශ්‍රීකාන්තාවගේ; තන, පයොධරයෙහි, කොකුම්, කුඞ්කුමය; බුජතුරු, භුජාන්තරයෙහි හෙවත් බාහුව අතරෙහි (ළයෙහි); අතල, ආස්තරණයකළාවූ හෝවත් නැවරීමකළාවූ; පැරකුම්බා නරනිඳුසඳුව, පරාක්‍රමබාහු නරෙන්ද්‍රොත්තමයාහට; සොයොවුරු; සහොදරවූ; මුලුලොව, සමස්තලොකය; බැබලු, භ්‍රාජමානකළාවූ නොහොත්; මුලුලොව, සමස්තලොකයෙහි; බැබලු, භ්‍රාජමාන වන්නාවූ; දිනිසුරු අසුරු, දිනෙශ්වරාකාරවූ හෙවත් සූය්‍ර්‍යයාට බඳුවූ; තදතෙද, සාන්ද්‍ර තෙජසක් ඇත්තාවූ; දිනිසුරු සදිසි, ධනෙශ්වරයාට ශාදෘශ්‍යවූ හෙවත් වෛශ්‍රවණයාට සමානවූ; සුලකුළු, අත්‍යලඞ්කෘතවූ නොහොත්; සුලකුළු, අති චිත්තකාන්තවූ; රුදු, රෞද්‍රවූ නොහොත් මහත්වූ; පැරකුම්නි, පරාක්‍රමයෙන් යුක්තවූ; රන්, ස්වර්ණයා වහල්, දාසන; මදගජ, මත්තහස්තිය; අනගි, අනඝවූ(අගයකළ නොහැකි); පටසළු, පට්ටසාටකය(යන), දිනි, ධනයන් නොහොත්; දිනි, දානයන්; ඉරිදුගමන්, ඍජුවූ චිත්තයෙන්; යදියන්ට; යාජකයන්ට හෙවත් යාචකයන්ට; දිනි, දානයකළාවූ; නැබුළු, මහත්වූ; තිලිනෙන්, ත්‍යාගිගුණයෙන් යුක්තවූ—

ශ්‍රීලඞ්කාවීපය නමැති දෙව්නුවරෙහි දෙව්තුරුමෙන් හෙවත් පරසතුරුක පරිද්දෙන් පරසිදුවූ ලැපැත්ත ඇතුලත නමැති ගේ සැරසුවාවූ නොහොත් ගෙයි සැදුවාවූ අලුත්වූ නොහොත් තවවැදෑරුම්වූ මැණික් නමැති පහන් ඇත්තාවූ සතුරු (ජනයන්) නමැති කෙශරී සිංහයන්ගේ වික්‍රම නමැති දර්පය හෙවත් එඞ්ඩ එනම් නොපසුබැස ඉදිරියට එන ආඩම්බර ගතිය නැතිකළාවූ සරභනම් මෘගයා වැනිවූ * ප්‍රභාවය උත්සාහය මන්ත්‍රණය යන තුන්වැදෑරුම් ශක්තියෙන්ද භෙදය, දණ්ඩය, සාමය, දානය, යන උපාය සතරෙන්ද ඓශ්වය්‍ර්‍ය පුනඃ; යසශ්‍රී, සංකල්ප, සිද්ධි, ප්‍රයත්න, යන ගුණසයෙන්ද අසුරගුරුවූ ශුක්‍රාචාය්‍ර්‍යයන්—ශ්‍රීකාන්තාවගේ පියවුරෙහි ගල්වනලද කොකුම් (තමන්ගේ) ලැපැත්තෙහි නැවරීමකළාවූ පරාක්‍රමබාහු යන නම් ඇති රජතුමන්ගේ සහෝදරවූ සියලු ලොව බැබලුවාවූ සූය්‍ර්‍යයාට බඳුවූ දූඩි තෙජසක් ඇත්තාවූ (දනිසුරුවූ) වෙසමුනියාට සමානවූ ඉතා අලඞ්කාර ඇති සිත්කලුවූ මහත් පරාක්‍රමයක් ඇත්තාවූ රත්රන්ස. වාල්ලූය, දාසය, මත්ඇතුන්ය, අගය (වටිනාකම) කියනොහැකි පටසළුය යනාදිවූ ධනයන් නොහොත් දානයන් ඇදනැති හොඳසිතින් යාචකයන්ට දුන්නාවූ මහත් ත්‍යාගිගුණයෙන් (තැගිවන්තකමින්) යුතුවූ—

197 ප හ යා දිගත යස සඳපහණින් නිතො ර
ප හ යා ගත් රූනල කුබර අයු ර
ම හ යා දුනු නුවරැ රැඳි යුවරද පව ර
ස හ යා පතින් රකිණුව අයදින් මිතු ර

* සරගම්‍රගසා, ඉහලට පහලට කකුල් සතර සතර බැගින් කකුල් අටක්ද උඩට ඇස්ද තිබෙන මෘගවිශෙෂයෙක්වේ.

† පැරකුම්නිරුදු සිද හැකි එකල—රුදු, රංජිතවූ, පැරකුම්නි, පරාක්‍රමයෙන් යුක්තවූ; නිරුදු, නිරන්තර රවුද්‍රවූ; සියාද මේ ඇර තවත් ආකාරවලටද කියත හැකි.

‡ සඳපහණින්, චන්ද්‍රපාෂාණයෙන්, චන්ද්‍රප්‍රදීපයෙන්—සිද හැකි.

197. නිතොර, නිරන්තරවූ; යස, කීර්ති නමැති; සඳපහණින්, ‡ චන්‍ද්‍රප්‍රභා වෙත් හෙවත් චන්‍ද්‍රමරීචියෙන්; දිගන, දිශාන්තරය; පහයා, ප්‍රභාමත්කොට (වසන්නාවූ); නලකුබර, කුවේර පුත්‍රයාගේ හෙවත් (රම්භානම් දිව්‍යාම්බිකාව ගේ ස්වාමිවූ) නලකුබරයාගේ; රූ, රූපශ්‍රිය; පහයාගත්අයුරු, පැහැරගත් ආකාර ඇත්තාවූ, මහයාදුනු නුවර, මායාදුන්නු නගරයෙහි; රැඳි, රඤ්ජිතවූ; පවර, ප්‍රවරවූ හෙවත් ශ්‍රෙෂ්ඨවූ; යුවරද සහ, උපරාජයාද සමග; යාපතින්, යහපත්, ආකාරයෙන්; රකිණුව, රක්ෂාකරණුපිණිස; මිතුර, මිත්‍රය; අයදින්, ආයාචනා කරන්—

නිතර පවත්නා කීර්ති නමැති හඳපහණින් දිශාන්තරය හෙවත් ඒ ඒ දිශාවන් පහදවා (එලිකර) නොහොත් ඒ ඒ දිශාවාසීන්ගේ සිත්සතුටු කොට (වසන්නාවූ) රම්භානම් දෙවඟනගේ හිමියාවූ) නලකුබරයාගේ රූපශ්‍රිය පැහැරගත් (උදුරාගත්) ආකාර (රූපලක්ෂණ) ඇත්තාවූ මායාදුනු නුවර රඳන්නාවූ (නැවතීසිටින) උතුම්වූ යුවරජුද සමග යහපත් අන්දමින් රකිණුපිණිස මිතුරෙ යාඥකරන් හෙවත් ආරක්ෂාව ඉල්වත්—

198 පැරකුම්රජ වියත—පහළ නවසඳලෙල් යු   රූ
සිරිලක් වවන රජබිජුසරු කෙනෙව් දි   සි
සිරිපින් ලකුණු මිනිපිරි නිඳනෙක සඳි   සි
සඳවත් නමින් යුත්—රජ්දුලඳුව සිරිබ   ර

නොලසා සමුව මෙන් දෙව්සෙන් වඩන රූ   ති
සලසා සරිකුලෙන් හිමියෙකු රූ පිණූ   ති

ගත්රුසිරූ සුරකුමරෙකු මෙන් බැබ   ළ
යුත්ගුණ නැණ දූහුමැති නෙපල කිවින   ළ
මෙත්කරැ මෙලක රතිණ දූරූමෙන් කිරූ   ළ
පුත්රුවණක් දෙනලෙස අයදින් යහ   ළ

198. පැරකුම්රජ, පරාක්‍රමබාහුරාජ නමැති; වියත, ආකාශයෙහි; පහළ, ප්‍රාදුර්භූතවූ; නවසඳලේසුරු, අභිනව චන්ද්‍රලෙඛාණුකාරිවූ, සිරිලක්, ශ්‍රීලඞ්කාවිජයෙහි, රජබිජු, * රාජබිජය; වවන, වර්ධනයකරන්නාවූ; සරුකෙනෙව්, සාරක්ෂෙත්‍රයක්මෙන්; දිසි, දෘශ්‍යමානවූ; සිරිපින්ලකුණු, සෞභාග්‍ය පුණ්‍යලක්ෂණ නමැති හෙවත් ශ්‍රීපුණ්‍යලක්ෂණ නමැති; මිණි, මාණික්‍යයෙන්; පිරි, පූරිතවූ හෙවත් පිරුණාවූ; නිඳනෙක සඳිසි, නිධාන සාදෘශ්‍යවූ හෙවත් නිධානයක් සමානවූ; සඳවත් නමින්යුත්, චන්ද්‍රවතී හෙවත් චන්ද්‍රවතී යන නාමයෙන් යුක්තවූ; සිරිබර, ශ්‍රීභරිතවූ; රජදූලඳුව, රාජදුහිතෘවූ යෞවනීට; නොලසා, වහා නොහොත්; නොලසා, අනාලස්‍යවූ; දෙව්සෙන්, දිව්‍යසේනාවගේ; රූතිවඩන, රූතිවර්ධනය කරන්නාවූ; සමුවමෙන්, ශන්මුඛයා පරිද්දෙන්; රූපිණූති, රූපපූර්ණත්විතවූ; සරිකුලෙන්, සමාන වංශයෙන්; හිමියෙකු, ස්වාමියෙකු; සලසා, සලස්වා; රූසිරුගත්, රූචිරවූ ගාත්‍රයෙන් හෙවත් විශාලකාන්ත ශරීරයෙන්; සුරකුමරෙකු මෙන්,

* රජබිජු, රාජබීජසම්; සරුකෙතෙවූ, සාරක්ෂෙත්‍රයක්වූ—සිද හැකි.

දිව්‍යකුමාරයෙකුපරිද්දෙන්; බැබළී, භ්‍රාජිතවූ; ගුණනැතසුත්, ගුණයෙන් හා සලක්ෂණයෙන් යුක්තවූ; කිවිතළුතෙපල, කාව්‍යනාටක වචනයන්; දූනුමැති, දූනීම් ඇත්තාවූ; කිරුළු දූරුමෙන්, කිරීටධාරණය කිරීමෙන්; මෙත්කර, මෛත්‍රීකොට; මෙලක, මේ ලඞ්කාව; රකිණු, රක්ෂාකරන්නාවූ; පුත්රුවනක්, පුත්‍රරත්නයක්; දෙනලෙස, දානයකරණ පරිද්දෙන්; සහළු, මිත්‍රය; අයදින්, ආයාචනාකරන්—

පරාක්‍රමබාහුරජු නමැති ආකාශයෙහි පහළවූ අලුත් චන්ද්‍රරේඛාවක් වැනිවූ ශ්‍රීලඞ්කාද්වීපයෙහි රජ නමැති බීජය වවන්නාවූ සරුකෙතක් මෙන් පෙනෙන්ට පවත්නාවූ ඓශ්චර්‍ය්‍ය පූර්ණලක්ෂණයෙන් හෙවත් ශ්‍රිවත්‍ත (ශ්‍රියාඇති) බවෙන් හා පින්ලකුණු නමැති මැණික්වලින් පිරුණාවූ නිධානයක් සමානවූ (චන්ද්‍රයාට බඳුවූ මුහුන ඇතිහෙයින්) චන්ද්‍රවතිය යන නාමයෙන් යුතුවූ ශ්‍රියාවෙන් බරවූ රජුගේ දූවූ කුමාරිකාවට නොපමාව නොහොත් ආලසීතුවූ (සවභා ඇති) දිව්‍ය සෙනාවගේ රුචිය (කැමැත්ත සතුට) වඩන්නාවූ කතරගමදෙවියන් වැනිවූ රූපලක්ෂණය හා පින්ඇත්තාවූ (තමන්ට) සමාන ගොත්‍රයෙන් (සැහෙන කුලයකින්) පුරුෂයෙකු ලැබීම සිදුකර සිත්කැමැතිකරණ ශරීරශ්‍රීයෙන් දෙව්කුමරෙකු පරිද්දෙන් බැබලීම් ඇත්තාවූ ගුණනුවණින් යුතුවූ කිවිතලූ තෙපුල් දූනීම් ඇතිවන්නාවූ ඔවුනු දූරීමෙන් මෛත්‍රීකර මේ ලඞ්කාව රකින්නාවූ (හොඳ) පුත්‍රරත්නයක්ද දෙනඅන්දමින් යාඥකරන්—

199 * අනොමුනිතෙර මහපිරිවර නිරිඳු ල ග
අරුත උතුරු කටයුතු නියුතු මැති ව ග
ගජ හයරිය පාබල සිව්රඟ සෙන ග
රකිණ ලෙසට අයදින් මිතුරෙ මනර ග

199. අනොමූනිතෙර, අනොමූනිනම් ස්ථවිරයන්වහන්සේද; නිරිඳුලඟ, නරේන්ද්‍රයාගේ සමීපයෙහිවූ; මහපිරිවර, මහාපරිවාරයන්ද; උතුරු, උත්තමවූ නොහොත් මහත්වූ; අරුත, අර්ථයක් හෙවත් වැඩක් පැමිනිකල්හි; කටයුතු, කර්‍තව්‍යයෙහි හෙවත් කටයුතු කිරීමෙහි; නියුතු, නියුක්තවන්නාවූ; මැතිවග, මන්ත්‍රීවර්ගයාද; ගජහයරිය පාබල, හස්ත්‍යශ්ව රථපාදගාට යන; සිව්රඟසෙන්, චතුරඞ්ගිනි සෙනාවන්ද; රකිණලෙසට, රක්ෂාකරණ ආකාරයට; මනරඟ, මනොරංගවූ; මිතුරෙ, මිත්‍රය; අයදින්, ආයාචනාකරන්—

අනොමූනි නම් තෙරුන්වහන්සේද, රජහුගේ සමීපයෙහි වසන මහත්වූ පිරිවරද මහත් වැඩක් කරන්ට ඇතිවූකල්හි කටයුතු කිරීමෙහි නියුක්තවන ඇමතිසමූහයාද ඇත් අස් රිය (රථ) පාබල යන චතුරඞ්ගිනි සෙනාවන්ද රකිණ අන්දමට සිත් අලවන්නාවූ මිතුරෙ යාඥකරන්—

* ඇතිවූ තිහොර මහපිරිවර; නිරිඳුලඟ—සීදැහැකි.

200 ස ඳ ව න් යස රැසින් හෙලිකල මුලු දිය    ත
ස ඳ ව න් සිරින් දනමන කොඳ කලදිමු    ත
ස ඳ ව න් සුරිඳු සියතුනු මිණි කරඬු ප    ත
ස ඳ ව න් බිසෝසඳ වැඳ කියව මෙපව    ත

209. සඳවන්, ඡන්දයවූ පරිද්දෙන්; යසරැසින්, යශොරාශියෙන් හෙවත් කීර්ති පුඤ්ජයෙන්; මුලුදියත, සමස්තලොකය; හෙලිකල, ආලොකකලාවූ; සඳවන්, චන්ද්‍රයාටබඳුවූ; සිරින්, ශොභාවෙන්; දන, ජනයන්ගේ; මනකොඳ, * චිත්ත කුන්දය, දිමුතකල, දීප්තිමත්කලාවූ; අසුරිඳු. අසුරෙන්ද්‍රයාගේ; සියතුනු, ස්වකීය ශරීරයෙහි; මිණිකරඬුපත, මාණික්‍ය කරණ්ඩක ප්‍රාප්තවූ; සඳවන්, චන්ද්‍රිකාව හෙවත් කාන්තාව වැනිවූ; සඳවන්, ඡන්දය ඇතිවන්නාවූ හෙවත් ලොභඋපද වන්නාවූ රූපශ්‍රීයෙන් යුක්තවූ; බිසොසඳ, හෙසිකා උත්තමියට වැඳ, වන්දනය කොට; මෙපවත, මේ ප්‍රවෘත්තිය; කියව, කථනයකරව—

ඊප්සිතවූ පරිද්දෙන් හෙවත් කැමැතිවූ පරිද්දෙන් කීර්ති සමූහයෙන් සියලුලොව එලියකලාවූ චන්ද්‍රයාට සමානවූ ශ්‍රියාවෙන් ජනයාගේ සිත්නමැති කොමුදයන් දීප්තිමත්කලාවූ හෙවත් සතුටුකලාවූ (සමුද්ද ජාතකයෙහි කියනලද පරිද්දෙන්) අසුරිඳුගේ ස්වකීය ශරීරයෙහි මැණික්කරඬුවට පැමිනියාවූ කාන්තාවන් වැනිවූ ලොභ උපදවන (රූපශ්‍රී ඇත්තාවූ) මහෙසිකාවූ උතුම් තැනැත්තියටද වැඳ මෙහි මූලින් කියනලද ප්‍රවෘත්තිය (පනිවිඩ වචන සංඛ්‍යාත සංදෙශයෙහි තොරතුරු) කියාපන්—

201 දු නු කම් රම් රජුමෙන් ලොවැ පුවත    ර ව
දු නු පරසුරම් ගණරන් දුනු සරද    ර ව
දු නු පුල්වන් දෙව්රජකුල ගරුත    ර ව
දු නු දෙව් රජහටද මෙතෙපුල් සැලක    ර ව

201. දුනුකම්, ධනුකර්මයෙහි; රම්රජුමෙන්, රාමරාජයා පරිද්දෙන්; ලොවැ, ලොකයෙහි; පුවතරව, ප්‍රසිඬවූ; ගණරන්, සාණ්ඩවර්ණමයවූ; දුනුසර, ධනුබාණයන්; දරව, ධාරිතව; පරසුරම්, එරසුරාමයා; දුනු, ජයග්‍රහණයකලාවූ; උපුල්වන්දෙව්රජකුල, උත්පලවර්ණ දිව්‍යරාජ වංශයෙහි; ගරුතරව, † අතිශයින් ගෞරවණීයව; දුන්, ජනිතවූ; දුනුදෙව්රජහටද, ජනකදෙවතාවාටද; මෙතෙපුල්, මේ වචනයන්; සැලතරව, ආරොචනයකරව—

දුනුසිල්පයෙහි (පොරණවිසු) රාමරජහු මෙන් ලොකයෙහි ප්‍රසිඬව ගණරන් මයවූ දුනු ඊතල දරන්නෙක්ව හෙවත් දරාගෙණ පරසුරාමයා පරාජයකලාවූ උපුල්වන් දෙව්රජහුගේ කුලයෙහි ඉතා ගරුකටයුත්තෙක්ව උපන්නාවූ ජනක දෙවතාවාටත් මේ වචනය දනුම්දෙව—

---

* කොඳ—යනු—පිච්ච වැනොඳ සවස පිපෙන මල්වලටද කියති-

† ගරුතරව, අතිශයින් ගරුකටයුතුවූ; උපුල්වන් දෙව්රජකුල, උත්පලවර්ණ දිව්‍යරාජ වංශයෙහි—සිද හැකි.

202 දසදෙසැ පතල යසයුතු සුරිඳුට දිමු තු
රසවත් අසුන් සැලකර මෙලෙසින් අමු තු
හසරදවන් නුබ විල්කෙළියෙහි නියු තු
තොසසිය නෑ සහ පරෙවිඳු සඳ පව තු

202. දසදෙසැ, දශදිශාවෙහි; පතල, ව්‍යාප්තවූ; දිමුතු, දීප්තිමත්වූ; යසයුතු, කීර්තියෙන් යුක්තවූ; සුරිඳුට, සුරේන්ද්‍රයාහට; අමුතු, (පෙරකපින් පිටතවූ) මුක්තනුවූ හෙවත් අමුතුවූ, රසවත්, රසවත්තාවූ; අසුන්, සන්දේශය; මෙලෙසින්, මේ ආකාරයෙන්; සැලකර, ආරෝචනයකොට; නුබ, නභනමැති; විල්කෙළියෙහි; තලාක ක්‍රීඩාවෙහි, නියුතු, නියුක්තවූ; හසරදවන්, හංසරාජයෙකු වැනිවූ; පරෙවිඳුසඳ, පාරාවතේන්ද්‍රොත්තමය; (උඹ) නෑසිය සහ, ඥාතිසඛීයයන්ද සමග; තොස, (චිත්ත) තොෂයෙන් යුක්තව; පවතු, (චිරකාලයක් සැපසේ) ප්‍රවෘත්තනය වන්න නොහොත්; පරෙවිඳුසඳ, පාරාවතෝත්තමයා; පවතු, ප්‍රවෘත්තිතවේවා හෙවත් සැපසේ ජීවත්වේවා—

දශදිශාවෙහි පැතුරුණාවූ දීප්තිය ඇති යසසින් යුතුවූ දෙව්රජුහට (පෙර නොකියන ලද්දක් බැවින්) අමුතු (කියමනක්) වූ රසඇතිවන්නාවූ (යථෝක්තාකාරයෙන්) මේ පනිවිඩ වචනය දැනුම්දී ආකාශය නමැති විලේ ක්‍රීඩාවෙහි නියුතුවූ (විල්වල කෙළියෙහි නිතර ඇලුම් ඇත්තාවූ) හංශරාජයෙකු සමානවූ පරෙවියන්ට උතුම් පරෙවිය (උඹ) නෑයන් හා සඛීයයන්ද සමග සතුටින් සැපසේ චිරකාලයක් පැවතෙව හෙවත් ජීවත්වන්න නොහොත් පරෙවියන්ට උතුම් පරෙවියා නෑයන් හා තමන්ගේ ජාතියේ වෙනඅයද සමග සැපසේ පවතීවා හෙවත් ජීවත්වේවා—

203 කඳවුරු කුලැ උපන් රැඳි තොටගමු පිය ස
සෙදදත් සියල් කවි හෙළු මගද සකුබ ස.
කඳ සුරිඳුන් වරලැබු පසලොස් වය ස
වදහල රහල් වැඩිතැන් කලරැව් සඳෙ ස

203. කඳවුරුකුලැ, සකන්ධාවාර වංශයෙහි; උපන්, උප්පජ්ජිතවූ, තොටගමුපියස, තීර්ථග්‍රාම ප්‍රදේශයෙහි; රැඳි, රඤ්ජිතවූ; සියල්කවි, සකල කාව්‍යශාස්ත්‍රයන් හා හෙළුමගද සකුබස, සිංහල මාගධික සංස්කෘත භාෂාවන්; සෙද, වහා (අප්‍රමාදව), දත්, ජානනයකලාවූ; පසලොස්වයස, පඤ්ච දශකවයසයෙහි; කඳ සුරිඳුන්, සකන්ධ සුරේන්ද්‍රයන්ගෙන්; වර, ප්‍රාර්ථනයක්; ලැබූ, ලබ්ධවූ; රහල්, රාහුලනම්වූ; වැඩිතැන්, වෘද්ධ තැනැත්තහු හෙවත් පණ්ඩිතයා විසින්; වදහල, වදාරණලද්දාවූ; කලරැව් සඳෙස, කපෝත සන්දේශයයි—

කඳවුරුනම්වූ කුලයෙහි උපන්නාවූ තොටගමුව යන නම්ඇති පලාතෙහි නැවැත් වාශයකලාවූ සියලු කවිසතරහා සිංහල පාලි සංස්ක්‍රිත යන භාෂාවන් නොපමාව දැනගත්තාවූ ඉපදී පසළොස්වෙනි හවුරුද්දෙහි කතරගම දෙවිඳුගෙන් වරලැබුවාවූ රාහුල යන නම්ඇති (වයසින් හා ශාස්ත්‍ර දැනීමෙන්ද) වැඩිතැණතුරට හෙවත් වැඩිතැන් සංඛ්‍යාත පණ්ඩිත භාවයට පැමිනි තැනැත්තහු විසින් වදුරණලද හෙවත් කියනලද පරෙව් සන්දේශයයි— නිමි— සිද්ධිරස්තු
සුභමස්තු ආරෝග්‍යමස්තු [illegible] සිද්ධිරස්තු—